

# කාරිකාව



# කාරිකාව

---*---

## වැලිතොට

විද්‍යාභාෂ පරිවෙණාධිපති

**අමරපුර ගණප්‍රධාන සංඝනායක**

උක්කණ්ඨමහාතිස්සඅරියවංසාලඞ්කාර

ආචාය්‍යී

**ඤාණතිලක නායකස්ථවිරයන් වහන්සේ විසින්**

ලියනලදසන්නසහිතයි.

---

බී. ඇස්. පී. රාජකරුණ ඩබ්ලියුම් කාර්තර්

ඇන්. මාර්ලිස්ද සිල්වා වෛද්‍යක

යන අප විසින්

වැලිතොට

## විද්‍යාරත්නාකර

**යන්ත්‍රාලයෙහි**

අච්චුගස්වනලදි.

---

බු. 2441

ක්‍රි. 1897

# සංඥාපනය.

**කාරිකාව**-මෙමග්‍රන්ථය තම්බදිපරටේ අරිමද්‍දනනුවර තන්‍ද්‍නම් විහාරයෙහි වැඩවිසූ ''ධම්මසෙනාපති'' නම් ම හාසථවිරංකෙණකුන් විසින් කරණලද්දකි—

මේ සථිරෙජනාමයෝ වනාහි තෙවළා බුදුවදන්හිද මාගධි සංස්කෘතාදි නොයෙක් භාෂාවන්හිද නාට්‍ය ඡන්‍දෝලංකාර ව්‍යාකරණාදි නා නා ශාස්ත්‍රයන්හිද අතිශ ය පටුත්වයක්ඇති කෙණෙක්වූවෝයි—

බුඩවර්ෂ එක්දහස් සසිය එක්වැන්නෙහි රජපැමිණි ''ජ ස්‍ගුහිස්‍'' නම් මහීපාලයන්ගේ කාලයෙහි මෙයකරණ ලදබවද ඒකාලයෙහි රහතන්වහන්සේලා ගන්‍ධමාදන පර්වතයෙහි සිට මේතන්‍ද්‍නම් විහාරයට පැමිණ වස්විසුබවද ඒකාලයෙහි උන්වහන්සේලාගේ හමුවෙහි මෙය ලිය නලදබවද එහෙයින් මෙය ගරුවශයෙන් සැලකියයුතු මාහැඟි ග්‍රන්ථයෙකැයි ආචාය්‍ය්‍යයන්විසින් කියනලද බවද ශාසනවංශයෙහි දක්වාතිබේ—

මෙයින්ම මෙම ග්‍රන්ථයාගේ අනර්ඝත්වය ප්‍රකාශිත බැවින් ග්‍රන්ථප්‍රශංසනය බෙහෙවින් කුමට වර්ණනාක රමුද?—

මෙම ග්‍රන්ථය ගාථාපන්සිය හැටපහකින්පමණ යුක්ත වූයේයි. න්‍යාස, රූපසිඩි, නිරුත්ති සාරමඤ්ජූසා, විශුඩිමාගී ටීකා, සඟිටිකා, යන ආදි මාගධිග්‍රන්ථයන්ද, කාතන් ත්‍ර කාසිකාවෘත්ති යන ආදි සංස්කෘත ග්‍රන්ථයන්ද, ආශ්‍ර යකොට නා නා ආචායඪිමතද අන්‍යමාගධව්‍යාකරණ ග්‍ර න්ථයන්හි නොදක්වනලද ඇතම්වැදගත් ව්‍යාකරණ ලක්‍ෂණද දක්වාකරණලද ප්‍රයොජනවත් ප්‍රශස්තග්‍රන්ථ යෙක්වූයේයි—

මාගධිව්‍යාකරණ ලක්‍ෂණෝද්ග්‍රහණයෙහි කච්චායන හෙද, නිරුත්තිසඞ්ග්‍රහ, සඳ්දසාරත්ථජාලිනී, ආදිය මෙන් මෙය ප්‍රයොජනවූවත් ඒග්‍රන්ථයන්ටවඩා අතිශයින් දුර් බොධ ගම්භීර ග්‍රන්ථිසථානවලින්ද යුක්තවූයේයි—

මෙහි ශබ්දවිනිශ්චය, සන්ධ්‍යක්ෂරශාසනවිනිශ්චය, කාරිකා
විනිශ්චය, සූත්‍රාගම විනිශ්චය, ... ර විනිශ්චය, ... වරණවිනි
ශ්චය, ප්‍රසව දීර්ඝ විනිශ්චය, ... ක්‍ෂ්‍යාදිගාවත් සමාසවිනි
ශ්චය, කාරකාදියාවත් සන්ධිවිනිශ්චය, සන්ධිකාරිකාය,
නාමකාරිකාය, කාරකකාරිකාය, සමාසකාරිකාය, ත
ද්ධිතකාරිකාය, ආඛ්‍යාතකාරිකාය, කෘදන්තකාරිකායයි
පරිච්ඡේද සොළසකින් යුක්තවූයේයි—

මෙය බුරුමරටේ ප්‍රාඥයෝ කච්චායනාදියමෙන් ශිෂ්‍ය
යන්ට පුහුණුකරවති. පුහුණුකරණලබන්නෝද මාගධී
ව්‍යාකරණයෙහි අතිශයින් නිපුණවූවෝවෙති-බුරුමරටේ
ව්‍යාකරණලක්ෂණ උගන්වනුලබන දශපිටග්‍රන්ථයන්ට
මෙයද ඇතුළත්කරණලද්දේයි—

ව්‍යාකරණලක්ෂණ ඉගණීමෙහි මෙය ඉතා ප්‍රයෝ
ජනවුවත් ලක්දිව සොයාගැන්මටද ඉතා දුෂ්කර
වූයේයි—ඒසොයාගත්නමුදු කාලාන්තරයෙන්ජනිත නා
නා දෝෂයන්ගේ බාහුල්‍යයෙන් පොත කියවන්ට පවා
නොහැක්කේයි. කෙතරම් දුරට එනකුලවතිබේදැයි කිව
හොත් පොත්දෙකක් එකටතියවා බැලුකල නිරායාස
යෙන් හැඟියෙයි—බොහෝසෙයින්ම මේ පොත ඔවුනො
වුන්අතර රහස්ගනව පැවැත ආයේයි—

මෙහි අගයදත් කතිපය භවතුන්විසින් මෙය සකස්කළ
යුතුවැයි අපට නොයෙක්වර ඇරයුම්කෙළහයින්ද ව්‍යාඛ්‍යාන
යක්නොමැතිව මෙහි නෑවාවබෝධය අතිශයින් දුෂ්කර
හෙයින්ද අපමිතු බුස්සේ සඩාතිස්ස ගිහිතුමන්ගෙන්
පොත්දෙකක්ද මොරකොළ සීලරතනස්ථවිරතුමන්ගෙන්
පොතක්ද වැලිවත්තේ වජිරඥාන ස්ථවිරතුමන්ගෙන් පො
තක්ද ගෙන්වා බලා බණ්ඩාරමුල්ලේ ශිෂ්‍යනෑනන්සමග
බොහෝපරිශ්‍රමයෙන් ශුද්ධකොට මෙයෙහි ව්‍යාඛ්‍යානය
ලියනලද්දේයි—එනකුදුවුවත් මෙවැන්නෙහිදු අපගේ
පෘථග්ජනස්වභාවය වැලකියනොහැක්කේයි—එහෙයි
න් ප්‍රමාදභ්‍රමාදියෙන් ජනිත යම්කිසි දෝෂාංශුවක්නුදු මෙහි
අවිද්‍යමානයයි නොකියමු. ප්‍රාඥයෝ එහිනිර්දෝෂාභිප්‍රාය
සංලක්ෂණයකෙරෙත්වයි ආශිංසනයකරමු—



AMARAPURAGANAPRADHANA SANGHANAYAKA
U. A. NANATILAKA, HIGH PRIEST.

# DEDICATED

*by*

*Permission*

*to*

*His Majesty Samdach*
*Mahamakuta Sammata Dewawansa*
*Paraminda*

*CHULALANKARA*

*King of Siam*

## ශ්‍රීමත්

ශ්‍රේෂ්ඨ සම්දච් මහාමකුට සම්මත දෙවවංස
පරමින්ද චූලාලඞ්කාර සියම් මහ රජතුමන්විසින්
පිළිගන්නාලදී.

# ශුද්ධිපත්‍රය

| පිට- | පේළි | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 8 | 23 | විචාරණු | විචා[illegible] |
| 20 | 15 | සාමාන්‍යපකරණලද | සං[illegible]යෙන් |
| 22 | 10 | පරිච්ජයෙහි | පරිච්ඡේදයෙහි |
| 22 | 11 | අවලාගසක් | අවලෝගසක් |
| ,, | ,, | පරිච්ජදයෙහි | පරිච්ඡේදයෙහි |
| 23 | 16 | ප්‍රශත්කාදී | ප[illegible]දී |
| 24 | 28 | සහෙතාවෙද්ද | සඟෙ[illegible]වෙද්ද |
| ,, | 29 | කයම්වෙත් | නම්වෙ[illegible] |
| 26 | 26 | සනිවුහන් | සනිටුහ[illegible] |
| 27 | 9 | ගෙතෲකයි | ගෙතෲ[illegible] |
| ,, | 16 | විසුඩ | විශුඩ |
| 33 | 17 | ගතමොනු | ගම් |
| ,, | 19 | තත්‍රමඩාදී | තත්‍රමධ්‍යාදී |
| 35 | 18 | ආදීන් | ආදීන් |
| 41 | 26 | ගාව | ගාවත් |
| 48 | 14 | ගාව | ගාවත් |
| 49 | 1 | එකවිධං | එකවිධං |
| ,, | 17 | ගදිවජාදීති | ගදිවජාදිශි |
| ,, | 23 | නපුංසකං | නපුංසක |
| ,, | 29 | සසවාසන | සවාසය |
| ,, | 34 | බ්‍යඤ්ජනසංඥාන | ව්‍යඤ්ජනසංඥාන |
| 54 | 25 | සාමාඩීනගෙයන් | සාමඩීනයෙයන් |
| 61 | 1 | වක්ඛි | වක්කි |
| ,, | 1 | පක්ඛී | පක්ඛි |
| 63 | 17 | එකාරගෙනා | එකාරගෙනා |
| ,, | 30 | පුල්ලිඩෙගා | පුල්ලිඩෙගාගහි |
| 64 | 11 | එකාරගෙනා | එදගෙනා |
| 67 | 17 | ජාති, ජාති, | ජාති |
| 69 | 23 | ඔකාරගෙනා | ඕකාරගෙනා |

| පිට- | පෙල | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 72 | 12 | ආකාරනත | අකාරනත |
| 76 | 24 | සර්වනාමයනෙම | සර්වනාමයද |
| ,, | ,, | සර්වගුණනාමයයිද | සර්වගුණනාමයද |
| ,, | 25 | තුන්ලිඟුනාමයයිද | තුන්ලිඟුනාමයයි |
| 78 | 14 | දක්නාහෙයින් | දක්නාහෙයින්ද |
| 82 | 14 | වයයිද | වඤ්ජයයිද |
| 84 | 33 | කරකයෙක් | කාරකයෙක් |
| 85 | 20 | ක්‍රියාසිඩි | ක්‍රියාසිඩිං |
| ,, | ,, | ක්‍රියාසිඩිතොමෝ | ක්‍රියාසිඩිය |
| 89 | 24 | විසිත් | විසින් |
| 91 | 27 | විභක්තායි | විභක්තියි |
| 92 | 20 | ලිඞ්ගාත්ථ | ලිඞ්ගාර්ථ |
| ,, | 22 | පවහිද | පවහිමද |
| ,, | 33 | නවතනතෙ | නවාවතනතෙ |
| ,, | ,, | නොපවති | නොමපවති |
| 95 | 23 | නාමයුත්) විසිත් | නාමයන් විසින් |
| 103 | 11 | පුබ්බපදත්ථ | පුබ්බමත්ථ |
| 108 | 8—33 | බාධකතෝන | බාධකතෙනන |
| ,, | 18 | වත්ථුං | වත්ථු |
| ,, | 33 | බාධකාර්ථයෙන් | බාධකත්වයෙන් |
| 115 | 30-32 | ප්‍රදෙශයෙහි | උපදෙශයෙහි |
| 120 | 20 | දන්නාදල්දෑහුය | සලකුණු කරණලද්දෑහුය |
| 122 | 10 | ඉකඛනෙ | ඉකඛ්‍යතෙ—වෙනත් |
| 123 | 24 | සඞ්ඛනදී | සඞ්ඛ්‍යාදි |
| 125 | 8 | සබ්බස්ස | දබ්බස්ස |
| ,, | 11 | ක්‍රියා | කිරියා |
| 127 | 17 | නාංතනවමානං | නාංවතනමානං |
| ,, | ,, | වතනමානය | වත්මානය |
| 131 | 7-28 | කතතු | කතතා |
| ,, | 9 | අකළමකො | අකම්මකො |
| 132 | 8 | විභත්ති, නමස්ස | විභත්ති, නාස්ස |

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 133 | 20 | ආසිංසනාජීවී | ආශිංසනාජීවී |
| 137 | 21 | නිරන්තරං | නිච්චං |
| ,, | 24 | ඒ කර්ත්‍රා | ඒකර්ත්‍රාදි |
| 138 | 19 | කිත්තිතා | පරිකිත්තිතා |
| 145 | 17 | අකම්මකා | අකම්මා |
| 151 | 11 | නඋග්ගතෙ | උග්ගතෙ |
| ,, | ,, | කල්පනානොකරයි | කල්පනාකරයි |
| ,, | 24 | අතිවිත්ථාරතොඑව | විත්ථාරතොතුඑව |
| ,, | ,, | ඉතාවිස්තරනයින්ම | විස්තරනයින්ම |

86 374 ගාථාවේ—තස්මා, එසේහෙයින්; යො,යම්සම්ප්‍රදානාඛ්‍යයෙක්; පධානං; ප්‍රධානභාවයෙන්; පගීයතෙ, (ආචාර්‍ය්‍යයින්විසින්) ව්‍යවහාරකරණුලැබේද; කරණාදිපුරස්සරෙ, කරණාදිකාරකයන්ට ප්‍රධානවූයේ; පාකාදිකංක්‍රියං, පචනාදික්‍රියාව; කුබ්බං, කරන්නේවේද; සොඑව, ඒපදාඛ්‍යයනෙමෙම; කත්තාභවෙ, කර්තෘනම්වන්නේය—132 පිටේ 476 ගාථාවේ—විභත්තිනං, විභක්තින්ගේ; පරස්සපදං, පරස්මෛපදයවේ—යනු ශුද්ධයි—ග්‍රන්ථපරිසමාප්තියෙහි 17 ගයේ 'දිපෙඨාපිය'-යන්න වෙනුවට-දීපමිහිඨාපිය' යිද 26 ගාථාවේ 'නාථවිභයං' යන්න වෙනුවට "නාථනානං'' යිද වේ—

---

**අමරපුර ගණප්‍රධාන සංඝනායක**

පූ. ඒ. ඤාණතිලක නායකස්ථවිරයන්වහන්සේ විසින් වයස අවුරුදු 21 පමන් 35 දක්වා කරණලද ග්‍රන්ථ.

1 එකක්ඛරකොස ව්‍යාඛ්‍යාව (පාළිව්‍යාකරණ)
2 ශබ්දබින්දු ව්‍යාඛ්‍යාව (පාළිව්‍යාකරණ)
3 කච්චායනසාර ව්‍යාඛ්‍යාව (පාළිව්‍යාකරණ)
4 මුඛමත්තදීපනී ව්‍යාඛ්‍යාව (පාළිව්‍යාකරණ)
5 නිරුක්තිරත්නාකර (ගාථා 10000 පාළිව්‍යාකරණ)
6 කාරිකා ව්‍යාඛ්‍යාව (පාළිව්‍යාකරණ)
7 ගන්ධාභරණ ව්‍යාඛ්‍යාව (පාළිව්‍යාකරණ)
8 සාසනවංසදීපව්‍යාඛ්‍යාව(පාළිශාසනවෘත්තාන්තකාව්‍ය)
9 විදග්ධමුඛමණ්ඩන ව්‍යාඛ්‍යාව (සංස්කෘතකාව්‍ය)
10 ශබ්දවෘත්ති ව්‍යාඛ්‍යාව (පාළිව්‍යාකරණ)
11 අඤ්ජනනිදාන ව්‍යාඛ්‍යාව (වෛද්‍ය)
12 ශෘඞ්ගාරතිලක ව්‍යාඛ්‍යාව (සංස්කෘතකාව්‍ය)
13 නිරුක්තිසංග්‍රහ ව්‍යාඛ්‍යාව (පාළිව්‍යාකරණ)
14 වච්චවාචක ව්‍යාඛ්‍යාව (පාළිව්‍යාකරණ)
15 මොහමුද්ගරය (සංස්කෘත නීතිශාස්ත්‍ර)

සන්න සහිත

# කාරිකාව

—— * ——

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

---

1 සම්බොධි පුබ්බධරණීධර පාතුභූතො
භූතම්බුජෙ භුවනනීරරුහාකරෙසු
ධම්මංසුනා නධිවරම්බුජපාණී ජනෙ
යො බොධසී තමතුලං සිරසා නමාමි

2 සම්බුද්ධතොදිත මුළාර මනොමතෙජං
විද්ධස්තමොහතිමිරොඝ මසෙසතොව
සඞ්ඛාචිතන්නලිකා ලද්ධා මාඝ්‍ය දයං
සද්ධම්මභානු මමලං සිරසා නමෙ තං

3 සත්තඥුසුගන්ධි සතජෙහි මරීචියා ච
බුද්ධං නථාගතමධුබ්බන මොද දසිං
සංසුද්ධ සීලසුරභිං හදයාභිරාමං
සඞ්ඝම්බුජං ගුණමධුං සිරසා නමෙ තං

4 ව්‍යාසෙන මෙ විභජ්ජනං සමඤ්ඤාන මත්ථං
අග්ගොති එස ඨපිතො මුනිනෙ තදග්ගෙ
කච්චායනොති විදිතො යතිපුඞ්ගවො යො
සද්දානුසාසන මකාසි නමාමහං තං

5 යො සස්සදුම් කනක කෙසර ගාමජාතො
සන්තානංච තෙළසසමං සුසු මුබ්භවා තො
සත්ථාගමාදිසු මමං පදුමාදිරාම
නාමො විතෙනසි පණමාමි ගරුං මමං තං

——00——

6 ඨානීයකාමිති අරිමද්දන නාමධෙය්‍ය
නන්දාභිධානසහිතෙ විදිතෙ විහාරෙ
වාසං නිවාස මුපගො වර ධම්මසෙනා
පත්‍යව්හයො පකරණං කරි කාරිකාව්හං.

7 උප්වාසයෙන සුහදෙන මම භාරුකාධා
රාමාධිපෙන ජිනසාසන මාමකෙන
සද්ධාධනෙන විදුරෙන ගුණාකරෙන
අජ්ඣෙසිතො සුගතවංස යතිස්සරෙන.

8 සල්ලෙඛියෙන සුරතෙන සුසඤ්ඤතෙන
ධීරෙන සුබ්බචනරෙන තපොධනෙන
සිස්සෙන මෙ අමරසීහ සමඤ්ඤකෙන
ව්‍යාඛ්‍යං කරෙමි ඉම මස්ස සමං සමාණනා.

(සකල ජම්බුද්වීප තලයෙහි නානා නගරයන්හි ප්‍රකටවූ තම්බදීප රාෂ්ට්‍රයෙහි ස්වර්ණ රජත මාණික්‍ය මුක්තා ප්‍රවාළ භාජනයශාදි රත්නයෙන් හා වස්ත්‍රාභරණාදි සියලු කැමැති වස්තුවෙන්ද පරිපූර්ණහෙයින් 'පූර්ණිම' යයිද පසළොස් නගරයන්හි නරෙන්ද්‍රයන්ගේ බලය විශෙෂයෙන් මර්දනය කළහෙයින් 'අරිමද්දන' යයිද අන්‍යතීර්ථකයන්ගේ ලබ්ධිය දුරීභූතකොට රත්නත්‍රය ගුණසඞ්ගීක පූර්වඞ්ගමවූ මුනින්ද්‍රොත්තමයන් වහන්සේගේ ප්‍රොත්ඵුල්ලපද්මාකාර මුඛවිවරයෙන් විනිගීතවූ පිටකත්‍රයාවලම්බිතව දශපුණ්‍යක්‍රියාවස්තුවෙහි මනාකොට නියුක්තවූ උදාරධනාශයඇත්තාවූ අනන්‍යතන පරිශුද්ධ දෘෂ්ටිඇති පුණ්‍යාන්විතවූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍යාදීන්ට වාසස්ථාන භාවයෙන් 'දක්ෂිණනගර' යයිද ලබ්ධාභිධානඇත්තාවූ නගරයෙහි 'අභිමඞ්ගලසම්මත ගජේන්ද්‍රාව සෙමහිකුඤ්ජර ස්වාමි ශ්‍රී ත්‍රිභවනාදිත්‍ය වර ධර්මරාජ ජයශූර චක්‍රවර්ති නරෙන්ද්‍රොත්තමයාවිසින් සම්මතකරණලද ශීලාදි ගුණගණොපලක්ෂිතවූ මහාස්ථවිරොත්තමයන්ට වාසස්ථානවූ නන්දාභිධාන විහාරයෙහි වාසයකළාවූ 'ධම්මසෙනාපති'

——00——

1 සිද්ධ සද්දත්ථ සම්බන්ධ, දෙසකං ජිනපුඞ්ගවං
තප්පකාසිත ධම්මඤ්ච, ගණඤ්ච ගුණසාගරං—

යති ආචාර්‍ය්‍යයන්විසින් ගෘහීතනාමධෙයයක් ඇති ස්ව සමය පරසමයාන්තර ග්‍රහණ අධ්‍යවග්‍රහණයන්හි සමර්ථ වූ ආචාර්‍ය්‍යශ්‍රීනමේ ත්‍රිලොක තිලකායමානවූ භවත් සර්වඥ යනාර්ථවිරොචනනාමයන්වහන්සේවිසින් කරණලද ශබ්දානුශාසනයට අත්‍යන්තොපකාරවූ කාරිකාග්‍රන්ථය ආධ්‍යාත්මික බාහ්‍යොපද්‍රව නිවාරණයට සමර්ථවූ රත්නත්‍රය ප්‍රණාමය කොට කරනුකැමැත්තේ 'සිද්ධ සද්දත්ථ සම්බන්ධ දෙසකං' යන ආදිය කීය)

1 සිද්ධ, ප්‍රසිද්ධවූ; සද්දත්ථ සම්බන්ධ, ශබ්දාර්ථ සම්බන්ධය; දෙසකං, දෙශනාකළාවූ; ජිනපුඞ්ගවං, ශ්‍රෙෂ්ඨවූ සර්වඥයන් වහන්සේද; තප්පකාසිත, ඒ ශ්‍රෙෂ්ඨවූ සර්වඥයන්වහන්සේ විසින් ප්‍රකාශකරණලද; ධම්මඤ්ච, ධර්මයද; ගුණසාගරං, ගුණයන්ට සාගරය බඳුවූ; ගණඤ්ච, අෂ්ටාර්‍ය්‍යපුද්ගල මහාසංඝයා වහන්සේද—මතාට සම්බන්ධයි—

('සිද්ධ සද්දත්ථ සම්බන්ධ දෙසකං' යන මෙහි සිද්ධ ශබ්දය නෙමේ නිත්‍යාර්ථයෙහිද නිෂ්පන්නාර්ථයෙහිද ප්‍රසිද්ධාර්ථයෙහිද වැටේ—'සිද්ධමාකාසං' යන මෙහි නිත්‍යාර්ථයෙහිවැටේ 'සිද්ධමන්නං' යන මෙහි නිෂ්පන්නාර්ථයෙහි වැටේ-'කම්පිල්ලොසිද්ධො' යන මෙහි ප්‍රසිද්ධාර්ථයෙහි වැටේ—ඔවුන් අතුරෙන් මෙතැන්හි ප්‍රසිද්ධාර්ථයෙහි වැටේ--ශබ්දනම් කිම? උච්චාර්‍ය්‍යමාණවූ යමකින් අර්ථය දන්නාලෑ වේද ඒ ශබ්ද නම්, අර්ථය ප්‍රකාශකරණ විඥප්ති විකාරශබ්දනොයිති—අර්ථනම්කිම? උච්චාර්‍ය්‍යමාණ ශබ්දයකින් යමක් දන්නාලෑ වේද ඒ අර්ථනම් වේ— සම්බන්ධනම් කිම? සඞ්කෙතයෙන් මේනෙමේ මොහුගේ අර්ථය, මේ අර්ථය මේනෙමේ ප්‍රකාශ කෙරේයයි අර්ථ ප්‍රකාශකරණ කාරණනම්— 'ජින පුඞ්ගවං' යන මෙහි ජිනශබ්දයාකෙරෙන් පරවූ පුඞ්ගව ශබ්දයතෙම ශ්‍රෙෂ්ඨාර්ථ වාචකවේ— "නරසද්දාදිනො පරු

——00——

2 නත්වා කච්චාන ථෙරඤ්ච, තෙන සද්දානුසාසනං
යමිදානි කතං තස්ස, කාරිකා වුච්චතෙ මයා—

සීහ උසභ සද්දූල පුඞ්ගව කුඤ්ජර ව්‍යග්ඝ නාගසද්දා සෙට්ඨවා චකා''යි කීහෙයිනි— මෙහි ධම්ම ශබ්දයෙන් සපර්‍ය්‍යාප්තික නවලොකොත්තර ධර්මය දක්වනලදි— පර්‍ය්‍යාප්තියගේ අර්ථවූ ලොකොත්තරාධිගමයට හෙතුවූ ශීලාදී පූර්වභාග ප්‍රතිපත්තිධර්මය කුමක්හෙයින් නොගත්තාලද්දේද යත්? ''අද්‍යන්තෙන ගහිතෙ තම්මජ්ඣපතිතානං ගහණං භවති''යි කීහෙයින්හෝ පාරිශෙෂන්‍යායයෙන්හෝ ප්‍රතිපත්තිධර්මය ගන්නාලැබේ)

(දැන් ප්‍රාප්තවූ ප්‍රතිසම්භිදාඥානයහා ක්ෂීණාශ්‍රවත්වය ඇතිහෙයින් සංඝරත්නයෙහි අන්තර්ගතවූද කච්චායන ස්ථවිරයන් වහන්සේ ප්‍රකරණකරණයෙහි බහූපකාරඇතිබැවින් වෙන්කොට නැවත වඳිනුපිණිස ''නත්වා කච්චානථෙරඤ්ච'' යන ආදිය කිය)

2 කච්චානථෙරඤ්ච, කච්චායන ස්ථවිරයන් වහන්සේද; නත්වා, (කාය වාක් චිත්තයෙන්) වැඳ, තෙන, ඒ කච්චායන ස්ථවිරයන් වහන්සේවිසින්; යංසද්දානුසාසනං, යම් ශබ්දානුශාසනයෙක් (කච්චායන ප්‍රකරණයෙක්) කතං, කරණලද්දේද; තස්ස, ඒශබ්දානුශාසනයාගේ; කාරිකා, අර්ථප්‍රකාශිකාවෙක් හෙවත් කාරිකානම් ප්‍රකරණයෙක්; මයා, මාවිසින්; ඉදානි, දැන්; වුච්චතෙ, කියනුලැබේ—

('නත්වා' යන මෙයින් ක්ෂෙත්‍රාධ්‍යාශය සම්පත්ති ඇති රත්නත්‍රය ප්‍රණාමක්‍රියායෙන් ජනිතවූ දෘෂ්ටධර්ම වෙද්‍යවූ ප්‍රථම ජවනචෙතනාවෙන් තමාවිසින් ප්‍රාරබ්ධ කටයුතු ග්‍රන්ථය සිඬ වේයයි දක්වයි—කෘශි වර්ණදානාදි සම්පත්ති නිෂ්පාදක ව්‍යාපාරයෙන් ප්‍රකටවූ කච්චයාගේ පුත්‍රභාවයෙන් හෝ රූපවිලාසයෙන් ප්‍රකටභාවයෙන් හෝ ගොත්‍රයෙන් පැමිණි නාමයෙන් හෝ 'කච්චායන' නම් වේ—ස්ථිරගුණයෙන් යුක්තභාවයෙන් ථෙරනම් වේ—''අනුසාසීයන්ති ති

——00——

3 වුත්තස්ස තත්ථ සද්දස්ස; කින්නු මෙ සද්දලක්ඛණං
ඝටපටාදි අත්ථස්ස, ජොතනං සද්දලක්ඛණං—

4 තදත්ථජොතකො සද්දො, කුතො නු'උප්පජ්ජතෙ
සවිඤ්ඤත්ති විකාරත්තා, චිත්තතොසෝප්පජ්ජතෙ—

---

පච්චාදියන්ති සද්දා අනෙනාති සද්දානුසාසනං'' අනෙන, මේ කරණකොටගෙණ; සද්දා, ශබ්දයෝ; අනුසාසීයන්තිසිසේ සී; නීපච්චාදියන්ති ඉති, නිපදවනුලැබෙත්නුයි; සද්දානුසාසනං, සද්දානුසාසන නම්— (මේකච්චායන ප්‍රකරණයි) 'වුච්චතෙ' යී කියයුත්තහුගේ අනාගත කාලික බැවින් 'වුච්චිස්සතෙ' යී කිවමනානන්හි වර්තමාන සමීපබැවින් අනාගතය වර්තමානම කොට 'වුච්චතෙ' යී කියනලදි—'බම්මස්ස, ගණස්ස, ථෙරස්ස' යන මෙහි ම ශබ්දය සමුච්චයාර්ථයී)

(දැන් ශබ්දලක්ෂණය ප්‍රකාශ කිරීමපිණිස 'වුත්තස්ස'යන ආදිය කිය)

3 තත්ථ, ඒ (සිබ සද්දත්ථ සම්බන්ධ දෙසකං යන) වචනයෙහි; වුත්තස්ස, කියනලද; සද්දස්ස, (අර්ථ ප්‍රකාශකරණ විභක්තිසහිතවූ) ශබ්දයාගේ; සද්දලක්ඛණං, ශබ්දලක්ෂණය; කිංනුමෙ, කුමක්දයත්? ඝටපටාදි අත්ථස්ස, ඝටපටාදි (සමූහාර්ථ පරමාර්ථ සඞ්ඛ්‍යාත) අර්ථයාගේ; ජොතනං, ප්‍රකාශ කිරීම; සද්දලක්ඛණං, ශබ්ද ලක්ෂණ නම් වේ—

(දැන් ශබ්දෝත්පත්ති කාරණය ප්‍රකාශකිරීමපිණිස 'තදත්ථජොතකො' යන ආදිය කිය)

4 තදත්ථජොතකො, ඒ(ඝටපටාදි) අර්ථ ප්‍රකාශකරන්නාවූ; සද්දො, ශබ්දයතෙම; කුතො නු උප්පජ්ජතෙ, කවර හෙතුවකින් උපදීද?; සො, ඒ (චිත්ත සමුට්ඨානික) ශබ්දයතෙම; සවිඤ්ඤත්ති විකාරත්තා, විඥප්ති විකාරශබ්ද සහිත භාවයෙන්; චිත්තතො, සිත හෙතුකොටගෙණ; උප්පජ්ජතෙ, උපදී—

—–00—–

5 උතුසමුට්ඨානා සද්දා, කස්මා මෙත්ථ න ගය්හරෙ
සාසනස්සානුපකාරෙ, තස්මා ති යො නගය්හනෙ.
6 කෙචි නාභිපදෙසම්හා, පවක්ඛාමි ඉදඤ්චිදං
ජිනගොචරනයස්ස සම්භූතො, පයත්තනකෙතුතො—
7 පෙසිතො පාණකො වායු, ගච්ඡන්තො උපරූපරි
උරප්පභුතිඨානානං, ඨානෙ අඤ්ඤතරම්හි ච—

---

('කුතොනු' යන මෙහි 'නු' යනු ප්‍රශ්නාර්ථද්‍යොතක නිපාතයි)

(සෘතුසමුත්ථානික ශබ්දයාගේ පිටකත්‍රයට අනනුරූපත්වය දක්වනු පිණිස 'උතුසමුට්ඨානා' යන ආදිය කිය)

5 උතුසමුට්ඨානා, (ශීතොෂ්ණ) සෘතු (සඞ්ඛ්‍යාත තෙජෝ ධාතු)වෙන් උපදින්නාවූ; සද්දා, ශබ්දයනෙමේ; එත්ථ, මේ කාරිකාග්‍රන්ථයෙහි; කස්මාම, කුමක්හෙයින්; නගය්හරෙ, නොගන්නාලැබේද; ති, යම්හෙයකින්; සාසනස්ස, (බුද්ධ) ශාසනයට; අනුපකාරෙ, උපකාර රහිත වේද; තස්මා, එහෙයින්; තෙ, ඒ සෘතුසමුත්ථානික ශබ්දයනෙමේ; නගය්හනෙ, නො ගන්නාලැබේ—

('කස්මාම' යන මෙහි ම ශබ්දය වචනාලඞ්කාරයෙහි වැටේ)

(දුන් අන්‍යාචාර්යවාදයකින් ශබ්දොත්පත්ති කාරණය දක්වනු පිණිස "කෙචි නාභිපදෙසම්හා" යන ආදිය කිය)

6 කෙචි, (ජිනෙන්ද්‍රබුද්ධි ආදි) කිසි ආචාර්යකෙනෙක්; ඉදං ඉදංම, මේමේ වචනයද; පවක්ඛාමි ඉති, කියන්නෙමි යි; ජිනගොචරනයස්ස, කල්පනා කරන්නහුගේ; පයත්තනකෙතතො, (මනොණිවාරණ) උත්සාහයෙන්වනාහි; සම්භූතො, උපන්නාවූ—

7 පෙසිතො, මෙහෙයනලද; නාභිපදෙසම්හා, නැබ පෙදෙසින්; උපරි උපරි, මතුමත්තෙහි; ගච්ඡන්තො; ගන්නාවූ; පාණකො වායු, ප්‍රාණවායුනෙම; උරප්‍ර

---00---

8 පතියනන වාරිනො, තංතං ඨානං විනස්සති
ඨානාභිඝට්ටනා සද්දො, ජායතීති වදන්තිච—

9 ආකාස වායුප්පභවො, චිත්තජො දෙහනිස්සිතො
සද්දො උරසි කණ්ඨෙ ච, සිරස්මිං තිසු ජායතෙ—

---

භූතිඨානානං, ලය ආදිකොටඇති ස්ථානයන්ගෙන්; අ ඤ්ඤතරම්හි ඨානෙහි, එක්තරා ස්ථානයෙක්හිද—

8 පතියනන වාරිනො, (වණ්ණාවාරණ) උත්සාහ යෙන් වලකනලද්දේ; තංතංඨානං, ඒ ඒ ස්ථානයට, විනස්සති, ගටයී; ඨානාභිඝට්ටනා, (අක්ෂරඋපදින)ස්ථානයන්ගේ ගැටීමෙන්; සද්දො, ශබ්දයතෙමේ; ජායති ඉතිච, උපදියයිද; වදන්ති, කියත්—

(‘පවක්ඛාමිහි ඉදඤ්චිදං’ යී කිච්චනාකල්හි ජනදත්ත ධිගහසින් ඉහිශබ්දය ලොප්කොට ‘පවක්ඛාමි ඉදඤ්චිදං’ යී කියනලදි— ‘උරප්පභූති ඨානානං’ යන මෙහි ‘පභූති’ ශබ්දයෙන් ගෙල තල්ලු මුදුන දත් තොල් නැහැ යන මොවුන් ගැණේ)

(නැවත ප්‍රකරණාන්තරයෙහි අනන්තවායයී වාදයකින් අක්ෂරොත්පත්ති කාරණය දක්වනුපිණිස “ආකාස වායුප්පභවො” යන ආදිය කිය)

9 ආකාස වායුප්පභවො, (රූප ධර්මයන්ගේ පරිච්ඡේද) අවකාශයෙහි (ඊරණ ලක්ෂණ)වායො ධාතුව උත්පත්ති ස්ථානකොටඇති; දෙහනිස්සිතො, කය ඇසුරුකළාවූ; චිත්තජො,සිතින්උපදිත්තාවූ; සද්දො, ශබ්දයතෙමේ; උරසි, ළෙහිද; කණ්ඨෙච, ගෙලෙහිද; සිරස්මිං, මුදුනෙහිද යන; තීසු, තුන්තැන්හි; ජායතෙ, උපදී—

(දූත් අක්ෂරොත්පත්ති ස්ථානනියමය දක්වන්නේ ‘සො ඝොසො’ යන ආදිය කිය)

——00——

10 සොපච්චා පඤ්ච ඨානානි, වණ්ණත්තා මුපගච්ඡති
උපගන්ත්වාන වණ්ණත්තං, තංතං අත්ථප්පකාසකො—

සද්ද විනිච්ඡයො

---

11 සද්දානුසාසනං නාම, කෙන සද්දානුසාසනං
සද්දෙනෙනානුසාසීයතෙ, තෙන සද්දානුසාසනං—
12 සද්දානුසාසනං කෙසං, සද්දාන මනුසාසනං
ලොකියසාසනිකානං, සද්දාන මනුසාසනං—

---

10 සො, (ඒ විතතජ) ශබ්දයතෙමේ; පඤ්චඨානානි, (ගෙල තල්ලු මුදුන දත් තොල් සඞ්ඛ්‍යාත) පඤ්චස්ථානයන්ට, පත්වා, පැමිණ; වණ්ණත්තං, (එක්සාලිසක්)අක්ෂරබවට: උපගච්ඡති, යේ; වණ්ණත්තං, අක්ෂරබවට; උපගන්ත්වාන, පැමිණ; තංතං අත්ථප්පකාසකො, ඒ ඒ අර්ථ ප්‍රකාශකරන්නේ වේ—

ශබ්ද විනිශ්චයයි

---

(දැන් ශබ්දානුශාසන ලක්ෂණය දක්වනුපිණිස "සද්දානුසාසනං" යන ආදිය කීය)

11 සද්දානුසාසනං, කච්චායන ප්‍රකරණයතෙම; කෙන, කවර අර්ථයකින්; සද්දානුසාසනං නාම, ශබ්දානුශාසන නම්වේද?; සද්දා, ශබ්දයෝ; අනෙන, මේ කාරණකොට ගෙණ; අනුසාසීයතෙ, (යම්හෙයකින්) නිපදවනු ලැබෙද්ද; තෙන, එහෙයින්; සද්දානුසාසනං, ශබ්දානුශාසනනම්වේ—

(නිපදවියයුත්තන්ගේ ස්වරූපය විචාරණු පිණිස "සද්දානුසාසනං කෙසං" යන ආදිය කීය)

12 කෙසං සද්දානං, කවර ශබ්දකෙනෙකුන්ගේ; අනුසාසනං, නිපදවීම; සද්දානුසාසනං, ශබ්දානුශාසනනම් වේද? ලොකියසාසනිකානං, ලෞකික ශාසනිකවූ; සද්දානං, ශබ්දයන්ගේ; අනුසාසනං, නිපදවීම; (ශබ්දානුශාසනනම්) වේ—

——00——

13 ලොකිකා චිතත පුරිස, ගෙහ රථ ඝටාදිකා
සාසනිකා භික්ඛර, කඨිනා පත්ති ආදිකා—
14 සඤ්ඤානුසාසනං එතං, මුනිපුඞ්ගව වණ්ණිතං
දුවිධානම්පි සඤ්ඤානං, කරෙ තෙසානුසාසනං—
15 පකතිප්පච්චයාදීනං, විභාගපරිකප්පනා
අත්ථ විසෙසන වතා, ලක්ඛණතෙතන සාධනං—

---

(දූන් ශබ්දයන්ගේ ස්වරූපය දක්වනු පිණිස "ලොකිකා" යන ආදිය කිය)

13 චිතත, චිතතශබ්දය; පුරිස, පුරිසශබ්දය; ගෙහ, ගෙහශබ්දය; රථ, රථශබ්දය; ඝටාදිකා, ඝටශබ්දය යන මේ ආදි ශබ්දයෝ; ලොකිකා, ලෞකිකශබ්දයෝනම්වෙත්; භික්ඛර, භික්ඛර ශබ්දය; කඨින, කඨිනශබ්දය; ආපත්ති ආදිකා, ආපත්ති ශබ්දය යන මේ ආදි ශබ්දයෝ; සාසනිකා, ශාසනිකනම් වෙත්—

14 එතං සඤ්ඤානුසාසනං, මේ ශබ්දානුශාසනයතෙම; මුනිපුඞ්ගව වණ්ණිතං, සර්වඥතනාමයන් වහන්සේ විසින් වදාරණලද්දේය; දුවිධානං අපි, දෙවැදෑරුම්වූද; එතෙසං සඤ්ඤානං, මේ ශබ්දයන්ගේ; අනුසාසනං, නිපදවීම; කරෙ, (කච්චායන ස්ථවිරතෙමේ) කියන්නේය—

(ශබ්දානුශාසනයෙහි අනුශාසනාකාරය දක්වනුපිණිස "පකතිප්පච්චයාදීනං" යන ආදිය කිය)

15 පකතිප්පච්චයාදීනං, (පළමුකොට තැබියයුතුවූ ලිඞ්ගධාතු) ප්‍රකෘතිය (නාම ආඛ්‍යාත තිතක උනාදිකල්පයන්හි කියනලද) ප්‍රත්‍යය යන මේ ආදීන්ගේ; විභාගපරිකප්පනා, විභාගපරිකල්පනා යෙන්; අත්ථ විසෙසනවතා, අර්ථ විශෙෂණවත්වූ; ලක්ඛණතෙතන, සූත්‍රභාවයෙන්; සාධනං, සිඞ්කිරීම වේ—

(මෙහි ආදිග්‍රහණයෙන් ස්වර ව්‍යඤ්ජනාදි විභක්තිහුද සියලු කච්චායන ව්‍යාකරණයෙහි ආ ව්‍යඤ්ජනාදි ප්‍රභෙදයෝද ගන්නාලද්දාහුය)

——00——

16 ද්විධාදිං සමුද්දිට්ඨො, සද්දො, චිත්තො තු සම්භවො
සවිඤ්ඤාණක සද්දොව, හොති චිත්ත සමුට්ඨානො
ද්විධො පි අයං සද්දො, සද්දාරම්මණ සඞ්ගහො—

17 ද්විසු පෙතෙසු සද්දෙසු, කතමස්සා නුසාසනං
අත්ථවාචක සම්බන්ධෙ, යො අත්ථපටිපාදකො.—

18 අත්ථප්පකාසකත්තෙන, පදීපොවත්ථජොතකො
සවිඤ්ඤාණක සද්දස්ස, එතස්ස අනුසාසනං—

සද්දානුසාසන විනිච්ඡයො.

---

16 චිත්තො තු සම්භවො, චිත්තයෙන්හා සෘතුවෙන් උපදින්නාවූ; ද්විධො, දෙමැදෑරුම්වූ; සද්දො, ශබ්දයතෙම; ආදිං, පළමුකොට; සමුද්දිට්ඨො, දක්වනලද්දේය; සවිඤ්ඤාණක සද්දො එව, සවිඤ්ඤාණක ශබ්දයම; චිත්තසමුට්ඨානො හොති, සිතින් උපදින්නේ වේ; ද්විධො අපි, ද්විප්‍රකාරවූද; අයං සද්දො, මේ ශබ්දයතෙම; සද්දාරම්මණසඞ්ගහො, ශබ්දාලම්බන සඞ්ග්‍රහව වේ—

(දැන් නිපදවියයුතු ශබ්දය කියනුපිණිස "ද්විසු" යන ආදිය කීය)

17 එතෙසු ද්විසුසද්දෙසුඅපි, මේ ශබ්දයන්දෙදෙනා අතුරෙනුදු; කතමස්ස, කවර ශබ්දයක්හුගේ; අනුසාසනං, නිපදවීම වේද?; යො, යම්ශබ්දයෙක්තෙමේ; අත්ථවාචකසම්බන්ධෙ, වාච්‍යවාචකයන්ගේ සම්බන්ධයෙහි—

18 අත්ථප්පකාසකත්තෙන, (ලෞකික ලොකොත්තරාදි) අර්ථප්‍රකාශකරණ භාවයෙන්; අත්ථජොතකො, වස්තු ප්‍රකාශකරන්නාවූ; පදීපොඉව, පහණක්මෙන්; අත්ථපටිපාදකො, අර්ථ නිපදවන්නේවේද; එතස්ස, මේ; සවිඤ්ඤාණක සද්දස්ස, සවිඤ්ඤාණක ශබ්දයාගේ; අනුසාසනං, (රූපසිද්ධි) නිෂ්පාදනය වේ—

ශබ්දානුශාසන විනිශ්චයයි.

—00—

19 කාකදන්ත පරික්ඛාව, න මෙත්ථ නිප්පයොජනං
දසදාළිමවාක්‍යංච, නමෙත්ථානභිධෙය්‍යකං

20 ජරස්ස හරෙ තක්ඛක, චූළාමණිං පදෙසනං
යථා අසක්කානුට්ඨානං, උපදෙසො පි එත්ථ න

---

(දැන් ශබ්දානුශාසනය දක්වනුපිණිස "කාකදන්ත"ය
න ආදිය කිය)

19 එත්ථ, මේ(ශබ්දානුශාසන සඞ්ඛ්‍යාත) කච්චායනව්‍යා
කරණයෙහි; (පිටකත්‍රයානුකූල ශබ්දනිෂ්පාදනය) කාක
දන්තපරික්ඛාඉව, කවුඩන්ගේ දත්පරීක්ෂාකිරීමමෙන්; න
චනිප්පයොජනං, (තදර්ථ ප්‍රකාශක උදාහරණසාධකලක්ෂ
ණභාවයෙන්)නිෂ්ප්‍රයොජන වන්නේ නොවේ; එත්ථ, මේ
ශබ්දානුශාසනයෙහි; දසදාළිම වාක්‍යංඉව, දසදාළිම යන
වාක්‍යයමෙන්; නම අනභිධෙය්‍යකං, සම්බන්ධ නො වන්
නේද නොවේ.

(කවුඩෝ දත් ඇත්තාහුද නැත්තාහුදැයි? විවාදාවූ සම
හරු දත්ඇති කවුඩෝ නොදක්නාලද්දාහුයයි කියති-සම
හරු කවුඩෝ මුවතුඩුපමණක් ඇත්තාහුය. දත් නැත්තා
හුයයි කියති— මෙසේ කවුඩන්ගේ දත් ඇතිනැතිබැව් ප
රීක්ෂාකිරීම නිෂ්ඵල වන්නාක්මෙන් මේකසයින්වියරණෙ
හි පිටකත්‍රයානුකූල ශබ්දනිෂ්පාදනය නිෂ්ප්‍රයොජන වන්
නේ නොවේ— දසදාළිම යන වාක්‍යයමෙන් එකාර්ථප්‍රති
පාදක පදසමූහයටපැමිණි වාක්‍යඇතිබැවින් සම්බන්ධ නො
වන්නේද නොවේ— පූර්ව චකාරය වාක්‍යාරම්භාර්ථයි-පශ්චි
ම චකාරය සමුච්චයාර්ථයි)

20 තක්ඛක චූළාමණිං, තක්ඛකනම් නාරජහුගේ ශි
ඛාමාණික්‍යයතෙමේ; ජරස්ස හරෙ, ජ්වරරෙගය නසන්
නේය; (යන) උපදෙසනං යථා, උපදෙශයමෙන්; අනු
ට්ඨානං, වැටහීමට, අසක්කො, නොහැකිවූ; උපදෙසො
අපි, උපදෙශයෙක්ද; එත්ථ, මේ කච්චායන ව්‍යාකරණ
යෙහි; න, නැත්තේය.

—00—

21 මාතු පිවාහුපදෙසො, යථා නෙත්ථි අසම්මතො
ලහුපායන්තරං එත්ථි, නචෙත්ථි අනුපායතා.—

22 පඤ්ච පකරණෙ දොසා, ගන්ධකාරෙන වජ්ජිතා
සුසඨං දොසවිගතං, සසම්බන්ධපපයොජනං.—

23 සබ්බං පයොජනඤ්චෙව, සම්බන්ධස්ස ඊදිසං උභො
ගන්ථස්ස අනඞ්ගභූතා තස්මා, හීනෙන තු පයොජනා-

---

(තක්ඛකනම් නාරජහුගේ සිළුමිණ ලත්කල්හිම උණ රොගය සංසිඳෙන්නේය යන උපදෙශයමෙන් වැටහෙන්ට නොපිළිවන්වූ උපදෙශයෙක් මේ කසයින් වියරණෙහි නැත්තේයි— අපිශබ්දය සමුච්චයාර්ථයි)

21 මාතුපිවාහුපදෙසො යථා, මාතෘව විසින් සම්මත නොකරණලද පිවාහොප දෙශය මෙන්; එත්ථි, මේ කච්චායන ව්‍යාකරණයෙහි; අසම්මතො, (විඥයන්විසින්) සම්මත නොකරණලද උපදෙශයෙක්; න, නැත්තේය; එත්ථි, මේ කච්චායන ව්‍යාකරණයෙහි; ලහුපායන්තරං, ලහුවූ උපාය විශෙෂයෙක් ඇත්තේය; එත්ථි, මේ කච්චායන ව්‍යාකරණයෙහි; අනුපායතඤ්ච, උපෙය්‍යයාගේ අනිෂ්පාදනයටහෙතුවූ අපිග්‍රහණයෙක්ද; න, නැත්තේය.—

(මේ ප්‍රකරණදෝෂයෝයයි දක්වනුපිණිස "පඤ්චපපක රණෙ" යන ආදිය කීය)

22 පකරණෙ, ප්‍රකරණයෙහි; පඤ්ච දොසා, දොෂයෝ පස්දෙනෙක්; ගන්ධකාරෙන. (ප්‍රකරණ දෝෂය දන නිර්දෝෂ) ප්‍රකරණ කාරණ ආචාර්යයා විසින්; වජ්ජිතා, හරණ ලද්දාහුය; සසම්බන්ධපපයොජනං, සම්බන්ධප්‍රයොජන සහිතවූ; දොස විගතං, දොෂයෙන් තොරවූ ග්‍රන්ථයනෙම; සුසඨං, (විඥයන්විසින්) මනාකොට පසස්නා ලද්දේය.—

(සම්බන්ධයෙහි ග්‍රන්ථ ප්‍රයොජනයන්ගේ සන්නිහිත භාවයද ඒ ග්‍රන්ථ ප්‍රයොජනයන්හි සම්බන්ධයාගේ අනානගීත භාවයද දක්වනුපිණිස "සබ්බං" යන ආදිය කීය)

23 සබ්බං, ග්‍රන්ථයද, පයොජනඤ්චෙව, ප්‍රයොජනය

—–00—–

24 වුත්තෙ පයොජනෙ යෙව සම්බන්ධො විහිතො සියා
පයොජනං හි විහිතං සම්බන්ධෙ විහිතෙ තථා—

25 සබ්බසෙසවතී සත්ථස්ස, කම්මුනොවාපි කස්සචි
යාව පයොජනං නුත්තං, තාව තං තෙන ගය්හතෙ

26 සුතත්ථං සුතසම්බන්ධං, සොතා සොතුං පවෙච්ඡති
අවිඤ්ඤාතත්ථසම්බන්ධං, සත්ථං නාභ්‍යුපගණ්හතෙ

---

දයන; උභො, දෙදෙන; සම්බන්ධස්සසිද්ධං, සම්බන්ධයතිශ්‍රිත වත්නාහුය; තෙසු, ඒශාස්ත්‍රප්‍රයොජනයන්හි; අනෙනාගතො,(සම්බන්ධයතෙම යම්හෙයකින්) අනාගීතවේද; තස්මා,එසේහෙයින්; පයොජයා, ප්‍රයොජනයෙන්; නිගෙතා වෙන්කරණලදුව; නඋත්තො, නොකියනලද්දේය—

24 පයොජනෙඑව, ප්‍රයොජනයම; වුත්තෙ, කීකල්හි; සම්බන්ධො; සම්බන්ධයතෙම; විහිතොසියා, කියනලද්දේ වන්නේය; තථා, එසේම; සම්බන්ධෙ, සම්බන්ධය; විහිතෙ, කියනලදකල්හි; පයොජනංහි, ප්‍රයොජනයම; විහිතං, කියනලද්දේය—

(සියලු කර්‍මයාගේ ඵලය විද්‍යමානකල්හියම්කිසිවකින් උගන්නාලැබේයයි දක්වනුපිණිස 'සබ්බසෙස වතී' යන ආදිය කීය)

25 සබ්බසෙසවතිසත්ථස්ස,(වා) සියලුමශාස්ත්‍රයාගේහෝ; කම්මුනොවාඅපි, කර්‍මයක්හුගේහෝ; පයොජනං, ප්‍රයොජනයම; යාව, යම්තාක්; කස්සචි, කිසිවෙක්විසින්; නඋත්තං, නොකියනලද්දේද; තාව, ඒතාක්; තං, ඒශාස්ත්‍රයහෝ කර්‍මය; තෙන, ඔහුවිසින්, නගය්හතෙ, නුඋගන්නාලැබේ—

(ශ්‍රොතෲපුද්ගලතෙම ශ්‍රුතාර්ථයද ශ්‍රුතසම්බන්ධයද අසනු කැමැතිවේයයි දක්වනුපිණිස 'සුතත්ථං සුතසම්බන්ධං' යන ආදිය කීය)

26 සොතා, ශ්‍රොතෘතෙමේ; සුතත්ථං, දත්නාලදඅර්ථ

——00——

27 සද්දාදිම්හි නානොවුත්තො, සම්බන්ධොසප්පයොජනො
සප්පයොජනසම්බන්ධං, සත්ථං ඤත්වා උදීරයෙ.

28 සද්දානුසාසනස්ස කිං, පයොජනන්ති චෙ වදෙ
රක්ඛොහාගමලහුපා, සසන්දෙහහානිං මෙවච.

29 තත්ථ රක්ඛාහි අත්ථස්සා, නුපායපරිහාරතා
සුත්තන්තරක්ඛනත්ථං හි, සික්ඛිතබ්බං සුධීමතා.

---

ඇති; සඤ්ඤාතසම්බන්ධං, දන්නාලදසම්බන්ධඇතිශාස්ත්‍රය; සො තුං, අසන්ට; පවෙච්ඡති, කැමැතිවේ; අවිඤ්ඤාතාත්ථිය සම්බන්ධං, නොදන්නාලදඅර්ථනා සම්බන්ධඇති; සත්ථං, ශාස්ත්‍රය; සාඅභිලපකාර්ථයෙන, මහාවිඤ්ඤගෙ යොගාණියි.

27 නානො, එසේනොයිත්; සද්දාදිම්හි, ශාස්ත්‍රාරම්භාදියෙහි; සප්පයොජනො, ප්‍රයොජනසහිතවූ; සම්බන්ධො, සම්බන්ධයතෙම; වුත්තො, කියනලද්දේය; සප්පයොජන සම්බන්ධං, ප්‍රයොජනයහාසම්බන්ධයහිතවූ, සත්ථං, ශාස්ත්‍රය; ඤත්වා, දැන; උදීරයෙ, කියන්නේය.

28 සද්දානුසාසනස්ස, ශබ්දානුශාසනයාගේ; පයොජනං, ප්‍රයොජනයතෙම, කිංඉහිවෙ, (ස්වරූපවශයෙන්) කිමෙක්දයත්; වදෙ, කියන්නේද; රක්ඛා, රැකීමය; ඌහ, තාකීණයකිරීමය; ආගම, ආගමය; ලහුපාය, ලඝුපාය; සසන්දෙහහානිංඑවච, ශඞ්කායයනමොවුත් ප්‍රයොජන කොට ඇත්තේමය.

(මෙහි ඉතිශබ්දය වචනාලඞ්කාරයි—එව ශබ්දය අවධාරණාර්ථයි—එසින් 'අකබරදැයෙහි මෙම' යනු සනිටුහන් කෙරේ- මකාරය නිපාතමාත්‍රයෙකි)

(රක්ඛාදිඅර්ථප්‍රකාශකිරීමපිණිස 'තත්ථ' යනාදියකිය)

29 තත්ථ, ඒරක්ඛාදිපඤ්චාර්ථයන් අතුරෙන්; රක්ඛාති, රක්ෂාතම්; අත්ථස්ස, අර්ථයාගේ; අනුපාය පරිහාරතා, අනුපායපිණිසපරිහාරකරණබවවේ; සුත්තන්තරක්ඛනත්ථං, පිටකත්‍රයාගේපාලනයපිණිස; සුධීමතා, සුප්‍රාඥ

---00---

30 එවං සතෙහි ආදිම්හි, ලොපො සකාරආදිනං
යථසිදංහි ආදිම්හි, යකාරාදීන මාගමො—

31 ආරිසං අජ්ජවනානාදිං, විකාර කරණම්පිච
ඉච්චාදි සුත්ත ගන්ථස්ස, ආරබ්භාහි පකාසිතා—

32 යදිහි න ගතො ඨානෙ, කායදුච්චරිතාදිනා
මනානං පුල්ලිඞ්ග නිද්දිඨං, යද ඉත්ථී තද සියා
යදිහි න ගතො ඨානෙ, ඉත්ථිලිඞ්ගන ඌහනෙ—

---

යාවිහින්; හි, දැකීකොට; සිංහබිම්බං, (කාව්‍යාසනවින කරණය) තිස්මිය යුත්තෝය—

(සූත්‍රාන්ත රක්‍ෂණයාගේ උදාහරණ නියමය දක්වනු පිණිස 'එවං' යන ආදිය කීය)

30 එවංසතෙහි, එවංසතෙයන; ආදිම්හි, මේආදිප්‍රයොගයෙහි; සකාරආදිනං, සකාරාදීන්ට; ලොපො, (ඛ්‍යඤ්ජනොව විසංයොගයොසනසූත්‍රයෙන්) ලොප්වේ; යථසිදංහි, යථසිදංයන; ආදිම්හි, මේආදිප්‍රයොගයෙන්; යකාරාදීනංආගමො, (යවමදනතරළාචාගමොසනසූත්‍රයෙන්) යකාරාදින්ගේ ආගමය වේ—

31 ආරිසංඅජ්ජවංහි, ආරිසංඅජ්ජවංයන; ආදිං, මේ ආදිප්‍රයොගයෙහි; විකාරකරණංඅපිච, විකාරකිරීමද වේ; ඉතිආදි, යනමේආදියෙනමේ; සුත්තගන්ථස්ස, සූත්‍රග්‍රන්ථයාගේ; ආරබ්භාහි, ආරම්භයෙහි; පකාසිතා, ප්‍රකාශ කරණ ලද්දිය—

32 යදිහි, ඉදින්වනාහි; යද, යම්කලෙක්හි; ඉත්ථී, ස්ත්‍රීතොමෝ; කායදුච්චරිතාදිනා, කායදුශ්චරිතාදියෙන්; සියා,(යුක්ත)වන්නීද; තද, එකල්හි; නගතොනාගතියේය (යන)ඨානෙ, ස්ථානයෙහි; මනානං, පරමාර්ථබුද්ධවචනය; පුල්ලිඞ්ගනිද්දිඨං, පුංලිඞ්ගයෙන්දක්වනලද්දේය; යදිහි නගතො, යදිහිනගතොයන; ඨානෙ, ස්ථානයෙහි; ඉත්ථිලිඞ්ගන, ස්ත්‍රීලිඞ්ගශබ්දයෙන්; ඌහනෙ, කල්පනාකෙරේ—

——00——

33 එතෙන නිද්දිට්ඨ මෙකන්තං, බහුත්තෙනාපි ඌහතෙ
සම්පාදෙහීති ආදිම්හි, සම්පාදෙථාති ආදිනා.

34 සුත්තන්තාදූහණඤ්චෙව, සද්දානුසිට්ඨිසාධනං *
නවඞ්ගිනස්ස ආදීනං, නවඞ්ගිනෙහි ආදිනා
සත්තම්‍යන්තාදි ඌහණං, ඌහණන්ති පකාසිතං

35 පරම්පර නවජ්ජන්න, උපදෙසොච ආගමො
නික්කාමි ජින ධම්මො සො, නවඞ්ගං ජිනසාසනං

---

33 එතෙන, පරමාර්ථබුද්ධවචනයෙහි; සම්පාදෙහිඉති සම්පාදෙහියන; ආදිම්හි, මේආදිප්‍රයොගයෙහි; නිද්දිට්ඨං දක්වනලද; එකන්තං, එකාන්තය; සම්පාදෙථඉති, සම්පාදෙථයන; ආදිනා, මේආදිවශයෙන්; බහුත්තෙනාපි, බහුවචනයෙන්ද; ඌහතෙ, කල්පනාකෙරේ.

34 සුත්තන්තාදූහණංචඑව, පිටකත්‍රයාගේ; (පුංලිඞ්ගය ස්ත්‍රීලිඞ්ගාදි වශයෙන්ද එකවචනය බහුවචනාදිවශයෙන්ද)කල්පනාකිරීමම; සද්දානුසිට්ඨි සාධනං, ශබ්දානුශාසනයනිපදවත්නේවේ; නවඞ්ගිනස්සආදීනං, නවඞ්ගිනස්සයනආදීන්ගේ; නවඞ්ගිනෙ ඉති, නවඞ්ගිනෙයන; ආදිනා, මේආදිවශයෙන්; සත්තම්‍යන්තාදි ඌහණං, සප්තමිවිභක්ත්‍යන්තාදීන්ගේ කල්පනාකිරීම; ඌහණංඉති, ඌහණයයි; පකාසිතං, ප්‍රකාශකරණ ලද්දේය.

35 පරම්පරනවජ්ජනන, අනික් අනික් ආචාර්යයන්ගේ ප්‍රවේණියෙන් නොසිඳ පැවැත්තාවූ; උපදෙසොඑව, උපදෙශයම; ආගමො, (ආගම්සති ඉතොනෙන අර්ථයෙන්) ආගමනම්වේ; සො, ඒ; නික්කාමජින ධම්මො, ක්ලේශ කාම රහිතවූ සර්වඥයන්වහන්සේගේ ධර්මයනම්වේ; නවඞ්ගංජිනසාසනං, නවාඞ්ගශාස්ත්‍රශාසන නම්වේ.

---

* සද්දානුසාසනත්ථාධනන්ති සබ්බපොත්ථකෙසු දිස්සති

——00——

36 තදඞ්ගම ජානන්තෙන, සික්ඛිතබ්බං හිතෙසිනා
වෙය්‍යාකරණ නාමෙනං, නිරුත්තිසද්දලක්ඛණං

37 අසද්දිකමනජ්ඣානං, මිලක්ඛ වචනං යදි
අනගදිතවාක්‍යතා, භික්ඛුනා නෝපගම්‍යතෙ

28 අතොසද්දාපිඤ්ඤාතබ්බා, යෙසංඤාණෙනිරුත්තිතො
නත්ථිඅඤ්ඤොලහුපායො, සික්ඛෙය්‍යසද්දලක්ඛණං

39 දක්ඛිණමාහරෙය්‍යාති, සඞ්කෙතො ජායතෙ තද
දක්ඛිණං ධන මාහර, ඉති වුත්තෙන න සංසයො—

---

36 හිතෙසිනා, (දිට්ඨධම්මික සම්පරායික ආත්මාර්ථපරාර්ථ සම්බන්ධවූ) හිතෛෂීකුලපුත්‍රයාවිසින්; තදඞ්ගමජානන්තෙන (සර්වඥයන්වහන්සේගේ පටන් අදදක්වා නොසිඳපැවැත්තාවූ උපදෙශ නවාඞ්ග ශාසනවූ) ආගමයාගේද නිමපිණිස; නිරුත්තිසද්දලක්ඛණං, (මාගධික භාෂාවෙසින් අවිපරීතවූ) නිරුක්තිශබ්දයන්ගේලක්ෂණඇති; වෙය්‍යාකරණංනාම, (කච්චායන) ව්‍යාකරණනම්වූ; එනං, මේශාස්ත්‍රය; සික්ඛිතබ්බං, ශික්ෂම්‍යුත්තේය—

37 යදි, ඉදින්, අසද්දිකං, අපශබ්දයෙන්යුක්තවූ; අනජ්ඣානං, සිහියනොහැක්කාවූ; මිලක්ඛවචනං, ප්‍රත්‍යන්ත දෙශවාසීන්ගේවචනයෙක්වීනම්; භික්ඛුනා, මහණහුවිසින්; අනුඅගදිතවාක්‍යතා, නැවතනැවත නොකියනලද වාක්‍යඇතිබැවින්; නඋපගම්‍යතෙ, නොදන්නාලැබේ—

38 අතො, එසේහෙයින්; සද්දාපි, ශබ්දයෝද; ඤාතබ්බා, දතයුත්තාහුය; යෙසං, එශබ්දයන්ගේ; ඤාණෙ, දැනීමෙහි; නිරුත්තිතො, නිරුක්තිශාස්ත්‍රයෙන්; අඤ්ඤො, අන්‍යවූ; ලහුපායො, ලඝුවූඋපායයෙක්, නත්ථි, නැත්තේය, සද්දලක්ඛණං, ශබ්දලක්ෂණය; සික්ඛෙය්‍ය, ඉගෙණගත්තේය—

39 දක්ඛිණං ආහරෙය්‍ය ඉති, දක්ඛිණං ආහරෙය්‍ය කියත්

---()---

40 යමධීත මවිඤ්ඤාය, ගුරූපදෙසතො විජ්ජතෙ
අනග්ගිම්හිව සුක්ඛෙධො, න තං ජලති කහචි.

**සද්දානුසාසන පයොජන විනිච්ඡයො.**

---

හොති; තදා, එකල්හි; සන්දෙහොපායමෙ, සැකළුපදී දණ්ඩිනංඛහංඅනාරූහි, දණ්ඩීනංඛහංඅහාරයති; වුපෙතා සකල්හි; සංසයො; සැකයැත්තේය.

('දණ්ඩිනං ඛහාරෙයය' යිසිකල්හිසැකළුපදනේයකුමක් හෙයින්දයත්? 'දණ්ඩිනං' යනමෙහි 'නං' නිපාතකහාරණයා' යන සූත්‍රයෙන් කෘතනුස්වාරසංඥයා ඉකාරෙන් පරවූ අංචි ඎනිගටනං යන ආදෙශකිරීමෙන්, 'සුනංතිදුම' යනමේසූ ආදෙශ (වඤ්ජනයෙන් දැක්වලකිමෙන් සුවිශකතිනංවිභ ක්තිගිවිතනනි තිම්නාස්වරූපයෙන් මිශ්‍රවූහෙයිනි- දණ්ඩි නංඛහංඅහාර' යි කිකල්හි සැකයෙක් නැත්තේය කුමක් හෙයින්දයත්? සම්බන්ධවිශෙෂය දක්වූහෙයිනි)

(මෙසේ සන්දෙහය ඇතිකල්හි ආචාර්‍යොපදෙශයෙන් දතහැකිබෙන්තෝයන් දක්වනුපිණිස 'යමධීතං' යන ආදිය කීය)

40 අවිඤ්ඤාය, (පෙර) නොදන්නාලද, යං, යමක්; අධීතං, හදාරණලද්දේද; (එහෙයින්) ගුරූපදෙසතො, (ගුර්වා චාර්‍යයන්ගේ) උපදෙශයෙන්; විජ්ජතෙ, දත්තාලැබේ; අනග්ගිම්හි, ගිනිනැතිකල්හි; සුක්ඛෙධොඉව, වියලිදර මෙන්; තං, ඒ (හදාරණලද) ශාස්ත්‍රයතෙමේ; කහචි, කිසිතැනෙක්හි; නජලති, (අර්ථ) ප්‍රකාශනො කෙරේ.

# ශබ්දානුශාසනප්‍රයොජන, විනිශ්චයයි

---

(ශාස්ත්‍රයාගේ ප්‍රයොජනවිශේෂයන්අතුරෙන් මෙකාරිකා යයි දක්වනුපිණිස ''ප්‍රයොජනවිසෙසසම්බන්ධං'' යන ආදිය කීය)

—— 00 ——

41 පඤ්චාවයවසම්බන්ධං, තන්තානං තන්තවිදූ විදූ *
සඞ්ගහො කාරිකා සුත්තං, වුත්ති සත්ථානුසාසනං —

42 තෙසවයං කාරිකා නාම, සද්දසත්ථප්පකාසිකා
කාරිකාලක්ඛණං එතං, වෙදිතබ්බං කථං ඉහිවෙ —

43 උබ්භරිත්වාන ගම්භීරං, උත්තානත්ථප්පකාසිකා
විවරන්ති පටිමජ්ජනං, ගූළ්හමත්ථප්පකාසිකා —

---

41 තන්තානං, තන්ත්‍රයන්ගෙ; සඞ්ගහො; (එක්සූත්‍රයෙක්හි උදාහරණයන්) සඞ්ග්‍රහකොටකියනලද රූපසිද්ධ්‍යාදි ශාස්ත්‍රයද; කාරිකා, ගාථාමයවසිටි බාලප්පබොධනාදී ශාස්ත්‍රයද; සුත්තං, සූත්‍රමයවසිටි ශාස්ත්‍රයද; වුත්ති, (සූත්‍රවිවරණ) වෘත්ති ශාස්ත්‍රයද; සත්ථානුසාසනං, ශාස්ත්‍රයාගේ අර්ථවිවරණ(වශයෙන්)නිපදවන(න්‍යාසාදි)ශාස්ත්‍රයද(යන,) පඤ්චාවයවසම්බන්ධං, අවයවපසකින්යුක්තයයි; තන්තවිදූ, තන්ත්‍රදන්නාවූආචාර්යයෝ; විදූ, දනිත් —

(තන්ත්‍රාවයවයන් පස්දෙනාඅතුරෙන් තමාවිසින් පවත්නන්නාලද තන්ත්‍රාවයවයන්ගේවිශෙෂය කියනුපිණිස 'තෙසවයං' යන ආදිය කීය)

42 තෙසු, ඒඅවයවයන්පස්දෙනාඅතුරෙන්; අයං කාරිකා නාම, මේකාරිකාවනම්; සද්දසත්ථප්පකාසිකා, ශබ්දශාස්ත්‍රයාගේ; අර්ථප්‍රකාශකරන්නීය; එතං කාරිකාලක්ඛණං, මේකාරිකාලක්ෂණයහොම; වෙදිතබ්බං, දතයුත්තේය; කථංඉහිවෙ, කවරප්‍රකාරයකින්දතයුතුදයත්?

43 ගම්භීරං, ගැඹුරුඅර්ථය; උබ්භරිත්වාන, (සමූහයකින් විශෙෂනිර්ධාරණ වශයෙන්) උපුටා, උත්තානත්ථප්පකාසිකා, ප්‍රකටකොටඅර්ථප්‍රකාශකරන්නිවූ; පටිමජ්ජනං, (ලිඞ්ග විභක්ති වචන කාරක සමාස තද්ධිත ධාතු ප්‍රත්‍යයයන්) පිළිසන්වූ අර්ථය; විවරන්ති, විවරණයකරන්නී

---

*තන්තා විදෙ, විදූ යි පොත්ථකෙසු දිස්සති

---00---

44 අප්පක්ඛරමසන්දිද්ධං, සාරවන්තං ගූළ්හනිණ්ණයං
නිද්දෝසං හේතුමන්තං ච, සුත්තං ච පචුරත්ථකා—

45 සඞ්ඛිත්තා විවරන්තීව, සිලෝකම්‍යසණ්ඨිතා
පණ්ඩිතෙන සමාධානා, කාරිකා කාරිකාලක්ඛණා

46 වුත්තිනාමෙසු හෙරුත්ති, මඤ්ජුසාරූපසික්ඛිසු
අත්ථව්‍යාඛ්‍යානසම්පත්ථ ච, කාසිකා වුත්තියම්පිව—

---

වූ; ගුප්තනිශ්චය කාසිකා, (කියනලදලිඞ්ගාදියෙන්ම) ගැඹු වූ අර්ථයප්‍රකාශකරන්නීවූ—

44 අප්පක්ඛරං, මඳඅක්ෂරඇත්තාවූ; අසන්දිද්ධං, සැක නැත්තාවූ; සාරවන්තං, (විදුයන්විසින්ප්‍රශංසාකටයුතුවූ) ර සනාමාර්ථඇත්තාවූ; ගූළ්හනිණ්ණයං, ගූඪාර්ථපමුණුවත් නාවූ; නිද්දෝසං, දොෂරහිතවූ; හේතුමං, හේතුඇත් තාවූ; තථං, අවිපරීතාර්ථයෙන්යුක්තාවූ; සුත්තංච, සූ ත්‍රයමෙන්; පචුරත්ථකා, බොහෝඅර්ථඇත්තාවූ—

45 සඞ්ඛිත්තා, සංක්ෂෙපකරණලද, විවරන්තීව, විවර ණයකරන්නීවූ; සිලෝකම්‍යසණ්ඨිතා ගාථාමයවසිටිනී; කාරිකා, කාරිකායයි; කාරිකාලක්ඛණා, කාරිකාලක්ෂ ණඇත්තාවූ; පණ්ඩිතෙන, පණ්ඩිතයාවිසින්; සමාධාන තා, මනාකොටකියනලද්දිය—

46 වුත්තිනාමෙසු කාච්චායනවෘත්තිනාමසයයින්ද්‍රත්ථ යන්හිද; හෙරුත්තිමඤ්ජුසාරූපසික්ඛිසු, නිරුක්තිසාරම ඤ්ජුසාරූපසිද්ධිප්‍රකරණයන්හිද; අත්ථව්‍යාඛ්‍යානසම්පත්ථ, (කච්චායනප්‍රකරණයාගේ) අර්ථව්‍යාඛ්‍යානග්‍රන්ථයෙන් ද; කාසිකාවුත්තියම්පිව, කාසිකාවෘත්තියෙහිද—

(කාසිරට විසූ ආචාර්‍යයෙකුවිසින් කළ හෙයින් කාසිකා වෘත්තියයි කියනලදී—මෙහි අපිශබ්දය සමුච්චයාර්ථයි— මකාරය පදපූරණයි)

---00---

47 තදඤ්ඤසද්දසත්ථෙසු, ආගමට්ඨකථාසු ච
විප්පකිණ්ණස්ස තන්තස්ස, කාරිකා සාරසඞ්ගහා—

## කාරිකා විනිච්ඡයො.

48 සද්දානුසාසනෙ වුත්තං, සන්ධි නාමඤ්ච කාරකං
සමාස තද්ධිතාඛ්‍යාතං, කිතකඤ්ච උණාදිකං—

49 සන්ධිම්හි එකපඤ්ඤාසං, නාමම්හි ද්විසතං භවෙ
අට්ඨාරසාධිකඤ්චෙව, කාරකෙ පඤ්චතාලිසං—

50 සමාසෙ අට්ඨවීසඤ්ච, වාසට්ඨි තද්ධිතෙ මතං
අට්ඨාරස සතාඛ්‍යාතෙ, කිතෙ සුත්තසතං භවෙ—

---

47 තදඤ්ඤසද්දසත්ථෙසු, එයින්අන්‍යශබ්ද ශාස්ත්‍රයන්හිද; ආගමට්ඨකථාසුච, පිටකත්‍රය අට්ඨකථාවන්හිද; විප්පකිණ්ණස්ස, විප්‍රකීර්ණවූ; තන්තස්ස, තන්ත්‍රයාගේ; සාරසඞ්ගහා, සාරයඑක්කොටගැන්ම; කාරිකා, කාරිකා නම්වේ—

## කාරිකාවිනිශ්චයයි

48 සද්දානුසාසනෙ, ශබ්දාගතව්‍යාකරණයෙහි, සන්ධි, සන්ධියද, නාමංච, නාමයද, කාරකං, කාරකයද; සමාස, සමාසය; තද්ධිත, තද්ධිතය; ආඛ්‍යාතං, ආඛ්‍යාතය යනමේයද; කිතකංච, කිතකයද; උණාදිකං, උණාදියද; වුත්තං, කියනලද්දේය—

49 සන්ධිම්හි, සංහිතාපරිච්ඡෙදයෙහි; එකපඤ්ඤාසං (සූත්‍ර) එක්පනසෙක්වේ; නාමම්හි, නාමපරිච්ඡෙදයෙහි අට්ඨාරසාධිකං, අටළොසක්අධිකකොටඇති; ද්විසතඤ්චෙව භවෙ, (සූත්‍ර)දෙසියයක්දවන්නේය; කාරකෙ, කාරකපරිච්ඡෙදයෙහි; පඤ්චතාලිසං,(සූත්‍ර)පන්සාලිසෙක්වේ—

50 සමාසෙ; සමාසපරිච්ඡෙදයෙහි; අට්ඨවීසංච, (සූත්‍ර) විසිඅටෙක්දවේ; තද්ධිතෙ, තද්ධිතපරිච්ඡෙදයෙහි; වාසට්ඨි

———00———

51 ඌනාදිම්හිව පඤ්ඤාසං, සුත්තමේතං පකාසිතං
කච්චායනෙන ථෙරෙන, තිලොකතිලකෙන තු.

52 යමෙතං සුත්ත මුද්දිට්ඨං, අනෙකවිධ භෙදනො
සබ්බෙසානාසසුත්තස්ස, කතමං ලක්ඛණාදිකං

53 අප්පක්ඛර මසන්දිද්ධං, සාරවං ගූළ්හනිණ්ණයං
නිද්දොසං හෙතුමංතථං, සුත්තලක්ඛණසම්මතං.

54 ආරම්භො වචනං පත්ති, ලක්ඛණං යොගමෙවච
වාක්‍යං සුත්තං යතනාදි, සුත්තාන මභිධානකං.

---

(සූත්‍ර) දෙසැටෙක්; මතං, දන්නාලද්දේය; ආඛ්‍යානෙන, ආඛ්‍යානපරිච්ඡෙදයෙහි; අෂ්ඨාරසසතං, (සූත්‍ර) එක්සියඅට ළොසෙක්වේ; කිතෙන, කිතකපරිච්ඡෙදයෙහි; සුත්තසතං හවෙ, සූත්‍රසියයෙක්වන්නේය.

51 ඌනාදිම්හිව, ඌනාදිපරිච්ඡෙදයෙහිද; පඤ්ඤාසං, (සූත්‍ර) පනසෙක්වේ; තිලොකතිලකෙන, තිලොවට තිලකයක්වැනිවූ; කච්චායනෙනථෙරෙන, කච්චායනනාමස්ථ විරයන්වහන්සේවිසින්ප්‍රඛ්‍යාති; එතං සුත්තං, මේසූත්‍රසමූහ; පකාසිතං, ප්‍රකාශකරණලද්දේය.

53 යංඑතංසුත්තං, යම්මේසූත්‍රයෙක්වේනම්; අනෙකවිධභෙදනො; නොයෙක්වැදෑරුම්බෙදයෙන්; උද්දිට්ඨං, දක්වනලද්දේද; එතස්සසබ්බස්සසුත්තස්ස, මේසියලුසූත්‍රයාගේ; ලක්ඛණාදිකං, ලක්ෂණාදිය; කතමං, කවරේද?

53 අප්පක්ඛරං, (සමක්)මදඅක්ෂරඇත්තේද, අසන්දිද්ධං, සැකනැත්තේද, සාරවං, උතුම්අර්ථඇත්තේද; ගූළ්හනිණ්ණයං, ගූඪාර්ථපමුණුවන්නේද, නිද්දොසං, දෝෂරහිතවේද, හෙතුමං, හෙතුඇත්තෝද; තථං, අවිපරීතාර්ථයෙන්යුක්තවේද, සුත්තලක්ඛණසම්මතං, (ඒ) සූත්‍රලක්ෂණයයිදන්නාලද්දේය.

(දන්සූත්‍රාභිධානදක්වනුපිණිස 'ආරම්භො' යනාදියකීය)

54 ආරම්භො, ආරම්භනයද; වචනං, වචනයද; පත්ති,

—:—00——

55 පොරාණං සරණංයෙව, නිරුත්ති සද්දවාචකං
තස්ස නිබන්ධනං සුත්තං, මිති කෙචි වදන්ති ච॥

## සුත්තගණ විනිච්ඡයො..

56 සඞ්ඛිතං සම්පවක්ඛාමි' ආදෙ සන්ධිස්ස කාරිකං
අක්ඛරතො සරතොච' රස්සදීඝාවබ්‍යඤ්ජනා॥

---

ප්‍රාප්තියද; ලක්ඛණං, ලක්ෂණයද; යොගංඑවච, යොගයද; ව්‍යාක්‍යං, ව්‍යාක්‍යයද; සුත්තං, සූත්‍රයද; යතනාදි යතනාදියද යනමේ; සුත්තානං, සූත්‍රයන්ගේ; අභිධානං, නාමනම්මේ.॥

(ආරම්භනම් ප්‍රයොගසිද්ධිය පිණිස සූත්‍රොපදෙශයාගේ ආදිභාවයෙන් ආරම්භකිරීමයි- වචනනම් ප්‍රයොගසිද්ධිය පිණිස කීමයි-ප්‍රාප්තිනම් ප්‍රයොගසිද්ධියපිණිස පැමිණීමයි- ලක්ෂණනම් ප්‍රයොගසිද්ධියපිණිස විභාගයොට සලකුණු කිරීමයි- යොගනම් ප්‍රයොග සිද්ධියපිණිස යෙදීමයි-ව්‍යාක්‍යනම් උදාහරණ රූපනිදර්ශනයන්ගේ කීමයි—සූත්‍රනම්උදාහරණරූපසිද්ධිප්‍රකාශකිරීම්ආදිභාවයෙන්අභිකීමයි-ප්‍රයත්නාදිනම්ප්‍රයොගසිද්ධියපිණිසප්‍රයත්නනයාගේආදියි)

55 පොරාණං, (යමක්) පුරාතනවේද; සරණංවඑව, විපර්‍යාව්‍යවහාරය නස්නේවේද; නිරුත්තිසද්දවාචකං, නිරුක්තිශබ්දයකියන්නේද; තස්ස, ඒ (ස්වභාවනිරුක්තිභූත) ශබ්දයාගේ; නිබන්ධනං, (රූපනිෂ්පත්තියට) කාරණවේද; (හේ) සුත්තංඉතිච, සූත්‍රයයිද; කෙචී, සමහරආචාර්‍ය්‍යයෝ, වදන්ති, කියත්॥

## සූත්‍රගණවිනිශ්චයයි

56 අක්ඛරතො, අක්ෂරවශයෙන්ද; සරතො, ස්වරවශයෙන්ද; රස්සදීඝාච, හ්‍රස්වදීර්ඝ වශයෙන්ද; බ්‍යඤ්ජනා, බ්‍යඤ්ජනවශයෙන්ද;॥ (මතුපාටසම්බන්ධයි)

——00——

57 වචනාවයව අඝොසෙසු, ඝොසනිග්ගහිතෙසු ච
පුබ්බාපරවසෙනාපි, ලොප ආගමතො පිච—

58 සංයොග පරනයන, වියොජනවසෙන ච
සිථිල ධනිතෙනාපි, ගරුක ලහුකෙන ච—

59 සම්බන්ධිත වවත්ථිත, විමුත්තාවධානතො පිච
කරණප්පයතනාදි, භෙදතො සන්ධිතො කථං—

60 එකමත්තාළිසමත්තා, වණ්ණා එතෙ පමාණතො
පඤ්ඤානනානා මභිධෙය්‍යං, නත්ථියන්තීති අක්ඛරා—

---

57 වචනාවයවඅඝොසෙසු, වර්ගීඅවර්ගීඅඝොෂ වශයෙන්ද; ඝොසනිග්ගහිතෙසුච, ඝොෂනිග්‍රහිතවශයෙන්ද; පුබ්බාපරවසෙන අපි, පූර්ව අපර වශයෙන්ද; ලොප ආගමතොඅපිච, ලොප ආගමවශයෙන්ද;—

58 සංයොග, සංයොගය; පරනයන, පරකුරුකාර පැමිණීමය; වියොජනවසෙනච, වෙන්කිරීමය යනමොවුන්ගේ වශයෙන්ද; සිථිල ධනිතෙන අපි, සිථිල ධනිත වශයෙන්ද; ගරුකලහුකෙ නච, ගුරු ලඝුවශයෙන්ද---

59 සම්බන්ධිත, සම්බන්ධය; වවත්ථිත, ව්‍යවස්ථිතය; විමුත්ත, විමුක්තය; ඨානතො අපිච, ස්ථානය යනමොවුන්ගේ වශයෙන්ද, කරණප්පයතනාදි, කරණප්‍රයත්නාදීන්ගේ; භෙදතො, භෙදයෙන්ද; සන්ධිතො, සංහිතාවශයෙන්ද; සද්දානං, ශබ්දයන්ගේ; සන්ධිස්සකාරිකං, සංහිතාකාරිකාව; ආදෙ, පළමුකොට; සම්පවක්ඛාමි, කියන්නෙමි; කථං, කෙසේද?—

60 පමාණතො, ප්‍රමාණවශයෙන්; එකමත්තාළිසමත්තා, එක්සාළිසක් පමණවූ; එතෙවණ්ණා, මේවර්ණයෝ; අනන්තානං, කෙළවරක් නැත්තාවූ, අභිධෙය්‍යං, අභිධෙය්‍යට; පත්වා, පැමිණ; නත්ථියන්ති, (යම්හෙයකින්) ක්ෂය නොවෙද්ද; ඉති, එසේහෙයින්; අක්ඛර, අක්ෂරයෝනම්වෙත්—

——00——

61 යං යං පිළන්ධනං කාතුං, මුදුතානං කඤ්චනං විය
පඤ්ඤා නනානවචනත්ථං, නක්ඛරන්තීති අක්ඛරා—

62 අචඤ්චල සභාවෙන, සද්දත්ථ පරිදීපකා
පඤ්ඤා නනාන වචනත්ථං, න චලන්තීති අක්ඛරා—

63 නිච්ඡයො වචනත්ථස්ස, මතභෙදෙන වුච්චතෙ
පරෙ සරූප මෙවාහු, කෙචි ජාතීති භාසරෙ*—

---

61 යං යං පිළන්ධනං, යම්යම් (කුණ්ඩලාභරණාදී) පළඳනාවක්; කාතුං, කරන්ට; මුදුතානං, මෘදුභාවයට පැමිණියාවූ; කඤ්චනංවිය, රත්රන්සෙයින්; අනනතවචනත්ථං, කෙළවරක්නැති පිටකත්‍රයාභිධෙයයට; පඤ්ඤා, පැමිණ; නක්ඛරනති, (යම්හෙයකින්) නැදබවට නොයෙද්ද; ඉති, එසේහෙයින්; අක්ඛරා, අක්‍ෂරයෝ නම්වෙත්—

62 අචඤ්චල සභාවෙන, නොසැලෙන ස්වභාවයෙන්; අනනතවචනත්ථං, කෙළවරක්නැති පිටකත්‍රයාභිධෙයයට; පඤ්ඤා, පැමිණ; සද්දත්ථපරිදීපකා, ශබ්දාර්ථයන් ප්‍රකාශ කරන්නාහු; නචලනති, (යම්හෙයකින්) නොසැලෙද්ද; ඉති, එසේහෙයින්; අක්ඛරා, අක්‍ෂරයෝ නම්වෙත්—

(දූත් අක්‍ෂරයන්ට විෂයවූ වචනාර්ථයාගේ සනිටුහන්කරණුකැමැත්තේ 'නිච්ඡයො වචනත්ථස්ස' යනාදියකිය)

63 වචනත්ථස්ස, (අක්‍ෂරයන්ට විෂයවූ) වචනාර්ථයාගේ; නිච්ඡයො, සනිටුහන්කිරීම; මතභෙදෙන, (විඥවූනානාවාදීන්ගේ) අභිප්‍රාය විශෙෂයෙන්; වුච්චතෙ, කියනුලැබේ; පරෙ, (වචනාර්ථයාගේ ස්වරූපය යුක්තිවශයෙන්දන්නාවූ) අනතාචාර්යකෙණෙක්; සරූපංඑව ඉති, (ඓත්ස්වභාවවූ ශෘති) ලක්‍ෂණමයසිද; කෙචි, ඇතම්ආචාර්යකෙණෙක්; ජාතිඉති, (ජාතිසම්බන්ධ)සාමාන්‍යයසිද; භාසරෙ, කියත්—

---

* 'වුච්චරෙ' ති පොත්කෙසු දිස්සති

———00———

64 කෙනචි දබ්බමෙවාහු, ජාති දබ්බන්ති කෙනචි
ජාතිගුණක්‍රියාභෙදා, තිවිධා කෙචි භාසරෙ.
65 කෙචි ජාති ගුණ ක්‍රියා, යදිච්ඡාහි චතුබ්බිධා;
ජාතික්‍රියා ගුණෙ දබ්බං, නාමන්තිපඤ්චධා පරෙ.
66 ටීකාකාරො භිධම්මස්සා, භිධානත්තා භිධෙය්‍යතො
තිනාච්ච ඤෙය්‍යත්ථවසා, දුවිධන්ති පකාසති.

---

64 කෙනචි, කිසිආචාර්‍ය්‍යයකුවිසින්; දබ්බංඑවඉති, ද්‍රව්‍යමයසිද; කෙනචි, කිසිආචාර්‍ය්‍යයකුවිසින්; ජාතිදබ්බං ඉති, ජාතිද්‍රව්‍යයසිද කියනලැබේ; කෙචි, කිසිආචාර්‍ය්‍ය කෙණෙක්; ජාතිගුණක්‍රියාභෙදා, ජාතිය ගුණය ක්‍රියාය යනමොවුන්ගේ භෙදයෙන්; තිවිධා, තුන්ප්‍රකාරයකින් හෝ; භාසරෙ, කියත්.

('කෙනචි දබ්බමෙවාහු' යනුවෙන් එකත්වශයෙන් වචනාර්ථයාගේ සනිටුහන් කිරීමයි— 'ජාතිදබ්බන්තිකෙනචි' යනුවෙන් ද්විකවශයෙන් වචනාර්ථයාගේ සනිටුහන්කිරීමයි— 'ජාතිගුණක්‍රියාභෙදා' යන මෙයින් ත්‍රිකවශයෙන් වචනාර්ථයාගේ සනිටුහන් කිරීමයි)

65 කෙචි, ඇතම් ආචාර්‍ය්‍යකෙණෙක්; ජාති, ජාතිය; ගුණ, ගුණය; ක්‍රියා, ක්‍රියාය; යදිච්ඡාඉති, යදිච්ඡායයි; චතුබ්බිධා, සතරපරිද්දකින් කියත්; පරෙ, අන්‍යාචාර්‍ය්‍ය කෙණෙක්; ජාති, ජාතිය; ක්‍රියා, ක්‍රියාය; ගුණෙ, ගුණය; දබ්බං, ද්‍රව්‍යය; නාමංඉති, නාමයයි, පඤ්චධා, පස්පරිද්දකින් කියත්.

(දූත් පරසමය ආචාර්‍ය්‍යයන්ගේ අභිප්‍රායෙන් වචනාර්ථය දක්වා ස්වසමය ආචාර්‍ය්‍යයන්ගේ වචනාර්ථයාගේ සනිටුහන් කියනුකැමැත්තෝ "ටීකාකාරො" යනාදියකීය)

66 අභිධම්මස්ස, අභිධර්මයාගේ; ටීකාකාරො, ටීකාකාර (ආනන්දාචාර්‍ය්‍ය) තෙමේ; අභිධානතො, අභිධානභාවයෙන්ද; අභිධෙය්‍යතො, අභිධෙය වශයෙන්ද; තිනා

—00—

67 සුත්තන්තටීකාකාරෙන, තිවිධන්ති පකාසිතං
පදත්ථ පදත්ථත්ථානං, අත්ථත්ථානං ප්පභෙදතො—
68 විසුද්ධිමග්ගටීකායං, අත්ථභෙදා පකාසිතා
පත්තබ්බ ඤාපයිතබ්බ, නිබ්බත්තනත්ථවසා තිධා—
69 ලොකුත්තරාදි යො කොචි, වචනත්ථප්පභෙදකො
සබ්බො සො අක්ඛරෙහෙව, ඤායතෙ වරබුද්ධිනා
70 යස්මා ච සිථිලාදීනං, අක්ඛරානං විපත්තියං
අත්ථස්ස දුන්නයො හොති, තස්මාඅක්ඛරකොසලං-

---

ත්ථ නෙය්‍යත්ථ වසා, නීතාර්ථ නෙයාර්ථ වශයෙන්ද; ද්විධංඉති, ද්විප්‍රකාරයයි; පකාසති, ප්‍රකාශ කෙරේ—

67 සුත්තන්තටීකාකාරෙන, සූත්‍රටීකාකාරාචාර්‍ය්‍යයා විසින්; පදත්ථපදත්ථත්ථානං, පදාර්ථපදාර්ථාර්ථයන්ගේද; අත්ථත්ථානං, අර්ථාර්ථයන්ගේද; පභෙදතො, ප්‍රභෙද වශයෙන්; තිවිධං ඉති, තුන්ප්‍රකාරයයි; පකාසිතං, ප්‍රකාශ කරණලද්දේය—

68 විසුද්ධි මග්ග ටීකායං, විසුද්ධි මාර්ග ටීකාවෙහි; අත්ථභෙදා, අර්ථවිශෙෂයෝ; පත්තබ්බ, ප්‍රාප්තව්‍යාර්ථය; ඤාපයිතබ්බ, ඥාපයිතව්‍යාර්ථය; නිබ්බත්තනත්ථවසා, නිර්වෘත්‍යාර්ථය යනමොවුන්ගේ වශයෙන්; තිධා, තුන්පරිද්දකින්; පකාසිතා, ප්‍රකාශකරණලද්දාහුය—

69 ලොකුත්තරාදි, ලොකොත්තරාදිවූ; යොකොචිවචනත්ථප්පභෙදකො, යම්කිසි වචනාර්ථවිශෙෂයෙක්ඇද්ද; සො සබ්බො, ඒ සියලුවචනාර්ථවිශෙෂයතෙම; අක්ඛරෙහිඑව, අක්ෂරයෙන්ම; වරබුද්ධිනා, උතුම්නුවණැත්තහු විසින්; ඤායතෙ, දන්නාලැබේ—

70 යස්මාච, යම්හෙයකින්වනාහි; සිථිලාදීනං, සිථිලාදිවූ; අක්ඛරානං, අක්ෂරයන්ගේ; විපත්තියං, අන්‍යථා ප්‍රවෘත්තියක් ඇතිකල්හි; අත්ථස්ස, අර්ථයාගේ; දුන්නයොහො

——00——

71 බහූපකාරං බුද්ධස්ස, වචනෙසු පදානිපි
අක්ඛරසන්නිපාතත්තා, අක්ඛරෙසොව ගය්හරෙ—

72 බ්‍යඤ්ජනෙ දුන්නිරූපිතම්හි, දුන්නිද්දිට්ඨෙව කාරණෙ
වොච්ඡිජ්ජන්ති පුථුබුද්ධා, එසා සද්ධම්මසඞ්ඛයා—

73 බ්‍යඤ්ජනෙ සුනිරූපිතම්හි, සුනිද්දිට්ඨෙ ච කාරණෙ
එකීභාවොදළ්හොහොති, එසාසද්ධම්ම සණ්ඨිති—

74 තස්මා අක්ඛර කොසල්ලං, සම්පාදෙය්‍යහිතත්ථිකො
උපට්ඨහං ගරුං සම්මා, උට්ඨානාදීහි පඤ්චහි—

---

හි, දුරවබොධයවේද; තස්මා, එසේහෙයින්; අක්ඛරකොසල්ලං, අක්ෂරකෞශල්‍යය—

71 බුද්ධස්ස, සර්වඥයන්වහන්සේගේ; වචනෙසු, වචනයන්හි; බහූපකාරං, බොහෝ උපකාරඇත්තේය; •පදානි අපි, පදයෝද; අක්ඛරසන්නිපාතත්තා, අක්ෂරයන්ගේ සන්නිපාතයෙන්වූරූපඇතිබැවින්; අක්ඛරෙසුඑව, අක්ෂරයන්හිම; ගය්හරෙ, ගන්නාලැබෙත්—

72 බ්‍යඤ්ජනෙ, ව්‍යඤ්ජනය; දුන්නිරූපිතම්හි, වරදවානිකල්හිද; කාරණෙ, කාරණය; දුන්නිද්දිට්ඨෙච, (එසේන්) ප්‍රකාශනොකරණලද කල්හිද; පුථුබුද්ධා, මහත්වූ ප්‍රඥාවෝ; වොච්ඡිජ්ජන්ති, නැසෙත්; එසා, මේනිරුක්ති නොමෝ, සද්ධම්ම සඞ්ඛයා, සද්ධර්මය විනාශකරන්නීය—

73 බ්‍යඤ්ජනෙ, ව්‍යඤ්ජනය; සුනිරූපිතම්හි, මනාකොටන්කල්හිද; කාරණෙ, කාරණය; සුනිද්දිට්ඨෙච, මනාකොට දක්වනලද කල්හිද; එකීභාවො, ඒකාග්‍රබව; දළ්හොහොති, ස්ථිරවේ; එසා, මෝතොමෝ; සද්ධම්ම සණ්ඨිති, සද්ධර්මයාගේ පැවැත්මවේ—

74 තස්මා, එසේහෙයින්; හිතත්ථිකො, හිතකැමැතිපුද්ගලතෙමේ; උට්ඨානාදීහි පඤ්චහි, නුනස්නෙන් නැගිසිටීම්ආදී පඤ්චාඞ්ගයෙන් යුක්තව; ගරුං, ආචාර්‍ය්‍යයාට;

——00——

75 උට්ඨාතාච උපට්ඨාතා, සුස්සූසා සුපරිග්ගහා
සක්කච්චං සිප්පුග්ගහණං, ගරුං ආරාධයෙ බුධො —

79 යො අක්ඛරෙහි සඤ්ඤාතො, විසයො අක්ඛරස්ස සො
අක්ඛරස්සා තදත්ථභූතො, අභිධෙය්‍යො නවිජ්ජති —

## අක්ඛර විනිච්ඡයො

77 යෙච ආදිම්හි නිද්දිට්ඨා, අක්ඛරා සරනාමකා
බ්‍යඤ්ජනානි සරාපෙතානා, නතුබ්‍යඤ්ජනමඤ්ඤගා —

---

සම්මා, මනාකොට; උපට්ඨහං, උපස්ථානකරන්නේ; අක්ඛර කොසල්ලං, (යථොක්ත) අක්ෂරයන්හි; (පටුතරඥාන සඞ්ඛ්‍යාත) කෞශල්‍යය; සම්පාදෙය්‍ය, නිපදවන්නේය —

75 බුධො, පණ්ඩිතතෙමේ; උට්ඨාතා, අනලසින්ද; උපට්ඨාතා, උවටැන් කිරීමෙන්ද; සුස්සූසා, මනාකොට ඇසීමෙන්ද; සුපරිග්ගහා, මනාකොට මෙනෙහිකිරීමෙන්ද; සක්කච්චං, සකස්කොට; සිප්පුග්ගහණං, ශිල්ප ඉගැන්මෙන්ද; ආරාධයෙ, සතුටු කරන්නේය —

76 යො, යම්අර්ථයෙක්තෙමේ; අක්ඛරෙහි, අක්ෂරයෙන්; සඤ්ඤාතො, දන්නා ලද්දේද; සො, ඒඅර්ථයතෙමේ; අක්ඛරස්ස, අක්ෂරයට; විසයො, විෂයවේ; අක්ඛරස්ස අක්ෂරයාගේ; අනත්ථභූතො; අර්ථනුවූ; අභිධෙය්‍යො, ශබ්දාර්ථයෙක්; නවිජ්ජති, නැත්තේය —

## අක්ෂර විනිශ්චයයි

(දැන්දක්වනලද අක්ෂරයන්හිස්වරයන්ගේඅනන්තර්ගතභාවය දක්වනුපිණිස "යෙචආදිම්හිනිද්දිට්ඨා" යනාදිය කීය)

77 ආදිම්හි, ආදියෙහි; නිද්දිට්ඨා, දක්වනලද; යෙ අක්ඛරාච, යම්අක්ෂරකෙණෙක්වනාහි; බ්‍යඤ්ජනානි, ව්‍යඤ්ජනයන්; සරාපෙතානා, (නාමාකෙරෙහි) හසුරුවන්නාහුදෙද්ද; (ඒඅක්ෂරයෝ) සරනාමකා, ස්වරනම්වෙත්; බ්‍යඤ්ජනා ව්‍යඤ්ජනය; නතුඅඤ්ඤගා, අනුවගොගියාහුවෙත් —

——00——

78 සද්දුච්චාරණ වෙලායං, සරෙහි සද්දසම්භවා
ඛ්‍යඤ්ජනනිස්සයා හුත්වා, සයං රජ්ජන්ති මෙ සරා—

79 කෙවලානම්පි එතෙසං, සද්දුච්චාරණ සම්භවා
ඛ්‍යඤ්ජනානං නිස්සයතො, පරූපත්ථම්භකා ඉමෙ—

80 අප්පටිබද්ධවුත්තිත්තා, භූමිපාලා යථා සරා
තතු සෙනාපතී විය, ඉති නෙරුත්තිකා බ්‍රවුං—

81 සභාව ඛ්‍යඤ්ජනෙනාපි, විනාව ඛ්‍යඤ්ජනෙන වා
අසනායාපි අත්ථස්ස, පකාසනසමත්ථිකා—

---

78 ඉමෙසරා, මේස්වරයෝ; සද්දුච්චාරණවෙලායං, ශබ්දයන්ගේ උච්චාරණකාලයෙහි; සරෙහි, ස්වරයන්කරණකොටගෙණ; සද්දසම්භවා, ශබ්දයන්ගේ ඉපැද්මට හෙතුභාවයෙන්; ඛ්‍යඤ්ජනනිස්සයාහුත්වා, ඛ්‍යඤ්ජනනිශ්‍රිතව; සයං, තුමූ; රජ්ජන්ති, හොබිත්—

79 කෙවලානං අපි, හුදකලාවූද; එතෙසං, මේ ස්වරයන්ගේ; සද්දුච්චාරණසම්භවා, ශබ්දයන්ගේ උච්චාරණයට හෙතුභාවයෙන්ද; ඛ්‍යඤ්ජනානං, ඛ්‍යඤ්ජනයන්ගේ; නිස්සයතො, නිශ්‍රයභාවයෙන්ද; ඉමෙ, මේස්වරයෝ; පරූපත්ථම්භකා, පරඛ්‍යඤ්ජනයන්ට උපස්ථම්භවෙත්—

80 සරා, ස්වරයෝ; අප්පටිබද්ධවුත්තිත්තා, (ඛ්‍යඤ්ජනයන්) පිළිබඳනුවූ පැවතුම්ඇතිබැවින්; භූමිපාලායථා, පෘථිවිපාලයන් මෙන්වෙත්; සෙනාපතීවියතතුඉති, සෙනෙවියන්මෙන් නොවේත්යයි; නෙරුත්තිකා, නෛරුක්තිකයෝ; අබ්‍රවුං, කීහු—

81 ඛ්‍යඤ්ජනෙනසහ එව අපි, ඛ්‍යඤ්ජනයහා සමගමද; ඛ්‍යඤ්ජනෙනවාවිනා එව, ඛ්‍යඤ්ජනයගෝහැරමද; අසනායාඅපි, අදහායවූවාහුද; අත්ථස්ස, අර්ථය; පකාසනසමත්ථිකා, ප්‍රකාශකිරීමට සමර්ථවෙත්—

——00——

82 සරා නාම ඉමෙ වණ්ණා, අඨ හොන්ති සරූපතො
අආ ඉඊ උඌ එඔ, ඉමෙ වණ්ණා සරා මතා—

83 අක්ඛරානං විනිච්ඡයො, තථා සරවිනිච්ඡයො
එකවණ්ණාං ළිස ඕගි, පමාණවචනෙන හි—

84 එකාදස විවජ්ජෙය්‍ය, පිණ්ඩිය වණ්ණසඞ්ගහං
පිටකස්සා නුපකාරා, බාහිරක්ඛරසම්මතා—

### සරවිනිච්ඡයො

85 පමාණං එකමත්තස්ස, නිම්මිසුම්මිසතො බ්‍රවුං
අඞ්ගුලිපොටකාලස්ස, පමාණෙනාපි අබ්‍රවුං—

---

82 ඉමෙඅඨවණ්ණා, මේ අක්‍ෂරයෝ අටදෙන; සරූපතො, ස්වරූපවශයෙන්; සරානාමහොන්ති, ස්වරයෝ නම්වෙත්; අ, අකාරය; ආ, ආකාරය; ඉ, ඉකාරය; ඊ, ඊකාරය; උ, උකාරය; ඌ, ඌකාරය; එ, එකාරය; ඔ, ඔකාරයයන; ඉමෙවණ්ණා, මේඅක්‍ෂරයෝ; සරා, ස්වර යෝයයි; මතා, දන්නාලද්දාහුය—

83 අක්ඛරානං, අක්‍ෂරයන්ගේ; විනිච්ඡයො, විනිශ්චය ද; තථා, එසේම; සරවිනිච්ඡයො, ස්වරයන්ගේවිනිශ්චයද දතයුත්තෝය; එකවණ්ණාළිසංඉති, එකවත්තාළිසංය න; පමාණවචනෙනහි, ප්‍රමාණවචනයෙන්වනාහි—

84 එකාදස, එකොළොස් අක්‍ෂරයන්; විවජ්ජෙය්‍ය, හරණේය; වණ්ණසඞ්ගහං, අක්‍ෂරයන්ගේ සඞ්ග්‍රහව; පිණ්ඩියෙ, පිඩුකරන්නේය; පිටකස්සඅනුපකාරා, (ත්‍රි) පිටකයට අනුපකාරහෙයින්; බාහිරක්ඛරසම්මතා, බාහ්‍යාක්‍ෂරයෝයයි; දන්නාලද්දාහුය—

### සරවිනිශ්චයයි

(දැන් හ්‍රස්වාදීන්ගේ විනිශ්චය කියනුකැමැතිව 'පමාණං' යන ආදිය කීය)

85 එකමත්තස්ස, එක්මාත්‍රාවක්ඇත්තහුගේ; පමා

——00——

86 ඒකමත්තෙන සංයුත්තා, රස්සා ඉති පකාසිතා·
දියඩ්ඪමත්තිකා චෙව, රස්සත්තෙනෙව ගය්හරෙ—

87 සුත්තාකාරෙන සුත්තම්හි, මුනිවණ්ණිතබුද්ධිනා
තදුභය ගහණත්ථං, ලහුමත්තා පකාසිතා—

88 රස්සා නාම සරා එතෙ, තයො හොන්ති සරූපතො·
ආදෙ වුත්තක්ඛරානං, ආදි තතියපඤ්චමා—

89 දිගුණෙනෙක මත්තස්ස, දීඝා ගොදූහනෙනවා
දීඝකාලෙන යුත්තත්තා, තබ්බන්තා දීඝනාමකා—

---

ණං, ප්‍රමාණය; නිම්මිසඋම්මිසනෙනා, ඇස්දල්වීම් ඇස්පි යනෙහළිම් වශයෙන්; අඩුවුං, කීහු; අඞ්ගුලිපොටකාලස්ස, අසුරුගසනකාලයාගේ; පමාණෙනඅපි, ප්‍රමාණයෙන්ද, අඩුවුං, කිහු—

86 ඒකමත්තෙන, එක්මාත්‍රයකින්; සංයුත්තා, යුක්තවූවානු; රස්සාඉති, හ්‍රස්වයෝයයි; පකාසිතා, ප්‍රකාශකරණලද්දාහුය; එව, මේ හ්‍රස්ව විනිශ්චයෙහි; දියඩ්ඪමත්තිකාව, දෙඩමාත්‍රාවක්ඇත්තාහුද; රස්සත්තෙනඑව, හ්‍රස්වභාවයෙන්ම; ගය්හරෙ, ගන්නාලැබෙත්—

87 මුනිවණ්ණිතබුද්ධිනා, සර්වඥයන්වහන්සේවිසින් වර්ණනාකරණලද බුද්ධිඇති; සුත්තාකාරෙන, සූත්‍රකාරකාචායර්යයාවිසින්; තදුභයගහණත්ථං, ඒ (එකමාත්‍රා දියඩ්ඪමාත්‍රා) දෙදෙනාගේ ගැන්මපිණිස; සුත්තම්හි; (ලහුමත්තාතයොරස්සායන) සූත්‍රයෙහි; ලහුමත්තා, (ඉති) ලහුමාත්‍රායයි; පකාසිතා, ප්‍රකාශකරණලද්දාහුය—

88 ආදෙ, ආදියෙහි; වුත්තක්ඛරානං, කියනලද අක්ෂරයන්අටදෙනාඅතුරෙන්; ආදිතතියපඤ්චමා, පළමුවනු තුන්වනු පස්වනුවූ; එතෙතයොසරා, මේස්වරයෝ තුන්දෙන; සරූපතො, ස්වරූපවශයෙන්; රස්සානාමහොන්ති, හ්‍රස්වයෝනම්වෙත්—

89 එකමත්තස්ස, එක්මාත්‍රාවක්හුගේ; දිගුණෙනවා,

——00——

90 දීඝානාම සරා එතෙ, පඤ්ච හොන්ති සරූපතො
දුතිය චතුත්ථ ඡට්ඨා, සත්තමට්ඨමකා චිමෙ.

91 ඡන්දෙ නිද්දිට්ඨවුත්තීනං, නියමෙනෙව විඤ්ඤෑතා
නියඩ්ඪමත්තිකා චෙත්ථ, දීඝත්තෙනෙව ගය්හරෙ.

92 නෙතෙව අක්ඛරසඤ්ඤාත, සුත්තෙන වුත්තෙන දීපිතා
විමත්තා දීඝ නාමාති, නියමස්ස අභාවතො.

---

වීගුණකිරීමෙන්හෝ; ගොදුහනෙනවා, දෙතදෝනාකාල ප්‍රමාණයෙන්හෝ; දීඝා, දීර්ඝයෝ කියනලද්දාහුය; දීඝකාලෙන, දීර්ඝකාලයක්හා; යුත්තානා, යෙදුනුහෙයින්ද; නබ්බනතා, ඒ දීර්ඝකාලය ඇත්තාහුද; දීඝනාමකා, දීර්ඝනම්වෙත්.

90 එතෙ පඤ්චසරා, මේ (මතුකියන) ස්වරයෝ පස්දෙන; සරූපතො, ස්වරූපවශයෙන්; දීඝානාමහොන්ති, දීර්ඝනම්වෙත්; දුතිය, දෙවනස්වරය; චතුත්ථ, සතරවනස්වරය; ඡට්ඨා, සයවනස්වරයයනමොහුද; සත්තම, සත්වනස්වරය; අට්ඨමකාච, අටවනස්වරයයනමොහුද; ඉමෙ, (යන) මොහු පඤ්චස්වරයෝ නම්වෙත්.

91 ඡන්දෙ, (ගායත්‍ර්‍යාදි) ඡන්දස්හි; නිද්දිට්ඨවුත්තීනං, දක්වනලද (තනුමධ්‍යාදි) වෘත්තයන්ගේ; නියමෙනඑව, නියමයෙන්ම; එත්ථ, මේ දීර්ඝවිනිශ්චයෙහි; නියඩ්ඪමත්තිකාචී, අඩුතුන්මාත්‍රාඇත්තාහුද; දීඝත්තෙනඑව, දීර්ඝභාවයෙන්ම; විඤ්ඤෑතා, පණ්ඩිතයාවිසින්; ගය්හරෙ, ගන්නාලැබෙත්.

92 නෙතෙ එව, එහෙයින්ම; සුත්තෙන, (අණුස්සුදීඝා යනසංඥා) සූත්‍රයෙහි; වුත්තෙන, කියනලද; අක්ඛරසඤ්ඤාත, අක්ෂරශබ්දයෙන්; විමත්තා, මාත්‍රාවයක්ඇත්තාහු; දීඝානාමඉති, දීර්ඝයෝ නම්වෙත්යනී; නියමස්ස, නියමයක්හුගේ; අභාවතො, නැතිහෙයින්; දීපිතා, ප්‍රකාශකරණලද්දාහුය

—00—

93 දූරතො අව්හානෙ ගීතෙ, තථෙව රොදනෙ පිච
පලුතා තිමත්තිකා වුත්තා, සබ්බන්තෙ තෙසුගය්හරෙ

## රස්ස දීඝ විනිච්ඡයො

94 ඨපිතං අන්ධකාරම්හි, වත්ථුං දීපො පකාසති
නිස්සායෙව සරෙ අත්ථං, ව්‍යඤ්ජයන්තිහි ව්‍යඤ්ජනා
95 මිස්සීභාවං ව්‍යඤ්ජනෙහි, පකතං භොජනං විය
මිස්සීභාවං සරෙහෙව, උපගච්ඡන්ති ව්‍යඤ්ජනා ——

---

93 දූරතො, දුරින්; අව්හානෙ, කැඳවීමෙහිද; ගීතෙ, ගායනාකිරීමෙහිද; තථාඑව, එසේම; රොදනෙඅපිච; හැඬීමෙහිද; (පවත්නාවූ) පලුතා, පලුතයෝ; තිමත්තිකා (ඉති) මාත්‍රාත්‍රයක්ඇත්තාහුයයි; වුත්තා, කියනලද්දාහුය; එතෙ, මේදීඝවිනිශ්චයෙහි; තෙසබ්බ, ඒ සියලුපලුතයෝ; ගය්හරෙ, නොගන්නාලැබෙත් ——

## හ්‍රස්ව දීර්ඝ විනිශ්චයයි

(දැන් ව්‍යඤ්ජනස්වරූපය අන්වර්ථවශයෙන් ප්‍රකාශක රණුපිණිස "ඨපිතං" යන ආදිය කියා)

94 අන්ධකාරම්හි, අන්ධකාරයෙහි; ඨපිතං, තබනලද; වත්ථුං, වස්තුවක්; දීපො, පහණතෙමේ; පකාසති, ප්‍රකාශකෙරේද; සරෙ, ස්වරයන්; නිස්සායඑව, නිසාම; අත්ථං, අර්ථය; ව්‍යඤ්ජයන්ති, (යම්හෙයකින්) ප්‍රකාශකෙරෙද්ද; ඉති, එසේහෙයින්; ව්‍යඤ්ජනා, ව්‍යඤ්ජනයෝනම්වෙත් ——

95 ව්‍යඤ්ජනෙහි, ව්‍යඤ්ජනයන්හා, මිස්සීභාවං, මිශ්‍රබවට; උපකතං, පැමිණියාවූ; භොජනංවිය, භොජනයමෙන්; ව්‍යඤ්ජනා, ව්‍යඤ්ජනයෝ; සරෙහිඑව, ස්වරයන්හාම; මිස්සීභාවං, මිශ්‍රබවට; උපගච්ඡන්ති, එළැඹෙත්-

——00——

96 මහාපුරිසලක්ඛණා, සනතානුබ්‍යඤ්ජනා විය
සරස්සා සනනභාවෙන, පිනතා බ්‍යඤ්ජනා මතා—

97 සෙනාපති පභූතයො, රාජසන්නිස්සිතා ඉව
පධානසරනිස්සිතා, බ්‍යඤ්ජනා අප්පධානකා—

98 තෙත්තිංසතිවිධා තෙසු, ඛත්තිංස සරආදිකා
බින්දුමත්තං පනෙතෙසු, එකංව සරඅනනකං—

99 කකාරාදි මකාරන්තා, පඤ්චවීසති බ්‍යඤ්ජනා
වග්ගාඉති පවුච්චන්ති, පඤ්චපඤ්ච විභාගතො—

---

(මෙහි 'උපගතං' යි කිවමනානත්ති 'දෙඛස්සච' ය න්නෙහි චග්‍රහණයෙන් ගකාරයහට කකාරකොට 'උ පකතං' යි කියනලදි)

96 මහාපුරිසලක්ඛණා, මහාපුරුෂලක්ෂණයෙන්; ආ සනනා, ආසන්නවූ; අනුබ්‍යඤ්ජනාවිය; අශීත්‍යනුබ්‍ය ඤ්ජනයන්මෙන්; සරස්සා, ස්වරයට; ආසන්නභාවෙන, ආ සන්නභාවයෙන්; පිනතා, සිටිබැවින්; බ්‍යඤ්ජනා, බ්‍ය ඤ්ජනයෝයයි; මතා, දන්නාලද්දහුය—

97 රාජසන්නිස්සිතා, රජහුආශ්‍රයකළාවූ; සෙනාපති පභූතයොඉව, සෙනාපතිආදින්මෙන්; බ්‍යඤ්ජනා, බ්‍ය ඤ්ජනයෝ; පධානසරනිස්සිතා, ප්‍රධානස්වරයන් ආශ්‍රය කළබැවින්; අප්පධානකා, අප්‍රධානවෙත්—

98 තෙත්තිංසතිවිධා, තෙතිස් වැදෑරුම්වෙත්; තෙසු, ඒ බ්‍යඤ්ජනයන් අතුරෙන්; ඛත්තිංස, දෙතිස්බ්‍යඤ්ජ නකෙණෙක්; සරආදිකා, ස්වරයන් ආදි කොට ඇත්තා හුය; එතෙසු, මේ බ්‍යඤ්ජනයන් අතුරෙන්; බින්දුමත්තං පන, බින්දුමාත්‍රවනානි; එකංච්ච, හුදකළාවම; සරඅනන කං, (හුස්ව) ස්වරයා අනනකොටඇත්තේය—

99 කකාරාදි, කකාරයා ආදිකොටඇති; මකාර න්තා, මකාරයා කෙළවරකොටඇති; පඤ්චවීසති බ්‍ය

——00——

100 තතොඅඤෙඤ අවග්ගාති, අවුත්තාසිඛි ඤායතො
වග්ගසඤ්ඤිත සුත්තෙන, අවග්ගාපි කථියරෙ.

101 එත්ථ පඤ්චසු වග්ගෙසු, වග්ගානං පඨමා පරා
වග්ගානං දුතියා පඤ්ච, සකාරෙ ච තථා පරෙ.

102 අබ්‍යත්තිනාදයුත්තත්තා, අඝොසා ඉති සඤ්ඤිතා
වග්ගානං තතියාචෙව, චතුත්ථ පඤ්චමා තථා.

103 යරලවහළාචෙව, එකවීසතිබා මතා
බ්‍යත්තිනාදෙනයුත්තත්තා, ඝොසා ඉතිපකාසිතා.

---

ඤ්ජනා, පස්විසිබ්‍යඤ්ජනයෝ; පඤ්චපඤ්ච විභාගෙන; පස්පස්කොටසින්; වග්ගාඉති, වගියෝනම්වෙතියි; පවුච්චන්ති, කියනුලැබෙත්.

100 තතො, ඒ වගියන්කෙරෙන්; අඤෙඤ, (යකාරාදි) සෙසුබ්‍යඤ්ජනයෝ; අවග්ගාඉති, අවගියෝයයි (කියනු ලැබෙත්) අවුත්තාසිඛිඤායතො, නොකියනලද අවගිසංඥසිඛියගේ යුක්තියෙන්; වග්ගසඤ්ඤිතසුත්තෙන, වගිසංඥකරණලදසූත්‍රයෙන්; අවග්ගාඅපි, අවගියෝද; කථියරෙ, කියනුලැබෙත්.

101 එත්ථපඤ්චසුවග්ගෙසු, මේ වගිපසඅතුරෙන්; වග්ගානං, වගියන්සම්බන්ධිවූ; පඨමා, පළමුවනුවූ; පඤ්ච, අක්ෂරයෝ පස්දෙනද; අපරා, අන්‍යවූ; වග්ගානං, වගීයන් සම්බන්ධිවූ; දුතියා, දෙවනඅක්ෂරයෝ පස්දෙනද; තථා, එසේම; අපරෙ, අන්‍යවූ; සකාරෙච, සකාරයද.

102 අබ්‍යත්තිනාදයුත්තත්තා, අව්‍යක්තඝොෂයෙන් යුක්තබැවින්; අඝොසාඉති, අඝොෂයෝයයි; සඤ්ඤිතා, දත්තාලද්දාහුනු; වග්ගානං, වගියන්ගේ; තතියාච එව, තුන්වනඅක්ෂරයෝද; තථා, එසේම; චතුත්ථපඤ්චමා, සතරවන් පස්වනඅක්ෂරයෝද.

103 මතා, (අවගිඅක්ෂරනයි) දත්නාලද; යරලවහළා ච එව, යකාර රකාර ලකාර වකාර හකාර ළකාරයෝ

——00——

104 කරණං නිග්ගහෙතබ්බාන, මුඛෙනා විවටෙන ච
යං බින්දුමත්තකං වුත්තං, නිග්ගහීතන්ති තං වදෙ—
105 යං පුබ්බං සන්ධිතො ආදි, සො සො අන්තාවයං පරං
විනාසො විජ්ජමානස්ස, ලොපො ඉති පවුච්චති—
106 අවිජ්ජමානං යං තත්ථ, තස්ස උප්පත්ති ආගමො
ද්විත්තං ව්‍යඤ්ජනානං වා, සංයොගො හොති යොගතො

---

ද යන; එකවීසතිධා, එක්විසිවැදෑරුම්වූ අක්ෂරයෝ; ව්‍යඤ්ජිතාදෙන, ව්‍යඤ්ජනඝොෂයෙන්; යුත්තත්තා, යුක්තබැවින්; ඝොසාඉති, ඝොෂයෝයයි; පකාසිතා, ප්‍රකාශකරණලද්දාහුය—

104 කරණං, අක්ෂරොත්පත්තිස්ථානය; නිග්ගහෙතබ්බාන, පෙළා; අවිවටෙන මුඛෙනම, අවිවෘතවූ මුඛයෙන්ද; යංබින්දුමත්තකං, යම්බින්දුමාත්‍රයෙක්; වුත්තං, කියනලද්දේද, තං, ඒ (බින්දුමාත්‍ර) ව්‍යඤ්ජනය; නිග්ගහීතංඉති, නිග්ගහීතයයි; වදෙ, කියත්තේය—

105 සන්ධිතො, (පද)සන්ධිකරෙන්; (පදච්ඡේදකාලයෙහි)යං, යම් අක්ෂරයෙක්; පුබ්බං, පූර්වවේද; සො, හේතෙමේ; ආදි, ආදිනම් වේ; යංච, යම්අක්ෂරයෙක්වනාහි; පරං, පරවේද; සො, හේතෙමේ; අන්තො, අන්තනම් වේ; විජ්ජමානස්ස, විද්‍යමානාක්ෂරයාගේ; විනාසො, නැස්ම ලොපොඉති, ලොපයයි; පවුච්චති, කියනුලැබේ—

106 තත්ථ, ඒපදච්ඡේදකාලයෙහි; යං, යම්අක්ෂරයෙක්; අවිජ්ජමානං, නැත්තේවේද; තස්ස, ඒ අක්ෂරයාගේ උප්පත්ති, ඉපැද්ම; ආගමො, ආගමනම් වේ; ද්විත්තං ව්‍යඤ්ජනානංවා, ව්‍යඤ්ජනයන්දෙදෙනෙකුත්ගේහෝ; යොගතො, (එකතුවීහි) යොගයෙන්; සංයොගො හොති, සංයොගනම් වේ—

——00——

107 අක්ඛරං බ්‍යඤ්ජනං පුබ්බං, නියතෙ යං පරක්ඛරං
තදෙව පරනයනනාති, සද්දසත්ථෙ පකාසිතං—
108 බ්‍යඤ්ජනස්ස විනිබ්භොගො, අනුබන්ධසරස්ස යො
වියොගො නාම සො හොති, සරෙනව වියොගතො—
109 පඤ්චවග්ගෙසු යං වුත්තං, පඨමං තතියං තථා
දසධා බ්‍යඤ්ජනං එතං, සිථිලන්ති පකාසිතං—
110 සිථිලෙන අගාළ්හෙන, අථද්ධෙනෙව සබ්බදා
විවටයොග මුදුනා, වත්තබ්බක්ඛරභාවතො—

---

107 අක්ඛරං, ස්වරරහිතවූ; පුබ්බං, පූර්වවූ; යං බ්‍යඤ්ජනං, යම් ව්‍යඤ්ජනයෙක්; පරක්ඛරං, පරාක්ෂරයාකරා; නියතෙ, පමුණුවනලැබේද; තංඑව, ඒ (පැමිණවියයුතු) පූර්වව්‍යඤ්ජනයම; පරනයනංඉති, පරනයනනමැයි; සද්දසත්ථෙ, ශබ්දශාස්ත්‍රයෙහි; පකාසිතං, ප්‍රකාශකරණලද්දේය—

108 අනුබන්ධසරස්ස, අනුබන්ධස්වරඇති; බ්‍යඤ්ජනස්ස, ව්‍යඤ්ජනයාගේ; යො විනිබ්භොගො, යම් වෙන්කිරීමෙක්ඇද්ද; සො, හේතෙමේ; සරෙනව, ස්වරයෙන්ද; වියොගතො, වෙන්කරණහෙයින්; වියොගොනාම හොති, වියොගනම් වේ—

109 පඤ්චවග්ගෙසු, පඤ්චවර්ගයන්හි; යං පඨමං, යම් ප්‍රථමාක්ෂරයෙක්; වුත්තං, කියනලද්දේද; තථා, එසේම; තතියං, තුන්වනඅක්ෂරයෙක්කියනලද්දේද; එතංදසධා බ්‍යඤ්ජනං, මේදශප්‍රකාරව්‍යඤ්ජනය; සිථිලං ඉති, සිථිලයයි; පකාසිතං, ප්‍රකාශකරණලද්දේය—

110 සබ්බදා, හැමකල්හි; සිථිලෙන, ලිහිල්වූ; අගාළ්හෙන, දැඩිනුවූ; අථද්ධෙනඑව, තදනුවූම; විවටයොගමුදුනා, මෘදුවූවිවෘතප්‍රයොගයෙන්; අක්ඛරභාවතො, අක්ෂරභාවයෙන්; වත්තබ්බං, කියයුත්තේය—

111 පඤ්චවග්ගෙසු දුතියං, චතුත්ථං ධනිතව්හයං
ගාල්හවචීපයොගෙන, වත්තබ්බ ක්ඛරභාවතො—

112 දීඝඤ්ච සංයොගපරං, වුත්තං ගරුකනාමකං
රස්සඤ්චා සංයොගපරං, භාසිතං ලහුකව්හයං

113 සම්බන්ධිත්වාන යං වුත්තං, සහ පරපදෙන තං
සම්බන්ධං යං පදච්ඡෙදං, කත්වා වුත්තං වවත්ථිතං

114 විස්සජ්ජෙත්වාන කරණං, විවටෙන මුඛෙන යං
වුච්චතෙ තං විමුත්තන්ති, කථයන්ති විචක්ඛණා

---

111 පඤ්චවග්ගෙසු, පඤ්චවර්ගයන්හි; දුතියං, දෙවන අක්ෂරයද; චතුත්ථං, සතර්වන අක්ෂරයද; ධනිතව්හයං, ධනිත නම් වේ; ගාල්හවචීපයොගෙන, දැඩිවූ වාක්ප්‍රයොගයෙන්; අක්ඛරභාවතො, අක්ෂරභාවයෙන්; වත්තබ්බං, කියයුත්තෝය—

112 දීඝඤ්ච, දීර්ඝස්වරයද; සංයොගපරං, සංයොගයා පරකොටඇති අක්ෂරයද; ගරුකනාමකං, ගුරුනම්වේයයි; වුත්තං, කියනලද්දේය; රස්සඤ්ච, හ්‍රස්වස්වරයද; අසංයොගපරං, සංයොගයා පරකොටනැති අක්ෂරයද; ලහුකව්හයං, ලඝුනමැයි; භාසිතං, කියනලද්දේය—

113 යං, යම් පූර්වපදයෙක්; පරපදෙන සහ, පරපද සහාසමග; සම්බන්ධිත්වාන, සම්බන්ධකොට; වුත්තං, කියනලද්දේද; තං, හේ; සම්බන්ධං, සම්බන්ධනම් වේ; යං, යම් පදයක්තෙම; පදච්ඡෙදං කත්වා, පදච්ඡෙදකොට; වුත්තං, කියනලද්දේද; වවත්ථිතං, (හේ) ව්‍යවස්ථිතනම් වේ—

114 කරණං, අක්ෂරොත්පත්තිස්ථානය; විස්සජ්ජෙත්වාන, විහිදුවා; විවටෙන මුඛෙන, විවෘතමුඛයෙන්; යං, යම් අක්ෂරයෙක්; වුච්චතෙ, කියනුලැබේද; තං, හේ; විමුත්තංඉති, විමුක්තයයි; විචක්ඛණා, පණ්ඩිතයෝ; කථයන්ති, කියත්—

——00——

115 අවණ්ණා චෙව කවග්ගා, හකාර කණ්ඨජා මතා.
ඉවණ්ණා චෙව චවග්ගා, යකාර තාලුජා මතා—

116 ටවග්ගා රළකාරා ච, මුද්ධජා පකාසිතා
තවග්ගා ලසකාරා ච, සත්ත දන්තජා ජායරෙ—

117 උවණ්ණා චෙව පවග්ගා, සත්ත ඔට්ඨිජා ජායරෙ
කණ්ඨතාලුභවෙකාරෙ, ඔකාරෙ කණ්ඨොට්ඨජො—

118 දන්තොට්ඨජො වකාරොතු, සිඛොනෙසං අනුක්කමො
නිග්ගහීතං පන එකං, නාසිකාය තු ජායති—

---

115 අවණ්ණාච එව, අවර්ණයද; කවග්ගහකාර, කවර්ගයහකාරය යනමොහුද; කණ්ඨජා, කණ්ඨයෙන්උපදනාහයි; මතා, දත්තාලද්දහුය; ඉවණ්ණාචඑව, ඉවර්ණයද; චවග්ගයකාර, චවර්ගය යකාරය යන මොහුද; තාලුජා, තල්ලෙන්උපදනාහයි; මතා, දත්තාලද්දහුය—

116 ටවග්ගා, ටවර්ගයද; රළකාරාච, රකාරළකාරයෝද; මුද්ධජා, මුදුනෙන්උපදනාහයි; පකාසිතා, ප්‍රකාශකරණලද්දහුය; තවග්ගා, තවර්ගයද, ලසකාරාච, ලකාර සකාරයෝද යන; සත්ත, අක්ෂරයෝසත්දෙන; දන්තජා, දනතයන්හි; ජායරෙ, උපදිත්—

117 උවණ්ණාචඑව, උවර්ණයද; පවග්ගා, පවර්ගය දයන; සත්ත, අක්ෂරයෝසත්දෙන; ඔට්ඨිජා, දෙතොලෙහි; ජායරෙ, උපදිත්; එකාරෙ, එකාරයතෙම; කණ්ඨතාලුජ භවො, ගෙලෙහිහාතල්ලෙහි උපදී; ඔකාරෙ, ඔකාරයතෙම; කණ්ඨොට්ඨජො, ගෙලෙහි හා දෙතොලෙහිඋපදී—

118 වකාරොතු, වකාරයතෙමවනාහි; දන්තොට්ඨජො, දත්හාදෙතොලින්උපදී; එසං, එවර්ණයන්ගේ අනුක්කමො, පිළිවෙළ; සිඛො, සිඛය; එකංනිග්ගහීතං පන, හුදකලාවූ නිග්ගහීතයතෙමවනාහි; නාසිකාය තු, නැහැයෙහිවනාහි; ජායති, උපදී—

—00—

119 පඤ්චමක්ඛර සඞ්ඛාතා, ඞඤණනමා පඤ්චිමෙ
සකසකට්ඨානිකා ච, නාසිකට්ඨානජාතිකා —

120 හකාරං පඤ්චමෙහෙව, අන්තට්ඨාහි ච සංයුතං
ඔරසන්ති වදන්තෙත්ථ, කණ්ඨජං තදසංයුතං —

ව්‍යඤ්ජනාදියාවට්ඨානවිනිච්ඡයො

121 කණ්ඨතාලොට්ඨදන්තාච, මුද්ධට්ඨානඤ්ච පඤ්චධා
තෙසුම කණ්ඨකට්ඨානං, කාකලට්ඨාන මුච්චතෙ —

---

119 පඤ්චමක්ඛරසඞ්ඛාතා, (වගී) පඤ්චමාක්ෂරයෝයි කියනලද; ඞඤණනමා, ඞකාර ඤකාර ණකාර නකාරම කාර යන; ඉමෙපඤ්ච, මේඅක්ෂරයෝපස්දෙන; සකසකට්ඨානිකාච, තමතමන්ගේස්ථානයෙහිඋපදින්නාහුද; නාසිකට්ඨානජාතිකා, නාසිකාස්ථානයෙහි උපදින්නාහුදවෙත් —

120 එත්ථ, මේ ස්ථානාක්ෂරයන්කියනප්‍රස්ථාවෙහි තොහොත් කණ්ඨාද්‍යක්ෂරයන් අතුරෙහි; පඤ්චමෙහිඑව, වගීපඤ්චමහයි කියනලද ඞඤණනමයනමොවුන්හාද; අන්තට්ඨාහිච, අන්තස්ථනයි කියනලද යරලව යනමොවුන් හාද; සංයුතං, යෙදුනාවූ; හකාරං, හකාරයා; ඔරසංඉති, ('බ්‍රහ්මචරියං ජිව්හා කාරෙ' යනආදියෙහිමෙන්) උරස්ථානයෙහි උපදනේයයි; වදන්ති, (ආචාර්‍ය්‍යවරයෝ) කියත්, තදසංයුතං, ඒවගීපඤ්චමඅන්තස්ථයන්හා යුක්තනූවූ හකාරයා; කණ්ඨජං, කණ්ඨස්ථානයෙහිඋපදීයයිකියත් —

ව්‍යඤ්ජනාදියාවස්ථානවිනිශ්චයයි

(දැන් ස්ථානවිශෙෂ දක්වනුපිණිස ''කණ්ඨතාලොට්ඨ දන්තාච'' යන ආදිය කිය)

121 කණ්ඨ, ගෙලය; තාලු, තල්ලය; ඔට්ඨ, තොලය; දන්තාච, දත්යයනමොහුද; මුද්ධට්ඨානංච, මූර්ධස්ථානයදයි; පඤ්චධා, පස්පරිද්දකින් වේ, තෙසුම, ඔවුන්අතුරෙහුද; කණ්ඨට්ඨානං, කණ්ඨස්ථානනම්; කාකලට්ඨානං; කාකලස්ථානයයි; උච්චතෙ, කියනුලැබේ —

—— 00 ——

122 කාකලට්ඨානකංනාම, උපසගට්ඨාන මුච්චතෙ
එතංච උපසග්ගට්ඨානං, යො කණ්ඨමණී උච්චතෙ —

123 කණ්ඨෙඋප්පන්නවණ්ණානං, තදෙව කරණං භවෙ
ඨානසඤ්ඤා කරණඤ්ඤෙව, සම එතෙ විසුං භවෙ —

124 ජිව්හාමූලෙන ආසන්නෙන, ජිව්හාය උපරිතලෙ
උප්පජ්ජමානවණ්ණානං, මජ්ඣංහිකරණම්භවෙ —

125 මුඛබ්භන්තරමුඛම්හි, මුඛට්ඨානං පකාසිතං
කරණංතජ්ජාතානං, ජිව්හොපග්ගනහිලක්ඛිතං —

---

122 කාකලට්ඨානකංනාම, කාකලස්ථානනම්; උපසග්ගට්ඨානං, උපසගස්ථානයයි; උච්චතෙ, කියනුලැබේ; යො, යම්උපසගප්‍රදෙශයෙක්; කණ්ඨමණී, කණ්ඨමාණික්‍යයයි; උච්චතෙ, කියනුලැබේද; එතංඋපසගට්ඨානංච, මේඋපසගස්ථානයද (කණ්ඨස්ථානනම්)වේ—

(දන්ත ස්ථානකරණයන්ගේ නානත්වය ප්‍රකාශකරණුපිණිස "කණ්ඨෙඋප්පන්නවණ්ණානං" යන ආදිය කීය)

123 කණ්ඨෙ, ගෙලෙහි; උප්පන්නවණ්ණානං, උපන්අක්ෂරයන්ට; තංඑව, ඒගෙලම; කරණංභවෙ, කරණවන්නේය; එතෙ, මේකණ්ඨස්ථානයෙහි; ඨානංච, ස්ථානයද; කරණඤ්ඤෙව, කරණයද; විසුංනභවෙ, වෙන්නොවන්නේය—

124 ජිව්හාමූලෙන, දිවමුලින්; ආසන්නෙන, ආසන්නවූ; ජිව්හාය, දිවගේ; උපරිතලෙ, උඩුතෙලෙහි; උප්පජ්ජමානවණ්ණානං, උපදිනවර්ණයන්ට; මජ්ඣංහි, (දිව) මැද තැන්; කරණං භවෙ, කරණවන්නේය—

125 මුඛබ්භන්තරමුඛම්හි, මුඛයාගේඇතුළතමුදුනෙහි; මුඛට්ඨානං; මුඛස්ථානය; පකාසිතං, කියනලද්දේය; තං, ඒමුඛස්ථානයෙහි; ජාතානං, උපන්නාවූඅක්ෂරයන්ට; ජිව්හොපග්ගං, දිවඅගලඟ; කරණංඉති, කරණයයි; ලක්ඛිතං, දන්නාලද්දේය—

126 උපරිදන්තට්ඨානස්ස, පන්ති ගබ්භන්තරම්හි ච
තත්ථ උප්පන්නවණ්ණානං, ජිව්හග්ගං කරණං භවෙ—

127 තාලුම්හි මුද්ධනි දන්තෙ, අසම්මිස්සකතො පිව
ඨානත්තයේ කරණඤ්ච, විසුං තිස්සො පවත්තති—

128 ඔට්ඨට්ඨානම්හි සම්භූත, වණ්ණානං කරණං පන
ඔට්ඨට්ඨානමනඤ්ඤන්ති, සද්දසත්ථප්පකාසිතං—

129 විවටමුබ්බිහන්තරං, පණව මම්මකං විය
තංසම්බන්ධාව යා ලෙඛා, සා ඉහ නාසිකා මතා—

---

126 දන්තට්ඨානස්ස, දන්තස්ථානයාගේ; උපරි පන්තිනා, උඩුපෙළෙහි; අබ්භන්තරම්හිච, අභ්‍යන්තරයෙහිද (දන්තස්ථානයෙහි) තත්ථ, ඒ දන්තස්ථානයෙහි; උප්පන්නවණ්ණානං, උපන්අක්ෂරයන්ට; ජිව්හග්ගං, දිවඅග; කරණං භවෙ, කරණ වේ—

127 තාලුම්හි, තල්ලෙහිද; මුද්ධනි, මුදුනෙහිද; දන්තෙ, දතෙහිද; (යන) තිස්සු, තුන්හැත්හි; ඨානංච, ස්ථානයද; කරණංචඑව, කාරණයද; අසම්මිස්සකතො අපිව, අසම්මිශ්‍රහෙයින්ද; විසුං, වෙන්ව; පවත්තති, පවතී—

128 ඔට්ඨට්ඨානම්හි, ඕෂ්ඨස්ථානයෙහි; සම්භූතවණ්ණානං, උපන්අක්ෂරයන්ට; කරණංපන, කාරණයවනාහි; ඔට්ඨට්ඨානමනඤ්ඤංඉති, ඕෂ්ඨස්ථානයෙන්අනිකක්නැත්තේයයි; සද්දසත්ථෙ ඉති, ශබ්දදන්නවුන්විසින්; පකාසිතං ප්‍රකාශකරනලද්දේය—

129 විවටමුබ්බිහන්තරං, විවෘතවූමුඛයාගේඇතුලත; පණවං මම්මකං විය, පණාබෙරසමක්මෙනි; තංසම්බන්ධාව, ඒ(පණාබෙරසමවැනි) මුඛාභ්‍යන්තරයසම්බන්ධවූද; යාලෙඛා, යම්රෙඛාවක්වේද; සා, ඒරෙඛානොමෝ; ඉහ, මේස්ථානවිනිශ්චයෙහි; නාසිකා, නාසිකායයි; මතා දන්නාලද්දීය—

130 යෙ වණ්ණා තත්‍ථ ජායන්ති, නාසිකණ්ඨජා ඤාතා
තදෙව කරණං තෙසං, වණ්ණානං සමුපලක්ඛිතං—

131 වණ්ණුච්චාරණ උස්සාහො, පයතනං මුදීරිතං
සංවුතං විවටඤ්චාපි, ඵුසිතං ඊසංඵුට්ඨකං—

132 සංවුතත්තං මකාරස්ස, විවටඤ්ච තථා පරං
අවසෙස සරානඤ්ච, සහකාරාන මෙව ච—

133 පයනානඤ්ච වග්ගානං, ඵුසිතන්ති පකාසිතං
යරලවා චසෙසානං, ඊසං ඵුට්ඨං පකාසිතං—

---

130 තත්‍ථ, ඒ නාසිකාස්ථානයෙහි, යෙ වණ්ණා, යම් අක්ෂරකෙනෙක්; ජායන්ති, උපදිද්ද; (ඒ අක්ෂරයෝ) නාසිකණ්ඨජා, නාසිකාස්ථානයෙහිඋපදනාහයි; ඤාතා, දත් නාලද්දාහු; තෙසංවණ්ණානං, ඒ අක්ෂරයන්ට; තංඑව, ඒ නාසිකාස්ථානයම; කරණං, කරණයයි; උපලක්ඛිතං, දන්නාලද්දේය—

131 වණ්ණුච්චාරණඋස්සාහො, අක්ෂරයන්ගේ උච්චාරණයකිරීමෙන් උත්සාහකිරීම; පයතනං, ප්‍රයත්නයයි; උදීරිතං, කියනලද්දේය; සංවුතං, සංවෘතයද; විවටංච අපි, විවෘතයද; ඵුසිතං, ස්පෘෂ්ටයද, ඊසංඵුට්ඨකං, ඊෂත්ස්පෘෂ්ටයදවේ—

132 සංවුතත්තං, සංවෘතබව; අකාරස්ස, අකාරයාහට වේ; තථා, එසේම; අපරං, අන්‍යවූ; විවටංච, විවෘතයද; අවසෙස සරානංච, සෙසුස්වරයන්ටද; සහකාරානංඑව, සකාරහකාරයන්ටද වේ—

133 වග්ගානං, වර්ගයන්ට; පයනානංච, ප්‍රයත්නනම්; ඵුසිතංඉති, ස්පෘෂ්ටයයි; පකාසිතං, ප්‍රකාශකරණලද්දේය; යරලවා චසෙසානං, සෙසු යකාර රකාර ලකාර වකාරයන්ට; ඊසංඵුට්ඨං, ඊෂත්ස්පෘෂ්ටයයි, පකාසිතං, ප්‍රකාශකරණලද්දේය—

—00—

134 සංවුතත්තං අකාරස්ස, පයතන සභාවතො
සවණ්ණසඤ්ඤාසිද්ධත්ථං, විවටත්තං පඨියතෙ—

135 තුල්‍යප්පයතනට්ඨානා, දීඝරස්සා සවණ්ණකා
දීඝවය විරස්සාව, සවණ්ණාව පවුච්චරෙ—

136 පදභෙදො පදච්ඡෙදො, පදසන්ධිච සංහිතා
සා අයං පකතිනාම, සමාහාරොඅයං තිච—

137 සමොධානඤ්ච සංසග්ගො, පදපූරි සිලිට්ඨතා
අක්ඛරානං සමවායො, පදාන මනුපුබ්බනා—

---

134 සංවුතත්තං, සංවෘතබව; පයතනසභාවතො, ප්‍රයත්නස්වභාවයෙන්; අකාරස්ස, අකාරයාහටවේ; සවණ්ණසඤ්ඤාසිද්ධත්ථං, සවර්ණසංඥාවගේ සිද්ධියපිණිස; විවටත්තං, විවෘතබව; පඨියතෙ, කියනුලැබේ—

135 දීඝරස්සා, දීර්ඝහ්‍රස්වයෝ; තුල්‍යප්පයතනට්ඨානා, සමානවූප්‍රයත්නස්ථානඇතිබැවින්; සවණ්ණකා, සවර්ණයෝනම්වෙත්; දීඝවයම්රස්සාච, දීර්ඝයන්දෙදෙනහාහ්‍රස්වයෝදෙදෙනද; සවණ්ණාඑව, සවර්ණයෝමයයි; පවුච්චරෙ, කියනුලැබෙත්—

136 පදභෙදො, (පූර්වාපර)පදයන්ගේ භෙදයද; පදච්ඡෙදො, (යථොක්ත) පදයන්ගේසිඳීමද; පදසන්ධිච, පදයන්ගේසන්ධියද; සංහිතා, (පදයන්ගේ) එක්වපැවැත්මද යන; සා අයං, ඒ මේ; පකතිනාම, ප්‍රකෘතිනම්වේ; අයං, මේනමේ; සමාහාරොතිච, සමාහාරනමැයිකියාද වේ;

(දුර්ලභානිර්දෙශයෙහි පදභාජනීයාංශයෙන් සන්ධි විභාගයදක්වනුපිණිස "සමොධානඤ්ච" යනාදියකීය)

137 සමොධානඤ්ච, (පූර්වාපරපදයන්ගේ) එක්වපැවැත්මද; සංසග්ගො, (පූර්වාපරපදයන්ගේ) එක්වීමද; පදපූරි, පදයන්ගේ (විච්ඡේදකොට) පිරීමද; සිලිට්ඨතා, (පූර්වාපරපදයන්ගේ) සිලිටුබවද; අක්ඛරානං, අක්ෂරයන්ගේ; සමවායො, සමූහයද; පදානං, පදයන්ගේ; අනුපුබ්බනා, (සන්ධිභාවයෙන්) පිළිවෙළබව වේ—

138 සංහිතේකපදෙ නිච්චා, නිච්චා ධාතුපසග්ගිකෙ
සමාසෙපි තථා නිච්චා, සා අඤ්ඤත්‍ථ විභාසියා—

139 පුබ්බාපර පදන්තානං, අභිසන්තික සංහිතා
වණ්ණකාලබ්‍යවධානා, භාවතො පරිදීපිතා—

140 සරන්තං වා සරෙ සන්ධි, සරසන්ධීති වුච්චතෙ
සරෙම බ්‍යඤ්ජනෙ පුබ්බ, නිසෙධොපි නිසෙධනං—

141 කෙචි නිමිත්තපධානං, කෙචි කාරියපධානකං
වදන්ති මතභෙදෙන, නෙති වුත්තං විචාරියං—

---

138 එකපදෙ, (විභක්ත්‍යන්තවූ) එක්පදයෙහි; සංහිතා, සංහිතානොමෝ; නිච්චා, නිත්‍යවන්නීය; ධාතුපසග්ගිකෙ, ධාතූපසර්ගයන්ගේ යුක්තස්ථානයෙහි; (සංහිතානොමෝ) නිච්චා, නිත්‍යවන්නීය; තථා, එසේම; සමාසෙපි, (ආචාර්‍ය්‍යයාවිසින්දක්වනලද) සමාසයෙහිද; නිච්චා, නිත්‍යවන්නීය; සා, ඒසංහිතානොමෝ; අඤ්ඤත්‍ථ (කියනලද්දවුන්කෙරෙන්) පිටත්තන්හි; විභාසියා, විකල්පාඛ්‍යයෙන්යුක්තවන්නීය—

(දැන් සන්ධිලක්ෂණ ප්‍රකාශකරණුපිණිස "පුබ්බාපර පදන්තං" යන ආදිය කීය)

139 පුබ්බාපරපදන්තානං, පූර්වාපරපදයන්ගේවනාහි; අභිසන්තිකසංහිතා, ඉතාසමීපවූසංහිතානොමෝ; වණ්ණකාලබ්‍යවධානාභාවතො, වර්ණව්‍යවධාන කාලව්‍යවධාන යන්ගේනැතිහෙයින්; පරිදීපිතා, කියනලද්දීය—

140 සරන්තංවා, ස්වරයන්ගේහෝ; සරෙ (වා) ස්වරපර නිමිත්තනෝ;(පැවති)සන්ධි, සන්ධිනමෙ; සරසන්ධීති, ස්වරසන්ධීයයි; වුච්චතෙ, කියනුලැබේ; සරෙම, ස්වරයාපරකල්හිද; බ්‍යඤ්ජනෙ,(ම) ව්‍යඤ්ජනයාපරකල්හිද; පුබ්බනිසෙධොඅපි, පූර්වකාර්‍ය්‍යයාගේවැලක්වීමද; නිසෙධනං, ප්‍රතිෂෙධසන්ධිනම්වේ—

141 කෙචි, කිසිආචාර්‍ය්‍යකෙනෙක්; නිමිත්තපධානං නිමිත්තප්‍රධානකොටද; කෙචි, කිසිආචාර්‍ය්‍යකෙනෙක්;

142 බ්‍යඤ්ජනෙබ්‍යඤ්ජනානම්පි සන්ධිබ්‍යඤ්ජනසන්ධිච
උභාපි දස්සන මයං, යථා පුබ්බං විචාරියං —

143 සරබ්‍යඤ්ජනනිමිත්තෙන, කාරි නිග්ගහිතං සියා
සන්ධි සො නිග්ගහීතන්ති, සද්දසත්ථෙ පකාසිතං —

144 සඤ්ඤාවිධානං සරසන්ධි සන්ධි
නිසෙධනං බ්‍යඤ්ජනසන්ධි සන්ධි
යො නිග්ගහීතස්ස ච සන්ධිකප්පො
සුනිච්ඡයො සො හි මයෙත්ථ වුත්තො —

---

කාරිප්පධානකං, කාර්‍ය්‍යප්‍රධානකොටද; මතභෙදෙන, අභිප්‍රායවිශෙෂයෙන්; වදන්ති, (සන්ධිවිභාගය) කියත්; තෙහි, ඒආචාර්‍ය්‍යයන්විසින්; වුත්තං, කියනලදවචනය; විචාරියං, පරීක්ෂාකටයුතු —

142 බ්‍යඤ්ජනෙ, බ්‍යඤ්ජනයාපරකල්හිද; බ්‍යඤ්ජනානංඅපි, බ්‍යඤ්ජනයන්ගේද; සන්ධි, සන්ධිතෙම; බ්‍යඤ්ජනසන්ධිච, බ්‍යඤ්ජනසන්ධිමවේ; උභෑපි, මේබ්‍යඤ්ජනසන්ධිවිනිශ්චයෙන්ද; දස්සනමයං, මතභෙදදෙක; යථාපුබ්බං, පෙරමෙන්; විචාරියං, පරීක්ෂාකටයුතු —

143 සරබ්‍යඤ්ජනනිමිත්තෙන, ස්වරනිමිත්තහා බ්‍යඤ්ජනනිමිත්තඇතිකල්හි; කාරි, කාර්‍ය්‍යතෙම; නිග්ගහිතං සියා, නිග්ගහිතයවේද; සොසන්ධි, ඒසන්ධිතෙම; නිග්ගහීතංඉති, නිග්ගහීතසන්ධියයි; සද්දසත්ථෙ, ශබ්දශාස්ත්‍රයෙහි; පකාසිතං, ප්‍රකාශකරණලද්දේය —

144 සඤ්ඤාවිධානං, සංඥාවිධානයද; සරසන්ධි, ස්වරසංහිතාද; නිසෙධනංසන්ධි, ප්‍රතිෂෙධසංහිතාද; බ්‍යඤ්ජනසන්ධි, බ්‍යඤ්ජනසංහිතාද; නිග්ගහීතස්සසන්ධිච, නිග්ගහීතයාසම්බන්ධිවූසංහිතාදයන; යො, යම් (පඤ්චප්‍රකාර) සන්ධියෙක්; සන්ධිකප්පෙ, සන්ධිකල්පයෙහි; වුත්තො, (කාත්‍යායන ස්ථවිරයන් වහන්සේ විසින්) කියනලද්දේද, සො, ඒ (පඤ්චප්‍රකාර) සන්ධිතෙම; සුනිච්ඡ

——00——

145 සන්ධිං පඤ්චවිධං එතං, සමාසේන හිතා මතා
සරබ්‍යඤ්ජන සන්ධීනං, වුත්තසන්ධිවසේන ච—

කාරණාදි යාව සන්ධි විනිච්ඡයො

# සන්ධි කාරිකා සමත්තා

146 අථාපරං පවක්ඛාමි, නාමකප්පස්ස කාරිකං
අත්ථාභිමුඛනාමත්තා, අත්ථානි මත්ථනාමතා—

යාති, සුන්දරවිනිශ්චයනැත්තේම; එතු, මෙසන්ධිපරිච්ඡේදයෙහි; මයා, මාවිසින්; (වුත්තො, කියනලද්දේය).

145 එතංපඤ්චවිධංසන්ධිං, මෙපස්වැරුම්වූ සන්ධිය; සරබ්‍යඤ්ජනසන්ධීනං, ස්වරසන්ධි බ්‍යඤ්ජනසන්ධීන්ගේ වශයෙන්ද; වුත්තසන්ධිවසෙනච; වෘත්තසන්ධියගේවශයෙන්ද; සමාසෙන, සංක්ෂෙපකොට; හිතා, තුන්පරිද්දකින්; මතං, දත්නාලදී—

කරණාදි යාව සන්ධි විනිශ්චයයි

# සන්ධිකාරිකාතොමෝ

ස මා ප් ත යි.

(මෙසේ සන්ධි කාරිකාව දක්වා දුන් නාමකාරිකාව දක්වනුපිණිස "අථාපරං" යන ආදිය කීය)

146 අථ, ඉක්බිත්තෙන්; අපරං; අන්‍යවූ, නාමකප්පස්සකාරිකං, නාමකල්පයාගේකාරිකාව; පවක්ඛාමි, කියන්නෙමි; අත්ථාභිමුඛනමනා, අර්ථයට අභිමුඛවනැමෙනහෙයින්ද; අත්ථානි, නමාකෙරෙති; අත්ථනාමතාව, අර්ථයනම්වනහෙයින්ද—

147 නාමං එකවිධං වුත්තං, ද්විධා අන්වත්ථරුළ්හිතො
තිවිධා පුම්ලිඞ්ගිත්ථී, නපුංසක විභාගතො —
148 සාමඤ්ඤ ගුණ ක්‍රියා යදි, ච්ඡාදීහි චතුධා මතං
ජාති ගුණ ක්‍රියා දබ්බ, නාමෙහි පඤ්චධා මතං —
149 ඉත්ථිලිඞ්ගඤ්ච පුල්ලිඞ්ගං, නපුංසක ලිඞ්ගිකං
තිලිඞ්ගඤ්ච අලිඞ්ගඤ්ච, නාමිකං ඡබ්බිධා මතං —
150 සුඩනාමං විලිඞ්ගඤ්ච, තිලිඞ්ගඤ්ච අලිඞ්ගිකං
සමාසං තද්ධිතඤ්චෙව, කිතනාමඤ්ච සත්තධා —
151 අවණ්ණිවණ්ණුවණ්ණන්ත, එකාරපකත්‍යන්තතො
බ්‍යඤ්ජනං අන්ත පකති, භෙදෙන ඡබ්බිධං මතං —

---

147 නාමං, නාමයතෙම; එකවිධං, එක්වැදෑරුම්යයි; වුත්තං, කියනලදී; අන්වත්ථරුළ්හිතො, අන්වර්ථරූඪිවශයෙන්; ද්විධා, දෙපරිද්දකින්වේ; පුම්ලිඞ්ගිත්ථීනපුංසක විභාගතො, පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග නපුංසකලිඞ්ග විභාගයෙන්; තිවිධා, තුන්පරිද්දකින්වේ —

148 සාමඤ්ඤ, සාමාන්‍යනාමය; ගුණ, ගුණනාමය; ක්‍රියා, ක්‍රියානාමය; යදිච්ඡාදීහි, යදිච්ඡානාමය යනාදී වශයෙන්; චතුධා, සතරපරිද්දකින්, මතං, දත්තාලදී; ජාති, ජාතිනාමය; ගුණ, ගුණනාමය; දබ්බ, ද්‍රව්‍යනාමය; නාමෙහි, නාම නාමය යනමොවුන්ගේ වශයෙන්; පඤ්චධා, පස්පරිද්දකින්; මතං, දත්තාලද්දේය —

149 ඉත්ථිලිඞ්ගංච, ස්ත්‍රීලිඞ්ගයද; පුල්ලිඞ්ගං, පුංලිඞ්ග යද; නපුංසකං, නපුංසකලිඞ්ගයහා; ලිඞ්ගිකං, ලිඞ්ග යද; තිලිඞ්ගංච, ත්‍රිලිඞ්ගයද; අලිඞ්ගංච, අලිඞ්ගයදයි; නාමිකං, නාමයතෙම; ඡබ්බිධා, සපරිද්දකින්; මතං, දත්තාලදී —

150 සුඩනාමං, ශුඩනාමයද; විලිඞ්ගංච, විලිඞ්ගනාමයද; තිලිඞ්ගංච, ත්‍රිලිඞ්ගනාමයද; අලිඞ්ගිකං, අලිඞ්ගනාමයද; ස සමාසං, සමාසනාමයද; තද්ධිතංචෙව, තද්ධිතනාමයද; කිත නාමංච, කිතකනාමයදයි; සත්තධා, සත්පරිද්දකින්වේ—

151 අවණ්ණ, අවර්ණාන්ත ප්‍රකෘතිය; ඉවණ්ණ, ඉවර්ණාන්තප්‍රකෘතිය; උවණ්ණන්ත, උවර්ණාන්ත ප්‍රකෘතිය; එකාරපකත්‍යන්තතො, එකාරාන්ත ප්‍රකෘතිය යන මොවුන්ගේ වශයෙන්ද; බ්‍යඤ්ජනංඅන්ත පකතිභෙදෙ

——00——

152 නාම අන්වත්ථකංනාම, අත්ථස්ස අනුරූපතො
සකඅත්ථ සභාවඤ්ච, පරිදීපෙන්ත වත්තති—

153 සද්දත්ථ මනපෙක්ඛිත්වා, නිමිත්ත විරහෙ පන
අත්ථෙ සද්දස්ස උප්පත්ති, රූළ්හනාමන්ති වුච්චති—

154 ලීනමඞ්ග මිදං ලිඞ්ගං, ලීනත්ථස්සච දීපනං
විසදා විසදාකාර, රහිතා කාර සාධකං—

155 සාමඤ්ඤං ලිඞ්ගවොහාරං, පුම්ත්ථිනාදි විසෙසනං
රුක්ඛො මාලා ධනම්ති, ලිඞ්ගත්තයුපලක්ඛණං—

156 තෙපිටක නරවර, වචනස්සූපකාරකං
අවිපරීත වොහාරං, සභාවක නිරුත්තියා—

---

න, ව්‍යඤ්ජනානන ප්‍රකෘතිභෙදයෙන්ද; අත්ථවිධං, අටවැදෑරුම්යයි; මතං, දත්නාලද්දේය—

152 නාමයී(පඤ්චවිධාදි)නාමවිශෙෂයන්අතුරෙන්; අන්වත්ථකංනාම, අන්වර්ථනාමනම්; අත්ථස්ස, ශබ්දාර්ථයට; අනුරූපතො, සුදුසුපරිද්දෙන්, සකඅත්ථසභාවංච, ස්වාර්ථස්වභාවද; පරිදීපෙන්තං, ප්‍රකාශකරන්නේ; වත්තති, පවතී—

153 සද්දත්ථං, ශබ්දාර්ථය; අනපෙක්ඛිත්වා, නොබලා; නිමිත්තවිරහෙ, (ශබ්දප්‍රවෘත්ති) නිමිත්තෙන් තොරවූ; අත්ථෙපන, අර්ථයෙහිවනාහි; සද්දස්ස, ශබ්දයාගේ; උප්පත්ති, ඉපැද්ම; රූළ්හනාමංඉති, රූඪිනාමයයි; වුච්චති, කියනලැබේ—

154 ඉදං, මේ; ලීනං අඞ්ගං, අප්‍රකටවූ අවයවය; ලිඞ්ගං ලිඞ්ගනම්වේ; ලීනත්ථස්ස, අප්‍රකටවූ අර්ථය; දීපනංච, ප්‍රකාශකරන්නේදවේ; විසද, දෘශ්‍යාකාරය; අවිසදාකාර, අදෘශ්‍යාකාරය; උභයරහිතාකාරසාධකං, උභයරහිතාකාරය යනමොවුන් නිපදවන්නේදවේ—

155 ලිඞ්ගවොහාරං, ලිඞ්ගප්‍රඥප්තිය; සාමඤ්ඤං, සාමාන්‍යවූ; පුම්ත්ථිනාදිවිසෙසනං, පුංස්ත්‍රීනාදීන්ගේ විශෙෂය වේ; රුක්ඛොමාලාධනංඉති, රුක්ඛොමාලා ධනංයනු; ලිඞ්ගත්තය, ලිඞ්ගත්‍රයට; උපලක්ඛණං උදාහරණයි—

156 සභාවකනිරුත්තියා, ස්වභාවනිරුක්තියගේ; අවිපරීතවොහාරං; විපරීතනුවූ ව්‍යවහාරය; තෙපිටකනරවර වචනස්ස, ත්‍රිපිටක බුද්ධවචනයට; උපකාරකං, වහල්වේ—

—00—

157 සාමාගධී මූලභාසා, නරා යායාදිකප්පිකා
බ්‍රහ්මාණෝ චස්සුතාලාපා, සම්බුද්ධා චාපි භාසරෙ—
158 යං සාමඤ්ඤාය සම්භූතං, මහාසම්මතආදිකං
නාමං තු සාමඤ්ඤනාමං තං. දීපෙතා චරියාසභො—
159 තථේව ගුණනාමම්පි, නීලපීතවමාදිකං
තථේව ක්‍රියානාමම්පි, කාරකපචකාදිකං—
160 තථා යදිච්ඡානාමම්පි, තිස්සපුස්සව මාදිකං
චතුබ්බිධං පනේතම්පි, නාමභේදං පකාසිතං—
161 භින්නෙසෙව භින්නධිසඳා, වත්තන්තෙ සබලාදිසු
සබලෙනෙව සාජාති, මාලා සුත්තංව අන්විතා—

---

157 ආදිකප්පිකා, ආදිකල්පයෙහි උපන්නාවූ; නරා මනුෂ්‍යයෝද; බ්‍රහ්මාණෝච, (රූපාවචර) බ්‍රහ්මයෝද; අස්සුතාලාපා, නොඅසනලද වචනඇති ළදරුවෝද; සම්බුද්ධාචඅපි, සම්‍යක්සම්බුදුවරයෝද; යාය, යම්භාෂාවකින්; භාසරෙ, කථාකෙරෙද්ද; සා, ඒ භාෂාතොමෝ; මාගධී, මගදරට උපන්නාවූ; මූලභාසා, මූලභාසානම්වේ—

158 මහාසම්මතආදිකං, මහාසම්මතආදිවූ; යං, යම් නාමයෙක්; සාමඤ්ඤාය, (ජන) සම්මුතියෙන්; සම්භූතං, වූයේද, තංතු, ඒනාමයවනාහී; සාමඤ්ඤනාමංඉති, සාමාන්‍යනාමයයි; ආචරියාසභො, ආචාර්‍යොත්තමතෙම; දීපෙති, ප්‍රකාශකෙරේ—

159 නීලපීතවමාදිකං, නීලපීතාදිනමේආදිවූ; ගුණනාමං අපි, ගුණනාමයද; තථාඑව, එසේමය; කාරකපචකාදිකං, කාරකපචකාදිවූ; ක්‍රියානාමංඅපි, ක්‍රියානාමයද, තථාඑව, එසේමය—

160 තිස්සපුස්සවමාදිකං, තිස්සය පුස්සය යනමේ ආදිවූ; යදිච්ඡානාමංඅපි, යදිච්ඡානාමයද; තථා, එසේය; එතංඅපි නාමභේදංපන, මෙම නාමභේදයවනාහී; චතුබ්බිධං, සිවුවැදෑරුම්යයි; පකාසිතං, ප්‍රකාශකරණලදී—

161 භින්නෙසු, නොයෙක් භෙදයෙන් බිඳුනාවූ; සබලාදිසු, සබලාදිපදයන්හි, අභින්නාධිසඳා, එකාකාර වූ ඕබිශබ්දයෝදෙදෙන, වත්තන්තෙ, පවතිද්ද; සබලෙනෙව, සබලය කරණකොටගෙණම; සා, ඕතොමෝ; ජාති. ජාතිනම්වේ; මාලා, මාලාතොමෝ; සුත්තං, හුය; අන්විතාව, අනුවගියාමෙති—

——00——

162 ජාති සද්දා සභාවාදී, ගොඅස්සා එවමාදිකා
මහාසාමඤ්ඤෙකදෙස, සාමඤ්ඤතො විධා මතා
163 කත්තාදි කාරකග්ගාම, නිබ්බත්තො අදබ්බසම්මතො
පදත්ථො කම්මකත්තුද්වයෙට්ඨො, ක්‍රියාසඞ්ඛ්‍යාති ක්‍රියා මතා--
164 ක්‍රියත්ථවාචකා සද්දා, ගතතාකතතාතිආදිකා
වුච්චන්ති ක්‍රියා නාමන්ති, අනෙකවිධ භෙදතො—
165 දබ්බාසයො තතො භින්නො, නස්සා වගම ආසයො
විපරිවත්ත ධම්මාව, නිග්ගුණො ඉච්ඡිතො ගුණො
166 ගුණත්ථවාචකා සද්දා, කණ්හසුක්කා වමාදිකා
වුච්චන්ති ගුණ නාමන්ති, ගුණත්ථ පරදීපකා—

---

192 ජාතිසද්දා, ජාතිශබ්දයෝ; සභාවාදී, සභාවධම්ම යන ආදිශබ්දයෝද; ගොඅස්සා එවමාදිකා; ගොඅශ්ව යන ආදිශබ්දයෝත් යන; මහාසාමඤ්ඤ එකදෙස සාමඤ්ඤතො, මහාසාමාන්‍යය එකදෙශ සාමාන්‍යය යන මොවුන්ගේවශයෙන්; විධා, දෙපරිද්දකින්; මතා, දත් නාලද්දහුය—

163 කත්තාදි කාරකග්ගාම. කර්තෘ ආදි කාරක සමූහයෙන් නිබ්බත්තො, උපන්නාවූ; අදබ්බසම්මතො, අද්‍රව්‍යභාවයෙන් සම්මතකරණලද; කම්මකත්තුද්වයෙට්ඨො, කර්ම කර්තෘදෙදෙනාකෙරෙහි පිහිටියාවූ; පදත්ථො, පදාර්ථයතෙම, ක්‍රියාසඞ්ඛ්‍යාති, ක්‍රියාදත්තවුත්විසින්; ක්‍රියා, ක්‍රියායයි; මතා. දත්නාලද්දීය—

164 ගතතාකතතාඉති, ගතතකතතයන; ආදිකං, මෙආදිවූ; ක්‍රියත්ථවාචකාසද්දා, ක්‍රියාර්ථවාචක ශබ්දයෝ; අනෙකවිධභෙදතො නොයෙක්ප්‍රකාර භෙදයෙන්; ක්‍රියනාමංඉති, ක්‍රියානාමයයි; වුච්චන්ති, කියනුලැබෙති—

165 දබ්බාසයො, ද්‍රව්‍ය ඇසුරුවූයේද, තතොභින්නො, එද්‍රව්‍යයෙන් භින්නවූයේද; නස්ස, ඒද්‍රව්‍යයාගේ; අවගමාසයො, දැනීමට කාරණවේද; විපරිවත්තධම්මාව, පෙරළෙනසුලුවේද; නිග්ගුණො, ගුණ (විශෙෂ) නැත්තේද; ගුණො, ගුණනමැයි; ඉච්ඡිතො, (පණ්ඩිතයන්විසින්) කැමතිවනලද්දේය—

166 කණ්හසුක්කාවමාදිකා, කණ්හසුක්කායන මේආ

——00——

167 යංයංවිසෙසතෙකිස්සුචි, තංතං දබ්බන්ති වුච්චතෙ
ජාත්‍යාදිනොප්‍යනො නාදි, දබ්බත්ත මුපකප්පතෙ-

168 දබ්බත්ථවාචකා සද්දා, ගුණවා ධනවාදිකා
වුච්චන්තෙ දබ්බනාමන්ති, දබ්බත්ථපරිදීපනා—

169 සඤ්ඤාරූපෙන සඤ්ඤත්තා, කොචි සද්දෙ විධීයතෙ
නාමන්ති තං යථා චිත්තො, නාමසද්දොව තද්ධනී—

170 අත්ථවාචක සම්බන්ධා, සන්ති යෙ වත්තුකා යදි
සම්බන්ධෙනතා නිබ්බත්තා, තතෙනත්ථ ව්‍යත්තහෙතුකා

---

දිවු; ගුණත්ථවාචකාසද්දා, ගුණාර්ථවාචක ශබ්දයෝ; ගුණත්ථපරිදීපනා, ගුණාර්ථය ප්‍රකාශකරණහෙයින්; ගුණනාමංඉති, ගුණනාමයයි; වුච්චතෙ, කියනුලැබේ;—

167 යංයංකිස්සුචි, යම් යම්කිසිවස්තුවෙක්; විසෙසතෙ වෙසෙසනුලැබේද; තංතං, ඒ ඒ වස්තුතෙම; දබ්බංඉති, ද්‍රව්‍යයයි; වුච්චතෙ, කියනුලැබේ. අනො, එහෙයින්; ජාත්‍යාදීනොඅපි, ජාතිආදිහුගේද; නාදි, එබඳුවූ; දබ්බත්තං, ද්‍රව්‍යබව; උපකප්පතෙ, කල්පනාකරණුලැබේ—

168 ගුණවා ධනවාදිකා, ගුණවත්තු ධනවත්තුයන ඈදිවූ; දබ්බත්ථවාචකා, ද්‍රව්‍යාර්ථවාචකවූ; සද්දා, ශබ්දයෝ; දබ්බත්ථපරිදීපනා, ද්‍රව්‍යාර්ථය ප්‍රකාශකරණහෙයින්; දබ්බනාමංඉති, ද්‍රව්‍යනාමයයි; වුච්චතෙ, කියනුලැබේ—

169 සඤ්ඤාරූපෙන, නාමස්වභාවයෙන්, සඤ්ඤත්තා, දන්නුහෙයින්; කොචි, (වෙන්නොකරණලද රූපවිශෙෂඇති) කිසිපදාර්ථයෙක්; සද්දේවිධියතෙ, නම්ඇත්තේ කරණුලැබේද, නාමංඉති, (ඒ) නාමයයි; (කියනලදී) තං යථා, ඒනාමයකෙසේද? චිත්තො, චිත්‍රශබ්දය නාමයවේ; තද්ධනී. ඒ චිත්‍ර යන පදය වාචකවූ ධනිශබ්දයෙමි; නාමසද්දොව, නාමශබ්දනමුදුවේ—

170 අත්ථවාචකසම්බන්ධා, අර්ථවාචකයන්ගේ සම්බන්ධ

——()——

171 යතො යත්ථ මති හොති, සඞ්කෙතස්සානුසාරතො
තස්ස සද්දස්ස සො අත්ථො, විධා විධි නිසෙධතො—
172 විස්සජ්ජිතත්ථබලෙනාඤ්ඤො, යොඤ්ඤොචිඅවගම්‍යතෙ
නසද්දත්ථොතිවිඤ්ඤෙය්‍යො, පමාණන්තරගොචරෙ-
173 ථූලො දිවා න භුඤ්ජෙ සො, ඉති භුත්තනිසෙධකො
සද්දත්ථො රත්තිභුත්තොති, සාමත්ථියෙන ගම්‍යතෙ—

---

ඇති; යෙවහුකා, යම්වස්තුකෙණෙක්; යදි, ඉදින්; ස
න්නි, ඇත්තාහුද; සඞ්කෙතෙන, (පූර්ව) ලක්‍ෂණයෙන්; අ
නභිව්‍යක්තා, අප්‍රකටහෙයින්; නෙ අභිව්‍යක්තහෙතුකා
ඒ අභිප්‍රකාශකාරණ හෙතුහු, න, නොවෙත්—

171 යතො, යම්හෙයකින්; යත්ථ, යම්වස්තුවෙක්හි;
සඞ්කෙතස්ස, සලකුණෙහේ; අනුසාරතො, අනුසාරයෙන්
මතිහොති, දැනීමවේද; තස්සසද්දස්ස, ඒ ශබ්දයාගේ;
සොඅත්ථො, ඒඅර්ථයතෙම; විධිනිසෙධතො, විධිනිෂෙධ
වශයෙන්; විධා, දෙපරිද්දකිත්වේ—

172 විස්සජ්ජිතත්ථබලෙන, දත්හැලදඅර්ථයාගේබලයෙ
න්, අඤ්ඤොයොඤ්ඤොචි, අන්‍යයම්කිසිඅර්ථයෙක්; අවග
ම්‍යතෙ, දත්නාලැබේද. (ඒඅර්ථයතෙම); පමාණන්තර
ගොචරෙ, ප්‍රමාණවිශෙෂයවඅරමුණුවූ; සද්දත්ථොනඉති,
ශබ්දාර්ථයනොවේයයි; විඤ්ඤෙය්‍යො, දතයුත්තේය—

173 සො, යමෙක්: ථූලො, ස්ථූලවූයේ; දිවා, දවල්;
නභුඤ්ජෙ, අනුභවනොකරන්නේද; ඉති, මෙසේ; භු
ත්තනිසෙධකො, භුක්තයවලකන්නාවූ; සද්දත්ථො, ශ
බ්දාර්ථයතෙම; රත්තිභුත්තොඉති, රාත්‍රියෙහිඅනුභවකො
ළේයයි; සාමත්ථියෙන, සාමාර්ථ්‍යයෙන්; ගම්‍යතෙ, ද
ත්නාලැබේ—

1. (සම්භාරූ තදර්ථසම්බන්ධය තදුත්පත්තිසම්බන්ධයත්අතු

--00--

174 සද්දත්ථානඤ්ච නානත්තං, පච්චක්ඛංතෙව ගම්‍යතෙ
අභෙදො වෙ විරුජ්ඣෙය්‍ය; අත්ථවාචකසඞ්ගති.—
175 සද්දත්ථභෙදවාදීනං, දස්සනං මතිමත්තකං
අග්ගිංගණ්හ ඉති වුත්තෙ, මුඛං ඩය්හෙය්‍ය පාවකො--
176 යථා හිනෙනා පදීපාදි, ඝටාද්‍යත්ථං පකාසති
තංසත්තිනියමෙනෙව, සද්දොප්‍යත්ථං පකාසති.—
177 යං වුත්තං. ඡබ්බිධං නාමං, නාමං සත්තාවිධාදිකං
නයානුගෙන තං ඤෙය්‍යං, නාමලක්ඛණවිඤ්ඤුනා-

---

ෙරත් නදත්ථසම්බන්ධය මෙතෙහිකොට ශබ්දාර්ථයන්ගේ අභෙදත්වය සිතත් එසේහෙයින් ඔවුන්ගේ භෙදය දක්වනු පිණිස ''සද්දත්ථානඤ්ච'' යන ආදිය කීය)

174 සද්දත්ථානංච, ශබ්දාර්ථයන්ගේද; නානත්තං, විශෙෂත්වය; පච්චක්ඛතෙව, ප්‍රත්‍යක්ෂවශයෙන්ම; ගම්‍යතෙ, හැඟේ; වෙ, ඉදින්; අභෙදො, වෙනසෙක්නැත්තෙනම්; අත්ථවාචකසඞ්ගති, අර්ථවාචකයන්ගේ පැවැත්ම; විරුජ්ඣෙය්‍ය, විරුද්ධවන්නේය.—

175 සද්දත්ථභෙදවාදීනං, ශබ්දාර්ථයන්ගේ වෙනසකියනසුලුවූ ආචාර්යයන්ගේ; දස්සනං, (ශබ්දාර්ථයන්ගේ) දැක්වීම; මතිමත්තකං, අභිප්‍රායමාත්‍රයෙක්වේ; අග්ගිං, ගින්න; ගණ්හඉති, ගණුවයි; වුත්තෙ, කීකල්හි; පාවකො, (ශබ්දාර්ථවූ) ගින්නතෙමේ; මුඛං, මුඛය; ඩය්හෙය්‍ය,' දවන්නේය.—

176 යථා, යම්සේ; හිනෙනා, වත්වෙන්වූ; පදීපාදී, ප්‍රදීපාදියතෙම, ඝටාද්‍යත්ථං, ඝටාදිඅර්ථය; පකාසති, ප්‍රකාශකරේද, තංසත්තිනියමෙනෙව, ඒප්‍රකාශශබ්දයාගේ ස්වභාවනියමයෙන්ම; සද්දොඅපි, (අර්ථප්‍රකාශක) ශබ්දතෙමේද; අත්ථං, අර්ථය; පකාසති, ප්‍රකාශකෙරේ.—

177 ඡබ්බිධං, සයවැදෑරුම්වූ; යංනාමං, යම්නාමයෙ

—00—

178 තථා කාරන්තනාමස්ස; සරූපං වුච්චතෙ මයා
පුරිසො සුගතො නාථො, සුද්ධොදනසුතො ජිනො.

179 එවං සුරා සුර නරො රග නාග යක්ඛා
ගන්ධබ්බ කින්නර මනුස්ස පිසාච පෙතා
මාතඞ්ග ජඞ්ගම තුරඞ්ග වරාහ සීහා
ව්‍යග්ඝ අච්ඡ කච්ඡප තරච්ඡ මිග සස සොනා—

---

ය්ද; සත්තවිධාදීනං, සප්තප්‍රකාරාදිවූ; නාමං, (නම්) නාමයෙස්ද; වුත්තං, කියනලද්දේද; තං, හේ නාමය නෙම; නාමලක්ඛණවිඤ්ඤුනා, නාමලක්ෂණදන්නහු විසින්; ඤෙය්‍යං, දතයුත්තේය—

178 තථා, ඒ නාමයන් අතුරෙන්, අකාරන්තනාමස්ස, අකාරාන්තනාමයාගේ; සරූපං, ස්වරූපය; මයා, මා විසින්; වුච්චතෙ, කියනුලැබේ; පුරිසො, පුරිසශබ්දයද; සුගතො, සුගතශබ්දයද; නාථො, නාථශබ්දයද; සුද්ධොදනසුතො, සුද්ධොදනසුතශබ්දයද; ජිනො, ජිනශබ්දයද වේ—

179 එවං, මෙසේ, සුර, සුරශබ්දය; අසුර, අසුරශබ්දය; නර, නරශබ්දය; උරග, උරගශබ්දය; යක්ඛා, යක්ඛශබ්දයනමොහුද; ගන්ධබ්බ, ගන්ධබ්බශබ්දය; කින්නර, කින්නරශබ්දය; මනුස්ස, මනුස්සශබ්දය, පිසාච, පිසාචශබ්දය; පෙතා, පෙතශබ්දයනමොහුද; මාතඞ්ග, මාතඞ්ගශබ්දය; ජඞ්ගම, ජඞ්ගමශබ්දය; තුරඞ්ග, තුරඞ්ගශබ්දය; වරාහ, වරාහශබ්දය; සීහා, සීහශබ්දය යනමොහුද; ව්‍යග්ඝ, ව්‍යග්ඝශබ්දය; අච්ඡ, අච්ඡශබ්දය, කච්ඡප, කච්ඡපශබ්දය; තරච්ඡ, තරච්ඡශබ්දය; මිග, මිගශබ්දය; සස, සසශබ්දය; සොණා, සොණශබ්දය යනමොහුද—

——00——

180 ආලෝක ලෝක නිලයා නිල වාග යෝග
වායාම ගාම නිගමා’ගම ධම්ම කාමා
සඞ්ඝෝඝ ඝෝස පටිඝා’සව කොධ ලොභ
සාරම්භ ථම්භ මද මාන පමාද මක්ඛා—

181 පුන්නාග පූග පනසා’සන චම්ප කම්බ
හින්තාල තාල වකුලජ්ජුන කිංසුකාව
මන්දාර කුන්ද පුචිමන්ද කරඤ්ජ රුක්ඛා
සෙද්‍යන මයූර සකුණණ්ඩජ කොඤ්ච හංසා—

---

180 ආලෝක, ආලෝකශබ්දය; ලෝක, ලෝකශබ්දය; නිලය, නිලයශබ්දය; අනිල, අනිලශබ්දය; වාග, වාගශබ්දය; යොග, යොගශබ්දය; වායාම, වායාමශබ්දය; ගාම, ගාමශබ්දය; නිගම, නිගමශබ්දය; ආගම, ආගමශබ්දය; ධම්ම, ධම්මශබ්දය; කාමා, කාමශබ්දය යන මොහුද; සඞ්ඝ, සඞ්ඝශබ්දය; ඔඝ, ඔඝශබ්දය; ඝොස, ඝොසශබ්දය; පටිඝ, පටිඝශබ්දය; ආසව, ආසවශබ්දය; කොධ, කොධශබ්දය; ලොභ, ලොභශබ්දය, සාරම්භ, සාරම්භශබ්දය; මද, මදශබ්දය; මාන, මානශබ්දය; පමාද, පමාදශබ්දය; මක්ඛා, මක්ඛශබ්දය යන මොහුද—

181 පුන්නාග, පුන්නාගශබ්දය; පූග, පූගශබ්දය; පනස, පනසශබ්දය; අසන, අසනශබ්දය; චම්පක, චම්පකශබ්දය; අම්බ, අම්බශබ්දය; හින්තාල, හින්තාලශබ්දය; තාල, තාලශබ්දය; වකුල, වකුලශබ්දය; අජ්ජුන, අජ්ජුනශබ්දය; කිංසුකාව, කිංසුකශබ්දය යන මොහුද; මන්දාර, මන්දාරශබ්දය; කුන්ද, කුන්දශබ්දය; පුචිමන්ද, පුචිමන්දශබ්දය; කරඤ්ජ, කරඤ්ජශබ්දය; රුක්ඛා, රුක්ඛශබ්දය යන මොහුද; මයූර, මයූරශබ්දය, සකුණ, සකුණශබ්දය; අණ්ඩජ, අණ්ඩජශබ්දය; කොඤ්ච, කොඤ්චශබ්දය;

——00——

182 මනොවචොවයොතෙජො,තපොචෙතොතමොයසො
වයො පයො සිරො රජො, උරො රහො අහො පිම—
183 ගච්ඡං මහං චරං තිට්ඨං, දදං භුඤ්ජං සුණං පචං
ජයං ජීරං චවං මියං, සරං කුබ්බං ජපං වජං—
184 භවන්ත ගන්ත සවන්ත, බ්‍රහ්මත්තසඛ ආත්මා
මඝවා යුව රාජාච, පුමාදයොච මාදිකා—

## අ කා ර න්තං

හංසා, හංසශබ්දය යනාමෙහිදු; දෙදනා, දාන යුන් නාහුය—

(දූත් මනොගණයෙහි අකාරාන්තනාම දක්වනු පිණිස 'මනො' යනාදිය කීය)

182 මනො, මනශබ්දයද; වචො, වචශබ්දයද; වයො, වයශබ්දයද; තෙජො, තෙජශබ්දයද; තපො, තපශබ්දයද; චෙතො, චෙතශබ්දයද; තමො, තමශබ්දයද; යසො, යසශබ්දයද; වයො, වයශබ්දයද; පයො, පයශබ්දයද; සිරො, සිරශබ්දයද; රජො, රජශබ්දයද; උරො, උරශබ්දයද; රහො, රහශබ්දයද; අහොඅපිච අහශබ්දයද—

(දූත් ප්‍රත්‍යයාන්ත අකාරාන්තනාම දක්වනු පිණිස 'ගච්ඡං' යනාදිය කීය)

183 ගච්ඡං, ගච්ඡන්ත ශබ්දයද, මහං, මහන්තශබ්දයද; චරං, චරන්තශබ්දයද; තිට්ඨං, තිට්ඨන්තශබ්දයද; දදං, දදන්තශබ්දයද; භුඤ්ජං, භුඤ්ජන්තශබ්දයද; සුණං, සුණන්තශබ්දයද; පචං, පචන්තශබ්දයද; ජයං, ජයන්තශබ්දයද; ජීරං, ජීරන්තශබ්දයද; චවං, චවන්තශබ්දයද; මියං, මියන්තශබ්දයද; සරං, සරන්තශබ්දයද; කුබ්බං, කුබ්බන්තශබ්දයද; ජපං, ජපන්තශබ්දයද; වජං, වජන්තශබ්දයද—

184 භවන්ත, භවන්තශබ්දයද; සන්ත, සන්තශබ්ද

——00——

185 ආකාරන්තාතු පුල්ලිඞ්ගා, සාසද්දො ඉති දීපිතො
එවං පච්චක්ඛධම්මාච, ගාණ්ඩීවධන්වා ආදිකා—

### ආ කා ර න්තං

186 ජොති පාණී ගණ්ඨි මුට්ඨි, කුච්ඡි වත්ථි සාලි වීහි.
ව්‍යාධි ඔධි බොධි සන්ධි, රාසි කෙසි සාති දීපි—

---

යද; සවතාන, සවතානශබ්දයද; බ්‍රහ්ම, බ්‍රහ්මශබ්දයද; අත්ත, අත්තශබ්දයද; ආතුමා, ආතුමශබ්දයද; මඝවා, මඝවන්තුශබ්දයද; යුව, යුවශබ්දයද; රාජාව, රාජශබ්දයද, පුමාඉති, පුමශබ්දයදයන; එවමාදිකා, මේආදිශබ්දයෝදවෙත්—

### අ කා රා න්ත සි

(දැන් ආකාරාන්තනාමදක්වා පළමුකොට තැබියයුතුප්‍රකෘතිභූතවූ ආකාරාන්තනාම දක්වනුපිණිස "ආකාරන්තාතු පුල්ලිඞ්ගා" යන ආදිය කීය)

185 සාසද්දොතු, සාශබ්දයතෙම්වනාහි; ආකාරන්තා පුල්ලිඞ්ගාඉති, ආකාරාන්තපුංලිඞ්ගයයි; දීපිතො, ප්‍රකාශකරණලද්දේය; පච්චක්ඛධම්මාච, පච්චක්ඛධම්මාශබ්දයද; ගාණ්ඩීවධන්වාආදිකා, ගාණ්ඩීවධන්වාශබ්දයද යන මේආදිශබ්දයෝද; එවං, මෙසේම්—

### ආ කා රා න්ත සි

(දැන්ඉකාරාන්තයන්ගේ ප්‍රකෘත්‍යන්තය දක්වනුපිණිස "ජොති" යන ආදිය කීය)

186 ජොති, ජොතිශබ්දයද; පාණී, පාණිශබ්දයද; ගණ්ඨී, ගණ්ඨිශබ්දයද; මුට්ඨි, මුට්ඨිශබ්දයද; කුච්ඡි, කුච්ඡිශබ්දයද; වත්ථි, වත්ථිශබ්දයද; සාලි, සාලිශබ්දයද; වීහි, වීහිශබ්දයද; ව්‍යාධි, ව්‍යාධිශබ්දයද; ඔධි, ඔධිශබ්ද

——00——

187 ඉසි මුනි මණි ධනි ගිරි රවි කවි නිධි
විධි අඝි කිමි පති හරි
අරි නිමි කලි බලි ජලනිධි ගහපති
උරුසිනි වරමති නිරුපධි අධිපති—

188 අපිනිවෙව සමාධි, උදධි වෙ වඤාදිකං
ඉකාරන්තා නාම නිද්දිට්ඨං; පුල්ලිඞ්ගං ලිඞ්ගවිඤ්ඤුනා—

## ඉ කා ර නතං

යද; බොධි, බොධිශබ්දයද; සන්ධි, සන්ධිශබ්දයද; රාසි, රාසිශබ්දයද; සාති, සාතිශබ්දයද; දීපි, දීපිශබ්දයද—

187 ඉසි, ඉසිශබ්දයද; මුනි, මුනිශබ්දයද; මණි, මණිශබ්දයද; ධනි, ධනිශබ්දයද; ගිරි; ගිරිශබ්දයද; රවි, රවිශබ්දයද; කවි, කවිශබ්දයද; නිධි, නිධිශබ්දයද; විධි, විධිශබ්දයද; අනි, අනිශබ්දයද; කිමි, කිමිශබ්දයද; පති, පතිශබ්දයද; හරි, හරිශබ්දයද; අරි, අරිශබ්දයද; නිමි, නිමිශබ්දයද; කලි, කලිශබ්දයද; බලි; බලිශබ්දයද; ජලනිධි, ජලනිධිශබ්දයද; ගහපති, ගහපතිශබ්දයද; උරුසිනි, උරුසිනිශබ්දයද; වරමති, වරමතිශබ්දයද; නිරුපධි, නිරුපධිශබ්දයද; අධිපති, අධිපතිශබ්දයද—

188 අපිනිවෙව, අපිනිශබ්දයද; සමාධි, සමාධිශබ්දයද; උදධිව, උදධිශබ්දයද; යන; එවං ආදිකං, මෙ ආදීය; ඉකාරන්තං පුල්ලිඞ්ගං ඉති, ඉකාරාන්ත පුංලිඞ්ගයයි; ලිඞ්ගවිඤ්ඤුනා, ලිඞ්ගයදන්නහුවිසින්; නිද්දිට්ඨං, දක්වලනලද්දේය—

## ඉ කා රා න්ත සි

(දුන් ඊ කාරාන්තය දක්වනුපිණිස 'ධම්මී' යනු ආදිය කීය)

—00—

189 ධම්මී සඞ්ඛී ඤාණී හත්ථී, චක්කී පක්ඛී දාඨී රට්ඨී
ඡත්තී මාලී වම්මී යෝගී, භාගී * භෝගී කාමී සාමී-
190 ධජී ගණී සසී කුට්ඨී, ජටී ඣානී සුඛී සිඛී
දන්තී මන්තී කරී මාගී, කුසලී මුසලී බලී—
191 පාපකාරී සත්තුඝාතී, මාලාකාරී දීඝජීවී
බ්‍රහ්මචාරී සීහනාදී, භූමිසායී සීඝයායී—

## ඊ කා ර න්තං

189 ධම්මී, ධම්මීශබ්දය; සඞ්ඛී, සඞ්ඛීශබ්දය; ඤාණී ඤාණීශබ්දය; හත්ථී, හත්ථීශබ්දය; චක්කී, චක්කීශබ්දය; පක්ඛී, පක්ඛීශබ්දය; දාඨී, දාඨීශබ්දය; රට්ඨී, රට්ඨීශබ්දය; ඡත්තී, ඡත්තීශබ්දය; මාලී, මාලීශබ්දය වම්මී, වම්මීශබ්දය; යෝගී, යෝගීශබ්දය; භාගී, භාගීශබ්දය; භෝගී, භෝගීශබ්දය; කාමී, කාමීශබ්දය; සාමී, සාමීශබ්දය—

190 ධජී, ධජීශබ්දය; ගණී, ගණීශබ්දය; සසී, සසීශබ්දය. කුට්ඨී, කුට්ඨීශබ්දය; ජටී, ජටීශබ්දය; ඣානී, ඣානීශබ්දය; සුඛී, සුඛීශබ්දය; සිඛී, සිඛීශබ්දය; දන්තී, දන්තීශබ්දය; මන්තී, මන්තීශබ්දය; කරී, කරීශබ්දය; මාගී, මාගීශබ්දය; කුසලී. කුසලීශබ්දය; මුසලී, මුසලීශබ්දය; බලී, බලීශබ්දය—

191 පාපකාරී, පාපකාරීශබ්දය; සත්තුඝාතී, සත්තුඝාතීශබ්දය; මාලාකාරී, මාලාකාරීශබ්දය; දීඝජීවී; දීඝජීවීශබ්දය; බ්‍රහ්මචාරී, බ්‍රහ්මචාරීශබ්දය; සීහනාදී, සීහනාදීශබ්දය; භූමිසායී, භූමිසායීශබ්දය; සීඝයායී, සීඝයායීශබ්දය යන මොහුවෙත්—

## ඊ කා ර න්ත යි

(දැන් උකාරාන්තය දක්වනුපිණිස 'භික්ඛු' යනාදිය කියා)

* ශාඛිහිටි පොත්කෙසු සෑහි—

——00——

192 භික්ඛු සෙතු කෙතු රාහු, භානු සබ්බඤ්ඤු උච්ඡු වේළු
මත්තු සිත්ථු බන්ධු නෙරු, මරු සත්තු කාරු හෙතු—

193 ජන්තු රුරු පටු සත්තු, පිතු මාතු භාතු ධීතු
ගන්තු හන්තු මෙරු සුසු, සිනෙරු එවමාදිකා—

## උකාරන්තං

194 අභිභූ වෙස්සභූ චෙව, සයම්භූච පරාභිභූ
සබ්බාභිභූ සබ්බවිදූ, කාලඤ්ඤූ වේදගූ විදූ

---

192 භික්ඛු, භික්ඛුශබ්දය; සෙතු, සෙතුශබ්දය; කෙතු, කෙතුශබ්දය; රාහු, රාහුශබ්දය; භානු, භානුශබ්දය; සබ්බඤ්ඤු, සබ්බඤ්ඤුශබ්දය; උච්ඡු, උච්ඡුශබ්ය; වේළු, වේළුශබ්දය; මත්තු;මත්තුශබ්දය; සිත්ථු, සිත්ථුශබ්දය; බන්ධු, බන්ධුශබ්දය; නෙරු, නෙරුශබ්දය; මරු, මරුශබ්දය; සත්තු, සත්තුශබ්දය;කාරු, කාරුශබ්දය; හෙතු, හෙතුශබ්දය—

193 ජන්තු, ජන්තුශබ්දය; රුරු, රුරුශබ්දය; පටු, පටුශබ්දය; සත්තු, සත්තුශබ්දය; පිතු, පිතුශබ්දය; මාතු; මාතුශබ්දය; භාතු, භාතුශබ්දය; ධීතු, ධීතුශබ්දය; ගන්තු, ගන්තුශබ්දය; හන්තු, හන්තුශබ්දය; මෙරු, මෙරුශබ්දය; සුසු, සුසුශබ්දය, සිනෙරු, සිනෙරුශබ්දයයන, එවමාදිකා, මේආදි ශබ්දයෝවෙත්—

## උකාරන්තයි

(දැන් ඌකාරාන්තය දක්වනුපිණිස "අභිභූ" යනාදිය කිය)

194 අභිභූ, අභිභූශබ්දයද, වෙස්සභූචඑව, වෙස්සභූශබ්දයද; සයම්භූච,සයම්භූශබ්දයද; පරාභිභූ, පරාභිභූශබ්දයද සබ්බාභිභූ, සබ්බාභිභූශබ්දයද; සබ්බවිදූ, සබ්බවිදූශබ්දයද; කාලඤ්ඤූ, කාලඤ්ඤූ ශබ්දයද; වේදගූ, වේදගූශබ්දයද, විදූ, විදූශබ්දයද—

---00---

195 මගධඤ්ඤූ චෙව ධම්මඤ්ඤූ, අත්ථඤ්ඤූ පාරගූ විභූ
රත්තඤ්ඤූ චෙව මත්තඤ්ඤූ කතඤ්ඤූ එවමාදිකා

ඌ කා ර න් තං

196 එකාරන්තො තු පුල්ලිඞ්ගො, අප්පසිද්ධො ති දීපිතො
ඔකාරන්තො තු පුල්ලිඞ්ගො, ගොසද්දොඉති දීපිතො

ඔ කා ර න් තං

197 පුරිසො සා ජන්තු පාණී, ධම්මී සඞ්ඝී තථෙව ච
භික්ඛාභිභූ වෙස්සභූ ච; ගොති පුල්ලිඞ්ග සඞ්ගහො-

පුල්ලිඞ්ගං නිට්ඨිතං

---

195 මගධඤ්ඤූ චෙව, මගධඤ්ඤූ ශබ්දයද; ධම්මඤ්ඤූ ධම්මඤ්ඤූ ශබ්දයද; අත්ථඤ්ඤූ, අත්ථඤ්ඤූ ශබ්දයද; පාරගූ, පාරගූශබ්දයද; විභූ, විභූශබ්දයද; රත්තඤ්ඤූ චෙව; රත්තඤ්ඤූ ශබ්දයද; මත්තඤ්ඤූ, මත්තඤ්ඤූ ශබ්දයද; කතඤ්ඤූ, කතඤ්ඤූ ශබ්දයද යන; එවමාදිකා, මේ ආදී ශබ්දයෝවෙත්—

ඌ කා රා න් ත යි

196 එකාරන්තො, එකාරාන්තවූ; පුල්ලිඞ්ගොතු, පුංලිඞ්ගශබ්දයෙක් වනාහි; අප්පසිද්ධොඉති, අප්‍රකටයයි; දීපිතො, ප්‍රකාශකරණලද්දේය; ගොසද්දොතු, ගොශබ්දයතෙමවනාහි, ඔකාරන්තො පුල්ලිඞ්ගො, ඔකාරාන්ත පුංලිඞ්ගශබ්දයයි, දීපිතො, ප්‍රකාශකරණලද්දේය—

ඔ කා රා න් ත යි

197 පුරිසො, පුරිසශබ්දයද; සා, සාශබ්දයද; ජන්තු, ජන්තුශබ්දයද; පාණී, පාණීශබ්දයද; ධම්මී, ධම්මීශබ්දයද; සඞ්ඝී, සඞ්ඝීශබ්දයද; තථෙවච, එසේම; භික්ඛු; භික්ඛුශබ්දයද; අභිභූ, අභිභූශබ්දයද; වෙස්සභූච, වෙස්සභූ

——00——

198 අකාරන්තා ඉත්ථිලිඞ්ගා, එදන්තා අප්පසිද්ධිකා
ආකාරන්තා ඉත්ථිලිඞ්ගා, කඤ්ඤාසද්දා තථෙව ච

199 සද්ධා මෙධා පඤ්ඤා විජ්ජා, චින්තා මන්තා තණ්හා වීණා
ඉච්ඡා මුච්ඡා එජා මායා, මෙත්තා මත්තා සික්ඛා භික්ඛා

200 ජඞ්ඝා ගීවා ජිව්හා වාචා, ඡායා ආසා ගඞ්ගා නාවා
ගාථා සෙනා ලෙඛා සාලා, මාලා වෙලා පූජා ඛිඩ්ඩා

---

ශබ්දයද; ගො ඉති, ගොශබ්දයද යනමේ; පුල්ලිඞ්ගස ඞ්ගහො, පුංලිඞ්ගසඞ්ග්‍රහයවේ —

# පුංලිඞ්ගය නිමවනලදී

(දැන් ස්ත්‍රීලිඞ්ගය දක්වනුපිණිස "අකාරන්තා" යන ආදිය කිය)

198 අකාරන්තා, අකාරාන්තවූද; එකාරන්තා, එකාරාන්තවූද; ඉත්ථිලිඞ්ගා, ස්ත්‍රීලිඞ්ගය; අප්පසිද්ධිකා, ප්‍රකටනොවේ; කඤ්ඤාසද්දා, කඤ්ඤාශබ්දයතෙම; ආකාරන්තාඉත්ථිලිඞ්ගා, ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගයවේ; තථාඑවච, එසේම—

199 සද්ධා, සද්ධාශබ්දයද; මෙධා, මෙධාශබ්දයද; පඤ්ඤා, පඤ්ඤාශබ්දයද; විජ්ජා, විජ්ජාශබ්දයද; චින්තා, චින්තාශබ්දයද මන්තා, මන්තාශබ්දයද තණ්හා, තණ්හාශබ්දයද; වීණා, වීණාශබ්දයද; ඉච්ඡා, ඉච්ඡාශබ්දයද; මුච්ඡා, මුච්ඡාශබ්දයද; එජා, එජාශබ්දයද; මායා, මායාශබ්දයද; මෙත්තා, මෙත්තාශබ්දයද; මත්තා, මත්තාශබ්දයද; සික්ඛා, සික්ඛාශබ්දයද; භික්ඛා, භික්ඛාශබ්දයද—

200 ජඞ්ඝා, ජඞ්ඝාශබ්දයද; ගීවා, ගීවාශබ්දයද; ජිව්හා, ජිව්හාශබ්දයද; වාචා, වාචාශබ්දයද; ඡායා, ඡායාශබ්දයද; ආසා, ආසාශබ්දයද; ගඞ්ගා, ගඞ්ගාශබ්දයද; නාවා, නාවාශබ්දයද; ගාථා, ගාථාශබ්දයද; සෙනා, සෙනාශබ්දයද; ලෙඛා, ලෙඛාශබ්දයද සාලා, සාලාශබ්දයද; මා

——()()——

201 පිපාසා වේදනා සඤ්ඤා, චේතනා තසිනා සුනා
දේවතා වට්ටකා ගොධා, බලාකා පරිසා සභා—

202 ඌකා සේඵාලිකා ලඞ්කා, සලාකා වාලුකා සිඛා
විසාඛා විසිඛා සාමා, විඛා වඤ්ඣා ජපා ඝටා—

203 ජේට්ඨා සොණ්ඩා විතණ්ඩා ච, කරුණා වනිතා ලතා
නිද්දා සුධා කථා නාගා, වාසනා සිංසපා පපා—

---

ලා, මාලාශබ්දයද; වෙලා, වෙලාශබ්දයද; පූජා, පූජාශබ්දයද; ඛිඩ්ඩා, ඛිඩ්ඩාශබ්දයද—

201 පිපාසා, පිපාසාශබ්දයද; වේදනා, වේදනාශබ්දයද; සඤ්ඤා, සඤ්ඤාශබ්දයද; චේතනා, චේතනාශබ්දයද; තසිනා, තසිනාශබ්දයද; සුනා, සුනාශබ්දයද; දේවතා, දේවතාශබ්දයද; වට්ටකා, වට්ටකාශබ්දයද; ගොධා, ගොධාශබ්දයද; බලාකා, බලාකාශබ්දයද; පරිසා පරිසාශබ්දයද; සභා, සභාශබ්දයද—

202 ඌකා ඌකාශබ්දයද; සේඵාලිකා, සේඵාලිකාශබ්දයද; ලඞ්කා, ලඞ්කාශබ්දයද; සලාකා, සලාකාශබ්දයද; වාලුකා, වාලුකාශබ්දයද; සිඛා, සිඛාශබ්දයද; විසාඛා, විසාඛාශබ්දයද; විසිඛා, විසිඛාශබ්දයද; සාමා, සාමාශබ්දයද; විඛා, විඛාශබ්දයද; වඤ්ඣා, වඤ්ඣාශබ්දයද; ජපා, ජපාශබ්දයද; ඝටා, ඝටාශබ්දයද—

203 ජේට්ඨා, ජේට්ඨාශබ්දයද; සොණ්ඩා, සොණ්ඩාශබ්දයද; විතණ්ඩා ච, විතණ්ඩාශබ්දයද; කරුණා, කරුණාශබ්දයද, වනිතා, වනිතාශබ්දයද; ලතා, ලතාශබ්දයදී; නිද්දා, නිද්දාශබ්දයද; සුධා, සුධාශබ්දයද; කථා, කථාශබ්දයද; නාගා, නාගාශබ්දයද; වාසනා, වාසනාශබ්දයද; සිංසපා, සිංසපාශබ්දයද; පපා, පපාශබ්දයද—

——00——

204 පභා සීමා ධමා දයා, ඛන්තියා සක්ඛර සුරා
දෙලා තුලා සිලා ලාලා, ලෙලා සුමෙඛලා කලා—
205 වළවා ලම්බුසා මූසා, මඤ්ජූසා සුලසා දිසා
නාසා ජුණ්හා ගුහා ඊහා, ලසිකා වසුධාදයෝ—
206 අම්බා අනනා තාථා අයාන, අම්මා තාතා තාථාපරා
ආකාරන්තා එවමාදී, අනෙකවිධභෙදකා—

ආ කා ර න්තං

204 පභා, පභාශබ්දයද, සීමා, සීමාශබ්දයද; ධමා, ධමාශබ්දයද: දයා, දයාශබ්දයද; ඛන්තියා; ඛන්තියාශබ්දයද; සක්ඛරා, සක්ඛරාශබ්දයද; සුරා, සුරාශබ්දයද, දෙලා, දෙලාශබ්දයද; තුලා, තුලාශබ්දයද; සිලා, සිලාශබ්දයද; ලාලා, ලාලාශබ්දයද; ලෙලා, ලෙලාශබ්දයද, සුමෙඛලා, සුමෙඛලාශබ්දයද; කලා, කලාශබ්දයද—

205 වළවා, වළවාශබ්දයද; අලම්බුසා, අලම්බුසාශබ්දයද; මූසා, මූසාශබ්දයද; මඤ්ජූසා, මඤ්ජූසාශබ්දයද, සුලසා, සුලසාශබ්දයද; දිසා, දිසාශබ්දයද; නාසා, නාසාශබ්දයද; ජුණ්හා, ජුණ්හාශබ්දයද; ගුහා, ගුහාශබ්දයද; ඊහා, ඊහාශබ්දයද; ලසිකා, ලසිකාශබ්දයද; වසුධාදයො, වසුධාශබ්දයද යන ආදිශබ්දයෝද—

206 අම්බා, අම්බාශබ්දයද; අනනා, අනනාශබ්දයද; තාථා, එසේම; අයාන, අයානශබ්දයද; අම්මා, අම්මාශබ්දයද; තාථා, එසේම; අපරා, අන්‍යවූ; තාතා, තාතාශබ්දයද යන; එවමාදී, මේආදිශබ්දයෝද; අනෙකවිධභෙදකා; නොයෙක්වැදෑරුම්වූවිශෙෂඇති; ආකාරන්තා; ආකාරාන්තශබ්දයෝ නම්වෙත්—

ආ කා රා න්ත සී

———00———

207 පන්ති යුත්ති වුත්ති තිත්ති, මුත්ති කිත්ති ඛන්ති කන්ති
සන්ති තන්ති සිද්ධි සුද්ධි, ඉද්ධි වුද්ධි බුද්ධි බොධි—

208 භූමි ජාති * පීති සූති, නන්දි සන්ධි සාණි කොටි
දිට්ඨි වුට්ඨි † තුට්ඨි යට්ඨි, පාළි අළි නාළි කෙළි—

209 සති මති කටි ජුති ඨිති, යුවති නිකති රත්ති
සුචි අසනි වසනි ඔසධි අඞ්ගුලි ධූලි—

## ඉ කා ර න් තං

(දැන් ස්ත්‍රීලිඞ්ගයෙහි ඉකාරාන්ත ප්‍රකෘතිය දක්වනු පිණිස "පන්ති" යනාදිය කීය).

207 පන්ති, පන්තිශබ්දයද; යුත්ති, යුත්තිශබ්දයද; වුත්ති, වුත්තිශබ්දයද; තිත්ති; තිත්තිශබ්දයද; මුත්ති, මුත්තිශබ්දයද; කිත්ති, කිත්තිශබ්දයද; ඛන්ති, ඛන්තිශබ්දයද; කන්ති, කන්තිශබ්දයද; සන්ති, සන්තිශබ්දයද; තන්ති, තන්තිශබ්දයද; සිද්ධි, සිද්ධිශබ්දයද; සුද්ධි, සුද්ධිශබ්දයද; ඉද්ධි, ඉද්ධිශබ්දයද; වුද්ධි, වුද්ධිශබ්දයද; බුද්ධි, බුද්ධිශබ්දයද; බොධි, බොධිශබ්දයද;—

208 භූමි, භූමිශබ්දයද; ජාති, ජාති, ජාතිශබ්දයද; පීති, පීතිශබ්දයද; සූති, සූතිශබ්දයද; නන්දි, නන්දිශබ්දයද; සන්ධි, සන්ධිශබ්දයද; සාණි, සාණිශබ්දයද; කොටි, කොටිශබ්දයද; දිට්ඨි, දිට්ඨිශබ්දයද; වුට්ඨි, වුට්ඨිශබ්දයද; තුට්ඨි, තුට්ඨිශබ්දයද; යට්ඨි; යට්ඨිශබ්දයද; පාළි, පාළිශබ්දයද; අළි, අළිශබ්දයද; නාළි, නාළිශබ්දයද; කෙළි, කෙළිශබ්දයද—

209 සති, සතිශබ්දයද; මතිශබ්දයද; කටි, කටිශබ්දයද; ජුති, ජුතිශබ්දයද; ඨිති, ඨිතිශබ්දයද; යුවති, යුවතිශබ්දයද; නිකති, නිකතිශබ්දයද; රත්ති, රත්තිශබ්දයද; සුචි; සුචිශබ්දයද; අසනි. අසනිශබ්දයද, වසනි,

* වති † වුඩ්ඪි—පොත්ථකෙසු

——00——

210 මහී වෙතරණී වාපී; පාටලී කදලී ඝටී
නාරී කුමාරී තරුණී, වාරුණී බ්‍රාහ්මණී සඛී—

211 කින්නරී නාගිනී දෙවී, යක්ඛී ගජී අජී මිගී
වානරී සූකරී සීහී, හංසී කාකී ච කුක්කුටී—

### උ කා ර න් තං

212 යාගු ධාතු ධෙනු කාසු; අන්ධු කණ්ඩු කච්ඡු රජ්ජු
කාරෙණු පියඞ්ගු සස්සු, එවමාදි විජානියං—

### ඌ කා ර න් තං

——

වසනිශබ්දයද; ඔසධි, ඔසධිශබ්දයද; අඞ්ගුලි, අඞ්ගුලිශබ්දයද; ධූලි, ධූලිශබ්දයදවේ—

### ඊ කා රා න් ත භා ෂා

(දැන් ඊකාරාන්තය දක්වනු පිණිස "මහී" යනා ආදිය කියති)

210 මහී, මහීශබ්දයද; වෙතරණී, වෙතරණීශබ්දයද; වාපී, වාපීශබ්දයද; පාටලී, පාටලීශබ්දයද; කදලී, කදලීශබ්දයද; ඝටී, ඝටීශබ්දයද; නාරී, නාරීශබ්දයද; කුමාරී, කුමාරීශබ්දයද; තරුණී, තරුණීශබ්දයද; වාරුණී, වාරුණීශබ්දයද, බ්‍රාහ්මණී, බ්‍රාහ්මණීශබ්දයද, සඛී, සඛීශබ්දයද—

211 කින්නරී, කින්නරීශබ්දයද; නාගිනී, නාගිනීශබ්දයද; දෙවී, දෙවීශබ්දයද; යක්ඛී, යක්ඛීශබ්දයද; ගජී, ගජීශබ්දයද; අජී, අජීශබ්දයද; මිගී, මිගීශබ්දයද; වානරී, වානරීශබ්දයද; සූකරී, සූකරීශබ්දයද; සීහී, සීහීශබ්දයද; හංසී, හංසීශබ්දයද; කාකීච, කාකීශබ්දයද; කුක්කුටී, කුක්කුටීශබ්දයදවේ—

### උ කා රා න් ත භා ෂා

(දැන් උකාරාන්තය දක්වනු පිණිස "යාගු" යනා ආදිය කියති)

212 යාගු, යාගුශබ්දය; ධාතු, ධාතුශබ්දය; ධෙනු,

----00----

213 ජම්බූ වට්ටූ ච සරභූ, සරබූ සුතනූ චමූ
චාමූරූ නාගනාසූරූ, සමානා බලු යාගුයා—

ඌ කාරන්තං

214 ඔකාරන්තා ඉත්ථිලිංගා, ගො සද්දොව පකාසිතො
පුල්ලිංග ඉත්ථිලිංගස්ස, ඔකාරන්තො විසුංතතො—

ඔ කා ර න් තං

---

ධෙනුශබ්දය; කාසු, කාසුශබ්දය; අඥු, අඥුශබ්දය, කණ්ඩු, කණ්ඩුශබ්දය; කච්ජු, කච්ජුශබ්දය; රජ්ජු, රජ්ජුශබ්දය; කරේණු, කරේණුශබ්දය; පියඞ්ගු, පියඞ්ගුශබ්දය; සස්සු, සස්සුශබ්දය යන; එවමාදි, මෙආදිය; විජානියං, දතයුත්තේය—

උ කා රා න් ත යි

(දැන් ඌකාරාන්තය දක්වනු පිණිස "ජම්බූ" යන ආදිය කීය)

213 ජම්බූ, ජම්බූශබ්දයද; වට්ටූච, වට්ටූශබ්දයද; සරභූ, සරභූශබ්දයද; සරබූ, සරබූශබ්දයද; සුතනූ, සුතනූශබ්දයද; චමූ, චමූශබ්දයද; චාමූරූ, චාමූරූශබ්දයද; නාගනාසූරූ, නාගනාසූරූශබ්දයද; (යනමේ ඌකාරාන්ත ඉත්ථිලිඞ්ගශබ්දයෝ;) බලු, එකාන්තයෙන්; යාගුයා, (පදමාලාවිශයෙන් උකාරාන්ත) යාගුශබ්දයහා; සමානා, සමානවෙත්—

ඌ කා රා න් ත යි

(දැන් ඔකාරාන්තය දක්වනුපිණිස "ඔකාරන්තා ඉත්ථිලිඞ්ගා" යන ආදිය කීය)

214 ඔකාරන්තා ඉත්ථිලිඞ්ගා, ඔකාරාන්ත ඉත්ථිලිඞ්ග යනතම, ගොසද්දොඑව, ගොශබ්දයමැයි; පකාසිතො, ප්‍රකාශකරණලද්දේය; පුල්ලිඞ්ගස්ස, පුල්ලිඞ්ගයෙන්; වි

——00——

215 කඤ්ඤා පන්ති යුත්ති වුඩ්ඪි, මහී වෙතරණීපිච
යාගු ධාතු ධෙනු කාසු, ජම්බු ගොත්‍රභිත්ථී සඞ්ගහො —

### ඉත්ථිලිඞ්ගං නිට්ඨිතං

216 නපුංසකෙ අනන්තභෙදෙ, එවං ඤෙය්‍යා විනාවිනා
කනකං චිත්ත රූපඤ්ච, පුප්ඵං පාපං ඵලුප්පලං —

---

පුං, වෙත්වූ; ඉත්ථිලිඞ්ගස්ස, ස්ත්‍රීලිඞ්ගය සම්බන්ධවූ; ඔකාරන්තා, ඔකාරාන්තයෙක්; නත්ථි, නැත්තේය—

### ඔ කා රා න් ත යි

215 කඤ්ඤා, කඤ්ඤාශබ්දයද, පන්ති, පන්තිශබ්දයද; යුත්ති, යුත්තිශබ්දයද; වුඩ්ඪි, වුඩ්ඪිශබ්දයද; මහී, මහීශබ්දයද; වෙතරණීඅපිච, වෙතරණීශබ්දයද; යාගු, යාගුශබ්දයද; ධාතු, ධාතුශබ්දයද; ධෙනු, ධෙනුශබ්දයද; කාසු, කාසුශබ්දයද; ජම්බු, ජම්බුශබ්දයද; ගොත්‍රභි, ගොශබ්දයදයනමේ; ඉත්ථිසඞ්ගහො, ස්ත්‍රීලිඞ්ග සඞ්ග්‍රහවේ—

# ස්ත්‍රීලිඞ්ගය නිමවනලදී

(දැන් නපුංසකලිඞ්ගය දක්වනුපිණිස "නපුංසකෙ අනන්තභෙදෙ" යන ආදිය කීය)

216 නපුංසකෙ, නපුංසකලිඞ්ගවෙහි; අනන්තභෙදෙ, අනන්තවිශෙෂයතෙම; එවං, මෙසේ: ඤෙය්‍යො, දතයුත්තේය; කනකං, කනකශබ්දයද; චිත්ත, චිත්තශබ්දයද; රූපංච, රූපශබ්දයද; පුප්ඵං, පුප්ඵශබ්දයද; පාපං, පාපශබ්දයද; ඵල, ඵලශබ්දයද; උප්පලං, උප්පලශබ්දයද;—

——00——

217 වසනං ආසනං ජනං, නගරං වන කණ්ඩනං
ලවණං පවනං වණ්ණං, නගරං නයනෝදකං—

218 මුඛං වදන කාණණංච, ඔබරං සීලං ධනං තථා
භවනං කුණ මුසලං, සුඛ දුක්ඛඤ්ච යානකං

219 ඣාන රම්මණ මාලම්බං; පදුමං සච්ච කානනං
පුප්ඵං ගගන වස්සංච, පුලිනං වජ්ජ වාදනං—

අ කා ර න් තං

---

217 වසනං, වසනශබ්දයද; ආසනං, ආසනශබ්දයද; ජනං, ජනශබ්දයද; නගරං, නගරශබ්දයද; වන, වනශබ්දයද; කණ්ඩනං, කණ්ඩනශබ්දයද; ලවණං, ලවණශබ්දයද; පවනං, පවනශබ්දයද; වණ්ණං, වණ්ණශබ්දයද; නගුරං, නගරශබ්දයද; නයන, නයනශබ්දයද; උදකං, උදකශබ්දයද—

218 මුඛං, මුඛශබ්දයද; වදන, වදනශබ්දයද; කාණණංච, කාණණශබ්දයද; අම්බරං, අම්බරශබ්දයද; සීලං, සීලශබ්දයද; තථා, එසේම; ධනං, ධනශබ්දයද; භවනං, භවනශබ්දයද; කුණ, කුණශබ්දයද; මුසලං, මුසලශබ්දයද; සුඛ, සුඛශබ්දයද; දුක්ඛංච, දුක්ඛශබ්දයද; යානකං, යානකශබ්දයද—

219 ඣාන, ඣානශබ්දයද; ආරම්මණං, ආරම්මණශබ්දයද; ආලම්බං, ආලම්බශබ්දයද; පදුමං, පදුමශබ්දයද; සච්ච, සච්චශබ්දයද; කානනං; කානනශබ්දයද; පුප්ඵං, පුප්ඵශබ්දයද; ගගන. ගගනශබ්දයද; වස්සංච, වස්සශබ්දයද; පුලිනං, පුලිනශබ්දයද; වජ්ජ, වජ්ජශබ්දයද; වාදනං, වාදනශබ්දයදවේ—

අ කා ර ගන යි

---

(දූත් ආකාරගනය දක්වනුපිණිස "අස්සබා" යන ආදිය කීය)

---00---

220 අසඞ්ඛා මුඛනාසිකා, ආකාරන්ත පභෙදකං
එවමාදිප්පකාරඤ්ච, විඤ්ඤාතබ්බං නපුංසකෙ—

ආකාරන්තං

221 අට්ඨි සප්පි දධි වාරි, අක්ඛි අච්චිව මච්ඡිව
එවමාදි ඉකාරන්තං, විඤ්ඤෙය්‍යං නෙකධා ඉධ

ඉකාරන්තං

222 සුඛකාරි සිඝයායි, එවමාදි අනෙකධා
ඊකාරන්තානි විඤ්ඤෙය්‍යා, අනන්තභෙද අනෙකධා

ඊකාරන්තං

---

220 අසඞ්ඛා, අසඞ්ඛාශබ්දය; මුඛනාසිකා, මුඛනාසිකාශබ්දයයන; එවමාදිප්පකාරංච, මේආදිප්‍රකාරවූද; නපුංසකෙ, නපුංසකලිඟුවෙහි; ආකාරන්තපභෙදකං; ආකාරාන්තවිශෙෂය; විඤ්ඤාතබ්බං, දතයුත්තේය—

ආකාරාන්තයි

(දන් ඉකාරාන්තයන් දක්වනුපිණිස "අට්ඨි" යනාදිය කීය)

221 අට්ඨි, අට්ඨිශබ්දයද; සප්පි, සප්පිශබ්දයද; දධි, දධිශබ්දයද; වාරි, වාරිශබ්දයද; අක්ඛි, අක්ඛිශබ්දයද; අච්චිව, අච්චිශබ්දයද; මච්ඡිව, මච්ඡිශබ්දයදයන; ඉධ, මේ කාරිකා ග්‍රන්ථයෙහි; එවමාදි, මේ ආදිවූ; ඉකාරන්තං, ඉකාරාන්තය; නෙකධා, නොයෙක් ප්‍රකාරයෙන්; විඤ්ඤෙය්‍යං, දතයුත්තේය—

ඉකාරාන්තයි

(දන් ඊකාරාන්තයන් දක්වනුපිණිස "සුඛකාරි" යනාදිය කීය)

222 සුඛකාරි, සුඛකාරිශබ්දය; සිඝයායි, සිඝයායිශබ්දය; යන එවමාදි, මේආදිය; අනෙකධා, නොයෙක් පරිද්දෙන්; ඊකාරන්තානි, ඊකාරාන්තයසිකියා; නපුංසකෙ, නපුංසකලිඟුවෙහි, අනන්තභෙද, අනන්තවිශෙෂයෝ; විඤ්ඤෙය්‍යා, දතයුත්තාහුය—

උකාරාන්තයි

—00—

223 ආයු චක්ඛුම සුතනු, මස්සු සිඞ්ගු ධනු හිප්පු
ගිඞ්ගු මධු ජතු වත්ථු, අම්බු ඉච්චෙවමාදිකං—

උ කා ර න් තං

224 ගොත්‍රභූචෙව අභිභූ, සයම්භූච තථා පරෙ
ධම්මඤ්ඤූ චෙවමාදිකො, ඌකාරන්තොති දීපිතො

ඌ කා ර න්තං

225 ඕකාරන්තො නපුංසකෙ, චිත්තගො හිපකාසිතො
බහුබ්බීහිසමාසෙන, කුලත්ථපරිදීපනා—

ඔ කා ර න්තං

---

(දැන් උකාරාන්තය දක්වනු පිණිස "ආයු" යනාදිය කිය)

223 ආයු, ආයුශබ්දයද; චක්ඛුම, චක්ඛුශබ්දයද; සුතනු, සුතනුශබ්දයද; මස්සු; මස්සුශබ්දයද; සිඞ්ගු, සිඞ්ගුශබ්දයද; ධනු; ධනුශබ්දයද; හිප්පු, හිප්පුශබ්දයද; ගිඞ්ගු, ගිඞ්ගුශබ්දයද; මධු, මධුශබ්දයද; ජතු, ජතුශබ්දයද; වත්ථු, වත්ථුශබ්දයද; අම්බුඉති, අම්බුශබ්දයදයන; එවමාදිකං, මේආදිය වේ—

උ කා රා න් ත සි

(දැන් ඌකාරාන්තය දක්වනුපිණිස 'ගොත්‍රභූ' යන ආදීය කිය)

224 ගොත්‍රභූචඑව, ගොත්‍රභූශබ්දයද; අභිභූ, අභිභූශබ්දයද; සයම්භූම, සයම්භූශබ්දයද; තථා, එසේම; අපරෙ, අන්‍යවූ; ධම්මඤ්ඤූච, ධම්මඤ්ඤූශබ්දයද යන; එවමාදිකො, මේආදිය; ඌකාරන්තොඉති, ඌකාරාන්තයයි; දීපිතො, ප්‍රකාශකරණලද්දේය—

ඌ කා රා න්ත සි

(දැන් නපුංසකලිඞ්ගයෙහි ඕකාරාන්තය දක්වනුපිණිස "ඕකාරන්තො" යන ආදිය කිය)

225 බහුබ්බීහිසමාසෙන, බහුබ්‍රීහිසමාසවිශයෙන්, කු

—00—

226 චිත්තඤ්ච මුඛනාසිකා, අච්ඡිව සුඛකාරිච
චක්ඛුං හිඞ්ගු චිත්තගොච, සඞ්ගහොයං නපුංසකෙ-

නපුංසකලිඞ්ගං නිට්ඨිතං

227 ඉදංකිංඑවමාදිකො, ඛ්‍යඤ්ජනන්තො පකාසිතො
සුඛනාමස්ස නානත්තෙ, සමත්තොයං විනිච්ඡයො—

ඛ්‍යඤ්ජනන්තං

228 අථා පරං පවක්ඛාමි, තිලිඞ්ගාදිස්ස කාරිකං
සබ්බනාමාදි විඤ්ඤෙය්‍යෙන, තිලිඞ්ගාදිවිනිච්ඡයො—

ලම්පරිදීපනා, කුලංකිචිත්‍රප්‍රකාශකරණහෙයින්; චිත්ත ගො, චිත්තගොශබ්දයතෙම; නපුංසකෙ, නපුංසකලිඞ්ග වෙහි; ඔකාරන්තොඉති, ඔකාරාන්තයයි; පකාසිතො, ප්‍රකාශකරණලද්දේය—

ඔකාරාන්තයි

226 චිත්තංච, චිත්තශබ්දයද; මුඛනාසිකා, මුඛනාසිකාශබ්දයද; අච්ඡිච, අච්ඡිශබ්දයද; සුඛකාරිච, සුඛකාරිශබ්දයද; චක්ඛු, චක්ඛුශබ්දයද; හිඞ්ගු, හිඞ්ගුශබ්දයද; චිත්තගොච, චිත්තගොශබ්දයද යන; අයං, මේ; නපුංසකෙ, නපුංසකලිඞ්ගවෙහි; සඞ්ගහො, සංග්‍රහව වේ—

# නපුංසකලිඞ්ගය නිමවනලදී

(දැන් ස්වරාන්තය දක්වා ව්‍යඤ්ජනාන්තය දක්වනුපිණිස 'ඉදං' යන ආදිය කීය)

227 ඉදංකිංඑවමාදිකො, ඉදංකිංයනමේආදිය; ව්‍යඤ්ජනන්තො, ව්‍යඤ්ජනාන්තයයි; පකාසිතො, ප්‍රකාශකරණලද්දේය; සුඛනාමස්ස, සුඛනාමයාගේ; අනත්තෙ, අන්‍යාවිශේෂයවූ; අයංවිනිච්ඡයො, මේ විනිශ්චයතෙම; සමත්තො, සමාප්තයි—

ව්‍යඤ්ජනාන්තයි

(දැන් සුඛනාමයාගේ ප්‍රකෘතිඅන්තයන් දක්වා ත්‍රිලිඞ්ගාදිය දක්වනුපිණිස 'අථාපරං' යන ආදිය කීය)

228 අථ, ඉක්බිත්තෙන්, අපරං, අන්‍යවූ; තිලිඞ්ගාදි

——00——

229 තිලිඞ්ගානං සුබනාමානං, සාධාරණසභාවතො
සබ්බනාමන්ති යං වුත්තං, තස්ස කිං ලක්ඛණන්තිමෙ

230 යෙහි රූපෙහි අඤ්ඤෙහි, රූපෙහිචුපලක්ඛිතං
සරූපඤ්ච පවක්ඛාමි, තෙසං දානි අනෙකධා—

231 සබ්බ'කතර කතම, උභය ඉතරාපිච
අඤ්ඤතර අඤ්ඤතම, පුබ්බ අපර දක්ඛිණ—

232 උත්තර අපර අඤ්ඤ, ය ත එත අමු ඉමා
කිං තුම්හ අම්හ එකාච, ද්විතිච චතුච පඤ්චච
සත්ත අට්ඨ නව දස, වීසාදි යාවසඞ්ඛ්‍යයා—

---

ඝස, ත්‍රිලිඞ්ගාදියගේ; කාරිකං, කාරිකාව, පවක්ඛාමි, කියන්නෙමි; තිලිඞ්ගාදිවිනිච්ඡයො, ත්‍රිලිඞ්ගාදිත්වයෙහිවිනිශ්චයතෙම; සබ්බනාමාදිවිසෙසඤ්ඤෙයො, සර්වනාමාදි(භෙද) යෙක්දතයුත්තේය—

229 තිලිඞ්ගානං සුබනාමානං, (පුංස්ත්‍රීනපුංසකාඛ්‍යාත) සුබනාමයන්තුන්දෙනාගේ; සාධාරණසභාවතො (විසදෘශවිසද උභයරහිතාකාර) සාධාරණස්වභාවයෙන්, යං, යම්නාමයෙක්; සබ්බනාමංඉති, සර්වනාමයයි; වුත්තං, කියනලද්දේද; තස්ස, ඒ සර්වනාමයාගේ; ලක්ඛණං, ලක්ෂණයතෙම; කිංඉතිමෙ; කවරේදැයි—

230 යෙහිරූපෙහි; යම්හිරූපයෙන්ද; අඤ්ඤෙහිරූපෙහිච, අන්‍ය (සුබනාමසදෘශවූ) රූපයෙන්ද; උපලක්ඛිතං, (සර්වනාමයයි) උපලක්ෂණයකරණලද්දේය; තෙසං, ඒ සර්වනාමයන්ගේ; සරූපංච; ස්වරූපයද; ඉදානි, දැන්; අනෙකධා, නොයෙක්පරිද්දෙන්; පවක්ඛාමි, කියන්නෙමි—

231 සබ්බ, සබ්බශබ්දය; කතර, කතරශබ්දය; කතම, කතමශබ්දය, උභය, උභයශබ්දය; ඉතරාපිච, ඉතරශබ්දය යන මොහුද; අඤ්ඤතර, අඤ්ඤතරශබ්දය; අඤ්ඤතම, අඤ්ඤතමශබ්දය; පුබ්බ, පුබ්බශබ්දය; අපර, අපරශබ්දය; දක්ඛිණ, දක්ඛිණශබ්දය යනමොහුද—

232 උත්තර, උත්තරශබ්දය; අපර, අපරශබ්දය; අඤ්ඤ, අඤ්ඤශබ්දය යනමොහුද; ය, යශබ්දය; ත, ත

——00——

233 නිද්දිට්ඨසබ්බනාමෙසු, පඤ්චජසත්තවජ්ජිතං
අට්ඨනවම්පිවජ්ජිතං, දසසඞ්ඛ්‍යම්පිවජ්ජිතං—

234 තුම්හාම්හඤ්චවජ්ජිතඤ්චෙව, සකලං සබ්බනාමිකං
සකලං ගුණනාමඤ්ච, තිලිඞ්ගනති උදාහටං—

235 සඞ්ඛ්‍යාවසෙන නිද්දිට්ඨං, සබ්බනාම විනිච්ඡයං
මතභෙදෙන දීපෙය්‍ය, සද්දසත්ථවිදූ ඉධ—

---

ශබ්දය; එත, එතශබ්දය; අමු, අමුශබ්දය; ඉම, ඉම ශබ්දය යනමොහුද; කිං, කිංශබ්දය; තුම්හ, තුම්හශබ්දය; අම්හ, අම්හශබ්දය; එක, එකශබ්දය යනමොහුද; ද්වි, ද්විශබ්දයද, ති, තිශබ්දයද; චතු, චතුශබ්දයද; පඤ්ච, පඤ්චශබ්දයද; ඡ, ඡශබ්දයද: සත්ත, සත්තශබ්දයද; අට්ඨ, අට්ඨශබ්දයද; නව, නවශබ්දයද; දස, දසශබ්දයද; වීසාදී, එකූනවීසාශබ්දයදආදිකොටඇති; යාවසඞ්ඛ්‍යා, සඞ්ඛ්‍යාශබ්දයන්දක්වා ඇතිශබ්දයෝදවෙත්-.

(මෙහි ඡන්දශ්භානිහයින් එකූනශබ්දයට ලොප්කොට 'වීසාදී' යි කියන ලදි)

233 නිද්දිට්ඨසබ්බනාමෙසු, (පිළිවෙළින්) දක්වනලද(සබ්බකතරාදි) සර්වනාමශබ්දයන්අතුරෙන්; පඤ්චඡසත්තවජ්ජිතං, පඤ්චශබ්ද ඡශබ්ද සත්තශබ්දයන්ගෙන්තොරවූද; අට්ඨනවම්පිවජ්ජිතං, අට්ඨශබ්ද නවශබ්දයන්ගෙන්තොරවූද; දසසඞ්ඛ්‍යම්පිවජ්ජිතං, දසශබ්දයෙන්තොරවූද—

233 තුම්හාම්හවජ්ජිතංචෙව, තුම්හ අම්හශබ්දයන් ගෙන්තොරවූද; සකලං සබ්බනාමිකං, සියලු සර්වනාමයතෙම; සකලංගුණනාමංච, සර්වගුණනාමයසිද; තිලිඞ්ගිකං, තුන්ලිඟුනාමයයිද; උදාහටං, ගෙණහැරදක්වනලදි—

235 සඞ්ඛ්‍යාවසෙන, සඞ්ඛ්‍යාශබ්දවශයෙන්; නිද්දිට්ඨං, දක්වනලද; සබ්බනාමවිනිච්ඡයං, සර්වනාමවිනිශ්චය; ඉධ, මේ කාරිකාග්‍රන්ථයෙහි; සද්දසත්ථවිදූ, ශබ්දශාස්ත්‍රදන්නා ආචාර්යයීතෙමේ; මතභෙදෙන, අභිප්‍රායවිශෙෂයෙන්; දීපෙය්‍ය, ප්‍රකාශකරන්නේය—

236 ඒකාදෝ'ට්ඨාරසන්තා යෙ, සද්දා සඞ්ඛෙය්‍යවාචකා
ලිඞ්ගත්තයෙන සංයුත්තා, එකාදිවචනවයා—

237 වීසාදී ආනවුත්‍යන්තා, සඞ්ඛ්‍යාසඞ්ඛෙය්‍යවාචකා
ඉත්ථිලිඞ්ගෙන සංයුත්තා; සදෙකවචනන්තකා—

238 සතාදී යාවසඞ්ඛෙය්‍යා, සඞ්ඛ්‍යා සඞ්ඛෙය්‍යවාචකා—
නපුංසකෙන සංයුත්තා, සබ්බදා වචනවයා—

239 සබ්බනාමා මිතො අඤ්ඤං; විඤ්ඤෙය්‍යං තබ්බිං විභාවිනා
පාළිප්පදෙසෙ නානත්ථං, විජ්ජමානං යථාරහං—

---

236 එකාදී, එකශබ්දය ආදිකොටඇති; අට්ඨාරසන්තා, අට්ඨාරසශබ්දය අන්තකොටඇති; යෙසද්දා, යම්ශබ්දකෙණෙක්; සඞ්ඛෙය්‍යවාචකා, (සඞ්ඛ්‍යාවහැර) සඞ්ඛෙය්‍යවාචකවෙද්ද; (ඔව්හු) ලිඞ්ගත්තයෙන, ලිඞ්ගත්‍රයෙන්; සංයුත්තා, යුක්තවන්නාහුය; එකාදිවචනවයා, එකවචනාදි වචනදෙක ඇත්තාහුය—

237 වීසාදී, එකූනවීසාශබ්දාදිහු, ආනවුත්‍යන්තා, නවුතිශබ්දයාගේකෙළවරදක්වා; සඞ්ඛ්‍යාසඞ්ඛෙය්‍යවාචකා, සඞ්ඛ්‍යාවද සඞ්ඛෙය්‍යයද කියන්නාහුය; ඉත්ථිලිඞ්ගෙන, ස්ත්‍රීලිඞ්ගයෙන්; සංයුත්තා, යුක්තවන්නාහුය; සදා, හැමකල්හි; එකවචනන්තකා, එකවචන අන්තකොට ඇත්තාහුවෙත්—

238 සතාදී, එකූන සතශබ්දාදී සඞ්ඛ්‍යාශබ්දයෝ, අසඞ්ඛෙය්‍යන්තයාව, අසඞ්ඛෙය්‍යශබ්දය දක්වා; සඞ්ඛ්‍යාසඞ්ඛෙය්‍යවාචකා, සඞ්ඛ්‍යාවද සඞ්ඛෙය්‍යයද කියන්නාහුය; නපුංසකෙන, නපුංසකලිඞ්ගයෙන්; සංයුත්තා, යුක්තවන්නාහුය; සබ්බදා, හැමකල්හි; වචනවයා, (එකවචන බහුවචනයන) වචනදෙකඇත්තාහුය—

239 ඉතොසබ්බනාමා, මේ සර්වනාමශබ්දයාකෙරෙන්; අඤ්ඤං, අන්‍යවූ; නානත්ථං, නානාර්ථඇති; පාළිප්පදෙසෙ, පාලිප්‍රදෙශයෙහි; විජ්ජමානං, විද්‍යමානවූ නාමලක්ෂණය; විභාවිනා, පණ්ඩිතයා විසින්; යථාරහං, සුදුසුපරිද්දෙන්; විඤ්ඤෙය්‍යං තබ්බිං, දතයුත්තේය—

———00———

240 ඉදප්පච්චයතාදීහි, ඉදංසද්දාභිදස්සනා
විසෙසකම්මාදිපාඨීහි, විසෙසසද්දාභිදස්සනා—

241 තථා ජනකපාඨීහි, තාතසුත්තාභිහිතිදස්සනා
කෙචි තසද්දආදෙස, තාතසද්දෝති වදන්ති ච—

242 ජනතාතා සද්දසත්ථංහි, පත්වා පාඨක්කමං යදි
පාළිං දූසිතුං නසක්කොන්ති, සබ්බබාහිරපණ්ඩිතා

243 ලොකවොහාරවිධුරා, නානාතීයං බහුකා නයා
සිංහොතිය මල සාගර, තරං නිබ්බාණගාමිනං—

244 පඤ්ච සබ්බසබ්බනාමිං, ඡ සත්තසබ්බනාමිකං
අට්ඨ නවසබ්බනාමං, දස ච සබ්බනාමිකං—

---

240 ඉදප්පච්චයතාදීහි, ඉදප්පච්චයතා සනාථදිපාඨයෙහි; ඉදංසද්දාභිදස්සනා, ඉදංශබ්දය දක්නාහෙයින්ද; විසෙසකම්මාදිපාඨීහි, විසෙසකම්මාදිපාඨයෙහි; විසෙසසද්දාභිදස්සනා, විසෙසශබ්දය දක්නාහෙයින් දතයුතු—

241 තථා, එසේම; ජනකපාඨීහි, ජනකපාඨයෙහි; තාතසුත්තාභිහිතිදස්සනා, තාතසුත්තාභිහිත ගත බොධුත්ගේ දක්නාහෙයින්; කෙචි, සමහර ආචාර්යකෙනෙක්; තසද්දආදෙස, තශබ්දයට ආදෙශවූ; තාතසද්දෝති ච, තාතශබ්දයද; වදන්ති, කියත්—

242 සබ්බබාහිරපණ්ඩිතා, සියලුබාහිරපණ්ඩිතයෝ; සද්දසත්ථංහි, (පාණිනිය චන්ද්‍රකාරක චාන්ද්‍ර ව්‍යාකරණාදී) ශබ්දශාස්ත්‍රයවතාහි; යදි, ඉදින්; ජනතාතා, දත්තානුජය මුදු; පාඨක්කමං, (සර්වඥයන්වහන්සේගේ) පාඨක්‍රමයට; පත්වා, පැමිණ; පාළිං, (සර්වඥයන්වහන්සේගේ) පාළිය; දූසිතුං, දූෂණයට; නසක්කොන්ති; නොහැකිවෙත්—

243 නානාතීයං, පාළියෙහි; ලොකවොහාරවිධුරා, ලොකව්‍යවහාරයෙන්වැලක්කාවූ; නයා, නයයෝ; බහුකා, බොහෝය; සාගරතරං, සසරනැමැති සමුද්‍රයෙන්එතරම කරන්නාවූ; නිබ්බාණගාමිනං, නිවන්නැමැති නොවටපැමිණියාවූ; අමලං; නිර්මලවූ පාළිය; සිංහොතියා, දුටන්නේය—

244 පඤ්ච, පඤ්චයන සර්වනාමයද; ඡ, ඡයන සර්වනා

—00—

245 උපසග්ග නිපාතාච, තුම්හාම්හාව්‍යයංචෙව
අලිඞ්ගම්ති භාසන්ති, * ලිඞ්ගභෙද විචක්ඛණා—

246 අලිඞ්ගං චෙ කථං නාම්හා, විභත්ති සම්භවන්ති චෙ
ලිඞ්ගරූපන්තරා භාවා, අලිඞ්ගං ලිඞ්ගමෙව තං

247 නතුඅබ්‍යත සඤ්ඤාච, අලිඞ්ගම්ති ජායතෙ
ඉත්ථි පුම නපුංසක, ලිඞ්ග සාධාරණං සියා—

248 ඉත්ථිලිඞ්ගඤ්ච පුල්ලිඞ්ගං, නපුංසක මථාපරං
තිලිඞ්ගඤ්ච අලිඞ්ගඤ්ච, නාමිකං පඤ්චධා ඨිතං—

# නාමකාරිකාසමත්තා

---

මයද; සත්තසඞ්ඛ්‍යානාමිකං, සත්තාංගන සර්වනාමයද; අඨ, අඨයන සර්වනාමයද, නවසඞ්ඛ්‍යානාමං, නවාංගන සර්වනාමය ද, දසසඞ්ඛ්‍යානාමිකංච, දසයන සර්වනාමයදයන සඞ්ඛ්‍යාන ඛ්‍යානාමද සඞ්ඛ්‍යාසර්වනාමයද;

245 උපසග්ගනිපාතාච, උපසර්ග නිපාතයෝද; තුම්හා මහාව්‍යයංඑවච, තුම්හශබ්ද අම්හශබ්දයෙදකද; අලිඞ්ගංඉති, අලිඟුයයි; ලිඞ්ගභෙද විචක්ඛණා, ලිඞ්ගවිශෙෂ දක්නාහු; භාසන්ති, කියත්—

246 චෙ, ඉදින්; අලිඞ්ගං, ලිඟුනොවත්නේනම්; නම්හා, ඒ අලිඟුහු කෙරෙන්; කථං, කෙසේ; විභත්ති සම්භවන්තීචෙ, විභක්තීහු වෙද්දයත්; ලිඞ්ගරූපන්තරාභාවා, (ස්ත්‍රී පුං නපුංසක) ලිඞ්ගරූපයන්ගේ වෙනසක් නැතිහෙයින්; අලිඞ්ගං, අලිඞ්ගනම්වේ; තං, ඒඅලිඟුනම්; ලිඞ්ගංඑව. ලිඟුමවේ—

247 අබ්‍යතසඤ්ඤාඑව, අබ්‍යතශබ්දයතෙම; අලිඞ්ගංඉති, ලිඟුනැත්තේනම්; නතුජායතෙ, නොවේ; ඉත්ථිපුමනපුංසකලිඞ්ග, ස්ත්‍රීපුංනපුංසක ලිඞ්ගයන්ට, සාධාරණංසියා, සාධාරණවන්නේය—

(දැන් සියලු නාමයන්ගේ සඞ්ග්‍රහය දක්වනුපිණිස 'ඉත්ථිලිඞ්ගඤ්ච' යන ආදිය කීය)

248 නාමිකං, නාමයතෙම; ඉත්ථිලිඞ්ගඤ්ච, ස්ත්‍රීලිඞ්ග

---

* වුච්චන්ති—පොත්කෙක

——00——

249 අථාපරං පවක්ඛාමි, කාරිකං කාරකාදිනං
සත්‍යාදි විභත්‍යත්ථ භූතා, සුත්තන්තෙ කාරකා දයො—

250 ක්‍රියානිමිත්තභාවෙන, යංකිඤ්චි අභිධියතෙ
කාරකංනාම තං ඤෙය්‍යං, ධීමතා කාරකඤ්ඤුනා—

251 විචිත්තසත්ති සම්බන්ධා, අත්ථො එකොපි භිජ්ජතෙ
කත්තුකම්මාදි භෙදෙන, නටොව නටභෙදතො—

---

යද; පුල්ලිඞ්ගං, පුල්ලිඞ්ගයද; නපුංසකං, නපුංසකලිඞ්ග යද; අථ, නැවත, අපරං, අන්‍යවූ; තිලිඞ්ගංච, ත්‍රිලිඞ්ගයද; අලිඞ්ගංච, අලිඞ්ගයදූයි; පවක්ඛාමි, පසංපරිද්දකින් කිනං, කිවියේය—

# නාමකාරිකා තොමෝ සමාප්තයි

(දැන් කාරකාදීන්ගේ කාරිකාව දක්වනු පිණිස 'අථාපරං' යන ආදිය කිය)

249 අථ; ඉක්බිත්තෙන්; අපරං, අන්‍යවූ; කාරකාදීනං. කාරකාදීන්ගේ, කාරිකං, කාරිකාව; පවක්ඛාමි, කියන්නෙමි; සත්‍යාදිවිභත්‍යත්ථභූතා, සිආදි විභක්ති අර්ථකොට ඇත්තාවූ; තෙකාරකාදයො, ඒ කාරකාදීහු; සත්තෙහොන්ති, සතෙත්වෙත්—

250 ක්‍රියානිමිත්තභාවෙන, ක්‍රියාවගේ නිෂ්පත්තියට හෙතුභාවයෙන්; යංකිඤ්චි, යම්කිසිවක් අභිධියතෙ, කියනුලැබේද; තං, ඒ; කාරකංනාම, කාරකනමැයි; කාරකඤ්ඤුනා, කාරකදන්නාවූ; ධීමතා, ප්‍රාඥයාවිසින්; ඤෙය්‍යං, දතයුත්තේය—

251 විචිත්තසත්තිසම්බන්ධා, නානාප්‍රකාර ශක්තියහාසම්බන්ධහෙයින්. එකොඅපිඅත්ථො, (දෙවදත්තාදි) එකම අර්ථයතෙම; කත්තුකම්මාදිභෙදෙන, කර්තෘකර්මාදීන්ගේ භෙදයෙන්; නටභෙදතො, (මාරදි) නෘත්‍යභෙදයෙන්; නටොඉව, නටත්තෙක්මෙන්; භිජ්ජතෙ, බිඳේ—

——00——

252 ඉච්චාපි මතභෙදෙන; කාරකත්තං විභාවයෙ
භූතතො කාරකානන්තු, සරූපං කිංවදෙති චෙ—

253 අඤ්ඤොව කාරකංනාම, තස්සසත්ති තදිච්ඡතෙ
සබ්බමඤ්ඤොපි තංයොගා, කාරකං අභිධීයතෙ * —

254 මුඛ්‍යතො කාරකංචඤ්ඤො, කිංසියා යෙන ඉච්ඡතෙ
එකස්සා නෙකධා භාවො, කථං යුජ්ජති වත්ථුනො-

255 සත්තිභෙදා අභින්නෙපි, වත්ථුම්හි තන්නිමිත්තකො
අයංකාරක වොහාරො, භින්නෙනාපි නවිරුජ්ඣතෙ-

---

252 ඉච්චපි, මේ කාරිකාග්‍රන්ථයෙහිද; කාරකත්තං, කාරකත්වය; මතභෙදෙන, අභිප්‍රාය විශෙෂයෙන්; විභාවයෙ, ප්‍රකාශකරන්නේය; භූතතො, ස්වභාවයෙන්; කාරකානංතු, කාරකයන්ගේ වනාහි; සරූපං,(වෙන්වෙන්වූ) ස්වරූපය; කිංඉතිචෙ, කුමක්දැයි? වදේ, කියන්නේය;—

(මෙහි අපිශබ්දය වාක්‍යාරම්භාර්ථයි)

253 අඤ්ඤොඑව, අභිධෙයතෙමේම, කාරකංනාම, කාරකනම්වේ; සත්ති, ශක්තිතොමෝ; තං, ඒ (මුඛ්‍ය) කාරකයයි; ඉච්ඡතෙනන්නු; කැමැත්තේවේනොවේද? සබ්බං, සැබව; අඤ්ඤොඅපි, අභිධෙයනෙමේද; තංයොගා, ඒශක්තිය හා යෙදුනුහෙයින්; කාරකං, කාරකයයි; අභිධීයතෙ, කියනුලැබේ—

254 මුඛ්‍යතො, ප්‍රධානභාවයෙන්; අඤ්ඤොච, අභිධෙයතෙමේද; කාරකං, කාරකනම්වේ (යයි සමහරෙක් කියත්තේය) යෙන, යම්දෝෂයකින්; (මෙසේ මුඛ්‍යවූඅභිධෙය අමුඛ්‍යභාවයෙන් කාරකනමැයි) ඉච්ඡතෙ, කැමැතිවේද; කිංසියා, (ඒදෝෂය) කිනම්වන්නේද? එකස්සවත්ථුනො, එක්වස්තුවක්හුගේ; අනෙකධාභාවො, (කර්ත්‍රාදිභෙදයෙන්) නොයෙක්ප්‍රකාරවීම; කථංයුජ්ජති, කෙසේ යොග්‍යවේද—

255 සත්තිභෙදා, ශක්තිභෙදයෙන්; අභින්නෙඅපි, වෙන්වෙන්නුවූද; වත්ථුම්හි, වස්තුවෙහි; තන්නිමිත්තකො, ඒ වෙන්වීම නිමිතිකොටඇති; අයංකාරකවොහාරො, මේ කාරකව්‍යවහාරයතෙම; භින්නෙනාපි, වෙන්වෙන්වූයේද; නවිරුජ්ඣතෙ, විරුද්ධනොවේ—

---

* සමභිධීයතෙ—පොත්කොළ

——00——

256 යථෙකොපි පටො සුක්ක, පීත රත්තාදි භෙදතො
සුත්තො සුක්කො තථා පීතො; රත්තො අඤ්ඤොපි වුච්චතෙ—

257 තථෙකම්පි වත්ථෙව, යුත්තං කාරකසත්තිහි
චිත්තාහි අපදිස්සතෙ තං තං කාරකභාවතො—

258 නත්ථි දබ්බං විනා යෙහි, න සත්තිනාම දිස්සති
දිස්සං වත්ථුං විනා යෙහි, අදිස්සං කින්නු ඉච්ඡසි—

259 වත්ථෙව කාරකං තස්මා, යුත්තං කිංඅඤ්ඤසත්තියා
සෙව තාව අසිද්ධා චෙ, තංයොගා කාරකං කථං—

---

256 යථා, යම්සේ; එකොඅපිපටො, එකම වස්ත්‍රයෙකම; සුක්කපීතරත්තාදිභෙදතො, සුදු කහාවත් රතුඅදි භෙදයෙන්; සුත්තො, යුක්තවූයේ; සුක්කො, ශ්වෙතවස්ත්‍රයයිද; තථා, එසේම; පීතො, කහාවත් වස්ත්‍රයයිද; රත්තො, රක්තවස්ත්‍රයයිද; අඤ්ඤොඅපි, අනික් නිලාදි වස්ත්‍රයයිද; වුච්චතෙ, කියනුලැබේද—

257 තථා; එසේම; එකංඅපි වත්ථුඑව, එකද (දෙවදත්තාදි) වස්තුවෙක්ම; තංතංකාරකභාවතො ඒ ඒ (කර්තෘාදි) කාරකයන්ගේභාවයෙන්; චිත්තාහි, නානාප්‍රකාරවූ; කාරකසත්තිහි, කාරකශක්තියෙන්; යුත්තං, යුක්තවූයේ; අපදිස්සතෙ, දක්නාලැබේ—

258 දබ්බං, ද්‍රව්‍යය; විහාය, හැර, යෙහි, යම්ද්‍රව්‍යයෙකින් සත්තිනාම, (ස්වරූපවශයෙන් ගතයුතුවූ) ශක්තියෙක් නම්; නදිස්සතිනනු, නොදක්නාලැබේනොවේද? දිස්සං,දක්නාලද; වත්ථුං, වස්තුව; විනාය හැර; යෙහි, යම්ද්‍රව්‍යයෙකින්; අදිස්සං, නොදක්නාලද වස්තුව; කිංඉච්ඡසිනු, කෙසේ කැමැතිවේද?--

259 තස්මා, එසේහෙයින්; වත්ථුඑව, (ප්‍රත්‍යක්ෂවූ)වස්තුවම; කාරකං, කාරකනම්වේ; අඤ්ඤසත්තියා, අනික්ශක්තියකින්; යුත්තං, යුක්තවූයේ; කිං, කවරප්‍රයොජනද? සාඑව, ඒශක්තිතොමෝම; තාව, පළමුකොට; චෙ, ඉදින්; අසිද්ධා, සිද්ධනොවන්නීනම්; තංයොගා, ඒශක්තිය හායෙදීමෙන්; කාරකං, කාරකය; කථං, කෙසේ; (සිද්ධවේ)ද?—

---00---

260 තත්‍රුපානං කරිමෙකස්ස, වත්ථුනො නෙකධා සියා
පරික්ඛරණං තදක්ඛණෙසු, ඛණිකත්තා කථංක්‍රියා-

261 උපාදනන්තරං ඛංසි, ඛණිකාංති කප්පියතෙ
දෙසන්තරං පරිප්ඵන්තා, කථං තස්සාදිසො භවෙ-

262 කථං සියා තද භාවෙ, කාරකං නික්‍රියං තතො
ක්‍රියාකාරක භාවොයං, ඛණිකත්තා වසීදති—

213 අථචිරම්දං වත්ථු, මක්‍රියඤ්ච පතීයතෙ
ක්‍රියාකාරක භාවොයං, තස්මා නෙත්ථ වසීදති—

264 යදි පතීයතෙ සායං, ක්‍රියාකාරක සණ්ඨිති
සන්ති පතීයතෙ සායං, ඉති සා පි න කිං මතා—

---

260 එකස්සවත්ථුනො, එක්වස්තුවක්හුගේ (සෙදල ක්‍ෂණය) අනෙකධා, නොයෙක්පරිද්දෙන්; කථංසියා, කෙසේවන්නේදසි; උත්තානංතත්‍ර, (ඉපිවිසින්) කියනල ද්දේනොවේද? මෙ, ඉදින්; පරික්ඛරණං, ක්‍ෂණක්‍ෂණයෙහි; තදක්ඛණං, එයින් සිතහවෙතම්; ඛණිකත්තා, ක්‍ෂණිකභාවය ඇතිකල්හි; ක්‍රියා; ක්‍රියාතොමෙ; කථං, කෙසේවන්නේද?

261 හි, යම්හෙයකින්; උපාදනන්තරං, ඉපැද්මවනන්තුරුව; ඛංසි, නස්නාසුලුවූක්‍රියාව; ඛණිකං, ක්‍ෂණිකයසි; කප්පියතෙ, කියනුලැබේද; තස්ස, ඕහුගේ; දෙසන්තරං, අනික්දෙශයෙක්හි; ඊදිසො, මෙබඳුවූ; පරිප්ඵන්තා, චලනස්වභාවක්‍රියාව; කථංභවෙ, කෙසේවන්නේද—

262 තදභාවෙ, ඒක්‍රියාව අවිද්‍යමානකල්හි; කාරකං, කාරකතෙද; නික්‍රියං, ක්‍රියාවිරහිතවූ ද්‍රව්‍යකාරකයද; කථං කවරප්‍රකාරයකින්; සියා, වන්නේද; තතො, එහෙයින්; අයංක්‍රියාකාරකභාවො, මේ (ලොකප්‍රසිද්ධ) ක්‍රියාකාරකභාවයතෙම; ඛණිකත්තා, ක්‍ෂණිකබවෙහි; අවසීදති, නැසේ—

263 අථ, නැවත; ඉදංවත්ථු, මේ (දෙවදත්තාදී) වස්තුතොමේ; චිරං, බොහෝකල් පවත්නේයයිද; අක්‍රියංච, ක්‍රියාවක්නොවත්නේයයිද; පතීයතෙ, හැඟේ; තස්මා, එහෙයින්; අයං ක්‍රියාකාරකභාවො, මේ (ලොකප්‍රසිද්ධ) ක්‍රියාකාරකභාවය; එත්ථ, මෙහි; න අවසීදති, නොනැසේ-

264 යදි, ඉදින්; සාඅයංක්‍රියාකාරක සණ්ඨිති, ඒ මේ

——00——

265 තථාහි සත්ති අස්සායං, කාරියො තම්හි පාකටො
පතීති අත්ථි ලොකානං, තස්මා සත්ති තදිස්සති—

266 වත්ථුව සත්තිනානඤ්ඤාවෙ, නසත්ති අත්ථි සබ්බදා
ඉති කිංන කරොතෙතං, කාරියං ඉච්ඡිතං සදා—

267 සතතභාවා නවෙ එවං, සිඩා සත්ති අයං න කිං
අථාපෙතං විසිඪ්ඨෙව, කාරකං කා විසිට්ඨතා—

268 දබ්බස්සයං කරොතෙත්‍යකං, සාමත්ථ්‍යං සත්තිඑව තං
කෙවලං සත්තිනා තත්තං, තස්මා සතෙනත්‍යවසත්තියො

---

ක්‍රියාකාරකයන්ගේ පැවැත්ම; පතීයතෙ, හැඟේද; සායං, ඒ මේක්‍රියාකාරකයන්ගේ පැවැත්ම; සත්ති, ශක්තියයි; පතියතෙ, හැඟේ; ඉති, එසේහෙයින්; සාඅපි, ඒ (ලොකප්‍රතීති) ශක්තිතොමෝද; කෙන, කවරකාරණයකින්; න; (ඒමේ ක්‍රියාසහිත ද්‍රව්‍යයක්මෙත්) නොවේයයි මිතා, දන්නාලද්දීද—

265 තථාහි, ඒවචනයසැබව; තම්හි, ඒ (ද්‍රව්‍යසවූ) දුසාදියෙහි; කාරියො, කාය්‍ය්‍යීය; පාකටො, ප්‍රකටය; අස්ස, ඒ දුසාදිද්‍රව්‍යයාගේ; සත්ති, ශක්ති (විෂය) වූ; ලොකානං, ලෝවැස්සන්ගේ; අයංපතීති, මේප්‍රතීතියෙක්; අත්ථි, ඇත්තේය; තස්මා, එසේහෙයින්; සත්ති, ශක්තිතොමෝ; තදිස්සති, නොදක්නාලැබේ—

266 වත්ථුඑව, වස්තුවම;සත්ති,ශක්තිනම්වේ; වෙ,ඉදින් අඤ්ඤ,(වස්තුඅනිශ්‍රිතවූ ශක්තියෙක්නම්) අන්‍යවූ ධම්ජාතියෙක්, න, නොවන්නේනම්; සබ්බදා,, හැමකල්හි; සත්ති, ශක්තිය; නඅත්ථි, නැත්තේය; ඉති, එසේහෙයින්; එතං, මේ (අග්නානදි) වස්තුතෙම; ඉච්ඡිතං, කැමැතිවූ; කාරියං, කාය්‍ය්‍යීය; සදා, හැමකල්හි; කිංනකරොති, කෙසේ නොකෙරේද—

267 එවං, මෙසේ; වෙ, ඉදින්; සතතභාවං, ශක්තියගේනැතිහෙයින්; න, නොකෙරේනම්; සිඩා, සිඩවූ; අයං සත්ති, මේශක්තිතොමෝ; කිං, කුමක්හෙයින්; න, සිඩ නොවේද; අථඅපි, නැවතද; එතං, මේවස්තුතෙම; වෙ, ඉදින්; විසිට්ඨං, (ශක්තියෙන්) වෙසෙසනලද; කාරකං, කාරකයෙක් වන්නේනම්; විසිට්ඨතා, (ද්‍රව්‍යයාගේ) වෙසෙසනලදබව; කා, කවරිද?

268 දබ්බස්සයං, ද්‍රව්‍යඇසුරුකළාවූ; සාමත්ථ්‍යං, සාම

—00—

269 සප්පධානා ක්‍රියාසිද්ධෙ, යො අඤ්ඤො තත්‍ථ වුච්චතෙ
සකත්තා වුච්චතෙ අඤ්ඤො, කරෙතීති පධානතො-

270 තත්‍රසාමග්ගි ආදිනා, ක්‍රියාසිද්ධි ම පෙක්ඛතෙ
කිං සප්පධාන මෙකස්ස, කත්තෙව සබ්බකාරකා—

271 තථාපි කරණාදීනං, ම පි කත්තුත්තතෝ ගතෙ
කරණාදීනම භාවා, කාරකං ඡබ්බිධං කථං—

272 යදිති අත්‍ථිකත්තුත්තං, වත්‍ථුතො කරණාදිසු
ක්‍රියාසිද්ධෙ තථාපෙතං, අප්පධානං පරඞ්ගතං

---

ත්‍ථිය; එකං, එක්කාරකයක්; කරෙති, කෙරේ; තං, ඒසාමත්‍ථිය; සත්තිඑව, ශක්තියමවේ; කෙවලං, හු දෙක්; සත්තිනානත්තං, සත්තිශබ්දයෙන් වෙන්වූයේවේ; තස්මා, එහෙයින්; සත්තියො, ශක්තිහු; සන්තිඑව, ඇත්තාහුමය—

269 තත්‍ථ, ඒ කාරකක්‍රමයෙහි; ක්‍රියාසිද්ධෙ, ක්‍රියාසිද්ධි විෂයෙහි; යොඅඤ්ඤො, යම්අනිකෙක්තෙමේ; සප්පධානා, සම්ප්‍රධානභාවයෙන්; වුච්චතෙ, කියනුලැබේද; පධානතො, ප්‍රධානභාවයෙන්; කරෙති, (සම්හෙයකින් ක්‍රියාව) කෙරේද; ඉති, එහෙයින්; සොඅඤ්ඤො, ඒඅනිකතෙමේ; කත්තා, කර්තෘයයි; වුච්චතෙ, කියනුලැබේ—

270 ක්‍රියාසිද්ධි, ක්‍රියාසිද්ධිතොමෝ; සාමග්ගිආදිනා, සාමග්‍රිආදියෙන්; අපෙක්ඛතෙතත්‍ර, අපෙක්ෂාකෙරේනම් වේද? එකස්ස, එක්කාරකයක්හුගේ; (ක්‍රියාවගේසිද්ධියපි ණිස) සප්පධානං, සප්‍රධානබව; කිං, කෙසේවන්නේද? සබ්බකාරකා, සියලු කාරකයෝ; කත්තාඑව, කර්තෘමවන් නාහුනොවේද?—

271 තථාපි, ඒවමනයසැබව; කරණාදීනංඅපි, කරණාදි කාරකයන්ගේද; කත්තුත්තනයොගතො; කර්තෘභාවයෙන්යෙදෙනහෙයින්; කරණාදීනං, කරණාදිකාරකයන්ගේ; අභාවා, නොවනහෙයින්; කාරකං, කාරකය; කථං, කෙසේ, ඡබ්බිධං, සයවැදෑරුම්වන්නේද?—

272 යදිති, ඉදින්වනාහි; ක්‍රියාසිද්ධෙ, ක්‍රියාසිද්ධි විෂයෙහි කරණාදිසු, කරණාදිකාරකයන්හි; වත්‍ථුතො, ස්වභාවයෙන්; කත්තුත්තං, කර්තෘත්වය; අත්‍ථි, ඇත්තේද? තථාපි

—00—

273 කරණාදීසු මඤ්ඤෙසු, කාරකෙසු පධානතො
ලක්ඛණං තං තදඞ්ගත්තා, කත්තුත්ත මුපසජ්ජනං-
274 තස්මා සෙව භවෙ කත්තා, යො පධානං පතීයතෙ
පාකාදිකං ක්‍රියං කුබ්බං, කරණාදි පුරස්සරො—
275 යො තස්ස පෙසකත්තෙන, පත්ති මුපගච්ඡති
සප්පයොජක කත්තොති, වුත්තො තස්ස පයොජකො
276 යො කම්මම්ව කත්තාති, ව්‍යපදෙසෙන දීපිතො
කත්තුභාවොපි කම්මත්ථො, කම්මකත්තාති වුච්චතෙ

---

එනකුදුවුවන්; එනං, මේකර්තෘත්වය, පරඞ්ගනං, අන්‍යකරණාදීන්ගේ අවයවභාවයෙන්; අප්පධානං, අප්‍රධානවේ- ('පරඞ්ගනං' යනු පඤ්චම්‍යර්ථයෙහි උපයොග වචනයි)

873 අඤ්ඤෙසු, (එහින්) අන්‍යවූ; කරණාදිසු කාරකෙසු, කරණාදි කාරකයන්හි, (කරණාදිත්වය) පධානතො, ප්‍රධානභාවයෙන්; (කියන්ට කැමැතිවනලද්දේද) තංතු එයවනාහි; තදඞ්ගං, ඒකරණාදි කාරකයන්ගේ අවයව හෙයින්; ලක්ඛණං, (අන්‍යකාරක යන්හි ප්‍රධානත්වයෙහි) උපලක්ෂණවේ; කත්තත්තමුපසජ්ජනං, කර්තෘත්වයෙහි අප්‍රධානවේ—(මෙහිද 'තදඞ්ගං' යනු පඤ්චම්‍යර්ථයෙහි විභ්‍යායි)

374 තස්මා, එසේහෙයින්; සොඑව, ඒ පදාර්ථයම; කත්තාභවෙ, කර්තෘනම්වන්නේය; යො, යම් පදාර්ථයෙක්; පධානං, ප්‍රධානභාවයෙන්; පතීයතෙ, (ආචාර්‍ය්‍යාවිසින්)ව්‍යවහාරකරනුලැබේද; පාකාදිකංක්‍රියං, පචනාදි ක්‍රියාව; කුබ්බං, කරන්නාවූ; කරණාදිපුරස්සරො, කරණාදිකාරකයන්ට ප්‍රධානවූ—

275 යො, යම්පදාර්ථයෙක්තෙම; තස්ස, ඒකර්තෘහුගේ පෙසකත්තෙන, මෙහෙයනබැවින්; පත්තිං, ප්‍රාප්තියට, උපගච්ඡති, යේද; සො; ඒපදාර්ථයතෙම; තස්ස, ඒප්‍රධාන කර්තෘහට; පයොජකො, මෙහෙයනබැවින්; පයොජකකත්තාඉති. ප්‍රයොජක කර්තෘයයි; වුත්තො, කියනලද්දේය,

276 යො, යම්පදාර්ථයෙක්; කම්මංඉව, කර්මයවැනි, කත්තා, කර්තෘවේද; ඉති, මෙසේ; ව්‍යපදෙසෙන, ව්‍යපදෙශයෙන්; දීපිතො, (කර්මභාවය) ප්‍රකාශකරනලද්දේද; ක

——00——

277 සුඛං තස්ස හි සිජ්ඣන්තො, කම්මත්ථස්ස සයං විය
ව්‍යපදෙසෙ කම්මකත්තා, අත්තනො පද සංයුතො—

278 අවුත්තෙ කත්තරි සති, තතියාඑව ජායතෙ
අභිහිතෙ ච පඨමා, ලිඞ්ගත්ථමත්තං පෙක්ඛිය—

279 බ්‍යාපියතෙ යං ක්‍රියාය, කත්තු තං කම්මමුච්චතෙ
නිබ්බත්ති විකතිප්පත්ති; භෙදෙන තිවිධං මතං—

280 අභූත තබ්භාවකාලා, යංකම්ම මුපලක්ඛිතං—
අවිපරීතකං කම්මං, තදඤ්ඤං විපරීතකං—

281 ගෙහුයොග්‍යතා තභිහිතෙ, දුතියා ජායතෙ සදා
අභිහිතෙ ච පඨමං. ලිඞ්ගත්ථං පන පෙක්ඛිය—

---

කත්තුභාවො අපි, කර්තෘවූද; කම්මත්ථො, (ඒ) කර්මාර්ථය තෙම; කම්මකත්තාඉති, කර්මකර්තෘයයි; වුච්චතෙ, කියනු ලැබේ—

277 හි, යම්හෙයකින්; තස්සකම්මත්ථස්ස, ඒකර්මාර්ථයාතමා; සයං, තෙමේ; සුඛං, සැපසේ; සිජ්ඣන්තොවිය, සිඬවන්නාක්මෙන්වේද; (එසේහෙයින්) ව්‍යපදෙසෙ, වැනිකොටකීමෙහි; කම්මකත්තා, කර්මකර්තෘතෙම; අත්තනොපදසංයුතො, ආත්මනෙපදයෙන් යුක්තවේ—

278 කත්තරි, කර්තෘකාරකය; අවුත්තෙසති, අනුක්තකල්හි; තතියාඑව, තෘතීයාවිභක්ති තොමෝම; ජායතෙ, වේ; අභිහිතෙච, උක්තකල්හිද; ලිඞ්ගත්ථමත්තං, ලිඞ්ගාර්ථමාත්‍රය; අපෙක්ඛිය, බලා; පඨමා, ප්‍රථමාවිභක්තිවේ-

279 කත්තු, කර්තෘහුගේ; ක්‍රියාය, ක්‍රියාවහා; යං, යම් කාරකයෙක්; බ්‍යාපියතෙ; සම්බන්ධකරණුලැබේද; තං, ඒකාරකයතෙම; කම්මං, කර්මයයි; වුච්චතෙ, කියනුලැබේ; නිබ්බත්ති, නිර්වෘත්තිය; විකති, විකෘතිය; පත්ති, ප්‍රාප්තිය යන; භෙදෙන, ප්‍රකාරයෙන්; තිවිධං, තුන්වැදෑරුම්යයි; මතං, දත්තාලද්දේය—

280 අභූතතබ්භාවකාලා, අභූත තද්භාවකාලයෙන්; යංකම්මං, යම්කර්මයෙක්; උපලක්ඛිතං, උපලක්ෂණයකරණලද්දේද; කම්මං, (ඒ) කර්මයතෙම; අවිපරීතකං, අවිපරීතකනම්වේ; තදඤ්ඤං, එයින්අන්‍යවූයේ; විපරීතකං, විපරීතකනම්වේ—

281 ගෙහුයොග්‍යත, බොහෝසෙයින්; අනභිහිතෙ, අනුක්

——00——

282 කම්මභෙදං ඉතො අක්ඛිං, සද්දසත්ථෙ පකාසිතං
ඉච්ඡිතා දිප්පභෙදෙන, කම්මං සත්තවිධං භවෙ—

283 තත්‍ර ක්‍රියාභිසම්බන්ධා, යදි කම්මං ඉච්ඡතෙ
සබ්බමෙතං භවෙ කම්මං, කාරකං භාවයොගතො-

284 ව්‍යාපිකත්තෙන යං කිඤ්චි, ක්‍රියාය තත්‍ර ලබ්භතෙ
නාඤ්ඤ කාරක භාවෙන, තං කම්මමිති ගය්හතෙ-

285 කත්තාදි කාරකත්තඤ්ඤං, තංතං භාවූපලක්ඛිතං
ක්‍රියායොගෙ පි න කම්මං, කාරකං තං විසුං සියා--

---

නකල්හි; සදා, හැමකල්හි; දුතියාජායතෙ, විතීයාවිභක්තිවේ; අභිහිතෙම, උක්තකල්හිද; ලිඞ්ගත්ථංපන, ලිඞ්ගාර්ථයවනාහි; අපෙක්ඛිය, බලා; පඨමා, ප්‍රථමාවිභක්තිවේ-

282 ඉතො, මෙයින්; අක්ඛිං, අනන්‍යවූ; කම්මභෙදං, කර්මභෙදය; සද්දසත්ථෙ, (ත්‍රිමුනිව්‍යාකරණාදිඅන්‍ය) ශබ්දශාස්ත්‍රයෙහි; පකාසිතං, ප්‍රකාශකරණලද්දේය; කම්මං, කර්මයතෙම; ඉච්ඡිතාදිප්පභෙදෙන, ඉච්ඡිත අනිච්ඡිතාදි ප්‍රභෙදයෙන්; සත්තවිධංභවෙ, සත්වැදෑරුම්වේ—

283 ක්‍රියාභිසම්බන්ධා, ක්‍රියාවහා සම්බන්ධහෙයින්; ඉත, මේශබ්දශාස්ත්‍රයෙහි; යදි, ඉදින්; කම්මං, කර්මය; ඉච්ඡතෙ කැමැතිවේනම්; එතං සබ්බංකාරකං, මේසියලු කාරකයතෙම; භාවයොගතො, ක්‍රියාසම්බන්ධයෙන්; කම්මංභවෙ නනු, කර්මවන්නේනොවේද?—

284 තත්‍ර, ඒශබ්දශාස්ත්‍රයෙහි; යංකිඤ්චි; යම්කිසිඅර්ථස්වරූපයක්; ක්‍රියාය, ක්‍රියාවගේ; ව්‍යාපිකත්තෙන, ව්‍යාප්තිභාවයෙන්; ලබ්භතෙ, (ආචාර්‍ය්‍යයාවිසින් විනිශ්චයකොට) දන්නාලැබේද; තං, ඒ අර්ථස්වරූපය; අඤ්ඤකාරක භාවෙන, අන්‍යකාරකත්වයෙන්; කම්මංඉති, කර්මකාරකයයි; ගය්හතෙ, (විනිශ්චයකොට) ගන්නාලැබේ—

285 කත්තාදිකාරකංතු, කර්ත්‍රාදිකාරකයතෙමවනාහි අඤ්ඤං; අනිකෙක්වේ; තංතං භාවූපලක්ඛිතං, ඒ ඒ ක්‍රියායෙන් උපලක්ෂණය කරණලද්දේය; ක්‍රියායොගෙඅපි ක්‍රියායොගයෙහිද; කම්මං; කර්මකාරකය, න, නොවේ; තංකාරකං, ඒ (කර්ත්‍රාදී) කාරකයතෙම; විසුංසියා, වෙන්වන්නේය—

——00——

286 කත්තු ක්‍රියාපසිද්ධෙ යං; සාධකං පරමිච්ඡතෙ
කරණං තං විදූ තෙන, ක්‍රියං කත්තා කරොති ච—

,286 බාහිරජ්ඣත්තභෙදෙන, දුවිධං තං පභෙදතං *
කායාකාය පටිබද්ධ, භාවෙන උපලක්ඛිතං—

288 ත්‍යාදීහි අනභිහිතෙ, පායෙන තතියා සියා
අභිහිතෙ තු ත්‍යාදීහි, පුබ්බංව පඨමා සියා—

289 සම්මා පදීයතෙ යස්ස, දීයමානෙන යොගතො
දින්නස්ස යදි සාමිත්තං, සම්පදානං තදුච්චතෙ—

290 පූජානුග්ගහ කාමෙන, දින්නං හොති යදා තදා
දින්නස්ස සාමිකත්තා ත්‍වං, සම්පදානං විජානියං—

---

286 යංසාධනා, යම්කාරකයෙක්; කත්තු, කර්තෘහුගේ, ක්‍රියාපසිද්ධෙ, ක්‍රියාසිද්ධියෙහි; පරං, ප්‍රධානවූයේ;ඉච්ඡතෙ, දක්නාලෑබේද; තං, ඒකාරකයතෙමේ; කරණං, කරණකාරකනමැයි; විදූ, දනිත්; කත්තා, කර්තෘතෙම; තෙන, ඒකරණකොටගෙණ; ක්‍රියංකරොතිච, ක්‍රියාවකෙරේ—(චශබ්දය වචනාලඞ්කාරයි)

287 තං, ඒකරණකාරකයතෙම; බාහිරජ්ඣත්තභෙදෙන, බාහිරකරණය අධ්‍යාත්මික කරණය යනමොවුන්ගේ භෙදයෙන්; දුවිධං, දෙවැදෑරුම්වේ; පභෙදතං, (ඒ)ප්‍රභෙදය; කායාකාය පටිබද්ධභාවෙන; කායනොකායප්‍රතිබද්ධභාවයෙන්; උපලක්ඛිතං, උපලක්‍ෂණය කරණලද්දේය—

288 ත්‍යාදීහි, තිආදීන්විසින්; අනභිහිතෙ, අනුක්තකල්හි; පායෙන, බොහෝසෙයින්; තතියාසියා, තෘතීයාවිභක්තිවේ; ත්‍යාදීහි, තිආදීන්විසින්; අභිහිතෙතු, උක්තකල්හි වනාහි; පුබ්බංඉව, පෙරසේ; පඨමාසියා, ප්‍රථමාවේ—

289 යස්ස, යමක්හට; (කිසිදියකුහුවකුහුවක්) සම්මා මනාකොට; පදීයතෙ, දෙනුලැබේද; දීයමානෙන, දෙනුලබන්නහුගා, යොගතො, සම්බන්ධභාවයෙන්; යදි,ඉදින් දින්නස්ස, දුන්දෙයට; සාමිත්තං, ස්වාමිබවවේද; තං, ඒ (ප්‍රතිග්‍රාහකස්වරූප) කාරකයතෙම; සම්පදානං, සම්ප්‍රදානයයි; උච්චතෙ, කියනුලැබේ—

290 යදා, යම්කලෙක්හි; පූජානුග්ගහකාමෙන, ගරු

---

* පභෙදතො—පොත්වෙක

——00——

291 තෙන වත්ථං රජකස්ස, රඤ්ඤො දණ්ඩං දදාතිච
ඉති ආදිපයොගෙසු, න භවෙ සම්පදානියං—

292 අනිරාකරණා රධ, * තබ්භනුඤ්ඤාවසෙනහි
සම්පදානං තිධා වුත්තං, රුක්ඛායාචකභික්ඛවො—

293 අවුත්තෙපන නාමදීහි, චතුත්ථී පායතො භවෙ
වුත්තෙච පන නාමදීහි, පුබ්බංව පඨමාතිච—

294 අවධීභූතතො යස්මා, ක්‍රියාපුබ්බං තුනිස්ස‌ටනං
නිස්සරතෙ චලංවා ඤ්ඤං, අපාදානං තදුච්චතෙ—

---

ගෞරවෙච්ඡායෙන්හා කාරුණෙච්ඡායෙන්; දියතං හොති, දෙනලද්දේවේද; තදා, එකල්හි; දියතස්ස, දෙනලද ධනයාගේ; සාමිකත්තා, ස්වාමිභාවයෙන්; තං, ඒ කාරකයතෙම, සම්පදානං, සම්ප්‍රදානයයි; විජානියං, දතයුත්තේය—

291 තෙන, එහෙයින්; රජකස්ස, රදවාහට; වත්ථං ච, වස්ත්‍රයද; රඤ්ඤො, රජහට; දණ්ඩංච, දඩයද; දදාතිඉති, දෙයියත; ආදිපයොගෙසු, මෙආදිප්‍රයොගයන්හි; සම්පදානියං නභවෙ, සම්ප්‍රදානයනොවේ—

292 සම්පදානං, සම්ප්‍රදාන කාරකයතෙම; අනිරාකරණ, අනිරාකරණය; ආරාධන, ආරාධනය; අබ්භනුඤ්ඤාවසෙනහි, අබ්භනුඤ්ඤාය යන මොවුන්ගේ වශයෙන්මනාහි; තිධා, තුන්පරිද්දකින්; වුත්තං, කියනලද්දේය; රුක්ඛායාචකභික්ඛවො, රුක්ඛායාචකභික්ඛවො යනු උදාහරණයි—

293 නාමාදීහි, නි ආදීන්විසින්; අවුත්තෙපන, අනුක්තකල්හිවනාහි; පායතො, බොහෝසෙයින්; චතුත්ථීභවෙ, චතුර්ථීවිභක්තිවේ; නාමාදීහි; නිආදීන්විසින්; වුත්තෙචපන, උක්තකල්හිදවනාහි; පුබ්බංඉව, පෙරසේ; පඨමාඉතිච, ප්‍රථමාදවෙයි—

294 අවධීභූතතො, හිමාවූ; යස්මා, යම්පදාර්ථයක්හු කෙරෙන්; තුනිස්සටනං, යම්කිසිද්‍රව්‍යයක්තෙම; ක්‍රියාපුබ්බං, ක්‍රියාවබානය නිමිත්තකොට, නිස්සරතෙ; පහවේද; චලංවා, චඤ්චලවූහෝ; අඤ්ඤංවා, අචඤ්චලවූහෝ; තං, ඒ (අපගමනලක්ෂණඅවධිභූතවූ) වස්තුතෙම; අපාදානං, අපාදානකාරකයයි; වුච්චතෙ, කියනුලැබේ—

---

* අනිරාකරණමාරාධ—පොතේතෙසු

——00——

295 අපාදානං ද්විධා වුත්තං, සඥලක්ඛණවිඤ්ඤුනා
කායසංයොග පුබ්බඤ්ච, චිත්තසංයොග පුබ්බකං—

296 අවුත්තෙපන ත්‍යාදීසු, පායතො පඤ්චමී භවෙ
වුත්තෙතුපන ත්‍යාදීසු, පුබ්බංව පඨමා මතා—

297 යො ක්‍රියං කත්තුකම්මානං; ආධාරෙති පදත්ථෙකො
ඔකාසකාරකංනාම, තං චතුබ්බිධ මෙව තං—

298 ඔපසිලෙසි කොචෙ වා, ධාරෙවෙසයිකොති ච
බ්‍යාපිකො චෙව ආධාරෙ, තථා සාමීපිකො පරෙ—

299 අවුත්තෙ පන ත්‍යාදීසු, පායතො සත්තමී සියා
වුත්තෙතු පන ත්‍යාදීසු, පුබ්බංව පඨමා භවෙ—

---

295 අපාදානං, අපාදානයතෙම; කායසංයොග පුබ්බඤ්ච, කායසංයොග පූර්වඅපාදානයද; චිත්තසංයොග පුබ්බකං, චිත්තසංයොගපූර්වඅපාදානයදැයි; ද්විධා, දෙපරිද්දකින් සඥලක්ඛණ විඤ්ඤුනා, ශබ්දලක්ෂණ දත්තහුවිසින්; වුත්තං, කියනලද්දේය—

296 ත්‍යාදීසු, ති ආදින්විසින්; අවුත්තෙපන, අනුක්ත කල්හිවනාහි; පායතො; බොහෝසෙයින්; පඤ්චමීභවෙ, පඤ්චමීවිභක්තිවේ; ත්‍යාදීසු, ති ආදින්විසින්; වුත්තෙතු පන, උක්තකල්හිවනාහි; පුබ්බංඑව, පෙරමෙන්, පඨමා, ප්‍රථමාවිභක්තිවේයයි; මතා, දත්තාලද්දිය—.

297 යොපදත්ථෙකො, යම්පදාර්ථයෙක්තෙමේ; ක්‍රියං; ක්‍රියාවගේ; (ආශ්‍රයවූ) කත්තුකම්මානං, කර්තෘකර්මයන්; ආධාරයති, දරාද; තං, ඒකාරකයතෙම; ඔකාසකාරකංනාම; ඔකාසකාරකනම්වේ; තං, ඒඔකාස කාරකයතෙම, චතුබ්බිධංඑව, සතරප්‍රකාරමවේ;—

(මෙහි 'ක්‍රියං' යනු ස්වාම්‍යර්ථයෙහි ද්විතීයායි—'කත්තුකම්මානං' යනු ද්විතීයාර්ථයෙහි ස්වාමීවිභක්තියි)

298 ඔපසිලෙසිකො ආධාරෙචඑව, ඖපශ්ලෙෂිකාධාරයද; වෙසයිකොනාම, වෛෂයිකාධාරයද; බ්‍යාපිකොආධාරෙචඑව; බ්‍යාපිකාධාරයද; තථා, එසේම; පරෙ, අන්‍යවූ; සමීපිකොති, සාමීපිකාධාරයදැයි- (චතුර්විධවේ)

299 ත්‍යාදීසු, තිආදින්විසින්; අවුත්තෙපන, අනුක්තකල්හිවනාහි; පායතො, බොහෝසෙයින්; සත්තමීසියා, ස

——00——

300 කත්තාද්‍යනුගතො සුබො සද්දෙන්වො චත්‍ථමත්තකො
අතොව තූනාදිවුත්තෙතු, පඨමා සම්පවත්තතෙ—
301 තතියාදීහි වුත්තොව, කස්මා කත්තාදි කාරකෙ
ආදි න වත්තතෙවෙ ත්‍ථ,ලිඞ්ගත්‍ථමත්තං පෙක්ඛිය—
302 අනාභිභාවිතනාමෙත්වා; කත්තාදි තතියාදිහි
වුච්චතෙ අඤ්ඤථා තස්මිං, පඨමා කිං නවත්තතෙ—
303 කත්තාදිමත්ත මුද්දිශං, තතියාදීහි වුච්චතෙ
අත්‍ථමත්තෙ තිරොභූතෙ, නවා සා තත්‍ථ වත්තතෙ—

---

නාමිවිභක්තිවේ, තූනාදින්, ති ආදීන්විසින්; වුත්තෙතුපන, කියනලදකල්හිවනාහි; පුබ්බංශ්‍රව, පෙරසේ; පඨමාභවෙ, ප්‍රථමාවිභක්තිවේ—

300 කත්තාදිඅනුගතො, කර්තෘාදිෂට්කාරකයන් අනුවර්ත්‍යාවූ; සුබො, (කර්තෘාදියෙන්) අසම්මිශ්‍රවූ; සද්දෙන්‍වොව ලිඞ්ගාර්ථයනොමවනාහි; අත්‍ථමත්තකො, අර්ථමාත්‍රනම් වේ; අතොඑව, ඒහෙයින්ම; තූනාදිවුත්තෙතු, ති ආදින් විසින් උක්තකල්හි වනාහි; පඨමා, ප්‍රථමාවිභක්තිතොමෝ; සම්පවත්තතෙ, පවතී—

301 කත්තාදිකාරකෙ, කර්තෘආදිකාරකය; තතියාදීහි, තෘතීයාදීන්විසින්; වුත්තොව, උක්තකල්හිද; එත්‍ථ, මෙහි; ආදි, ප්‍රථමාවිභක්තිය; ලිඞ්ගත්‍ථමත්තං, ලිඞ්ගාර්ථමාත්‍රය; අපෙක්ඛිය, අපෙක්ෂාකොට; කස්මා, කුමක්හෙයින්; නවත්තතිඑව, නොමපවතීද?—

302 අනාභිභාවිතනාමෙත්වා, ඇතුළතපැමිණීනාමයෙහිඇති; කත්තාදි, කර්තෘාදිකාරකයතෙම: තතියාදිහි, තෘතීයාදියෙන්; වුච්චතෙ, කියනුලැබේ; අඤ්ඤථා, අන් පරිද්දකින් වන්නේනම්; තස්මිං, ඒ කර්තෘාදිකාරකයෙහි; කිං, කවර කාරණයකින්; පඨමා, ප්‍රථමාවිභක්තිතොමෝ; නවත්තතෙ, නොපවතීද—

303 උද්දිශං, දක්වනලද; කත්තාදිමත්තං, කර්තෘමාත්‍රාදිමාත්‍රය; තතියාදීහි, තෘතීයාදිනාමවිභක්තියෙන්; වුච්චතෙ, කියනුලැබේ; අත්‍ථමත්තෙ, අර්ථමාත්‍රය; තිරොභූතෙ, මුවහවූකල්හි; තත්‍ථ, එහි, සා, ඒ ප්‍රථමාවිභක්තිතොමෝ; නවත්තතෙ, නොපවතී—

——00——

304 පතීතිපථ මාරූළ්හෙ, හ්‍යත්ථෙ සද්දො පවත්තති
න සතා මත්තතො තස්ස, සබ්බදෙව පසඞ්ගතො—

305 ඉච්චත්‍ර ගතිඑසෙව, අයං සමුපලබ්භතෙ
ත්‍යාද්‍යන්තතො පි නෙවාදී, තස්ස භාවප්පධානතො

306 තස්සභාවප්පධානත්තං, තතො නිප්පත්තිතො භවෙ
ක්‍රියානුගතවාක්‍යස්ස වොහාරං උපයොගිනො—

307 අථ ත්‍යාදීති ආඛ්‍යාතෙ, එකත්තාදිප්පසඞ්ගතො
පඨමා නෙති විසෙස්සයං, භවති සා විසෙසනො—

308 සාමඤ්ඤගත මෙවාහු, නෙකත්තාදිස්සු ත්‍යාදිකා
යතො විසෙස මාලම්බ, පඨමා ජායතෙ තතො—

---

304 පතීතිපථං, ප්‍රතීතිමාර්ගයට; ආරූළ්හෙ, නැංගාවූ; අත්ථෙ හි, අර්ථයෙහිම; සද්දො, ශබ්දයතෙමේ; පවත්තති, පවතී; සතා, විද්‍යමානවූ; මත්තතො, (අර්ථ) මාත්‍රය හෙතුකොටගෙණ; න, නොපවතී; (කුමක්හෙයින්දයත්) සබ්බදාඑව, හැමකල්හිම; තස්ස, ඒ ශබ්දයාගේ; පසඞ්ගතො, (ප්‍රවෘත්ති) ප්‍රසඞ්ගයෙනි—

305 අත්‍ර, මෙහි, ඉති, මෙසේ; එසාඅයංගතිඑව, ඒ මේ ගතිතොමෝම; සමුපලබ්භතෙ, දත්නාලැබේ; ආදී, ප්‍රථමාවිභක්තිය; ත්‍යාද්‍යන්තතොඅපි, ත්‍යාද්‍යන්ත ආඛ්‍යාතශබ්දයාකෙරෙන්ද, නඑව, නොමවේ; (කුමක්හෙයින්දයත්) තස්ස, ඒ ත්‍යාද්‍යන්ත ආඛ්‍යාතශබ්දයාගේ; භාවප්පධානතො, ක්‍රියාප්‍රධානහෙයිනි—

306 ක්‍රියානුගතවාක්‍යස්ස, ක්‍රියානුගතවූවාක්‍යයාගේ; වොහාරං, ව්‍යවහාරයෙහි, උපයොගිනො, යෙදුනාවූ; තස්ස, ඒ ආඛ්‍යාතශබ්දයාගේ; භාවප්පධානත්තං, ක්‍රියාප්‍රධානබව; තතො, ඒ ආඛ්‍යාතශබ්දවශයෙන්, නිප්ඵත්තිභාවතො, නිෂ්පත්තිභාවයෙන්, භවෙ, වන්නේය—

307 අථ, ඉක්බිත්තෙන්; ත්‍යාදීති, තිආදීන්විසින්; ආඛ්‍යාතෙ, ආඛ්‍යාතශබ්දයෙහි; එකත්තාදිප්පසඞ්ගතො, එකවචනාදිඅර්ථය (සාමාන්‍යයෙන්) ප්‍රකාශකරණහෙයින්; පඨමා, ප්‍රථමාවිභක්තිතොමෝ; නෙති, නොවේයයි; විසෙස්සයං, දතයුත්තේය; සා, ඒප්‍රථමාවිභක්තිතොමෝ, විසෙසනො, විශෙෂශබ්දයන්කෙරෙන්; භවති, වේ—

308 යතො, යම්හෙයකින්; ත්‍යාදිකා, ති ආදී ආඛ්‍යා

——00——

309 යදෙවිමාය යුත්තියා, අතොව තද්ධිතාදිකං
පාපුණෙය්‍ය විසෙසතො, කථං කත්තාදිආසයා—

310 විසෙසගත මත්‍ථ තත්‍ථ, දීති කත්තාදි ගම්‍යතෙ
සද්දසත්තිස්සභාවතො, තද්ධිතාදි නජායතෙ—

311 කිත ත්‍යාදි සමාසෙහි, තද්ධිතෙහිච ඊරිතෙ
කත්තාදෙ කිං විභත්‍යන්ත, භාවො ඉහිචෙ මතං—

312 වුත්තත්ථෙන විභත්‍යන්තා, ඉති සද්දොව ගම්‍යතෙ
අභිප්පතීතියා සද්දෙ, පත්ති චෙ සද්දෙන කිං—

---

තම්හනත්ථි; සාමඤ්ඤගතංඑව, සාමාන්‍යයම්; ආහු, කීයද්ද; එකත්තාදිංච, එකත්වාදියද; න, නොකීයද්ද; නතො, එයෙන්හෙයින්; විසෙසං, විශෙෂය; ආලම්බ, අපෙක්‍ෂාකොට; පඨමාජායතෙ, ප්‍රථමාවිභක්තිවේ—

309 යදිඑව, ඉදින් එසේවීනම්; ඉමායයුත්තියා, මේ න්‍යායයෙන්; අතොවිසෙසතො එව, මේ විශෙෂ ශබ්දයාගෙරෙන්ම; තද්ධිතාදිකං, තද්ධිතාදිය; පාපුණෙය්‍ය, පැමිණෙන්නේය; කථං, කෙසේද? කත්තාදිආසයා, කර්ත්‍රාදි අර්ථය නිශ්‍රිතහෙයිනි—

310 අත්‍ර, මේ න්‍යාදත්තයෙහි; විසෙසගතං, විශෙෂගතවූ; කත්තාදි, කර්ත්‍රාදිය; ත්‍යාදීහි; ති ආදියෙන්; ගම්‍යතෙ; දන්නාලැබේ; (කුමක්හෙයින්දයත්) සද්දසත්ති සභාවතො, ශබ්දශක්තිස්වභාවයෙනි; තද්ධිතාදි, තද්ධිතාදිය; නජායතෙ, නොවේ—

311 කිත, (ණාදි) කිතකය; ත්‍යාදි, ත්‍යාදි (ආඛ්‍යාත) ය; සමාසෙහි, සමාසය යන මොවුන් විසින්ද; තද්ධිතෙහිච, (ණාදි) තද්ධිතයන් විසින්ද; කත්තාදෙ, කර්ත්‍ර ආදිකාරකය; ඊරිතෙ; උක්තකල්හි; විභත්‍යන්තං, (ත්‍යාදි) විභක්තින්ගේ; අභාවො, නොවීම; කිංඉහිචෙ, කුමක්හෙයින්වේදැයි; මතං, දන්නාලද්දේද—

312 වුත්තත්ථෙන, උක්තාර්ථයෙන්; විභත්‍යන්තාඉති, වෙන්වූ අර්ථඇඟිවීමෙන් යන, (මේ) සද්දො, යුක්තිය; අවගම්‍යතෙ, දන්නාලැබේ; සද්දෙ; ශබ්දයනෙව; අභිප්පතීතියා, අර්ථප්‍රතීතිය පිණිසවේ; චෙ, ඉදින්; පත්ති, ප්‍රාප්තියෙක්වීනම්; සද්දෙන; (නාමාදිවාචක) ශබ්දයෙන්; කිං, කවරප්‍රයොජනද?—

——00——

313 විභත්තියොත්‍ථ එවං තා, භවන්ති විනයොගතො
අවුත්තෙනෙව කත්තාදෙ, ඉති ව්‍යත්තං පරං භවෙ—

314 නනු කත්තාදි අත්‍ථොයං, වුත්තො නාමෙහිදෙවහි
සච්චං වුත්තොපි එතාහි, විනාබ්‍යත්තිං නවින්දති-

315 අබ්‍යත්තොයං කථංවුත්තො වුත්තොඅබ්‍යත්තතො කථං
ඉති විරුඬ මායාති; මාතා වඤ්ඣා ගිරා යථා—

316 නනුවුත්තොපි ධාත්‍වත්‍ථො, ධාතුනා පාදිහි විනා
අබ්‍යත්තො දිඨ්ඨොචෙවං, විරුඬං වුච්චතෙ කථං—

317 අසිඬං තදසිඬෙන, විරුඬං ඉති චෙ මතං
පාදීනං නාභිධෙය්‍යා යං, ධාත්‍වත්‍ථොති නියාමිතං-

---

313 එවං, මේ (යටකියනලද) ප්‍රකාරයෙන්; තා විභත්තියො, ඒ විභක්තිහු වනාහි; විනයොගතො, අර්ථප්‍රකාශක ලක්‍ෂණව්‍යාපාරය ලැබෙනහෙයින්; කත්තාදෙ; කර්තෘාදිකාරකය; අවුත්තෙනෙව; අනුක්තකල්හිමවෙන්, ඉති, මෙසේ; පරං, අතික්උක්තවචනය; ව්‍යත්තංභවෙ; ප්‍රකටවන්නේය—

314 අයං කත්තාදිඅත්‍ථො, මේ කර්තෘාදි අර්ථයතෙම; නාමෙහිඑවහි, (ඝටපටාදි) නාමයන් විසින්ම; වුත්තො නනු; කියනලද්දේනොවේද? සච්චං, සැබව; වුත්තො අපි, කියනලද්දේද? එතාහිවිනා, ඒ විභක්තීන්හැර; බ්‍යත්තිං, ප්‍රකටබව; නවින්දති, නොලබයි—

315 අයං, මේ කර්තෘාදිඅර්ථයතෙම; වුත්තො, (ඝටපටාදිනාමයන්) විසින් උක්තවූයේනම්; කථං, කෙසේ; අබ්‍යත්තො, අප්‍රකටවේද, අබ්‍යත්තතො, අප්‍රකටහෙයින්; කථං, කෙසේ; වුත්තො, (නාමයන්විසින්) උක්තවේද; ඉති, මෙසේ; මාතා, මවුතොමෝ; වඤ්ඣාගිරායථා, වැඳියයනවචනයමෙන්; විරුඬං, විරුඬයට; ආයාති, පැමිණේ—

316 ධාතුනා, ධාතුහුවිසින්; වුත්තොඅපි, කියනලද්දේද; ධාත්‍වත්‍ථො, ධාත්වර්ථයතෙම; පාදිහිවිනා, ප පරා යනආදියනැතිව; අබ්‍යත්තො, අප්‍රකටවූයේ; දිඨංහඳු, දක්නාලද්දේනොවේද? එවං, මෙසේ; විරුඬංඉති, ප්‍රතිපක්‍ෂයයි; කථං, කවරප්‍රකාරයකින්; වුච්චතෙ, කියනු ලැබේද?—

(මෙහි 'දිඨං' යනු ලිඛිතවිපර්‍යාසයි)

317 තං, ඒ (පෙරකියනලද) වචනය; අසිඬං, සිඬනු

——00——

318 ආරම්භාදිවිසෙසො යං, පාදිතොඤ්ඤො යදිච්ඡතෙ
ධාත්වත්ථො නනු චෙ සොපි, තදත්ථාබ්‍යතිරෙකතො-
319 අන්වයබ්‍යතිරෙකෙහි, ධාතුනෙවාභිධියතෙ
භාවො විසිට්ඨො අඤ්ඤො වා, පාදි නෙවස්ස වාචකො.
320 වාචකාභෙදතො චෙස, බ්‍යත්තං නුත්තොපි ගම්‍යතෙ
විසෙසො තස්ස බ්‍යත්තත්ථං, පාදිත්වයමපෙක්ඛතෙ-
321 අසිද්ධ සාධනං තෙන, නාසිද්ධෙ තෙනදී දිසං
තතො විභත්ති පාදිව, කත්තාදි බ්‍යඤ්ජකා සියුං—

---

වූයේය; අසිද්ධෙන, සිද්ධනොවීමෙන්; විරුද්ධංඉති, විරුද්ධයයි; චෙ, ඉදින්; මතං, දන්නාලද්දේද? අයංධාත්වත්ථො, මේ ධාත්වර්ථයතෙම; පාදීනං, පාදිශබ්දයන්ගේ; අභිධෙය්‍යො න,(නනු)අභිධානයනොවන්නේනොවේද? ඉති,මේකාරණය; නියාමිතං, නියමකරණලද්දේය—

318 අයංආරම්භාදිවිසෙසො, මේආරම්භාදිවිශෙෂය;පාදිතො, ප ආදිශබ්දයාගේ; අඤ්ඤො, අන්‍යයයි; යදි, ඉදින්; ඉච්ඡතෙ, කැමතිවේනම්; එසොඅපි, මේ ආරම්භාදිවිශෙෂයතෙමේද; තදත්ථාබ්‍යතිරෙකතො, ඒධාත්වර්ථයටවඩා වෙනසක් නැතිහෙයින්; ධාත්වත්ථොනනුව ධාත්වර්ථයනොවේද?—

319 විසිට්ඨො, විශෙෂකළද; භාවොවා, ක්‍රියාවක්හෝ අඤ්ඤොවා, අනික්ක්‍රියාවක්හෝ අන්වයබ්‍යතිරෙකෙහි, සාමාන්‍යයෙන්හා විශෙෂයෙන්; ධාතුනාඑව, ධාතුන් විසින්ම; අභිධියතෙ, කියනුලැබේ; පාදි, පාදිශබ්දයතෙම; අස්ස, ඒක්‍රියාව; නෙවවාචකො, නොමවාචකවේ—

320 එසොවිසෙසොඅපි; මේ (යථොක්ත) විශෙෂය තෙමේද; වාචකාභෙදතො, වාචකයාගේ අභෙදයෙන්; උක්තොඅපි, (ධාතුහුවිසින්) කියනලද්දේද; බ්‍යත්තං, ප්‍රකටය; නගම්‍යතෙ, (නොහැඟේ) තස්ස, ඒ විශෙෂයාගේ; බ්‍යත්තත්ථං, ප්‍රකටාර්ථය; අයංපාදිතු, මේ පාදිශබ්දයතෙමේවනාහි; අපෙක්ඛතෙ, අපෙක්ෂාකෙරේ—

321 තෙන, එහෙයින්; එතං, මේවචනය; ඊදිසං, මෙබඳුය; අසිද්ධෙන, සිද්ධනුවූවස්තුවකින්; අසිද්ධසාධනං; සිද්ධනුවූවස්තුහුගේ සිද්ධවීම; න, නොවේ; තතො, එහෙයින්; පාදිඉව, පාදිශබ්දයමෙන්; විභත්ති, (ස්‍යාදි) විභක්තිහු; කත්තාදිබ්‍යඤ්ජකාසියුං, කර්ත්‍රාදිය ප්‍රකාශකරන්නාහු වන්නාහුය—

——00——

322 යථෙව රුක්ඛසද්දෙන, ගදිතො පි බවාදිකො
විසෙසො විනාසද්දෙහි, විසෙසෙහි න ඤායති—

323 තථා නාමෙහි වුත්තොපි, කත්තාදි අවිසෙසතො
තතියාදි විභත්තීහි, බ්‍යඤ්ජතෙ භෙදවන්තිහි—

324 විජ්ජමානොපි නීලාදි, යථා දීපාදිකෙ සති
බ්‍යත්තිමායාති කත්තාදි, තථා සත්ත විභත්තියා—

325 කත්තාදිපටිබද්ධො යො, අඤ්ඤො සම්බන්ධ සඤ්ඤිතො
සම්බන්ධිද්වයමාධාරෙ, ඡට්ඨී තමවගාහතෙ—

326 විසෙසං තත්‍ථ සම්බන්ධි,සම්බන්ධො සො විසෙසතො
කිරියං කිඤ්චි නිස්සාය, සම්බන්ධො සම්පවත්තතෙ—

---

322 බවාදිකො, දුවකිතිරිආදිවූ; විසෙසො, විශෙෂය තෙම; රුක්ඛසද්දෙන, රුක්ඛශබ්දයෙන්; ගදිතොඅපි, කියනලද්දේද; විසෙසෙහි, විශෙෂවාචකවූ; සද්දෙහිවිනා ශබ්දයන්හැර; යථෙව, යම්සේම; නඤායති, නොහැඟේද—

323 තථා, එසේම; කත්තාදී, කර්තෘආදිඅර්ථයතෙමේ; අවිසෙසතො, සාමාන්‍යයෙන්; නාමෙහි, (දෙවදත්තාදි) නාමශබ්දයන්විසින්; වුත්තොඅපි, කියනලද්දේද, භෙද වන්තිහි, විශෙෂයෙහි පවත්නාශීලිවූ, තතියාදිවිභත්තීහි, තෘතියාදිනාමවිභක්තීන්විසින්, බ්‍යඤ්ජතෙ, ප්‍රකාශකර ණුලැබේ—

324 යථා, යම්සේ; විජ්ජමානොඅපි, ඇත්තාවූද, නී ලාදි, නීලපීතාදිතෙමේ; දීපාදිකෙසති, ප්‍රදීපාලොකාදි යඇතිකල්හි; බ්‍යත්තිං, ප්‍රකටභාවයට; ආයාති, ඒද; ත ථා, එසේම, සත්තවිභත්තියා, (තෘතීයාදි) සප්තවිභක්ති ඇතිකල්හි; කත්තාදි, කර්තෘආදීඅර්ථය (ප්‍රකටභාවයටපැමි ණෙන්නේ) වේ—

325 යොඅඤ්ඤො, යම්අර්ථයෙක්තෙමේ; කත්තාදිපටි බද්ධො, කර්තෘදිකාරකයෙහි ප්‍රතිබද්ධවූයේද; ස ම්බන්ධිද්වයමාධාරෙ, සම්බන්ධීන්දෙදෙනා විෂයකොටඇ ත්තේද (ඒඅර්ථයතෙම;) සම්බන්ධසඤ්ඤිතො, සම්බන්ධය යිදන්නාලද්දේය; ඡට්ඨී, ෂෂ්ඨීතොමෝ; තං, ඒසම්බන්ධා ර්ථය; අවගාහතෙ, ප්‍රකාශකෙරේ—

326 තත්‍ථ, ඒසම්බන්ධ සම්බන්ධීන් දෙදෙනාඅතුරෙන්;

---00---

327 සම්බන්ධෙනතු අවිසෙසෙ, ඡට්ඨිං ඉච්ඡන්ති භෙදකා
තනොච්චන්ති සඤ්ඤාතා, සම්බන්ධං පරිදීපිතා—

328 තච්චයම්හාපි භාවොස්සා, සම්භූතා එකතොච්චති
උභයෙසුපි යොගස්ස, ඤාතෙන විඵලත්තතො—

329 එකතො ඤායමානාපි, භෙද්‍යතො තතු ඤායතෙ
ඤායමානාය භෙද්‍යම්හා, සම්බන්ධා නභිධානතො—

330 සද්දසත්තිස්සභාවොය, මිති එත්ථ පතීයතෙ
අඤ්ඤුපෙතං කථං හොති, මිච්චෙ සම්බන්ධමඤ්ඤකෙ-

---

සම්බන්ධී, සම්බන්ධීතෙමේ; විසෙසං, විශෙෂ්‍යනම්වේ, සම්බන්ධො, සම්බන්ධයතෙම, විසෙසකො, විශෙෂණනම්වේ; යොසම්බන්ධො, ඒසම්බන්ධයතෙමේ; කිඤ්චිකිරියං; කිසි ක්‍රියාවක්; නිස්සාය, නිසා; සම්පවත්තතෙ, පවතී—

327 සම්බන්ධෙනතු, (විවෘතුන්ගේ) සම්බන්ධයවනාහි; අවිසෙසෙ, සාමාන්‍යකල්හි; භෙදකා, විශෙෂණයාකෙරෙන්; ඡට්ඨිං, ෂෂ්ඨිවිභක්තිය; ඉච්ඡන්ති, කැමැතිවෙත්; තනොච්චන්, ඒ විශෙෂණයාකෙරෙන්මී; සඤ්ඤාතා, වූ ෂෂ්ඨීතොමෝ; සම්බන්ධං; සම්බන්ධය; පරිදීපිතා, ප්‍රකාශකරන්නීවේ—

328 වයම්හාඅපි, (සම්බන්ධීන්දෙදෙනවාචක) ශබ්දවයකෙරෙන්ද; අස්සා, ඒෂෂ්ඨියගේ; භාවො, වීමතොවේ; එකතොච්චති, එකම්විශෙෂ්‍ය ශබ්දයාකෙරෙන්; සම්භූතාය, වූෂෂ්ඨියෙන්; උභයෙසුඅපි, සම්බන්ධීන්දෙදෙනා අතුරෙහුදු; යොගස්ස, සම්බන්ධයාගේ; ඤාතෙන, දැකීමෙහි; විඵලත්තතො, නිෂ්ප්‍රයොජනබැවිනි—

(මෙහි "සම්භූතාය" යී කිවමනාකල්හි යකාරයලොප් කොට 'සම්භූතා' යී කියන ලදී)

329 එකතො, එක්ශබ්දයක්හුකෙරෙන්; ඤායමානාඅපි, වන්නාවූ ෂෂ්ඨීතොමෝද; භෙද්‍යතො, විශෙෂ්‍යයාකෙරෙන්; තතුඤායතෙ, නොවේ; (කුමක්හෙයින්දයත්) භෙද්‍යම්හා, විශෙෂ්‍යයාකෙරෙන්, ඤායමානාය, වූන්නාවූ ෂෂ්ඨිවිභක්තියතමා; සම්බන්ධා නභිධානතො, සම්බන්ධය නොකියනහෙයිනි—

330 එත්ථ, මෙහිලා, අයං, මේනියමයතෙම; සද්දසත්තිස්සභාවොඉති, ශබ්දශක්තිස්වභාවයයි; පතීයතෙ, හැගේ; අඤ්ඤුපෙතං, අන්පරිද්දකින් වූයේනම්; විශෙ, දෙ

331 සම්බන්ධීනො යතො එතෙ, ඉති බුද්ධි පජායතෙ
සම්බන්ධො සොති විඤ්ඤෙය්‍යො සංසාමාදිප්පභෙදතො

332 නනු වත්ථුචයා අඤ්ඤො, සම්බන්ධො තු න දිස්සති
තං කිමෙසා මති සිද්ධා, න නිමිත්තො භවත්වයං—

333 වත්ථුචයං, නිමිත්තංචෙ, න වත්ථුචය මත්තකෙ
පසඞ්ගතො විසෙසො චෙ, පිසිද්ධං යොග්‍යමෙව තං—

334 කාරියා සම්භවා අත්ථෙ; සම්මතො ස්‍යාදිසම්භවො
සද්දවාචකතො තම්හා, සම්භූතො තස්ස දීපකො—

---

දෙනාකෙරෙහි පිහිටියාවූ; සම්බන්ධවත්ථුකෙ, ( මේ ) ස
ම්බන්ධවස්තුවෙහි; එතං, මේ නියමස්වරූපය; කථං හොති
කෙසේවේද—

331 යතො, යමක්හෙතුකොටගෙණ; එතෙ, මේව
ස්තූහුදෙදෙන; සම්බන්ධිනොඉති, සම්බන්ධඇත්තාහුයි;
බුද්ධිපජායතෙ; බුද්ධිඋපදීද; සො, ඒහෙතුවූදෙය; සම්බ
න්ධොඉති, සම්බන්ධයයි; සංසාමාදිප්පභෙදතො, සංසාමි
සම්බන්ධාදි භෙදයෙන්; විඤ්ඤෙය්‍යො, දතයුත්තේය—

332 වත්ථුචයා, වස්තුදෙකකෙරෙන්; අඤ්ඤො, අන්‍ය
වූ; සම්බන්ධොතු, සම්බන්ධයෙක්වනාහි; නදිස්සතිනනු,
නොදක්නා ලැබෙනොවේද? තං, ඒ වචනය; කිං, කුම
ක්හෙයින්කියනලද්දේද? එසාඅයං මති සිද්ධා, ඒ මේ ලො
කප්‍රසිද්ධනොමේ; නිමිත්තො, නිමිත්තෙනි; නභවතු, නො
වේවා—

333 වත්ථුචයං, වස්තුදෙක; චෙ, ඉදින්; නිමිත්තං, නිමි
ත්තවේනම්; න; යොග්‍යනොවේ; වත්ථුචයමත්තකෙ, ව
ස්තුචයමාත්‍රයෙහි; පසඞ්ගතො, පැමිණෙනහෙයිනි; චෙ,
ඉදින්; විසෙසො, විශෙෂයතෙම නිමිත්තවේනම්; තංපිසි
ද්ධං, ඒවිශිෂ්ටත්වය; යොග්‍යංඑව, යොග්‍යමවේ—

334 අත්ථෙ, (කර්ත්‍රාදි) අර්ථයෙහි; කාරියාසම්භවා,
(ස්‍යාදිවිභක්තීන්ගේ) කාර්‍ය (විජානන) යාගේ නොලැ
බෙනහෙයින්; තම්හාසද්දවාචකතො, ඒ කර්ත්‍රාද්‍යර්ථ
වාචකශබ්දයාකෙරෙන්; ස්‍යාදිසම්භවො, සිආදිවිභක්තීන්
ගේ; (කාර්‍යවිධානයාගේ) ලැබීම; සම්මතො, (ආචා
ර්‍යයන්විසින්) සම්මතකරණලද්දේය; සම්භූතො, (කර්
ත්‍රාද්‍යර්ථවාචක ශබ්දයාකෙරෙන්) වූස්‍යාදිවිභක්තිකාර්‍ය
ය; තස්ස, ඒ කර්ත්‍රාදිඅර්ථය; දීපකො, ප්‍රකාශකරන්
නේය—

——00——

335 පදවයන්තු යංකිඤ්චි, සම්බන්ධ මුපලබ්භතෙ
විසෙසණ විසෙස්සත්ථා, ඤෙය්‍යං ඉච්ඡානු රූපතො-

336 විසෙසමෙව වත්ථූනං, යදිනාම පවත්තතෙ
සාමඤ්ඤසද්දතො තෙසං, විසෙසමෙව ගම්‍යතෙ—

337 තතො පයුජ්ජතෙ කිඤ්චි, භෙදකං තං කුතොචිපි
වත්ථුං වත්ථන්තරා ඉත්ථං, විසෙසණ මනෙකධා—

338 ජාතිගුණෙහි ක්‍රියාය, දබ්බෙන ච විසෙස්සතෙ
පදත්ථො තංයථා අස්සො, සුක්කො ගන්තා විසාණවා

339 යථා අත්ථො සනාමෙහි, ඤාණාදෙවං විසෙස්සතෙ
ඤාණාදී ග් විසෙසෙන්ති, ඤාණාදීනඤ්ච ආසයො—

---

335 යංකිඤ්චිපදවයන්තු, යම්කිසිපදදෙකෙක්වනාහි; සම්බන්ධං, සම්බන්ධවූයේ; උපලබ්භතෙ, දක්නාලැබේද; විසෙසණවිසෙස්සංච, විශෙෂණවිශෙෂ්‍යයද; ඉච්ඡානුරූපතො, කැමැතිපරිද්දෙන්; ඤෙය්‍යං, දතයුත්තේය—

336 යදිනාම, ඉදින්වනාහි; එතංවත්ථූ, මේ (නීලොත්පලාදී) වස්තූනගේ; විසෙසංඑව, විශිෂ්ටවූයේම; පවත්තතෙ, පවතීද; සාමඤ්ඤසද්දතො, සාමාන්‍යශබ්දභාවයෙන්; එතං, මේ උත්පලාදිවස්තූනම; විසෙසං එව, විශිෂ්ටවූයේම; නගම්‍යතෙ, නොහැඟේ—

337 තතො, එහෙයින්; ඉත්ථං, කැමැතිවනලද; කිඤ්චිවත්ථු, කිසිවස්තුවෙක්තෙම; කුතොචිපි වත්ථන්තරා, කිසිවස්තුවිශෙෂයකින්; භෙදකං, වෙසෙසන්නේවේද; තං, ඒ; විසෙසණං, විශෙෂණනම්; අනෙකධා, නොයෙක් ප්‍රකාරයෙන්; පයුජ්ජතෙ, යෙදේ—

338 පදත්ථො, පදාර්ථයතෙම; ජාතිගුණෙහි; ජාතියෙන් හා ගුණයෙන්ද; ක්‍රියාය, ක්‍රියායෙන්ද; දබ්බෙනච, ද්‍රව්‍යයෙන්ද; විසෙස්සතෙ, වෙසෙසනුලැබේ; තංයථා, ඒකෙසේද? අස්සො, අශ්වතෙම; සුක්කො, සුදුය; ගන්තා, යන්නේය; විසාණවා, අං ඇත්තේය—

339 යථා, යම්සේ; අත්ථො, අර්ථයතෙමේ; සනාමෙහි, ස්වකීයනාමයෙන්; විසෙස්සතෙ, වෙසෙසනුලැබේද; එවං, එසේම; ඤාණාදි, ඥාන ආදිය වෙසෙසනුලැබේ; ඤාණාදිහි, ඥාන ආදිහුවනානි; විසෙසෙන්ති, (අර්ථය) වෙසෙසත්; ඤාණාදීනං, ඥාන ආදීන්ගේ; ආසයොච, ආශ්‍රයවූපදාර්ථයද වෙසෙසයි—

—:—00——

340 භෙද්‍යස්ස කස්සචි භෙදෙ, භූයො තං තංවිසෙසණං
අත්ථස්ස භෙදකත්තෙන, සද්දොපිච විසෙසණං—

341 සද්දෙන පතියන්තත්ථෙ, මනෙනෙති නියුජ්ජතෙ
ගොහි වුච්චන්ත පරියායො, වාචානස්ස විසෙස්සතෙ

342 විසෙසණ විසෙස්සත්තං, සතාදීනාදි සම්භවා
නිප්ඵාදෙහි පූරණත්ථං, වාක්‍යං වොහාරිකඤ්ච තං

343 සම්බන්ධා යෙහි යෙකෙචි; අත්ථා තෙ එව සබ්බථා
අවිනාභාවි අඤ්ඤඤ්ඤං, කිං පපඤ්චෙන තාදිනං

විසෙසණ විසෙස්ස විනිච්ඡයො

# කාරක කාරිකා සමත්තා

340 කස්සචිභෙද්‍යස්ස, කිසිවෙසෙසියයුතුවස්තුවක්හු ගේ; භෙදෙ. වෙනස්කිරීමෙක්ඇත්තේද; තංතං, ඒ ඒ අර්ථස්වරූපය; භූයො, බොහෝසේයින්; විසෙසණං, විශෙෂණනම්වේ; සද්දොඅපිච, ශබ්දයනෙමේද; අත්ථස්ස, අර්ථයාගේ; භෙදකත්තෙන, වෙනස්කරණභාවයෙන්; විසෙසණං, විශෙෂණනම්වේ—

341 අනෙකසද්දෙන, මේ (අර්ථවාචක) ශබ්දයකරණකොටගෙණ; අත්ථං, අර්ථය; පතියනාහි, (යම්හෙයකින්) හඟවද්ද; ඉහි, එහෙයින්; පරියායො, පර්‍ය්‍යායශබ්දනමැයි; නියුජ්ජතෙ, යෙදේ; ගොඉහි, ගොසී; වුච්චතෙ, කියල්ති, අස්ස, ඒශබ්දයාගේ; වාචාඉහි, වචනයයනඅර්ථය; විසෙස්සතෙ, වෙශෙසනුලැබේ—

342 විසෙසණවිසෙස්සත්තං,විශෙෂණවිශෙෂ්‍යත්වය;සතාදිනාදි සම්භවා, සි ආදි හි ආදින්ගේ එක්වීමෙන්; පූරණත්ථං, පිරීමපිණිස; තංවාක්‍යංච, (කාරකාන්විත ක්‍රියා සම්බන්ධ) ඒවාක්‍යයද; වොහාරිකංච, ව්‍යවහාරයෙහි නියුක්තවාචකයද; නිප්ඵාදෙහි, නිපදවයි—

343 යෙහි, යම්කෙනෙකුන්හා; සම්බන්ධා, සම්බන්ධවූ; යෙකෙචිඅත්ථා, යම්කිසිඅර්ථකෙනෙක්වෙද්ද; තෙ, ඒඅර්ථයෝ; සබ්බථාඑව, සියලුප්‍රකාරයෙන්ම; අඤ්ඤඤ්ඤං, ඔවුනොවුන්, අවිනාභාවී, වෙන්නොවන සුලුමෙද්ද; තාදිනං, එබඳුවූ විශෙෂණ විශෙෂ්‍යාදින්ගේ (කාරකල

344 විසෙසණවිසෙස්සානං, අභිනනත්ථපධානතා
සමාසොතිභවිසඤ්ඤොගා, සොඑකත්ථසභාවතො-
345 එකත්ථං ඉහිපිහෙතං, සමාසං අපදිසසති
එකොඅත්ථො ඉමස්සෙසති, අන්වත්ථස්ස පරිග්ගහා—
346 සමාසෙ තුම අඤ්ඤත්ථ, චඤ්ඤවජ්ජෙ විසෙසණං
අඤ්ඤයොගස්ස විච්ඡෙදං, ඵලං සමධිගිණ්හති—

---

ෂණය); පපඤ්චවන, විස්තරකිරීමෙන්; කිං, කවරප්‍රයොජනද?—

විශෙෂණවිශෙෂ්‍ය විනිශ්චයයයි

# කාරකකාරිකාතොමෝ සමාප්තයි

(දැන් සමාසලක්ෂණය ප්‍රකාශකරණුපිණිස 'විසෙසණ විසෙස්සානං' යන ආදිය කිය)—

344 විසෙසණවිසෙස්සානං; විශෙෂණවිශෙෂ්‍යයන්ගේ; අභිනනත්ථපධානතා, වෙන් වෙන්නුවූ අර්ථයාගේ ප්‍රධානභාවයවේද; ඉහ, මේ කසයින් ව්‍යාකරණෙහි; සො, ඒ, සමාසො ඉති, සමාසනමැයි, විඤ්ඤෙයො, දනයුත්තේය; (කුමක් හෙයින්දයත්) එකත්ථසභාවතො, එකාර්ථස්වභාවයෙනි-

345 හි, යම්හෙයකින්; එතංසමාසං, මේසමාසයතෙම; එකත්ථංඉහිඅපි, එකාර්ථඇත්තේයයිම; අපදිසසති, (අන්‍ය ශබ්දශාස්ත්‍රයෙහි) ප්‍රකාශකරණුලැබේද; ඉති, එසේහෙයින්; අන්වත්ථස්ස, අන්වර්ථනාමයාගේ; පරිග්ගහා, පරිග්‍රහණයහෙතුකොටගෙණ; ඉමස්ස, මේ (විශෙෂණවිශෙෂ්‍ය) පදවන්නාගේ; අත්ථො, අර්ථයතෙම; එකො, සමානවේ—

346 අතුම, මේ (සියලු) සමාසවිෂයෙහිද; චඤ්ඤවජ්ජෙ, චන්ද්‍රසමාසය වර්ජිතකොටඇති; අඤ්ඤත්ථසමාසෙ, සෙසුසමාසයෙහි; විසෙසණං, (කියනලද) විශෙෂණයතෙම; අඤ්ඤයොගස්ස, අන්‍යවිශෙෂ්‍යයාගේ; විච්ඡෙදං, (අනිෂ්වස්තුවකින්) පිරිසිඳින්නාවූ; ඵලං, ප්‍රයොජනය; සමධිගිණ්හති, සිඩකෙරේ—

සියලු සමාසයන් අතුරෙන් පළමුකොට අව්‍යයීභාවස්මාසය දක්වනු පිණිස "පුබ්බමත්ථපධානොව" යනාදිය කීය)

—:—00——

347 පුබ්බපදත්ථප්පධානොච තථා අඤ්ඤත්ථ පධානකො
නපුංසකො භවෙ සො වා, බ්‍යයීභාවොති වුච්චතෙ
348 සත්ථන්තරෙ පසිද්ධො යො, අසඞ්ඛ්‍යං ඉති නාමතො
උපකුම්භං තදුම්මත්ත, ගඞ්ග මිච්චෙවමාදිකො—
349 උත්තරත්ථප්පධානොච, යත්ථ ලිඞ්ගඤ්ච තග්ගතං
දුතියාදි තප්පුරිසො, අනෙකවිධ භෙදකො—
350 ජච්චන්ධාදි පදෙකත්ථං, කෙසඤ්චි මතසම්මතං
යථාච රාජපුරිසො, රාජපුත්තොති ආදිකො—
351 සමානත්ථා යදා යත්ථ, භෙද්‍ය භෙදකවාචකා
කම්මධාරයසමාසො, විසෙසත්ථං පවත්තති—

---

347 පුබ්බපදත්ථප්පධානොච, (යම් සමාසයෙක්) පූර්ව පදාර්ථප්‍රධානවේද; තථා, එසේම; අඤ්ඤත්ථප්පධානකො, අන්‍යපදාර්ථප්‍රධානවේද; නපුංසකොභවෙ, නපුංසකලිඞ්ග ඇතිවේද; සොච, හේසමාසයතෙම; අබ්‍යයීභාවොඉති, අබ්‍යයීභාව සමාසයයි; වුච්චතෙ, කියනුලැබේ—

348 සත්ථන්තරෙ අනික් (ව්‍යාකරණ) ශාස්ත්‍රයෙහි; යො, යම් අබ්‍යයී භාවසමාසයෙක්; නාමතො, නාමයෙන්; අසඞ්ඛ්‍යංඉති, අසඞ්ඛ්‍යනමැයි; පසිද්ධො, ප්‍රකටවේද; (එහි) උපකුම්භං තදුම්මත්තගඞ්ගංඉති, උපකුම්භං තදුම්මත්තගඞ්ගංයන, එවමාදිකො, මෙආදිය නිදර්ශනයි—

349 යත්ථ, යම්සමාසපදයෙක්හි; උත්තරත්ථප්පධානොච, පරපදාර්ථප්‍රධානවේද; ලිඞ්ගඤ්ච, ලිඞ්ගයද; තග්ගතං ඒ උත්තරපදයෙහි පැමිණියේවේද; දුතියාදිතප්පුරිසො, (ඒ) ද්විතීයාදි තත්පුරුෂ සමාසනම්වේ; අනෙකවිධ භෙදකො, නොයෙක්වැදෑරුම්වූ ප්‍රභෙදඇතිවන්නේය—

350 ජච්චන්ධාදිපදෙකත්ථං, ජච්චන්ධාදි පූර්වපදයන් පෙර්රපදයන්හා එකාර්ථබව; කෙසඤ්චි, ඇතම්ආචාර්යයින්ගේ; මතසම්මතං, මතයෙන් සම්මතකරණලද්දේය, යථාච, කෙසේද?; රාජපුරිසො රාජපුත්තොඉති, රාජපුරිසො රාජපුත්තොයන; ආදිකො, මේආදිය නිදර්ශනවේ—

351 යදා, යම්කලෙක්හි; යත්ථ, යම්සමාසවිෂයෙක්හි; සමානත්ථා, සමානාර්ථඇත්තාහුද; භෙද්‍යභෙදකවාචකා විශෙෂ්‍ය විශෙෂණ වාචකවෙද්ද; (ඒසමාසයතෙම) කම්මධාරයසමාසො, කර්මධාරය සමාසනම්වේ, විසෙසත්ථං, විශෙෂනාර්ථයෙහි; පවත්තති, පවතී—

——00——

352 විසෙසණං ජහං සත්ථං, විසෙසසත්ථං පවත්තති
තදප්පධාන මිතරං, පධානං සත්ථවත්තකං—

353 අනෙනෙව ක්‍රියායොගං, භෙද්‍යමෙවොපජායතෙ
පධානෙන යථා නීල, සරොජ මුපනීයතෙ—

354 විසෙසනම්හි ගතං යත්ථ, ලිඞ්ගමෙතං පදත්ථතො
විසෙසණ සමාසොති, කෙසඤ්චි මතසම්මතො—

355 පදන්තරස්ස යත්ථත්ථො, පධානං ලිඞ්ගමස්ස ච
බහුබ්බීහි සමාසොති, අඤ්ඤත්ථො පරසම්මතො—

356 තග්ගුණාතග්ගුණොවෙති, සමාසොයං ද්විධාමතො
තං යථා ලම්බකණ්ණාහි, චිත්තගු දීඝසාගරෙ—

---

352 විසෙසණං, විශෙෂණවාචකපදයතෙම; සත්ථං, ස්වාර්ථය; ජහං, දුරුකරන්නේ; විසෙසසත්ථං, විශෙෂ්‍යාර්ථයෙහි; පවත්තති, පවතී; තං, ඒවිශෙෂණවාචක පදයතෙම; අප්පධානං, අප්‍රධානවේ; ඉතරං, අනික්විශෙෂ්‍ය වාචක පදයතෙම; පධානං, ප්‍රධානවේ; සත්ථවත්තකං, ස්වාර්ථයෙහි පවත්නේවේ—

353 අනෙනෙව, එහෙයින්ම; ක්‍රියායොගං, ක්‍රියාවහා යෙදීම; පධානෙන; ප්‍රධානභාවයෙන්; භෙද්‍යංඑව උපජායතෙ, විශෙෂ්‍යයමවේ; යථා, හේමෙසේයි; නීලසරොජං නීලොත්පලයතෙම; උපනීයතෙ, ගෙණයනුලැබේ—

354 යත්ථ, යම්කර්මධාරය සමාසයෙක්හි; පදත්ථතො, පදාර්ථභාවයෙන්; (විශෙෂිතව්‍යයාගේ ප්‍රධානභාවයෙනැයි සේයි) එතංලිඞ්ගං, මේලිඞ්ගය; විසෙසනම්හි, විශෙෂ්‍යයෙහි; ගතං, පවත්නේවේද; (ඒසමාසයතෙම) විසෙසණ සමාසොඉති, විශෙෂණසමාසයයි, කෙසඤ්චි, සමහරුන්ගේ; මතසම්මතො, අභිප්‍රායෙන් සම්මතකරණලද්දේය—

355 යත්ථ, යම් සමාසයෙක්හි; පදන්තරස්ස; අන්‍යපදයක්හුගේ; අත්ථො, අර්ථයද; අස්ස, ඒඅන්‍යපදයාගේ; ලිඞ්ගඤ්ච, ලිඞ්ගයද; පධානං, ප්‍රධානවේද; (ඒසමාසයතෙම) බහුබ්බීහිසමාසො, බහුබ්‍රීහිසමාසනම්වේ; අඤ්ඤත්ථොඉති, අන්‍යාර්ථසමාසයයි; පරසම්මතො, පරවෛයාකරණයන්විසින් සම්මතකරණලද්දේය—

356 අයංසමාසො, මේ බහුබ්‍රීහි සමාසයතෙම; තග්ගුණො, තද්ගුණසංවිඥානයද; අතග්ගුණොවඉති, අතද්ගුණ සංවිඥානයදැයි; ද්විධා, දෙපරිද්දෙකින්; මතො, දත්

—00—

357 සප්පධානම්පි යත්ථත්ථො, මිථුසාපෙක්ඛකො ඉව
ක්‍රියාසම්බන්ධ සාමඤ්ඤා, වුච්චතෙ චන්ද සඤ්ඤිතො-

358 නානාඤ්ඤමඤ්ඤං විභාවෙන්ති, චන්දෙ අත්ථා පදතිවා
සකත්ථවුත්තිතො තෙසං, පධානත්තං පකාසතෙ—

359 ඉතරීතරයොගොයං, සමාහාරො ති ච ද්විධා
සමාසොදුවිධොඤ්ඤෙති, සම්මතො චත්ථසඤ්ඤිතො

360 ඉතරීතරයොගස්මිං, අත්ථභෙද සමුබ්භවො
සඞ්ඛ්‍යානස්ස තිරො භාවො, පරංව ලිඞ්ගමෙත්ථ ච—

361 ඉතරීතරයොගොයං, භෙදමෙව අපෙක්ඛතෙ
ධම්මත්ථකාමා ඉච්චාදි, උදාහරණ මස්සච—

---

නාලද්දේය, තංයථා, හේඋදාහරණ කවරේද? ලඞ්කා ලෙණාචිත්තගු දීඝසාගරොඉති, ලඞ්කලෙණා චිත්තගුදීඝසාගරයනු උදාහරණයි—

357 යත්ථ, යම්සමාසයෙක්හි: අත්ථො, අභිධෙයතෙම; සප්පධානංඅපි, තමාප්‍රධානවූයේද; ක්‍රියාසම්බන්ධසාමඤ්ඤා, ක්‍රියාසම්බන්ධසාමාන්‍යයෙන්; මිථුසාපෙක්ඛකොඉව, ඔවුනොවුන් අපෙක්‍ෂාකරන්නාක්මෙන්වේද; (ඒසමාසයතෙම) චන්දසඤ්ඤිතො, චන්දනාමයෙන්; වුච්චතෙ, කියනු ලැබේ—

358 චන්දෙ, චන්දසමාසයෙහි; අත්ථා, අභිධෙයෝහෝ; පදතිවා, පදයෝහෝ; අඤ්ඤමඤ්ඤං, අන්‍යොන්‍යයන්; නවිභාවෙන්ති; ප්‍රකාශනොකරත්; සකත්ථවුත්තිතො, ස්වාර්ථයෙහි පැවතුම්ඇතිබැවින්; තෙසං, ඔවුන්ගේ; පධානත්තං, ප්‍රධානබව; පකාසතෙ, යෙදේ—

359 අයං, මේචන්දසමාසයතෙම; ඉතරීතරයොගොච, ඉතරීතරයොග චන්දසමාසයද; සමාහාරොචඉති, සමාහාරචන්දසමාසයද්‍යයි; ද්විධා, දෙපරද්දකින්වේ; ද්විබෙධා, දෙවැදෑරුම්වූ; සමාසො, (චන්ද)සමාසයතෙම; අඤ්ඤෙහි, අන්‍යචාත්‍රිකාචායයීන්විසින්; චත්ථසඤ්ඤිතො, චාර්ථනාමයෙන්; සම්මතො, දන්නාලද්දේය—

360 ඉතරීතරයොගස්මිං, ඉතරෙතරයොග චන්දසමාසයෙහි; අත්ථභෙදසමුබ්භවො, අභිධෙයභෙදයාගේ ඉපැද්මද; සඞ්ඛ්‍යානස්ස, සමූහයාගේ; තිරොභාවො, ප්‍රතිච්ඡන්න භාවයදවේ; එත්ථච, මේ ඉතරෙතරයොග චන්දසමාසයෙහිද; ලිඞ්ගං, ලිඞ්ගය; පරංඑව, පරමවේ—

361 අයංඉතරීතරයොගො, මේ ඉතරෙතරයොග ච

—00—

362 සඞ්ඛ්‍යාතුප්පත්තිකොයස්මිං, භෙද යස්ස තිරොහිතා
සමාහාරොතිචායං වුත්තො, එකත්තඤ්ච නපුංසකං—

363 සඞ්ඛානවන්තො සංඝාතො, ඉති භෙදචයං මතං
උදාහරණමෙතස්ස, ධම්මාධම්මන්ති ජාතියං

364 කිංනසියා ඤ්ඤවත්ථම්හි, සමාසො න්‍ව්‍යයාදිකෙ
නිසෙධාභාවතො තස්ස, සාමඤ්ඤවචනෙනිහ—

365 පරම්පරමපෙක්ඛානං; එකත්ථීභාව සම්භවා
අව්‍යයාදිකෙ චෙව, මභාවා නාස්සසම්භවො—

---

ද්වන්ද්වසමාසයතෙම; භෙදංඑව, විශෙෂයම; අපෙක්ඛිතො, බලයි; ධම්මත්ථකාමාඉති, ධම්මාර්ථකාමායන, ආදී, මේආදිය; අස්සච, මේ ඉතරෙතරයොගද්වන්ද්වසමාසයට; උදාහරණං, උදාහරණයවේ—

362 යස්මිං, යම් ද්වන්ද්වසමාසයෙක්හි; සඞ්ඛ්‍යාතුප්පත්තිකො, සමූහයාගේ උත්පත්තියවේද; යස්ස, යම්ද්වන්ද්වසමාසයෙක්හි; භෙද, විශෙෂයෝ; තිරොහිතා, ප්‍රතිච්ඡන්නවේද්ද; අයංවුත්තො, මේද්වන්ද්වසමාසයතෙමවනාහි," සමාහාරො, සමාහාරනම්වේ; එකත්තංච, එකත්වයද; නපුංසකං නපුංසකත්වයදවේ—

363 සඞ්ඛානවන්තො, සමූහඇත්තෝය; සඞ්ඛාතො ඉති, සමූහයයි; භෙදචයං, භෙදදෙක; මතං, දත්තාලද්දේය; එතස්ස, මේ සමාහාර ද්වන්ද්වසමාසයට; ධම්මාධම්මං ඉති; ධම්මාධම්මංයනු; උදාහරණංඉති, උදාහරණයයි; ජාතියං, දතයුත්තේය—

364 අව්‍යයාදිකෙ, අව්‍යයාදීවූ; අඤ්ඤවත්ථම්හි, අන්‍යවකාරාර්ථයෙහි; සමාසො, සමාසයතෙම, කිං, කුමක්හෙයින්; නසියා, නොවන්නේද? ඉහ, මේ (නාමානං සමුච්චයො ද්වන්දොනා) සමාසවිධායක සූත්‍රයෙහි; සාමඤ්ඤවචනෙන, සාමාන්‍යවචනයෙන්; තස්ස, ඒවකාරාර්ථ ද්වන්ද්වයාගේ; නිසෙධාභාවතො, ප්‍රතිෂෙධයනැතිහෙයිනි—

365 පරම්පරංඅපෙක්ඛානං, ඔවුනොවුන් අපෙක්ෂාකරන්නවුන්ගේ; එකත්ථීභාවසම්භවා, එකාර්ථීභාවයාගේලැබෙනහෙයින් (සමාසය)වේ; අව්‍යයාදිකෙච, අව්‍යයාදියෙහිද; එවං, මෙසේ; අභාවා, (ඔවුනොවුන් අපෙක්ෂාකරණ ලක්ෂණයාගේ) අභාවයෙන්; අස්ස, මේසමාසයාගේ, සම්භවො, ලැබීම; න, නොවේ—

—00—

366 අතො එවං සමත්ථාන, මෙවාය * මවතිට්ඨතෙ
සාමත්ථියතො හි තෙ තස්මිං, තං තාදිස මපෙක්ඛතෙ

367 ඉතරීතරයොගාදි, සඤ්ඤානං එව තාදිනං
අත්ථො චකාරසංයොගා, බ්‍යත්ති චත්ථො පවුච්චතෙ

368 අඤ්ඤෙප්‍යෙවංවිධා සද්දා, ජොතකාව සමත්ථා
සද්දන්තරාන්වයෙන, පධානා වාචකා න තෙ—

369 තද්ධිතත්ථොත්තරපදෙ, සමාහාරෙ භවෙ දිගු
සඞ්ඛ්‍යාපුබ්බපධානොව, කම්මධාරය ආදිකො—

370 පඤ්චකාබලභොජනං, පඤ්චගවධනාදිකං
තිලොකාදේ‍යකාදසාති, උදාහරණ මස්සච—

සමාසවිනිච්ඡයො

---

366 හි, එහෙයින්; අතොසාමත්ථියතො, ඒසාමර්ථ්‍යයෙන්; එවං, මෙසේ; අයං, මේසමාසයනෙම; සමත්ථානංඑව, ඔවුනොවුන් අපෙක්ෂාකරණ ලක්ෂණඇත්තවුන් මසම්බන්ධව; අවතිට්ඨතෙ, ලැබේ: එතස්මිං, මේකච්චායන ව්‍යාකරණයෙහි; තංතාදිසං, ඒ එබඳු පරිභාෂාසූත්‍රයෙක්; න අපෙක්ඛතෙ, නොපැණේ—

367 ඉතරීතරයොගාදි, ඉතරේතරයොගාදි සමාසය නොම; තාදිනං, එබඳුවූ; සඤ්ඤානංඑව, (ඉතරේතරයොගාදි අර්ථවාචක) ශබ්දයන්ගේම; අත්ථො, අර්ථයවේ. චකාරසංයොගා, චකාරයහා යෙදීමෙන්; බ්‍යත්ති, (අර්ථය) ප්‍රකටවේ; චත්ථො, (ඒසමාසය) චකාරාර්ථයයි; පවුච්චතෙ, කියනුලැබේ—

368 එවංවිධා, මෙබඳුවූ; අඤ්ඤෙසද්දාඅපි, සෙසු (වා දි) ශබ්දයෝද; ජොතකාඑව, ද්‍යෝතකවූවෝම; සමත්ථා, දන්නාලද්දහුය; තෙ, ඒනිපාතශබ්දයෝ; සද්දන්තරාන්වයෙන, අන්‍යශබ්දයක්කරා අන්වයාමෙන්; පධානා, ප්‍රධානව, න වාචකා, වාචකනොවෙත්—

369 තද්ධිතත්ථෙ, තද්ධිතාර්ථය; උත්තරපදෙ; අන්‍යපදාර්ථයෙහිද; සමාහාරෙ, සමාහාරයෙහිද, දිගුභවෙ; දිගුසමාසයවේ; සඞ්ඛ්‍යාපුබ්බපධානොව, සඞ්ඛ්‍යාපූර්වද සඞ්ඛ්‍යාප්‍රධානදවේ; කම්මධාරයආදිකො, කර්මධාරයසමාසාදියනිශ්‍රිතදවේ—

370 පඤ්චකාබලභොජනං, පඤ්චකාබලභොජනංය

---

* මෙතස්ස මවතිට්ඨතෙ—පොත්කෙසු

---00---

371 අබ්‍රාහ්මණොති ආදිම්හි, නකාරෙනො නිරූපයතෙ
තස්සෙසො පරියුදාසො, පසජ්ජස්ස නිසෙධනං—

372 සෙදයෙනාසො පරියුදාසො, නඤ්ඤං පරියුද්දිස්සති
වත්ථුංකිඤ්චි විනිධාති; කාරකඤ්ඤං ක්‍රියායුතං—

373 අඤ්ඤතාවිධිප්පධානොව; වුත්තො පරියුදාසකො
නිවත්තෙතනයංකිඤ්චි, වත්ථන්තර පරිග්ගහා—

374 අධම්මො සයනෙ නාස්මිං, ධම්මමත්තං, නිවත්තතෙ
අඤ්ඤො වධාදි අපරෙ, බාධකත්තෙන ගම්‍යතෙ—

---

ත්‍රද; පඤ්චගවධනාදිකං, පඤ්චගවධනංගතආදියද; තිලොකාදි, තිලොකංගතආදියද; එකාදසඉති, එකාදසයතුද; අස්ස, මේද්විගුසමාසයට; උදාහරණං, නිදර්ශනවේ--

## සමාස විනිශ්චයයි

371 අබ්‍රාහ්මණොඉති, අබ්‍රාහ්මණොයන; ආදිම්හි, මේආදියෙහි; නකාරෙනො, නකාරයකියනෙමේ; නිරූපයතෙ, කල්පනාකරණුලැබේ; තස්සෙනො, නකාරයකියනෙමේ; පරියුදාසො, පර්යුදාසප්‍රතිෂෙධයද; පසජ්ජංනිසෙධනංව, ප්‍රසජ්‍යප්‍රතිෂෙධයදවේ—

372 නඤ්ඤං, නකාරයකිය; කිඤ්චිවත්ථු, (කත්‍රාදිවශයෙන් ව්‍යවස්ථා කළාවූ) කිසි (බ්‍රාහ්මණාදි) කාරකයක්; පරියුද්දිස්සති, නවතාද; ක්‍රියායුතං, ක්‍රියායෙන්යුක්තවූ; අඤ්ඤංකාරකං, අනික් (කර්ත්‍රාදි කාරකසම්බන්ධ බ්‍රාහ්මණාදශ ක්‍ෂත්‍රියාදිවූ)කාරකයක්; විනිධාති, පිහිටුවාද; සො, ඒනශබ්දයතෙම; පරියුදාසො, පර්යුදාසයයි; සෙයොනා, දනයුත්තේය —

373 අඤ්ඤා, එහෙයින්; පරියුදාසකො, පර්යුදාසශබ්දයතෙම; යංකිඤ්චි, යම්කිසි (කැමැතිවූ) වස්තුවක්; නිවත්තෙනත, වැළකීමෙන්ද; වත්ථන්තරපරිග්ගහා, අනික්වස්තුවක්හුගේ පරිග්‍රහණයෙන්ද; විධිප්පධානොඑව, භාවප්‍රධානමැයි; වුත්තො, කියනලද්දේය—

374 අධම්මොසයතිග්ගහි, අධර්මොසයතියන; අස්මිං, මෙප්‍රයොගයෙහි; ධම්මමත්තං, ධර්මමාත්‍රය; නිවත්තතෙ, නවතයි; අපරෙ, (ධර්මයෙන්) අන්‍යවූ; වධාදි, වධාදිවූ; අඤ්ඤො, අන්‍යයතෙම; බාධකත්තෙන, බාධකත්වයෙන්; ගම්‍යතෙ, හැඟේ—

—00—

375 පසජ්ජපටිසෙධොතු, සත්තියාව නිවත්තතෙ
කාරකාඤ්ඤමනිධාය, භවෙ භාවස්ස කස්සචි—

376 නිවත්තිපරතායෙව, පසජ්ජපටිසෙධකෙ
අභාවො භවතීත්‍යත්‍ර, භාවො එව නිවත්තතෙ—

377 යෙස මාරොපනෙනෙන, කාරකත්තං න ඤායතෙ
නිවත්තිමෙවෙ ත්‍ය් සියා, න අත්‍ථි විධිසම්භවො—

278 අභාවෙ භාවිතත්තං න, කප්පිතං නතු වත්ථුකං
විරොධා තං ක්‍රියායොගො, භවතීති නිසෙධනෙ—

379 අබ්‍රාහ්මණොව සුතෙනෙන, විපෙපා විප්පදත්තං නම
ඉට්ඨාරොපනිසෙධායං, විධි තෙනා නිරාසදෙ—

---

375 පසජ්ජපටිසෙධොතු, ප්‍රසජ්‍ය ප්‍රතිෂෙධයෙහි වනාහි; අඤ්ඤං කාරකං, (ක්‍රියායෙහි යුක්ත) අනික් කාරකයක්; අනිධාය, නොපිහිටුවා; භාවස්ස, කිසි ක්‍රියාවක්හු ගේ; සත්තියා එව, ශක්තියගේම; නිවත්තතෙ, වැළැක් මෙහි; භවෙ, වන්නේය—

376 පසජ්ජපටිසෙධකෙ, ප්‍රසජ්‍යප්‍රතිෂෙධකාරයෙහි; නිවත්තිපරතාවඑව, නිවෘත්තියපරයෙකාට ඇතිබවම වේ; අභාවො භවතීති, අභාව වෙයි යන; අත්‍ර, මේ ප්‍රයොගයෙහි; භාවො එව, භාවයම; නිවත්තතෙ, නවතී—

377 යෙසං, යම් අර්ථකෙණකුන්ගේ, කාරකත්තං; කාරකත්වය: ආරොපනෙනෙන, ආරොපනයබවයෙන්; න ඤායතෙ, නොදන්නාලැබේද; එත්, මෙබඳු අර්ථයන්හි; නිවත්තිමඑව, (ක්‍රියා) නිවෘත්තියම: සියා, වන්නේය; විධිසම්භවො, විධියගේ (වෘතුශක්තියගේ) වීමෙක්; න අත්‍ථි, නැත්තේය—

378 න, යම්හෙයකින්, අභාවෙ, අභාව (ආදිකම්මාත්‍ර) යෙහි; භාවිතත්තං, භාවක්‍රියාවගේ සම්බන්ධබව; කප්පිතං, කගනලද්දේද; වත්ථුකං, පරමාර්ථය; නතු, නොකගනලද්දේද; තං, එහෙයින්; ක්‍රියායොගො, ක්‍රියායොගයනොම; විරොධා, (භාවඅභාවයන්ගේඅන්‍යොන්‍යය) විරොධභාවයෙන්; භවතීති, වේයයි; නිසෙධනෙ, වලකයි—

379 අබ්‍රාහ්මණො එව, (ක්‍ෂත්‍රියාදි) අබ්‍රාහ්මණභාවය; සුතෙනෙන, සුත්‍රහෙතුවෙන්, තටවිපෙපා, බ්‍රාහ්මණයො

——00——

380 එවංජාතිය මඤ්ඤෙසු, සමාසලක්ඛණු ගිතං
නකාරත්ථවයං එතං, බ්‍යත්තම්හි පතීයතෙ—

381 න නිසෙධො සතො යුතො, දෙසාදිනියමං විනා
අසතොව ඵලො තස්මා, කථං අබ්‍රාහ්මණොතිචෙ--

382 නිසෙධත්ථානුවාදෙන, පටිසෙධවිධි ක්වචි
පරස්ස මිච්ඡාඤාණස්ස, ඛ්‍යාපනායො පපජ්ජතෙ--

383 පසජ්ජපටිසෙධො තු; කෙවලං වත්ථුනස්සිතා
වත්ථුතොඤ්ඤත්ථ යා වුත්ති, පර්යුදාස ලක්ඛණං--

නකාරස්ස සමාසවිනිච්ඡයො

# සමාස කාරිකා සමත්තා

---

චේ; විප්ඵන්දනං, විස්පන්දනයවේ; ඉති, මෙසේ; අයංආරොපනිසෙධො මේ ආරොපනයාගේ ප්‍රතිෂෙධයවේ; හෙන, එහෙයින්; විධි, අභිධානාන්තරපරිග්‍රහණයතෙම; අනිරාසෙද, අනවකාශතොවේ—

380 එවං, මෙසේ; ජාතියං, (පර්යුදාසප්‍රසජ්‍යසඞ්ඛ්‍යාත උදාහරණවිෂයසදෘශ) අවස්ථාවද, අඤ්ඤංම, අන්‍යන කාරාර්ථයද, සමාසලක්ඛණුගිතං, සමාසලක්ෂණවශයෙන් කල්පනාකරණලද්දේය; එතංනකාරත්ථවයං, මේ නකාරාර්ථදෙක; ඉති, මෙසේ; බ්‍යත්තං, ප්‍රකටකොට; පතීයතෙ, දන්නාලැබේ—

381 සතො, විද්‍යමානවස්තුහුගේ; නිසෙධො, ප්‍රතිෂෙධය; දෙසාදිනියමංවිනා, දෙශාදිනියමයක්නැතිව, නයුතො, (යම්හෙයකින්) යොග්‍යතොවේද; තස්මා, එසේහෙයින්; අසතොව, අවිද්‍යමානවස්තුහුගේ ප්‍රතිෂෙධය; අඵලො, නිෂ්ඵලවේ, අබ්‍රාහ්මණොඉති, අබ්‍රාහ්මණයන ප්‍රයොගයතෙම; කථංඉතිචෙ, කෙසේයෙදේදයත්?-

382 නිසෙධත්ථානුවාදෙන, නිෂෙධාර්ථයාගේ අනුවාදයෙන්; පටිසෙධවිධි; ප්‍රතිෂෙධවිධිතෙම; ක්වචි, කිසිතැනෙක්හි; මිච්ඡාඤාණස්ස, මිථ්‍යාබුද්ධියගේ; පරස්ස, අන්‍යයාහට; ඛ්‍යාපනාය, හැඟවීමපිණිස, උපපජ්ජතෙ, පවති—

383 පසජ්ජපටිසෙධො තු, ප්‍රසජ්‍යප්‍රතිෂෙධයතෙමවනාහී; කෙවලං, සත්‍යයෙන්; වත්ථුනස්සිතා, වස්තුහුගේඅභාවත්වයවේ; වත්ථුතො, (ප්‍රතිෂෙධ) වස්තුස්වභාවයෙන්;

384 ණාදයොතු විහත්‍යන්තා, සත්තධා පච්චාදිනා
සාමඤ්ඤතො පඨමතො, සමත්ථිභාව ජායරෙ

385 වසිඨාදීසු පඨවාදිං, ණාදයො පච්චයා ඉමෙ
දීපිතා පුබ්බතො ජාතා, පරම්හා තතු දීපිතා—

386 ණාදීනං පච්චයානතතු, යුත්තාපෙක්ඛු පවත්තනං.
අපච්චාදිසු අපෙක්ඛු, සමාසො ඉව ජායතෙ—

387 තපෙස්සත්තාදි වජ්ජෙත්වාන, ගහෙත්වා තබ්බිධානතො
පුබ්බතො එව තබ්භාවෙවා, පරම්හා සම්භවොපුනො

---

අයුක්තවේ, අනන්‍යවස්තුවෙක්ත්; යාවුනාහි, යම්පැවැත්මෙ ක්වෙද; පරියුදුපලක්ඛණං, (ඒ) පරියාසුදුපත්මෙධ ලක්ෂණයවේ—

## තකාරාඤ්ඤසමාසවිනිශ්චයයි

# සමාසකාරිකාතොමෝ සමාප්තයි

---

384 ණාදයොතු, ණ යන ආදි තද්ධිතප්‍රත්‍යයෝවනාහි, විහත්‍යන්තා, විභක්ත්‍යන්තපදයාකොරෙන්; සත්තධා, සත් පරිද්දකින්; පච්චාදිනා, තිපදවනලද්දාහුය; සාමඤ්ඤතො, සාමාන්‍යයෙන්; පඨමතො, පූර්වූවසිඨශබ්දාදින්කෙරෙන්; සමත්ථිභාඑව, අර්ථාන්තරාපෙක්ෂායෙන්ම; ජායරෙ, වෙත්—

386 ඉමෙණාදයොපච්චයා, මේ ණාදිතද්ධිතප්‍රත්‍යයෝ; පුබ්බතො, පූර්වවසිඨාදිශබ්දයාකෙරෙන්; ජාතා, වූවාහු; වසිඨාදිංච, වසිෂ්ඨාදිඅර්ථයද; අපච්චාදිං, (ච) අපත්‍යාදිඅර්ථයද; දීපිතා, ප්‍රකාශකරන්නාහුය: පරම්හා, පරඅපච්චාදිශබ්දයාකෙරෙන්වූවාහු; තතුදීපිතා, ප්‍රකාශනොකරන්නාහුය—

386 ණාදීනංපච්චයානංතු, ණ ආදි ප්‍රත්‍යයන්ගේවනාහි; අපච්චාදිසුඅපෙක්ඛු, අපත්‍යාදිඅර්ථයන්හි; පවත්තනං, පැවැත්ම; යුත්තාපෙක්ඛු, යුක්තාර්ථයන්හි; (පැවති) සමාසොඉව, සමාසයමෙන්; ජායතෙ, වේ—

387 තපෙස්සත්තාදී, තපෙස්සඅපච්චං යන ආදි ප්‍රයොගයෙහ

——00——

388 අවධ්‍යවධිමන්තාන, පකතිප්පච්චයස්ස තු
නියතිච්ඡිතසිද්ධත්ථං; සඤ්ඤාසම්බන්ධයොගතො—

389 කොයං කමො පජ්ජිත්වා, යදිච්ඡිත පරිච්ඡිතං*
පයුජ්ජෙය්‍ය උපායඤ්ඤූ, උපායෙ සති තාදිසෙ—

390 නමපච්චාදි සඤ්ඤානං, පයොගස්මිං අපෙක්ඛතෙ
අත්ථ මත්තස්ස නිද්දෙසා, ණාදිවිධි පවත්තියා—

391 න පරස්මා තතො යස්මා, සබ්බදා තස්සි සම්භවො
නසෙසවා භාවතො තස්මිං, අත්ථමත්ත පරිග්ගහා—

---

ති; අවධිතොතන, ප්‍රකෘතිභාවයෙන්; ගහෙත්වා, ගෙණ; තබ්බිධානතො, ඒ අපත්‍යාදිඅර්ථයෙහිකළහෙයින්; පුබ්බතොඑව, පූර්වූවසිෂ්ඨාදිශබ්දයාකෙරෙන්ම; තබ්භාවො, ඒ ණාදිප්‍රත්‍යයන්ගේවීමවේ; පරම්හා, පරඅපච්චාදිශබ්දයාකෙරෙන්; සම්භවො, (ඒණාදිප්‍රත්‍යයන්ගේ) වීම; කුතො, කොයින්ද?

388 නියතිච්ඡිතසිද්ධත්ථං, එකාන්තයෙන්කැමැතිවනලද වසිෂ්ඨාදිප්‍රයොගයාගේසිද්ධියපිණිස;පකතිප්පච්චයස්සතු, ප්‍රකෘතිප්‍රත්‍යයලක්‍ෂණයාගේවනාහි; අවධ්‍යවධිමන්තාන,(වසිෂ්ඨාදි) මයසිද්ධරූපයෙන්හා (ණාදිප්‍රත්‍යය) අවධිමාත්‍රරූපයෙන්ද; සඤ්ඤාසම්බන්ධයොගතො, ශබ්දසම්බන්ධයොගයෙන්ද—

389 තාදිසෙ, එබඳුවූ; උපායෙසති, උපායක්ඇතිකල්හි; යදි, ඉදින්; ඉච්ඡිතං, කැමැතිවනලද(ප්‍රකෘතිභාවයාගේ)යෙදීම; පජ්ජිත්වා, හැර, පරිච්ඡිතං, අනික්ප්‍රකාරයකින්කැමැතිවනලද (තත්ස්වභාවයාගේ)යෙදීම; උපායඤ්ඤූ, උපායදන්නාතැනැත්තේ; පයුජ්ජෙය්‍ය, යොදන්නේය;අයංකමො,මේශබ්දක්‍රමයතෙම;කො,කවරේද?

390 අස්මිං, මේණාදිතද්ධිතප්‍රත්‍යයවිධානයෙහි; අපච්චාදිසඤ්ඤානං, අපච්චාදිශබ්දයන්ගේ; පයොගො, ප්‍රයොගයතෙම; ණාදිවිධිපවත්තියා, ණාදිප්‍රත්‍යයවිධියගේ පැවැත්මපිණිස; අත්ථමත්තස්ස; අර්ථමාත්‍රයාගේ; නිද්දෙසා, දැක්වීමහෙතුකොටගෙණ; නම අපෙක්ඛතෙ, අපෙක්‍ෂානොකරණුලැබේ—

391 තස්මිං, ඒතද්ධිතප්‍රත්‍යය විධානයෙහි; අත්ථමත්ත

---

* යදිච්ඡිතං පරිච්ඡිතං—සමහර

——00——

392 යද්‍යපෙක්ඛිතෙ කිඤ්චි, යතො එවති තංසමෙව
පවත්ති වත්තිච්ඡාවසා, සද්දානං තාදිසත්ථා තතො-

393 වත්තුකාමො යථායොගං, උපායං නවිරොධතෙ
යථා ඉච්ඡාය විරොධො, තථා නෙවංසම්භතෙ—

394 අසමත්ථො න සම්භොති, තතො එවානපෙක්ඛිතෙ
කථං වාක්‍යපරාධීනො, පරෙනෙකත්ථතං වජෙ—

395 ගච්ඡංච නෙන එකත්තං, තමෙව සො අපෙක්ඛතෙ
අතො තදඤ්ඤරූපස්ස, සම්භවො එත්ථ කීදිසො—

---

පරිගහනා (අපමවාදි) අර්ථමාත්‍රයාගේ පරිග්‍රහණයෙන්; තස්සඑව, ඒඅපවාදිශබ්දයාගේම, අභාවතො, නොවීමෙන්; යස්මා, යම්හෙයකින්; පරස්මා, පර (අපවාදි) ශබ්දයාගෙකරෙන්; සම්භවො, (ඒනඝිතප්‍රත්‍යයාගේ) ඉපැද්මෙක්; තත්ථ, තැත්තේද; තතො, එසේහෙයින්; සබ්බදා, හැමකල්හි; න, නොවේ—

392 යතො, යම්වසිඨාදිශබ්දයක්හුකෙරෙන්; කිඤ්චි, කිසිතාර්ථාප්‍රත්‍යයකායයීයෙක්; යදි, ඉදින්; අපෙක්ඛතෙ, අපෙක්ෂාකෙරේද; අතොඑවති, ඒවසිඨාදිශබ්දයාකෙරෙන්ම; තං, ඒකාර්යයීය; හවෙ, වන්නේය; සද්දානං, ශබ්දයන්ගේ; පවත්ති, පැවැත්ම; වත්තිච්ඡාවසා, වක්තෘ විවක්ෂාවශයෙන්වේ; තතොඅඤ්ඤථා, එසින්අන්පරිද්දකින්; න, නොවේ—

393 වත්තුකාමො, කියනුකැමැතිපුද්ගලතෙම; යථායොගං, යෙදෙන යෙදෙන පරිද්දෙන්; උපායං, (වාසිඨෝ යන ඇදි ලක්‍ෂ්‍යසිඞියට) උපායවූ (තස්සාපවාං යනාදි) ලක්‍ෂණය; නවිරොධතෙ; නොවලකයි; යථා, යම්ප්‍රකාරයකින්, ඉච්ඡාය, කැමැත්තාගේ; විරොධො, විරොධයවේද; තථා, ඒප්‍රකාරයෙන්; නෙවසම්භතෙ, නොමපවතී—

394 තතොඑව, ඒ(වසිඨාදි)ශබ්දයන්කෙරෙන්ම; අසමත්ථා,අසමර්ථභාවයෙන්; අනපෙක්ඛිතෙ, අපෙක්ෂානොකරණලද ප්‍රයොගයෙහි; නසම්භොති, (තඞිතප්‍රත්‍යය) නොවේ; අඤ්ඤපරාධීනො, අනිත්අර්ථනානාභාවයෙහි අයත්වූ වසිඨාදියතෙමේ; පරෙන, පරවූ ණාදිතඞිත ප්‍රත්‍යයහා; එකත්ථතං, එකාර්ථබවට, කථං, කෙසේ; වජෙ, පැමිණෙන්නේද?—

395 සො, ඒවසිඨාදි ශබ්දයතෙම; නෙන, ඒණාදිතඞි

——00——

396 සම්භවෙනා ච නෙතායං, ණාදිකො අවගිඨමෙ
යථා භින්න සම්බන්ධි කාරකතා භිධානතො—

397 සාමඤ්ඤනිස්සයෙ ගරු, පටිපත්ති භවෙ අයං
ඉති වෙ ලක්ඛණ මෙව, නෙවං සබ්බත්ථ වත්තනං--

398 ඤායං ආසය යොග්‍යත්තං, සබ්බමෙවන් ලක්ඛණං
පවත්තතෙ යථා ලක්ඛ්‍යං, ගරුත්තං තදිදං සමං—

399 න සක්කා ලක්ඛණෙනෙව, ඤායතො මෙව කෙවලා
පවත්තෙතුං ඉදං බ්‍යත්තං, ඉදං වුත්ත මවෙක්ඛතෙ—

---

ත ප්‍රත්‍යයහු; එකත්තං, සමානත්වයට; ගච්ඡංඑව, යත් නේම; තංඑව, ඒ ණාදියම; අපෙක්ඛතෙ, අපෙක්ෂාකෙරේ; අතො, එහෙයින්; තාදක්ෂිරූපස්ස, ඒ ණාදිප්‍රත්‍ය යෙන් අත්‍යරූපයාගේ; සම්භවො, ඉපැද්ම; එත්ථ, මේඅ ප්‍රත්‍යාදි අර්ථයෙහි; කිදිසො, කෙබදුද?—

396 නෙත, එහෙයින්; සම්භවෙනාඑව, අර්ථාන්තර පෙක්ෂායෙන්ම; අයංණාදිකො, මේ ණාදි තද්ධිතප්‍රත්‍ය යතෙමේ; අවගිඨමෙ, පවති; (කුමක්හෙයින්දයත්) යථා භින්න සම්බන්ධිකාරකතා, යථොක්ත සම්බන්ධකාරක භාවයාගේ; අභිධානතො, කියනහෙයිනි—

397 අයංපටිපත්ති, මේ ප්‍රතිපත්තිතොමෝ; සාමඤ්ඤ නිස්සයෙ, සාමාන්‍යයාගේ නිශ්‍රයඇතිකල්හි; ගරුභවෙඉ තිවෙ, ගරුවන්නේයයි සිතහද? නඑවං; මෙසේ අර්ථග්‍ර හණය නැතිකල්හි; සබ්බත්ථ, සියලුතන්හි; ලක්ඛණාම එව, (නාත්‍යරන්ත) ලක්ෂණයෙන්ම; වත්තනං, (ලක්ෂ්‍ය යාගේ) සාධනයවේවා—

398 ති; යම්හෙයකින්; සබ්බංඑවලක්ඛණං, සියලුල ක්ෂණයද; ඤායං, (අතික්) න්‍යායක්ද; ආසයයොග්‍යත්තං, සාමාන්‍යපරිග්‍රහණය බහුලකොටඇත්තේ, යථාලක්ඛ්‍යං, ලක්ෂ්‍යවූපරිද්දෙන්; පවත්තතෙ, පවතීද; තං, එසේහෙ යින්; ඉදංගරුත්තං, මේ (ප්‍රතිපත්ති) ගරුබවත; සමං, ස මානවේ—

399 කෙවලා, හුදකළාවූ; ලක්ඛණෙනෙව, ලක්ෂණ සම්බන්ධතාසූත්‍ර (නිරපෙක්ෂා) යෙන්ද; ඤායතොමඑව, යු ක්තිහෙයින්ද; ඉදං, මේලක්ෂණසම්බන්ධත ප්‍රයොගසාධ නය; බ්‍යත්තං, ව්‍යක්තකොට; පවත්තෙතුං, පවත්වන් ට; නසක්කා, නොහැක්කේය; (එහෙයින්) ඉදංවයං,

—00—

400 පටිපත්ති ගරුත්තම්පි, ලහුත්තම්පි තථා සමං
ගන්ථලහුත්ත රූපත්තං, විසෙසස්මිං විභාවියතෙ—*

401 සද්දානුස්සරණං කිඤ්චි, බහුලස්මිං ඉධෙව මතං
යථානුරූප මත්ථෙනං, බහුප්පම්පි වා භවෙ—

402 ඉදං නපරිසඞ්ඛාතං, තස්මිං සෙසෙනාපි ච එත්ථ ම
අසාරගන්ථ භාවො ච, දුබ්බොධො සොපි න විජ්ජතෙ—

403 කිඤ්චි සද්දත්ථසඞ්කාය, සබ්බස්මිං නෙව සම්භවො
සබ්බත්ථ අප්පවිපත්ති, අනිච්ඡාති නපෙක්ඛිතා—

---

මේ (ලක්ෂණත්‍රය) දෙක; අවෙක්ඛනෙ, තොදන්නා ලැබේ—

400 පටිපත්තිගරුත්තංඅපි, අවබොධගමනයාගේගරුත්වයද; තථා, එසේම; ලහුත්තංඅපි, ලඝුත්වයද; සමං, සමානවේ; අස්මිං, මේ කච්චායන ව්‍යාකරණයෙහි; ගන්ථලහුත්තරූපත්තං, ග්‍රන්ථ ලඝුත්ව ස්වරූපයවනාහ; විසෙසං, විශෙෂකොට; විභාවියතෙ, ප්‍රකාශකරණුලැබේ—

401*අස්මිං, මේ කච්චායන ව්‍යාකරණයෙහි; සද්දානුස්සරණං, ශුත්‍යනිද්‍රක්වීම; කිඤ්චි, ස්වල්පවීද; බහුලංඉති, බොහෝවීදයි; එව, ඉදින්; මතං, (පින්වත්හුවිසින්) දන්නාලද්දේද? එතං; මේ ශාස්ත්‍රානුස්මරණය; යථානුරූපං, සුදුසුපරිද්දෙන්; අත්ථි, ඇත්තේය; බහු, බොහෝහෝ; අප්පංපිවා, ස්වල්පයහෝ; භවෙ, වන්නේය—

402 ඉදං, මේ ශ්‍රුත්‍යනිද්‍රක්වීම; නපරිසඞ්ඛාතං; (පුරාතනයන්විසින්) නොකියනලද්දේනම්; තස්මිං, ඒශබ්දශාස්ත්‍රයෙහිද; එත්ථච, මේ කච්චායන ව්‍යාකරණයෙහිද; එතෙනාඑව, මෙපමණකින්ම; න, නොකියනලද්දේය; අස්මිං, මේකච්චායන ව්‍යාකරණයෙහි; අසාරගන්ථභාවොච, නිෂ්ප්‍රයොජනසුත්‍ර ග්‍රන්ථභාවයද; දුබ්බොධො, දුරවබෝධනයද; නවිජ්ජතෙ, නැත්තේය—

403 කිඤ්චි, කිසිවක්; සද්දත්ථසඞ්කාය, ශබ්දාර්ථයන්ගේ සැකයහෙතුකොටගෙණ; සබ්බස්මිං, සියලු ප්‍රදෙශයෙහි; නෙවසම්භවො, ඉපැද්මනොමවේ; සබ්බත්ථ, සියලුප්‍රදෙශයෙහි; අනිච්ඡාභිහිවෙසිතා, නොකැමැතිවනලද ශබ්දයෙහි වදින්නහුගේ; අප්පවිපත්ති, අප්‍රතිපත්තියවේ—

---

* විභාවතෙ—පෙළ්ජෙකුහු

——00——

404 සාමඤ්ඤතො පදෙසතො, විසෙසත්ථස්ස නිච්ඡයො
සමානමෙතං සබ්බස්මිං, අඤ්ඤත්‍රාභිනිවෙසතො—

405 ලක්ඛණං සබ්බමෙවෙතං, උපදෙස සහායකං
තස්මා නායෙව රූපාය, සඞ්කාය සම්භවො කුතො-

406 උග්ඝොසිතෙ තං සබ්බෙහි, තත්ථ තත්ථ සසංසයෙ
අලක්ඛණං සසන්දෙහා, බ්‍යාඛ්‍යානතො භේදනිච්ඡයො

407 නාදෙතං සබ්බං පම්මුඨං, පරදූසක භාවතො
සදූසක මනිට්ඨෙහි, * පරෙහි අලම්ස්සයා †

408 සාමඤ්ඤවචනා සිද්ධෙ, අඤ්ඤේ ඤාය වසඞ්ගතා
නයුත්තො නං පරවාදො, කතපාඨම්හි ලක්ඛණං

---

404 සාමඤ්ඤතො, සාමාන්‍යයෙන්ද; උපදෙසතො, ව්‍යාඛ්‍යානයෙන්ද; විසෙසත්ථස්ස, විශෙෂාර්ථයාගේ; නිච්ඡයො; සනිටුහන්කිරිම (සුප්‍රතිපත්තියෙන්) වේ; අභිනිවෙසතොඅඤ්ඤත්‍ර, අභිනිවෙසයහැර; සබ්බස්මිං, සියලු ශබ්දශාස්ත්‍රයෙහි; එතං; මේ පිළිපැදීම; සමානං, සමානවේ—

405 එතංසබ්බංඑව, මෙසියල්ලම; ලක්ඛණං, (කච්චායන) ලක්ෂණයවේ; උපදෙසසහායකං, ව්‍යාඛ්‍යානය සහායකොටඇත්තේය; තස්මා, එහෙයින්; එවරූපාය; මෙබඳුවූ; නායසඞ්කායඑව, ඊසැකයාගේ; සම්භවො, ඉපැද්ම; කුතො, කොයින්ද?

406 තත්ථතත්ථසසංසයෙ, ඒ ඒ සංශයසහිත ස්ථානයෙහි: එතං, මේලක්ෂණය; සබ්බෙහි, සියල්ලන්විසින්; උග්ඝොසිතං, කියනලද්දේය; සසන්දෙහා, සැකසහිතවීමෙන්; අලක්ඛණං, වීරූඛලක්ෂණයවේ; බ්‍යාඛ්‍යානතො, ව්‍යාඛ්‍යානයෙන්; භෙදනිච්ඡයො, විශෙෂයාගේ සනිටුහන්කිරීමවේ—

407 නංඑතංසබ්බං, ඒමෙසියල්ල; අනිට්ඨෙහි, අප්‍රියවූ පරෙහි, සතුරන්විසින්; පම්මුඨං, මුවහකරණලද්දේය; සදූසකං, තමන්ගේදූෂණය; පරදූසනභාවතො, සතුරන්විසින් දූෂණයකරණහෙයින්; ඉස්සයා, ඊර්ෂ්‍යාවෙන්; අලං, යුක්තවේ—

408 ඤායවසංගතා, යුක්තියගේ වසයටගියාවූ; සාමු

---

* අදිට්ඨෙහි—† අලමුස්සයා— පොත්කෙසු

—00—

409 තාදිසං ලක්ඛණං කත්වා, ඛචි බ්‍යාපිතආදිතො
සාමඤ්ඤලක්ඛණං ගාහං; තං කිංරිදි පරිස්සමො—

410 සාමඤ්ඤලක්ඛණං තස්මා, උපදෙසනුසාසිතං
සබ්බත්ථවචනතෙබ්‍යාපි, පපඤ්චනීදිසෙන කිං—

411 කථං ලක්ඛණ මිදිත්ථං, ආරකා වත්තුලෙති තං
පපඤ්චිතං විසිට්ඨං, ඉති යං කිඤ්චි වුච්චතෙ—

412 බාලරඤ්ජනකං ත්විදං, නාධීනං සාරදස්සිනා
ලහු පාකට සම්පුණ්ණ, ලක්ඛණං පණයන්තිනා—

---

ඤ්ඤුවචනා, අවිශෙෂවචනයෙන්; අතෙව්; අයිව්ය, සිබෙ සිබකල්හි; ලක්ඛණං, (විශෙෂ) ලක්ෂණය; කාතබ්බං, කටයුතුය; ඉති, එහෙයින්, තංපඨමාගො, ඊසාමාන්‍ය වචනාංගෙ පරිත්‍යාගයතෙම; තයුතො, යොග්‍යතො වේ—

409 තාදිසං, එබඳුවූවිශෙෂස්වරූපය; ලක්ඛණංකත්වා, ලක්ෂණකොට; ඛචි, කිසිතැනෙක්හි; බ්‍යාපිතආදිතො, ව්‍යාපිතාදියෙන්; සාමඤ්ඤලක්ඛණං, සාමාන්‍යලක්ෂණය; ගාහං, ගතයුතුය; තං, එහෙයින්; රිදි, මෙබඳුවූ; පරිස්සමො, පරිශ්‍රමයතෙම; කිං, කුමක්හෙයින් කරණුලැබේද?—

410 තස්මා, එහෙයින්; සාමඤ්ඤලක්ඛණං, සාමාන්‍ය ලක්ෂණය; උපදෙසනුසාසිතං, උපදෙශනයින් ආශ්‍රිතවූයේ; සබ්බත්ථ, සියලුවිශෙෂයෙහි; බ්‍යාපි, ව්‍යාපනවගසුලු වූයේ; වචනෙන, පවගී, ඊදිසෙන, මෙබඳු; පපඤ්චෙන, විස්තරයෙන්; කිං, කවරප්‍රයොජනයෙක්ද?—

411 පපඤ්චිතං, විස්තරයපිණිසය; විසිට්ඨංඉති, විශෙෂයපිණිසයයි; යංකිඤ්චි, යම්කිසිලක්ෂණයක්; වුච්චතෙ, (අපවිසින්) කියනුලැබේද; ඊදිත්ථං, මෙවැනිවූ, තංලක්ඛණං, ඒලක්ෂණයතෙමේ; ආරකාවත්තුලෙන්, අතිනිම්ණයන්කෙළරන්අනන්තවාදීන්විසින්; කථං, කරණලද්දේය—

412 ඉදංතු, මේ ශාස්ත්‍රයතොමවනාහි; බාලරඤ්ජනකං, බාලයාරඤ්ජවත්නේයයි; සාරදස්සිනා, එකාන්තාදර්ශීවූ; ලහු, ලහුවූ; පාකට, ප්‍රකටවූ; සම්පුණ්ණලක්ඛණං, සම්පූර්ණලක්ෂණය; පණයන්තිනා, (අවබොධකරණු) කැමැත්තාවූ ප්‍රාඥයාවිසින්; නාධීනං, නොහඳුරණලද්දේය—

——00——

413 පසිද්ධතදත්ථ සම්බන්ධ, කරණාදි අභාවතො
ලහු පාකට පාකටං, විපරීතාභිවෙසතො—

414 තථප්පසිද්ධසන්දෙහ, වචන පටිපක්ඛතො
උච්චාවච නිරාසාය, වචනං පරිනිට්ඨිතං—

415 සකලත්ථගුණ සඞ්ගහං, සම්පුණ්ණං ඉදමීදිසං
සන්දීපනතො ව්‍යත්තං, සවිත්ථාර මපෙක්ඛතෙ—

416 අපවාදීසු ගුණද්‍යෙත්ථො, * වුච්චමානො නිවඩ්ඪතෙ
බහුභෙදතයා තස්මා, තස්මිං නායං පපඤ්චිතො †

417 සබ්බෙපෙතතු සද්දෙත්ථො, පඤ්චධා යො පදස්සිතො
තථා තථා විසිට්ඨො සො, අත්ථො ගුණදීන මිච්ඡතෙ-

---

413 පසිද්ධතදත්ථසම්බන්ධ, ප්‍රසිද්ධතදර්ථ සම්බන්ධයක් ගේ; කරණාදිඅභාවතො. කිරීම්ආදියක් නැතිහෙයින්; ලහු, (මේ ශාස්ත්‍රයතෙම) ලඝුවේ, අපාකටං, අප්‍රකටවේ; විපරීතාභිවෙසතො, විපරීතවචනයෙහි නිවිෂ්ටනොවන හෙයින්, පාකටං, ප්‍රකටවේ—

414 අප්පසිද්ධසන්දෙහවචන, අප්‍රසිද්ධවූසංසයභාවයකරණ වචනයට; පටිපක්ඛතො, ප්‍රතිපක්ෂහෙයින්, උච්චාවචනිරාසාය; ව්‍යාකූලවූ ප්‍රකාරයාගේ නිරාකරණයෙන්, තථංවචනං, අවිපරීතවචනය; පරිනිට්ඨිතං, හාත්පසින්නිමවනලද්දේය—

415 ඊදිසං, මෙබඳුවූ; ඉදං, මේවචනයතෙම;සකලත්ථගුණසඞ්ගහං; ස්වකීයලක්ෂණය සඞ්ග්‍රහකරන්නාවූ; සම්පුණ්ණං, අවිකලවූ, සන්දීපනතො, කාත්‍යායන ලක්ෂණය ප්‍රකාශකරණහෙයින්; ව්‍යත්තං, ප්‍රකටවූ, සවිත්ථාරං, විස්තරසහිතය; අපෙක්ඛතෙ, බලයි—

416 අපවාදීසු, අපවාදාදීයෙහිවූ; ගුණද්‍යෙත්ථො, ගුණයනආදි තද්ධිතප්‍රත්‍යයන්ගේ අර්ථයතෙමේ; බහුභෙදතයා; බොහෝභෙද ඇතිබැවින්; වුච්චමානො, කියනු ලබන්නේ; අභිවඩ්ඪතෙ, අතිශයින්වැඩේ; තස්මා, එසේහෙයින්; තස්මිං, ඒකාරිකාග්‍රන්ථයෙහි; අයං, මේ (අපවාදාදිගුණාදීන්ගේ) අර්ථයතෙම; නපපඤ්චිතො, විස්තරනොකරණලද්දේය—

417 යොසද්දත්ථො, යම්ශබ්දාර්ථයෙක්තෙමේ; පඤ්චධා, පස්පරිද්දකින්, සබ්බෙපෙතතු, සංක්ෂෙපයෙන්වනා

---

* අපවාදිගුණද්‍යෙත්ථො—† පපඤ්චිතෙ—පොත්ථකෙසු-

418 තථාවා පච්චණ්‍යාදි, විසෙසෙ බව්හනෙකධා
අයමෙවා භිධෙය්‍යත්තං, ණාදීනං පටිපජ්ජතෙ—

419 කිතප්පච්චයණාදිම්හි, සඤ්ඤොගං සම්පවත්තතෙ
තාණදීසු ම'ඤ්ඤථාභාවා, වවත්ථානා න දස්සිතො—

420 අපච්චාදිව සාමඤ්ඤං, අබ්‍යයං භාවතද්ධිතං
ණාදිකං අතිවිත්ථාරං, සඞ්ගණ්හන්ති තිධා පරෙ—

# තද්ධිතකාරිකාසමත්තා

---

ති; පදස්සිතො, දක්වනලද්දේද? සො, ඒශබ්දාර්ථයතෙ ම; තථාතථා, ඒ ඒප්‍රකාරයෙන්; විසිඨො, වෙසෙසනල ද; ණාදීනං, ණාදිතද්ධිත ප්‍රත්‍යයන්ගේ; අයෙථා, අ ර්ථයසි; ඉච්ඡතෙ, කැමැතිවනුලැබේ—

418 තථාව, එසේම; අයංඑව; මේ (පස්වැදෑරුම්වූ) ශබ්දාර්ථයතෙමේම; අපච්ච ණ්‍යාදිවිසෙසෙ, අපත්‍යාර්ථණ ප්‍රත්‍යයාර්ථාදිවිශෙෂයෙන්; බහුඅනෙකධා, බොහෝනො යෙක්ප්‍රකාරයෙන්; ණාදීනං, ණයනආදිතද්ධිතප්‍රත්‍යයන් ගේ; අභිධෙය්‍යත්තං, අභිධෙයබවට; පටිපජ්ජතෙ, පැ මිණේ—

419 අයංසඤ්ඤොගො, මේසම්බන්ධතෙමේ; කිතප්පච්චය ණාදිම්හි, කිත්කප්‍රත්‍යයෙහිහා ණප්‍රත්‍යයාදි තද්ධිතප්‍රත්‍ය යෙහිද; තාණදීසුච, ති ආදි (ආඛ්‍යාත) ප්‍රත්‍යයන්හිද; සම්පව ත්තතෙ, පවතී; අඤ්ඤථාභාවා, අන්‍යප්‍රකාරයක්නැති හෙයින්; වවත්ථානා, ව්‍යවස්ථානයෙන්; නදස්සිතො, නොදක්වනලද්දේය—

420 අතිවිත්ථාරං, ඉතාවිස්තරවූ; ණාදිකං, ණාදිය තමේ; අපච්චාදි, අපත්‍යාදිවූ; සාමඤ්ඤංච, සාමාන්‍ය තද්ධිතයද; අබ්‍යයං, අව්‍යයතද්ධිතයද; භාවතද්ධිතං, භාව තද්ධිතයද්‍යයි; තිධා, තුන්පරිද්දකින්; අපරෙ, සමහරු; සඞ්ගණ්හන්ති, සඞ්ග්‍රහකරත්—

# තද්ධිත කාරිකාතොමෝ
# සමාප්තයි

---

——00——

421 යං තිපුරිසසංයුත්තං; ක්‍රියාලක්ඛණ වාචකං
කාලත්තය සමායුත්තං, කාරකත්තය සංයුතං—

422 ලිඞ්ගත්තයවිසංයුත්තං, වචනද්වයසංයුතං
සද්දසත්ථඤ්ඤුනා වුත්තං, තදක්ඛ්‍යාතන්ති වුච්චතෙ—

423 තත්ථ වුත්තාව පුරිසා, පඨමා මජ්ඣි මුත්තමා
වෙය්‍යාකරණ පොරාණ; සඞ්ඛ්‍යාය අභිලක්ඛිතා—

424 නාමතුම්හාම්හසංයොගා, අත්ථභෙදප්පකාසකා
අජ්ඣාසයන්තු සිස්සානං, පූරෙන්තිව පුණන්තිව

425 ලිඞ්ගත්තයවසෙනෙවා, පරිවත්තනභාවතො
ලිඞ්ගත්තයසාධාරණ, සනාමො ක්‍රියලක්ඛණං—

---

421 යං, යම්පදයෙක්; තිපුරිසසංයුත්තං, (ප්‍රථමමධ්‍යමෝත්තමසඞ්ඛ්‍යාත) පුරුෂත්‍රයෙන් යුක්තවේද; ක්‍රියාලක්ඛණවාචකං, (ගමනපචනාදී) ක්‍රියාලක්ෂණයකියන්නේවේද; කාලත්තයසමායුත්තං, (අතීතානාගතප්‍රත්‍යුත්පන්නසඞ්ඛ්‍යාත) කාලත්‍රයෙන්යුක්තවේද; කාරකත්තයසංයුතං, (කර්තෘකර්මභාවසඞ්ඛ්‍යාත) කාරකත්‍රයෙන් යුක්තවේද—

422 ලිඞ්ගත්තයවිසංයුත්තං,(පුංස්ත්‍රීනපුංසකසඞ්ඛ්‍යාත) ලිඞ්ගත්‍රයෙන් යුක්තනොවේද; වචනද්වයසංයුතං, (එකවචන බහුවචන සඞ්ඛ්‍යාත) වචනද්වයෙන්යුක්තවේද; සද්දසත්ථඤ්ඤුනා, ශබ්දශාස්ත්‍රඥ පණ්ඩිතයාවිසින්, වුත්තං, කියනලද්දේද; තං, ඒ; ආඛ්‍යාතංඉති, ආඛ්‍යාතය යි; වුච්චතෙ, කියනුලැබේ—

423 තත්ථ, ඒ ආඛ්‍යාතයෙහි; වුත්තා, කියනලද; පුරිසාව, පුරුෂසංඛ්‍යෝවනාහි; පඨමා, ප්‍රථමපුරුෂසංඛ්‍යා; මජ්ඣිමා, මධ්‍යමපුරුෂසංඛ්‍යා; උත්තමා, උත්තමපුරුෂසංඛ්‍යාද; වෙය්‍යාකරණපොරාණසඞ්ඛ්‍යාය, පුරාතනවෛයාකරණයන්ගේසංඛ්‍යාවෙන්; අභිලක්ඛිතා, දන්නාලද්දාහුය--

424 නාමතුම්හාම්හසංයොගා, නාමශබ්දතුම්හශබ්දඅම්හශබ්දයන් හා යෙදුනාහු; අත්ථභෙදප්පකාසකා, අර්ථවිශෙෂය ප්‍රකාශකරන්නාහු ය; සිස්සානං, ශිෂ්‍යයන්ගේ; අජ්ඣාසයංතු, අදහසවනාහි; පූරෙන්තිව, සම්පූර්ණද කෙරෙත්; පුණන්තිව, සොධනද කෙරෙත්—

425 ලිඞ්ගත්තයවසෙනඑව, ලිඞ්ගත්‍රයවශයෙන්ම; අපරිවත්තනභාවතො, නොපෙරළෙනබැවින්; ලිඞ්ගත්තය

426 ගච්ඡති පුරිසො කඤ්ඤා, ගච්ඡති මානසං තථා
ගච්ඡති එවමාදික, මුදාහරණ මස්ස ච—

427 කථං පාකාදයො භෙදා; ක්‍රියා භාවධනිං ඵුටා
කරොත්‍යත්ථො ක්‍රියාභාවො, භවත්‍යත්ථොති යුජ්ජතෙ

428 කරණං හි ක්‍රියා භාවො, භවනං භාවොති වුච්චතෙ
තතො පාකාද්‍යභිධෙය්‍යං පාකාදීනං කථං භවෙ—

429 න හි පාකාද්‍යභිධෙය්‍යෙන, කරණාදිසු කප්පතෙ
තථා භාවාද්‍යභිධෙය්‍යෙන, පාකාදිසු න යුජ්ජතෙ—

---

සාධාරණසභාවො, ලිඞ්ගත්‍රයටසාධාරණ සම්බන්ධස්වභාව
යතෙම; ක්‍රියලක්ඛණං, ක්‍රියාලක්ෂණයවේ—

426 පුරිසො, පුරුෂතෙම; ගච්ඡති, යේ; කඤ්ඤා,
කන්‍යාතොමෝ; ගච්ඡති, යේ; තථා, එසේම; මානසං,
සිතතෙමේ; ගච්ඡති, යේ; (යන) එවංආදිකං, මේ ආ
දියතෙමේ; අස්සච, මේ ක්‍රියාලක්ෂණයට, උදාහරණං,
උදාහරණයවේ—

427 පාකාදයො, පාකාදිහු; ක්‍රියාභෙදා, ක්‍රියාවිශෙෂ
යෝ; කථං, කෙසේ; භාවධනිං, භාවශබ්දය; ඵුටා, සං
ලක්ෂණය කරණලද්දාහුවෙද්ද? ති, ඒවචනයසැබව; ක
රොත්‍යත්ථො, කරයනධාතුහුගේ අර්ථයතෙමේ; ක්‍රියා, කි
රීමය; භවත්‍යත්ථො, භූ යන ධාතුහුගේ අර්ථයතෙමේ;
භාවො, වීමයයි; යුජ්ජතෙ, යෙදේ—

428 හි, යම්හෙයකින්; කරණං, කිරීම; ක්‍රියා, ක්‍රියා
නමැයිද; භවනං, වීම; භාවොඉතිච, භාවනමැයිද; වු
ච්චතෙ, කියනුලැබේද; තතො, එහෙයින්; පාකාදීනං,
පචනාදික්‍රියාවිශෙෂයන්ගේ; පාකාද්‍යභිධෙය්‍යං, පාකාදි
ශබ්දයෙන්කියයුතුඅර්ථය; කථං, කෙසේ; භවෙ, වන්නේද

429 හි, ඒවචනයසැබව; පාකාද්‍යභිධෙය්‍යෙන, පචනා
දික්‍රියා විශෙෂශබ්දයෙන් කියයුතුවූ පිසීම්ආදිඅර්ථයතෙම;
කරණාදිසු, කිරීම්ආදි ක්‍රියාවිශෙෂයන්හි; නකප්පතෙ,
නොයෙදේ; තථා, එසේම; භාවාද්‍යභිධෙය්‍යෙන, භාවා
දික්‍රියාවිශෙෂයෙන් කියයුතුවූවීම්ආදිඅර්ථයතෙමේ; පාකා
දිසු, පිසීම්ආදිඅර්ථවිශෙෂයන්හි; නයුජ්ජතෙ, නොයෙදේ—

— —00— —

430 කාර්ය්‍යරූපා ධාත්වත්ථා, සබ්බෙ සන්තා යුතා ච තෙ
තතො ක්‍රියාච භාවොච, සාමඤ්ඤං තෙසු ඤාපයෙ*
431 සාමඤ්ඤසද්දතො තෙන, සබ්බධාත්වත්ථ දීපනං
යුත්තං භාවාදිසද්දෙන, රුක්ඛවච්චො ධවාදිව—
432 විසෙසතො න පාකාදි, සබ්බධාත්වත්ථදීපකා
න පලාසාදයො සද්දා, සබ්බරුක්ඛප්පකාසකා—
433 ක්‍රියානං අපි කම්මාදි, ලිඞ්ගසඞ්ඛ්‍යාවිධා න කිං
අද්දබ්බත්තා න චෙ එවං, පාකාදිවචාදිකං කථං—
434 සිද්ධසාධ්‍යාවත්ථා භෙදා, විධා භාවො පතීයතෙ
කාරියෙන කතො ධම්මො, සිද්ධො දබ්බ මිහෙත්ථතෙ

---

430 තෙසබ්බධාත්වත්ථා, ඒසියලුධාත්වර්ථයෝ; කාරියරූපා, කෘත්‍රිමස්වභාවඇත්තාහුදවෙත්; සන්තායුතාච, විද්‍යමානත්වයෙන් යුක්තදවෙත්; තතො, එහෙයින්; ක්‍රියාච, ක්‍රියාස්වරූපධාත්වර්ථයද; භාවොච, විද්‍යමානත්වයද; තෙසු, ඒපාකාදික්‍රියාවිශෙෂයෙන්හි; සාමඤ්ඤං, සාමාන්‍යය; ඤාපයෙ, හඟවන්නේය—

431 තෙන, එහෙයින්; සාමඤ්ඤසද්දතො, සාමාන්‍ය ශබ්දභාවයෙන්; භාවාදිසද්දෙන, භාවාදික්‍රියාශබ්දයෙන්; සබ්බධාත්වත්ථදීපනං, සියලුධාත්වර්ථයන්ගේ ප්‍රකාශකිරීම; යුත්තං, යොග්‍යවේ; (කුමක්මෙන්දයත්) රුක්ඛවච්චො, වෘක්ෂවාච්‍යවූ; ධවාදිඉව, ධවඛදිර ශබ්දාදීන්මෙනි—

432 පාකාදි, ( ක්‍රියාවිශෙෂවාචක ) පාකාදිශබ්දයතෙමේ; විසෙසතො, විශෙෂශබ්දභාවයෙන්; නසබ්බධාත්වත්ථදීපකො, සියලුධාතූන්ගේ අර්ථප්‍රකාශකරන්නෙනොවේ; පලාසාදයො, පලාසශබ්දාදිවූ; සද්දා, ශබ්දයෝ; නසබ්බරුක්ඛප්පකාසකා, සියලුවෘක්ෂයන් ප්‍රකාශකරන්නාහුනොවෙත්—

433 අපි, ඉක්බිතිව; ක්‍රියානං, (පාකාදි) ක්‍රියාවන්ගේ; කම්මාදිලිඞ්ගසඞ්ඛ්‍යාවිධා, කර්මාදිලිඞ්ගසඞ්ඛ්‍යාප්‍රභෙදයෝ; කිං, කුමක්හෙයින්; න, නොවේද්ද? අද්දබ්බත්තා, ද්‍රව්‍යනොවනහෙයින්; න, නොවෙත්නම්; චෙ, ඉදින්; එවං, මෙසේසිතන්නෙහිනම්; පාකාදිඉති, පාකාදියන; ආදිකං, මේආදිවචනය; කථං, කෙසේ සිද්ධවේද?—

434 භාවො, භාවයතෙම; සිද්ධසාධ්‍යාවත්ථාභෙදා, සි

---

* ගම්‍යතෙ—පොත්ථකෙසු—

435 සිද්ධාවත්ථා කිල අදබ්බං, ණාදයො තත්ථ ජායරෙ
තදන්තානං තතො ලිඞ්ග,සඞ්ඛ්‍යාකම්මාදි සම්භවො
436 සිද්ධරූපොපි භාවොයං, සද්දසත්ති සභාවතො
දබ්බංව ගම්‍යතෙ තෙන, තත්ථ කම්මාදිසම්භවො—
437 ත්‍යාද්‍යන්තෙනතු භාවොයං,සාධ්‍යරූපො භිධීයතෙ
සඞ්ඛ්‍යාදි භෙදකෙනෙහ, සබ්භි සම්භූයතෙ යථා—.
438 අභෙදෙ කානුසඞ්ඛ්‍යාතු, භාවාඛ්‍යාතෙ සභාවතො
භෙදයත්‍ර භාවස්ස සත්තාය, දබ්බධම්මා තු තස්ස න--

---

ධසාධ්‍ය වස්ථාභෙදයෙන්; විධා, දෙපරිද්දකින්; පතීය තෙ, දන්නාලැබේ; ථම්භො කරීයතෙකතො, ථම්භො කරීයතෙ ථම්භො කතොයනු උදාහරණයි; (ථම්භො, වැ ඹ; කරීයතෙ, කරණුලැබේ; කතො, කරණලද්දේය); ඉහ, මේ සාධ්‍යසිද්ධඅවස්ථාවූ ක්‍රියාවන්අතුරෙන්; සිද්ධො; සිද්ධවූ භාවයතෙම; දබ්බංඉව, ද්‍රව්‍යයක්මෙන්; ඉක්ඛතෙ, දක්නාලැබේ—

435 දබ්බං, ද්‍රව්‍යයතෙමේ; සිද්ධාවත්ථාකිල, සිද්ධවූඅව ස්ථාවෙක්වෙයිල; තත්ථ; එහි; ණාදයො, ණ යන ආදි ප්‍රත්‍යයෝ ජායරෙ, වෙත්; තතො, එහෙයින්; තදන්තා නං, ඒණාදි ප්‍රත්‍යයාන්ත සිද්ධාවස්ථාක්‍රියාවන්ගේ, ලිඞ්ග, (පුං ස්ත්‍රී නපුංසකයන) ලිඞ්ගයාගේද; සඞ්ඛ්‍ය, (එක ත්වබහුත්ව) සඞ්ඛ්‍යාවගේද; කම්මාදි, කර්මකාරකාදීන්ගේ ද; සම්භවො, ඉපැද්මවේ—

436 අයංභාවො, මේභාවයතෙම; සිද්ධරූපොඅපි, සි ද්ධස්වභාවවූයේද; සද්දසත්තිසභාවතො ,ශබ්දශක්තිස්වභා වයෙන්; දබ්බංඉව, ද්‍රව්‍යයක්මෙන්; ගම්‍යතෙ, හැඟේ; තෙන, එහෙයින්; තත්ථ, ඒණාදි කිතකප්‍රත්‍යයෙහි; ක ම්මාදිසම්භවො, කර්මාදීන්ගේ ඉපැද්ම වේ—

437 සාධ්‍යරූපො, සාධ්‍යස්වරූපවූ; අයංභාවො, මේ භාවයතෙම; ත්‍යාද්‍යන්තෙනතු, ත්‍යාද්‍යන්ත ක්‍රියාවාචක ශබ්දයෙන්වනාහි; අභිධියතෙ, කියනුලැබේ; ඉහ, මේ (ක්‍රියාලක්ෂණවාචක) ත්‍යාද්‍යන්තයෙහි, සඞ්ඛ්‍යාදිභෙදකෙ න, සඞ්ඛ්‍යාදීභෙදයෙන්වේ; යථා, කෙසේද? සබ්භිසම්භූ යතෙ, සබ්භිසම්භූයතෙයනු උදාහරණයි—

438 භාවාඛ්‍යාතෙ, භාවාර්ථසඞ්ඛ්‍යාත ආඛ්‍යාතයෙහි; සත්තාය, විද්‍යමානභාවයෙන්, භාවස්ස, ක්‍රියාවගේ; අභෙ

———00———

439 පධාන මප්පධා නෙවං, * යත්ථ භාවවචනං භවෙ
කම්මෙ දබ්බ විමද්දාදි, කිලින්නො තණ්ඩුලාදිකෙ—

440 තත්ථ කච්චනා අඤ්ඤස්ස, ධාතුනොව කිල ගම්‍යතෙ
තණ්ඩුලානං අයං පාකො, ඉච්චාදිම්හි තදික්ඛතෙ

441 ආරබ්භ විකිලින්නත්ථං, දබ්බ සංඝට්ටනාදිනා
කම්මස්ස ගුණභූතත්තං, කිලින්නස්ස පධානතා—

442 පාකොයංතණ්ඩුලානන්ති, පච්චෙකන්තනු ඤායතෙ
සම්බන්ධා ක්‍රියා සමුහොයං, තථා කිං නනු ඉච්ඡතෙ—

---

ද, (එකත්වබහුත්වවශයෙන්) භෙදයක්නැත්තාවූ; එකත්ත සඞ්ඛ්‍යාතු, එකත්වසඞ්ඛ්‍යාතෙනාමෝ වනාහි; සභාවතො, ප්‍රකෘතියෙන්; ඤෙය්‍යා, දතයුත්තීය; තස්ස, ඒක්‍රියාවගේ දබ්බධම්මාතු, ද්‍රව්‍යස්වභාවයෝවනාහි, න, නැත්තාහුය--

439 තණ්ඩුලාදිකෙ, සාල්ආදිවූ, යත්කම්මෙ, යම්කර්මයෙක්හි; දබ්බවිමද්දාදි, ද්‍රව්‍යයාගේ මැඩීම්ආදිය;අප්පධානං, අප්‍රධානවේ; කිලින්නො, ක්ලින්නය; පධානං, ප්‍රධානවේ; එවං; මෙසේ; භාවවචනං, ක්‍රියාදෙකෙක්; භවෙ; වේ—

440 තත්ථ,ඒකර්මවිෂයෙහි;එකවචනා,එක්(ප්‍රධානවූහෝ අප්‍රධානවූහෝ) ක්‍රියාවක්හුගේකීමෙන්;අඤ්ඤස්ස, අනික්ක්‍රියාවෙක්; ධාතොඉව, කියනලද්දක්හුමෙන්; ගම්‍යතෙ කිල, හැඟේල; තණ්ඩුලානංඅයංපාකොති,තණ්ඩුලානං අයංපාකොයන; ආදිම්හි, මේආදී විෂයෙහි; තං, ඒ ප්‍රධාන අප්‍රධානක්‍රියාදෙක; ඉක්ඛතෙ, දක්නාලැබේ—

441 විකිලින්නත්ථං, (තණ්ඩුලයන්ගේ ඕදනස්වරූපයෙන්) විකෙලදනයපිණිස; ආරබ්භ, පටන්ගත්තාලදින්; දබ්බ සංඝට්ටනාදිනා, ද්‍රව්‍යයන්ගේ ගැටීම්ආදි ක්‍රියාවගේ;කම්මස්ස, කර්මයාගේ; ගුණභූතත්තං, අප්‍රධානබවවේ; කිලින්නස්ස, කෙලදනයාගේ; පධානතා, ප්‍රධානබවවේ—

442 තණ්ඩුලානං අයංපාකොති, තණ්ඩුලානං අයංපාකොයන ප්‍රයොගයෙහි; අයංසම්බන්ධා ක්‍රියාසමූහො, (වහ්නිආලිම්පනථාලනරොපනජලසෙචනාදි) මේ සියලුක්‍රියාසමූහයතෙම; පච්චෙකන්තනු; ප්‍රත්‍යක්ෂයෙන්වනාහි; ඤායතෙ, හැඟේ; කිං, කුමක්හෙයින්; තථා, සත්‍යවශයෙන්; නනුඉච්ඡතෙ; නොකැමැතිවනුලැබේද?—

---

* මප්පධානඤ්ච—පොත්ථකෙසු

—00—

443 දෙවදත්ත කුසූලාදෙ, නනුඤ්ඤකිරි ඊක්ඛතෙ
න ගාමප්පත්තිගිනනාදි, කථමජ්ජො පපජ්ජතෙ—

444 දෙවදත්තාදිතො තඤ්චෙ, නිච්චං කිං න තදික්ඛතෙ
සබ්බදා සන්නිධානත්තා, න කදාචි ඉදං භවෙ—

445 ගන්තුරූපාද්‍ය භාවා චෙ, තතො එවානුමීයතෙ
ගමනාදිකා ක්‍රියා සබ්බා, පත්තාදි ඵලදස්සනා—

446 පච්චක්ඛාචාය මිච්චස්සා, ඝටා දබ්බං පතීතියා
අඤ්ඤථා චක්ඛනාමඤ්ඤු, සබ්බස්සාප්‍ය විසෙසතො—

## ධූපිසාදි ක්‍රියා විනිච්ඡයො

443 දෙවදත්තකුසූලාදෙ, දෙවදත්තයා ගබ්ජිති කුසූ ලොහිජ්ජනෙයන ආදී ප්‍රයොගයෙන්; අඤ්ඤකිරියා, අනික් ක්‍රියාවෙක්; නඉක්ඛතෙනනු, නොබලනුලැබේනො වේද? ගාමප්පත්තිගිනනාදි, ග්‍රාමප්‍රාප්ති ගිනනාදි ක්‍රියාඵලය; අජ්ජ, අද; කථං, කෙසේ; උපපජ්ජතෙ, උපදීද?--

444 දෙවදත්තාදිතො, දෙවදත්තාදි ද්‍රව්‍යයෙන්; තං, ඒගමට පැමිණීම්ආදි ඵලයවේයයි; චෙ, ඉදින් සිතහිතම්; කිං, කුමක්හෙයින්; සබ්බදා, හැමකල්හි; සන්නිධානත්තා,(දෙවදත්තාදිවස්තූන්ගේ) සන්නිහිත භාවයෙන්; තං ඒගමට පැමිණීම්ආදි ක්‍රියාව; නිච්චං, නිත්‍යයෙන්; න ඉක්ඛතෙ, නොබලාද? ඉදං, මේ ගමනපචනාදි කාර්‍ය්‍යය; කදාචි, කිසිකලෙකත්හි; නභවෙ, (නිත්‍ය) නොවේ—

445 ගන්තුරූපාද්‍යභාවා, ගන්තුස්වරූප දෙවදත්තාදි ද්‍රව්‍යයාගේ අභාවයෙන්; චෙ, ඉදින් (හැමකලහි ඒගමට පැමිණීම්ආදි කාර්‍ය්‍යය නොලැබේයයි) සිතහිතම්; තතො එව, එහෙයින්ම; ගමනාදිකා, ගමනආදිවූ; සබ්බාක්‍රියා සියලුක්‍රියාතොමෝ; පත්තාදිඵලදස්සනා, පැමිණීම්ආදි යගේ ඵලයදක්නාහෙයින්; අනුමීයතෙ, අනුමානකර නුලැබේ—

446 අයං, මේ ක්‍රියාතොමෝ; පච්චක්ඛාච, ප්‍රත්‍යක්ෂ මවේ; (කුමක්හෙයින්දයත්) ඉති, මෙසේ; අස්සා, මේක්‍රියාවගේ; ඝටාදබ්බං; ද්‍රව්‍යවූපරිද්දෙත්; පතීතියා, හැඟෙනහෙයිනි: අඤ්ඤථා, අන්පරිද්දකින් වූයේනම්; දබ්බස්ස අපි, (ඝටාදි) ද්‍රව්‍යයාගේද; අචික්ඛනාඅඤ්ඤු, ප්‍රත්‍යක්ෂබව

—–00—–—

447 පවත්තා හිට්ඨිතෙ භාවෙ, වත්තමාන මධිට්ඨිතං
වත්තමානං සමීපඤ්ච, වත්තමානන්ති වුච්චතෙ— *

448 යථා ගඞ්ගාසමීපඤ්ච, ගඞ්ගාසද්දෙ න වුච්චතෙ
ගඞ්ගායං න්හාතු මාගච්ඡ,ගඞ්ගායං ඝොස ඉච්චපි—

449 මුඛ්‍යාමුඛ්‍යප්පභෙදෙන, වත්තමානං මතං ද්විධා
මුඛ්‍යං නිරුඪ මාපන්නං, ආරොපෙන අමුඛ්‍යකං—

450 සද්දෙ යං සමවොහාරෙ, සද්දෙ එවච නබ්භිදෙ
මුඛ්‍යාමුඛ්‍යවසෙනෙව, ද්විධාකාරෙ පවත්තතෙ—

වේ; (සූමක්භෙයීත්දයත්) අවිශෙසයෙහා, වෙනසක්නැති හෙයිනි—

## පුරුෂාදි ක්‍රියා විනිශ්චයයි

447 පවත්ත, පැවති; අහිට්ඨිතෙ, නොනිම්යාවූ; භාවෙ, ක්‍රියාවෙහි; වත්තමානං, වර්තමානය; අධිට්ඨිතං, (ආචාර්යයන්විසින්) කියනලද්දේය; වත්තමානං, (කියනලදලක්‍ෂණඇති)වර්තමානකාලයට; සමීපංච, ආසන්න වූ අතීතානාගතකාලයද; වත්තමානංඉති, වර්තමානකාලයයි; වුච්චතෙ කියනුලැබේ—"වත්තමානං" යනු සමාන්‍යහිවයෙහි ඒකියායි—

448 යථා, යම්සේ; ගඞ්ගාසමීපඤ්ච, ගඟට සමීපස්ථානයද; ගඞ්ගාසද්දෙන, ගඞ්ගාශබ්දයෙන්; වුච්චතෙ, කියනු ලැබේද: (එසේම) ගඞ්ගායං, ගඟෙහි; න්හාතුං, නහන්ට; ආගච්ඡ, එව; ගඞ්ගායං, ගඟසමීපයෙහි; ඝොස, ගොපොල්ගමයි; ඉතිඅපි; යනමෙඋදාහරණයි—

("ඝොස" යනු 'ඝෝර' වාදෘනවූපාඨමෝ" යනුමෙන් අවිභක්තික නිර්දෙශයි)

449 වත්තමානං, වර්තමානයතෙම; මුඛ්‍යාමුඛ්‍යප්පභෙදෙන, ප්‍රධාන අප්‍රධාන භෙදයෙන්; ද්විධා, දෙපරිද්දකින්; මතං, දන්නාලද්දේය; මුඛ්‍යං, ප්‍රධාන වර්තමානයතෙම; නිරුඪං, නිරූඪයට; ආපන්නං, පැමිණියේය; අමුඛ්‍යකං අප්‍රධාන වර්තමානයතෙම; ආරොපෙන, ආරොපනයෙන් වේ—

450 අයංසද්දෙ, මේශබ්දයතෙමේ; සමවොහාරෙ, ස

—00——

451 නනු යාව ගතං කිඤ්චි; තාව භූතං තතොපරං
භාවි නං වත්තමානං තං,* කථෙව පරිකප්පතෙ—
452 භූතංවත්ථි භවිස්සන්ති, කුතො ඤාතං පතීතිතො
වත්තමානං අපි සන්තං, පතීති කිං න මඤ්ඤතෙ—
453 ඝටංකරීයතෙ චෙව, කරිස්සතිච්චිතිත්තයං
ඝටාදෙ පාකටං හොති, වත්තමානං න කිං මතං—
454 කතංච කාරිකං භූතං, භවිස්සං භාවිකං මතං
කුබ්බං කාරිය මප්පඤ්ඤං, වත්තමානන්ති පාකටං—

---

මව්‍යවහාරයවේ; සද්දෙඑවච, ශබ්දයෙහිද; තබ්භිදෙ, ඒ ව්‍යවහාරභෙදයෙන් බිඳුනේය; මුඛ්‍යාමුඛ්‍යවසෙන එව, ප්‍රධාන අප්‍රධානවශයෙන්ම; විප්පකාරෙ, විප්‍රකාරය; පවත්තනෙ; පවතී—

451 කිඤ්චි, (ඝටපටාදි) කිසිවස්තුවෙක්; යාව; යම්තාක්; ගතං, ගියේද; තං, එය; තාව, ඒතාක්; භූතං නනු, අතීතනොවේද? තතොපරං, එයින්අන්‍යවූයේ; භාවි, අනාගතනොවේද? ඉඩ, ෂම්අතීතානාගතයන්අතුරෙන්; කථෙව, කොතැන්හි; තංවත්තමානං, ඒවත්තමානයනෙම; පරිකප්පතෙ, පවසීද?—

452 භූතංච, අතීතයද, භවිස්සන්ති, අනාගතයද; අත්ථි, ඇත්තේයයි; කුතොපතීතිතො, කවරප්‍රතීතියකින්; ඤාතං, දන්නාලද්දේද? වත්තමානංඅපි, වර්තමානයද; සන්තං, විද්‍යමානය; පතීති, ප්‍රතීතිය; කිං, කුමක්හෙයින්; නමඤ්ඤතෙ, නොදන්නාලැබේද?

453 ඝටං, කළයක්; කරීයතෙචඑව, කරණුදලැබේ; කරිස්සතිචඉති,කරන්නේදවේයන; තයං, (අතීතානාගත වර්තමාන) තුණ; ඝටාදෙ, ඝටාදියෙහි; පාකටංහොති, ප්‍රකටවේ; වත්තමානං, වර්තමානය; කිං, කුමක්හෙයින්; නමතං, (ප්‍රතීතිවශයෙන්) නොදන්නාලද්දේද?—

454 කතංඑව, කරණලද්දවූම; කාරිකං, (ජලධාරණාදි)ව්‍යාපාරය; භූතං, අතීතනම්වේ; භාවිකං, වන්නාවූක්‍රියාවස්තුව, භවිස්සං, අනාගතනමැයි; මතං, දන්නාලද්දේය; අඤ්ඤං, (අතීතානාගතදෙකින්) අන්‍යවූ; කාරියංඅපි, කාය්‍යීයද; කුබ්බං, කරන්නේ; වත්තමානංඉති වර්තමානනමැයි; පාකටං, ප්‍රකටවේ—

---

* වත්තමානන්ති—පොත්ථකෙසු

——00——

455 වත්තමානප්පසඞ්ගතා, භින්නානාගත දස්සිතං
තථාපි බ්‍යාප්තියා කිඤ්චි, සප්පබාධා තිට්ඨතෙ *—

456 ක්‍රියාසන්තාන විච්ඡෙදෙ, එවං භූතං පතීයතෙ
ක්‍රියානං අවිනාසෙන, භූතං බ්‍රූති නජ්ජතෙ—

457 අනාරම්භෙතු භාවස්ස, ගම්‍යතෙ සො අනාගතො
උප්පාදාභිමුඛො තෙන, භාවො භාවීති දීපිතො—

458 වත්තමානාදිකො යොයං, කාලො භෙදසරූපතො
භෙදෙ, කථං භවෙ අස්ස, නිබ්බිකාරස්ස තාදිසො--

459 සම්බන්ධභෙදතො තස්ස, භෙදස්සු පචරියතෙ
කාලසම්බන්ධිනං භෙදෙ, කම්මානං සොපි භිජ්ජතෙ

---

455 වත්තමානප්පසඞ්ගත, වර්තමානප්‍රසඞ්ගයෙන්; අභින්නානාගතං, අභින්නවූ අනාගතය; දස්සිතං, දක්වන ලද්දේය; තථාපි, එතකුදුවුවත්; කිඤ්චිසප්පබාධකං, කිසි අභින්නානාගතයක්; බ්‍යාප්තියා, ව්‍යාප්තියපිණිස; අභිධීය තෙ, කියනුලැබේ—

456 එවං, මෙසේ; ක්‍රියානං, (පචනාදි) ක්‍රියාවන්ගේ; අවිනාසෙන, නොනැස්මෙන්: භූතං, අතීතයයි; බ්‍රූති, බ්‍රූති නොමෙි; නජ්ජතෙ, (යම්හෙයකින්) තුළුපදීද (එහෙසින්) ක්‍රියාසන්තානවිච්ඡෙදෙ, ක්‍රියාපරම්පරාවගේ සිඳීම ක්අැතිකල්හි; භූතං, අතීතයයි; ගම්‍යතෙ, හැඟේ—

457 භාවස්සතු, ක්‍රියාවගේවනාහි; අනාරම්භෙ, පටන් නොගැන්මක් ඇතිකල්හි; සො, ඒක්‍රියාව; අනාගතො, අනාගතයයි; ගම්‍යතෙ, හැඟේ; භාවො, ක්‍රියාව; උප්පාදාභිමුඛො, (යම්හෙයකින්) උත්පත්තියෙහි අභිමුඛවේද; තෙන, එහෙයින්; භාවීඉති, භාවීයයි; දීපිතො, ප්‍රකාශ කරණලද්දේය—

458 වත්තමානාදිකො, වර්තමානාදිවූ; යොඅයංකාලො යම්මේකාලයක් (කියනලද්දේ) වේද; එසොතු, මේ වර්තමානාදි කාලයතෙමවනාහි; සරූපතො, ස්වරූපයෙන් (දතයුතු) වේද; නිබ්බිකාරස්ස, නිර්විකාරවූ, අස්ස, මේකාලයාගේ; තාදිසො, එබඳුවූ; භෙදෙ, වෙනසතෙම; කථං, කෙසේ; භවෙ, වන්නේද?—

459 තස්සඅස්ස, ඒමේකාලයාගේ;සම්බන්ධභෙදතො,සම්බ

——00——

460 යථා නිච්චොපි ආකාසො, ඝටාදි දබ්බසංයුතො
ඝටාකාසාදි භෙදෙන, භින්නොවාති විධීයතෙ—

461 යථාවා, ඵලිකො භින්නො, ආභාති බන්ධූකාදිභි
සංයුත්තොතාහි තථෙකොපි,කාලො භින්නොව පතීයතෙ

462 අනාද්‍ය නිධනො එසො, පච්චයානුපපත්තිතො
නිදස්සිතොහ සදානිච්චො,කාලොසොකාලවිඤ්ඤූනා-

463 ක්‍රියාරූපො පිවා කාලො, පච්චක්ඛභෙදනිස්සයො
